# වෙස්සන් නොවූ වෙදුන්

## the healer and the drug pusher



දයා දිසානායක

# වෙස්සන් නොවූ වෙදුන්

2003 © දයා දිසානායක

ISBN ” 955”96508”4”X

**කතා ගේ වෙනත් පොත්**

**kat bitha** " හොඳම ඉංග්‍රීසි නවකතාව සඳහා රාජ්‍ය සාහිත්‍ය සම්මානය " 1999 (කතා ප්‍රකාශිත

**the saadhu testament** " ආසියාවෙන් අන්තර්ජාලයට එක්වූ ප්‍රථම නවකතාව.
මෙම කෘතිය saadhu.com නමින් මුද්‍රණය වී ඇත. (ගොඩගේ)

**the healer & the drug pusher** " ප්‍රකාශය Writer's Club Press \ USA
2001 වසරේ Sunday Island පත්‍රයේ කොටස් වශයෙන් පළවිය

**the bastard goddess** " 2003

# පෙර වදන

ලංකාවේ වෛද්‍ය ක්‍රම අදට වඩා ඉතා දියුණු තත්වයක මීට වසර දහසකට පෙර පැවති බවට ඇති විශ්වාසය මත ගොඩ නැගුනාවූ නවකතාවකි මේ.

පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික කරුණු පදනම් කරගෙන ගොඩ නලන ලද මේ කතාවේ එන සිදුවීම් හා චරිත සියල්ල මනඃකල්පිතවේ.

2000 වසරේ දි **the healer & the drug pusher** ඉංග්‍රිසි බසින් ලියා පළ කරණ ලදුව 2001 දි සන්ඩේ අයිලන්ඩ් පත්‍රයේ කොටස් වශයෙන් පළවිය සිංහල කතාව පළ කිරිම විවිධ හේතුන් නිසා පමා විය.

මෙවරත් මගේ දයාබර බිරිඳ ඉන්ද්‍රාණිත්, අදිතා, නිශාන්ත, රදිත, හා මාධවි දූ පුතුන්ද දුන් සහයෝගය නොවන්නට මෙය බිහි නොවන්නේය. පුරාවිද්‍යාත්මක කරුණු එකතු කර ගන්නට සහායවූ රාජ් සෝමදේව මහතාත්, නුවරකලාවියේ ගැමි ජිවිතය මට හඳුන්වාදුන් ඔරුක්මාන්කුලමේ වන්දන හිමියනුත්, මගේ පොත් සියල්ල අන්තර්ජාලයට එකතුකළ රදිත ටත් මා සදා ණය ගැතිය.

දයා දිසානායක
9/27 නුගෙ පාර
පැලියගොඩ

**daya@saadhu.com**

**http://www.saadhu.com**

දෙසැම්බර 16 2003

# අපේ පැරණි වෙදකම

**ක්‍රි ව 337 - 365 රජ තුමා විසින් තරුණයෙකුගේ හිස් කබල පලා ඇතුලේ සිටි ගෙඹි පැටියන් ඉවත් කර රෝගියා සුව කළ බව චූලවංසය සඳහන් කරයි**

**1917 Sinhales Materia Medica ග්‍රන්තයේ මෙ ගැන විග්‍රහ කරණ වෛද්‍ය ජොන් ආටිගල මේ තරුණයා එක්තරා පිළිකා රෝගයකින් පෙළුණ බවත් ඒ පිළිකා සෛල අන්වීක්ෂයකින් බැලූ විට කුඩා ඉස්ගෙඩියන් ලෙසින් දිස් වෙන බවත් සඳහන් කර ඇත**

**අපේ පැරණි වෛද්‍ය විද්‍යාව ගැන තවත් විස්තර කිරිමක් අවශ්‍ය නැත**

<u>DR. JOHN ATYGALLE</u>

"At first sight, the operations described in the Mahawansa as having been performed by this king seem to partake of the nature of legend rather than of sober truth. Closer and careful scrutiny, however, accompanied with due allowance for oriental imagination and the fondness of Eastern writers or hyperbole soon shows that the operations described are esaily recognizable as very similar to those performed almost daily by Western surgeons of the present day. the...operation might have been cephalotomy, for the removal of hydatid tumour, occasionally met with as we know within the cranium, and it is not a little interesting to observe that the cluster of hydatid growths, when seen under the microscope, is not unlike a group of young or half-grown toads after they have shed their tails. We also know, on the authority of Scobold, that one medium by which the echinococci find their way into the human frame is by the drinking of foul water."

Sinhalese Materia Medica. John Attygalla MD first published 1917. Introduction page IX.

**WHO**

Health is a state of complete physical, mental and social well-being and not merely the absence of disease or infirmity.

WHO definition of Health

| | | |
|---|---|---|
| 1 | කිතා | 7 |
| 2 | බෙහෙත් කන්න එපා | 14 |
| 3 | වෙද හාමුදුරුවෝ | 23 |
| 4 | බෙහෙත් ජාවාරම | 33 |
| 5 | දෙමළ අධිකාරි | 39 |
| 6 | අතුරු ආබාධය | 50 |
| 7 | පාලි | 57 |
| 8 | ස්මූත් | 70 |
| 9 | ප්‍රජාපත්‍ය | 84 |
| 10 | ගාන්ධර්වී | 95 |
| 11 | අක්ෂි වෛද්‍ය | 104 |
| 12 | දේශ සංචාරකයෝ | 113 |
| 13 | වෙද කමක් සෙවීම | 133 |
| 14 | මිත්‍ර | 149 |
| 15 | හීන් බෝවිට්ටියා | 155 |
| 16 | නව දිවිය | 165 |
| 17 | පැපිරස් පොත | 174 |

# කිතා

කිතා ගේ දෑස රැඳී තිබුණේ ඉතා සැහැල්ලුවෙන් අහසේ පාවෙන මුහුදු ළිහිණියා වෙතය. ඔහු අවට වූයේ තද නිල් පැහැ ගත් මුහුද ත් ඊට වියනක් වූ ලා නිල් වන් අහස් ගැබත්ය. ගුවන් තළයේ එකදු වළාවක් වත් නොවීය.

අවුරුදු දහතුනක් පමණ වයස් වූ කිතා ගේ කාළවණී වූ සිරුර වැසුණේ ඉනවට එතුන රෙදි කඩකින් පමණකි. ඔහු සමග ඔරුවේ සිටි එවැනිම පෙනුමක් ඇති ඔහුගේ පියාවූ මින්දා, තුනිවූ කෙස් සහිත හිස වටා තවත් රෙදි කඩක් ඔතාගෙන සිටියේ දැඩි අවු රශ්මියෙන් සහනයක් ලැබීමටය.

හිස මඳක් හරවා ගොඩබිම දෙස බැලුවහොත් මුහුදත් අහසත් වෙන් කෙරෙන කොල පාට තීරුවක් ලෙස විහිදී ගිය තල් ගස් පේළියත්, ඒ අතරින් මහේශාක්‍ය ලීලාවෙන් නැගී සිටි බුදුරුවත් කිතාට පෙනේ. බුදුන් වහන්සේගේ හිස පෙනෙන තෙක් මානයෙන් ඔබ්බට යන්නට මින්දා කිසි විටෙකත් තැත් කළේ නැත.

දිලිසෙන දියමත නොපැහැදිලි යම් දෙයක් හදිසියේම කිතාගේ නෙත ගැටුණේය. ඔහු ඉදිරියේවූ සිතුවම මත පතිත වූ කලු ලපයක් බඳුවූ මෙය මැකී ගියේ නම් මැනවැයි ඔහු සිතුවේය.

සිය පියාට උවමනා ලෙසින් ඔරුව පැදවුවත්, ඔහුගේ කුඩා හබල් පහරකින්වත් නිසල මුහුද සසල කරන්නට කිතා අකමැති විය. මෙවන් දිනක ඔහුගේ සාමකාමී ලෝකයට කිසිත් බාධාවක් ඇති වීම ඔහුගේ සිතට අසහනයක් විය. තාත්තාගේ බිලී පිත්ත එක් වරම ගස්සා මාලුවෙකු බා ගන්නා අයුරුත් බලා සිටි ඔහු අලුත් ඇමක් අමුනා දීමටද උත්සුක විය. ඔහු මුහුදු ලිහිණියා කොහි ඇතිදැයි සොයන්නට වූයේ, ඈතින් මතුවූ දෙය තාත්තාගේ අවධානයට යොමුකරන්නට විටෙක ඔහුට සිතුණත් එය එතරම් වැදගත් නැතැයි යලිත් ඇත්වූ හැගීම නිසාය. රෝහලට අවශ්‍ය තරම් මාලු තවමත් අසුවී තිබුණේ නැත.

නැවතත් ඔහු කලු ලපය දෙස නෙත් යොමු කළේය. එය තවමත් එතැනම තිබුණේය. කිතා බුදුරුව දෙස බැලුවේය. උන් වහන්සේගේ මුහුණ මෙතරම් දුරට නොපෙනුණත් එතුමාගේ කරුණාබර දෑස ඔවුන් වෙත යොමුවී ඇති බව කිතා දැන සිටියේය. ඕනෑම කරදරයකදී ඔවුන්ට තිබූ රැකවරනය බුදුන් වහන්සේගේ බැල්මය.

බුදුරුව පිහිටියේ බදකර අටන අසල වූ පිරිවෙණේ ය. රෝහල පිරිවෙණේ කොටසක් විය. මින්දා සතු රාජකාරිය වූයේ රෝහලට අවශ්‍ය වූ මාලු සැපයීමය. රෝහලට සැපයීමෙන් පසු ඉතිරිවෙන මාලු ගම්මණ්ඩියට ගෙනගොස් විකිණීමය ඔවුන්ගේ සිරිත. ගෙදර ගෙනියන්නේ ඉන් පසු ඉතිරිවන කුඩා වුත් අඩු ඉල්ලුමක් ඇතිවූ මාලුය. බොගයක් වගා කරන්නට ඔවුන් සතු ඉඩමක් නොවූ හෙයින් මින්දා

ගේ එකම ආදායම් මාර්ගය වුයේ මාලු විකිණීමය. තාත්තාට මුහුදු යන්නට බැරිවන දිනක මේ රාජකාරිය පැවරෙණු ඇත්තේ කිතාටය.

යලිත් බලන විට, ලපයක් ලෙස කලින් දුටු දෙය තරමක් ළංවී තිබුණෙන් කිතා එය ඔරුවක් ලෙසට හඳුනා ගත්තේය. ඔරුවක් නම් තාත්තාගේ අවධානයට යොමුවිය යුතු වන්නේය. අසල ගමකින් පැමිණි ඔරුවක් විය නොහැකි හෙයින් මේ ආගන්තුක ඔරුව මින්දාගේ විමසිල්ලට යොමු කළ යුතුයැයි කිතාට සිතුණේය.

ඒ දෙස මඳ වේලාවක් බලා සිටි මින්දා ඔරුව එදෙසට පදවන ලෙස පුතාට කිව්වේය. ආගන්තුක ඔරුව තුල කිසිවෙක් පෙනෙන්නට සිටියේ නැත. එය නැවකින් ආ ඔරුවක් විය යුතුය. වාරකන් සමයේදී හෝ දැඩි කුණාටුවකදී නම් නැවකින් ගිලිහී ආවක් බව සිතිය හැකිය. ඈත ගමක වෙරළක සිට වුවත් ගසා ගෙන එන්නට තරම් රළු වූ මුහුදක් පසුගිය දිනවල නොපැවතියේය. හිමිකම් කීමට කිසිවෙක් නොසිටියොත් රෝහල් අධිකාරින්ගේ අවසරයෙන් ඔරුව මින්දාට හිමි කර ගත හැකිවන්නේය.

ඒ අසලට ළං වත්ම වඩා පැහැදිලි ලෙස ඔරුව පෙනුනත් එහි කිසිවෙක් සිටිනා බවක් තවමත් දක්නට නොවිය. ඔරුව පිට පැත්තේ කිසියම් සළකුණු කිහිපයක් තිබුනත් ඒවා පියපුතු දෙදෙනාටම හ□ඳුනා ගැනීමට නොහැකි විය.

" නැවකින් ලිහිල ආපු එකක් වෙන්නැති" මින්දා පුතාට කීවේය.

"ඒකෙ කවුරුවත් පේන්න නැහැ"

"තව ටිකක් ළං වෙලා බලමු" ජීවිත කාලයක් තිස්සේ මාලු බෑමෙන් ප්‍රගුණ කරගෙන තිබූ ඉවසීමෙන් යුතුව තාත්තා පැවසුවේය.

ඔරුව තුල යමක් ඇති බව කිතා දුටුවේය. එය රෙදි කැබලි කිහිපයක් බව හැඳින ගත් විට කිතාගේ සිතට බියක් ඇතිවිය. සමහර රාත්‍රියක මුහුදු වෙරළේ ගිනි මැලයක් වටා එකතු වූ විට භූත නැව් ගැනත්, මුහුද හා බැඳි තිබූ වෙනත් බියකුරුවූ කතාත්, ගමේ මහලු මසුන් මරන්නන් බොහෝවිට කියනවා ඔහු අසා තිබුනේය. ඒ කතා එකින් එක ඔහුට සිහි වන්නට වුයේය. ඔහු තාත්තා දෙස බැලුවේය. මින්දා ඔරුව දෙස බලාගෙන නිහඬව හබල් ගෑවේය.

එය භූත ඔරුවක් විය නොහැකිද? එය කොහි සිට ආවක්ද? එහි සිටි මිනිසුන්ට වුයේ කුමක්ද? ප්‍රශ්න වැලක් ඔහු සිත තුළින් ගලා ආවේය. තවත් ළංවත්ම රෙදි කැබලි කිහිපය කිසියම් හැඩයක් ගත් අතර, ඒ තුලින් පා යුගලක් වැනි යමක් පැහැදිලි වෙමින් මිනිස් සිරුරක හැඩයක් ගත්තේය. හිසක් හෝ මුහුණක් තවමත් හඳුනාගත නොහැකිය. හදිසියේ එහි යම් චලනයක් දැක කිතා ගැස්සී සිටියත්, එය දඟකාර සුළඟ විසින් කරන ලද රෙදි කැබැල්ලක් සෙලවීමක් බව ඔහු ඒ සමගම වටහා ගත්තේය. ඔරුව වෙත ළඟා වූ විට තාත්තා කුමක් කරනු ඇතිදැයි කිතා කල්පනා කළේය.

මින්දා ලණු කැබැල්ලක් ගෙන අනිත් ඔරුව ගැට ගසා ඒ තුළ වූ සිරුර නොපැගෙන්නට ඔරුවට මාරුවිය. කිතා මහත් වෑයමින් ඔරු දෙක නොපෙරලෙන සේ අල්ලා ගෙන සිටියේය. මින්දා පහත්වී ඉතා ප්‍රවේශමින් සිරුරේ හිස වැසී තිබූ රෙදි කඩ මෑත් කළේය. සිරුරේ එක් අතක් මුහුණ වසාගෙන වැටී තිබුණේ අවසාන මොහොතේ හෝ හිරු රැස් වලකා ගන්නට තැත් කළ සෙයකිනි. සිරුරේ තැනින් තැන වූ සුදු පැල්ලම් දුටු කිතාගේ සිතට එක් වරම හැගුණේ කිසියම් සතෙකු විසින් සිරුර කා දැමීමට ගත් උත්සාහයක් ලෙසය. සීතල සුළගක් එක් වර හමා ආවාසේ කිතාගේ ඇග කිලිපොලා ගියේය.

මින්දා දෙගෙඩියාවෙන් සිරුරට අත තබා යලිත් වඩා සැලකිලිමත් ලෙස හිසටත් ගෙලටත් ඊ ළගට පපුවටත් අත තැබිය. ඔරුව එතැනම තිබෙන්නට හැර ආපසු යමු යැයි පැවසීමට කිතාට අවශ්‍ය වුවත්, එහි වූ මළ මිනිසා ගැන කුතුහලයක් ඒ සමගම ඔහු සිත තුල නැගී ආවේය. යම්තමින් හෝ පණ කෙන්දක් ඉතිරිවී තිබුණේ නම් ඒ මිනිසා මැරෙන්නට අතහැර දමා යන්නට තාත්තා කිසිසේත්ම කැමති වන්නේ නැත. ජීවිතය බේරා ගන්නට බැරි වුවත් මුහුද මැද මාලුන්ටත් උකුස්සන්ටත් ගොදුරක් වීමට ඉඩ දිය නොහැකි බැවින් ගමට ගෙන ගොස් ආදාහන කරන්නට තාත්තාට උවමනා වන්නේය.

ඔරුව තමා සතු කර ගැනීම මේ මොහොතේ මින්දාගේ ප්‍රමුඛතාවක් නොවන බවත් කිතාට වැටහුණේය.

"තාම පණ තියෙනව"

"තාත්ත කොහොමද දන්නෙ?" කිතා මෝඩ ප්‍රශ්නයක් ඇසුවේ යමක් කිව යුතු නිසාවෙන්ය.

"අපි රෝහලට ගෙනිහින් බලමු"

ආගන්තුක ඔරුව ඔවුන්ගේ ඔරුවට වඩා විශාල වූ හෙයින් එය ඇද ගෙන යාමට වඩා පැද ගෙන යාම පහසුයැයි තීරණය කළ මින්දා, පුතාටත් ඒ ඔරුවට නගින්නට කීවේය. කිතා එය කිසිසේත්ම බලාපොරොත්තු නොවූවක් විය. නන්නාඳුනනා මළ සිරුරක් සමග එක ඔරුවක ගමන් කරන්නේ කෙසේද, එය මිනිස් සිරුරක් ද නැතිනම් අවතාරයක්දැයි තාත්තා ට සැක හැර දැන ගැනීමට පුලුවන් කමක් නැත.

ඔරු දෙක එකට බැඳි ලණුව හොඳින් ගැට ගසා ඇතිදැයි නැවත වරක් පරීක්ෂාකර ඔහු අනිත් ඔරුවට නැංගේය. සිරුර දෙස නොබලාම ඔහු ඉදිරිය බලාගෙන වාඩිවී හබලක් අතට ගත්තේය. ඒ හබල අන්තිමට අල්ලන්නට ඇත්තේ මියගිය තැනැත්තා විසින් බව ඔහුට එවිට කල්පනා වුවත්, ඒ ගැන වෙන කරන්නට දෙයක් නොවීය. ඔවුන්ගේ ඔරුවේ ඇති හබල ගන්නට යලිත් යන්නට බැරිය. ඔහු පසුපස වූ සිරුර දෙස නොබලා ඔරුව පදින්නට වූයේ එහෙයිනි. කිසිවෙක් ඔහු දෙස බලා සිටින්නාක් මෙන් ඔහුට දැනුණේය. තාත්තා ඔහු පිටුපසින් සිටිනා බව සිහිවීමෙන් ඔහු සිත තුල වූ බිය මඳක් තුනී විය. එහෙත් ඒ අමුත්තා මියගොස් නැතැයි තාත්තාගේ විස්වාසය පිළි ගන්නට ඔහුට

අපහසු විය. කොයි මොහොතක හෝ මියගිය මිනිසා නැගිට සිට ඔහුගේ ගෙල මිරිකනවා ඇතැයි ඔහුට සිතුණේය.

ඔවුන්ගේ ඔරුවට වඩා විශාල වූ මේ ඔරුව පැදීම තරමක් අමාරු කාර්යයක් විය. වෙනදා නැති වෙහෙසක් ඔහුට දැනුනත්, හති දමමින් ඔහු මුලු වැර යොදා ඔරුව පදින්නට වුයේය.  ඔවුන් වෙරළට මෙ තරම් ඈතක සිටි බවක් කිතාට දැනේනට වුයේ දෑත් වේදනා ගෙන දෙන විටය. තල් ගස් වලට ඉහලින් ඔහු දෙස නොසැලී බලා සිටිනා දීපංකර බුදුන් දකිත්ම ඔහුගේ බිය මඳක් තුනීවූ අතර දෑතට අමතර දිරියක් ලැබුනේය.

"ඈවල ගිහිල්ල ඉන්න කෙනෙකුට ඉක්මනට එන්න කියන්න. ඒ එක්කම රෝහලට ඈවල ගිහින් අපි මෙහෙම ලෙඩෙක් අරගෙන එනව කියන්න" ඔවුන් වෙරළට ලගා වන්නටත් පෙර මින්දා කීවේය. කිතා ඔරුවෙන් පැන ගම දෙසට දුවන්නට වන්නේය. මියගිය මිනිසාගෙන් ඈත් වන්නට ලැබීම ඔහුගේ සිතට මහත් සහනයක් වුයේය.

ඔරු දෙකම වෙරළට ගෙන එන අතර මින්දාට ඇස් කොනකින් පෙනුනේ තල් ගස් අතරින් වැටුනු අඩි පාර දිගේ ඈව යන කිතාය. ඔහු ඔරුවෙන් බිමට පැන හැකි පමනින් ඔරුව උස් බිම වෙත ඇද්දේය. සුලු වේලාවකින් පිරිමි කිහිප දෙනෙක් වෙරළට දුවගෙන ආහ. ඔවුන් පසු පස ගැහැණුන් කිහිප දෙනෙක්ද ළමුන් රංචුවක්ද වුහ. ඔරු දෙකම වෙරළේ ඉහලට ඇද ගැනීමට ඔවුහු මින්දාට උදව් කළහ. ඒ අතර මින්දාගෙන් වැල නොකැඩී අසන්නට යෙදුන ප්‍රශ්න මාලාවක් විය.

"අපි මෙයාව රෝහලට ගෙනියන්න ඕන පුලුවන් ඉක්මනට. ජීවතේ කොයි වෙලාවෙද දන්නෙ නැහැ"

වයස්ගත තැනැත්තෙක් ඔරුවට නැඹුරුවී, එහි සිටි මිනිසාගේ අත මැණික් කටුව ළගින් අල්ලාගෙන නාඩි බලන්නට විය.

"හම ගැලවෙනව වගෙයි. මගෙ හිතේ ලුණු වතුරටයි, ඉර අව්වට පිච්චිලයි වෙන්න ඕන" මහල්ලා සුදු රැවුල පිරිමදිමින් වට පිට බැලුවේය. "හරිම පරිස්සමෙන් ගෙනියන්න වෙන්නෙ. රාමු ගිහින් හොඳවයෙන් කෙහෙල් කොල දෙකක් කපාගෙන වරෙන්. සුන්දර් උඹලගෙ ගෙදර ඉස්සරහ දොරට තියෙන ලෑල්ල ගෙනෙන්. ඉක්මන් කරපල්ල" ඔහු අණ දෙන්නට විය.

නන්නාඳුනන මිනිසාගේ වගකීමෙන් මිදුණු බවක් හැගුණෙන් මින්දාට නොදැනුවත්වම වාගේ සැනසුම් සුසුමක් හෙලුණේය. රැස්වී සිටියවුන් ඔරුවෙන් ඈත් කර තබන්නට ඔහු උත්සාහ කළේය. ගැහැණුන්ගෙන් තොරතෝංචියක් නැතුව නැගුණ ප්‍රශ්න ඔහු නෑසුනාක් මෙන් සිටියේය.

සුළං පහරින් ඉරෙන්නට ඉඩ නොදී රාමු කෙසෙල් කොල දෙකක් රැගෙන ආ අතර, සුන්දර් තවත් මිනිසෙක්!ගේද උදව්වෙන් දොර ලෑල්ලක් ඔසවාගෙන ආවේය. ගෙට ඇතුලුවීමට ඇති දොරටුව රාත්‍රියට ආවරණය කිරිමට යොදා

ගත්තේ එම ලෑල්ලය. මේ ගම්වල කිසිවෙක් අගුලු දමා වසා තැබිය හැකි දොරක් ගැන සිතුවේ නැත. ආරක්ෂා කරන්නට තරම් වස්තුවක් ඔවුන් සතු නොවූ අතර, තිබූ දෙයක් සොරා ගන්නට කිසිවෙක් එතැයි ගම්මු හීනෙකින් වත් සිතුවේ නැත.

ඔරුව අසලින් බිම තබන ලද දොර ලෑල්ල මත කෙසෙල් කොළ දෙක එලන ලදි. සිරුර ඔසවා ඒ මත තබන්නට, තරුණයින් කිහිප දෙනෙකුට මහල්ලා උපදෙස් දුන්නේය. ඔවුන් ඉතා පරෙස්සමෙන් ඔරුවට නැමී සිරුර ඔසවා ගත්හ. රෝහලේ සිට ආපසු පැමිණ සිටි කිතා කොයි මොහොතක හෝ මේ අමුත්තා ඇස් හැර ඔවුන් දෙස බලතැයි සිතුවේය. එක් ඇසක් මදක් ඇරී යලි වැසුනා සේ දුටු නමුත් ඒ ගැන කිසිවෙකුට කීමට ඔහු නොසිතුවේය. මිනිසා මියගොස් ඇතැයි ඔහුගේ විස්වාසය වෙනස් වූයේ නැත.

සිරුර සීරුවෙන් ඔසවාගෙන යන තරුණයින් කිහිප දෙනා පිටුපසින් ඉතිරි වූවෝ ගමන් කළහ. මහල්ලා රෝගියා ගැන සැලකිල්ලෙන් ඒ අසලින්ම ගමන් ගත් අතර රෝගියා ඔසවාගෙන යන්නනන් වෙහෙසට පත් වුවහොත් ඒ බර දරන්නට කිහිප දෙනෙක්ම සැරසී සිටියහ.

නිවාස කිහිපයකින් සැදුනු ගම හරහා ඔවුන් යන විට එහි සිටි ගැහැණු හා ළමෝ විස්තර අසන්නට වූහ. වෙරළේ සිට ආ ගැහැණු එහි නැවතී අනිත් අය ගේ ප?ශ්න වලට පිළිතුරු දෙන්නට වන්හ. ඒ ගැහැණු. මින්දා ගැනත් කිතා ගැනත් කතා කරණවා ඇතැයි කිතා සිතුවේය. මුහුදේ අතරමන් වී සිටි මිනිසෙකු බේරාගත් වීරයෙක් ලෙස ඔහුද මින් පසු ගැනෙනවා ඇතැයි කිතාට සිතුණේය. සමහර විට වසර ගණනාවක් යන තෙක් ගමේ අය මේ ගැන කතා කරනවා ඇත. රාත්‍රියට මුහුදු වෙරළේ ගිනිමැල ගසාගෙන පිළිසඳරේ යෙදෙන විට මේ ගැනත් කියනවා ඇත. අනිත් ළමුන් ඉදිරියේ ඔහුට මහත් ආඩම්බරයක් ඇතිවිය. අලුත් ඔරුව රෝහල් බලධාරින්ගෙන් ලද විට තාත්තාටද ආඩම්බරයක් ඇති වෙතැයි ඔහුට සිතුණේය.

රෝහල වෙරළේ සිට එතරම් දුර නොවූවත, අඩි පාරක් දිගේ ගස් අතරින් යන ගමන පහසු නොවිය. ලෑල්ල ඔසවාගෙන යන තරුණයින්ට දෙවරක්ම මාරුවෙන්නට සිදුවිය. නගරයේ සිට රෝහල වෙත දිවයන පාරට ළගාවූ පසු ගමන පහසු විය.

කිසිදා නොවැසෙන දොරටුවක් සහිත පවුරකින් රෝහල වටවී තිබුනේය. වසන්නේ නැත්නම් දොරටුවක් කුමකටදැයි කිතා බොහෝ විට සිතුවේය. දොරටුව හැර තිබුණත් එතැනින් ඇතුල්වූයේ රෝගියා ඔසවාගෙන ගිය කිහිපදෙනාත් මින්දාත් මහල්ලාත් පමණකි.

කිතා මේ දොරටුවෙන් කිසි දිනක රෝහලට ඇතුලුවී තිබුණේ නැත. රෝහලේ ප්‍රධාන ගොඩනැගිලි අසලකටවත් ගිහින් නැත. ඔහු කළේ පිටුපස දොරටුවෙන් ඇතුලුවී මුලුතැන් ගෙයට ගොස් අල්ලාගත් මාලු බාරදී ආපසු යෑමය. වෙනත් තැන්වල ඇවිදින්නට ඔහුට අවසර තිබුනේද නැත.

ගේට්ටුවෙන් පිටත රැඳුන මිනිසුන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු දෙන්නට කිතාට සිදුවිය. කිතා විස්තර කියාගෙන යද්දි වැඩිහිටියන් ඔහුට තරවටු කළේ ජීවතුන් අතර සිටි කෙනෙකු මළ මිනිසෙකු ලෙස ඔහු හැඳින්වීම නිසාය. ඉන් පසු ඔහු දුටුදේත් කළ දේත් පමණක් පැවසුවේය. ඔහු නොකීවේ ඒ අවස්ථාවේ ඔහු කෙතරම් බිය පත්ව සිටියාද යන්න පමනකි.

ටික වේලාවකින් මින්දා ආපසු ආවේය. ඔහුගේ මුහුණේ සියුම් සිනහවක් කිතාට හඳුනා ගත හැකිවිය.

"වෙද හාමුදුරුවො කියනව ලෙඩාට සනීප කරන්න පුලුවන් කියල" ඔහු එතැන සිටි අයට පැවසීය. "ඒ උනාට එයාට ඇස් පේන්නෙ නැතුව වගෙයි" ඔහු බිඳුණු හඬකින් එකතු කළේය.

කිතා ගැන අමතක කළ මිනිස්සු මින්දා වටා රොක්වී තව තවත් විස්තර දැනගැන්මට උත්සාහ කළහ. කිතා සෙමින් ගෙදර බලා පා නගන අතර එක වරම ඔහුට වෙරළේ නැවැත්වූ ඔරු දෙක ගැන සිහිවිය. ඔහු ඒ දෙසට හැරුණේය. ඔහු ඔරු දෙක තවත් උඩට ඇද ඔවුන්ගේ කුඩා ඔරුවේ තැබූ මාලු එකතු කරන්නට විය.

ඔරුවේ සිටි මිනිසාගේ දෑස් නොපෙනෙන ලෝකය කෙබඳු එකක් විය හැකිදැයි යන සිතුවිල්ල කිතා තුල ඇතිවිය. ඔහු ඇස් තදින් පියාගත්තේය. ඔහුට තමා මුහුණ ලා සිටි දිසාව සිතාගනිමට අපහසු විය. ඔහු ගොඩබිමට මිස මුහුදට මුහුණ ලා සිටිනවාදැයි දැන ගන්නට එක් වරක් දෑස් අරින්නට සිදුවිය. ඔහු ඇස් පියාගෙන ඇවිදින්නට තැත් කළද පියවර කිහිපයක් තබන්නට පෙර දර කැබැල්ලක පය පැකිලි වැටුණේය. දර කොටයේ වැදුණු පාගිලි වේදනා දෙන්නට විය. කිසිවෙක් මෙය දුටුවාදැයි ඔහු වට පිට බැලුණේය. ඔහු නැගිට බිම වැටී තිබූ මාලු අසුලාගෙන වැලි ගසා දමා රෝහල වෙතට යාමට හැරුණේය. මෙවර ඔහු පා නැගුවේ සුපුරුදු පසුපස දොරටුව වෙතය. ඔරුවේ සිටි අමුත්තා දකින්නට ඔහුට ආසාවක් ඇති වුවත්, රෝගියා සිටිනා තැනක් කිසිවෙකුගෙන් අසන්නට ඔහු පසුබට විය.

රෑ බෝ වන්නට පෙර ගෙදරට සමීප විය යුතුයැයි සිතා ගත් කිතා. රෝහලේ සිට ආපසු දුවන්නට වුයේ හඬන ඔරුව ගැනත් එහි වූ අවතාරය ගැනත් තවමත් සිත තුල රජ කළ බිය නිසාය.

"හාමුදුරුවන්ට ලෙඩා හොඳ කරන්න පුලුවන් වෙයිදද?" මින්දාගේ බිරිඳ එදා රෑ ගෙදර පිල මත වාඩිවී බුලත් විඩක් සපමින් සිටි සැමියාගෙන් ඇසුවාය.

"මට විස්වාසයි සනීප වෙයි කියල. මෙලහකට වෙද ඇත්තො ලෙඩා බලල කී දවසක් විතර මුදෙ ඉඳල තියෙනවද, නිරාහාරව ඉඳල තියෙනවද, හාමත ඇරෙන්න වෙනත් අසනීප තියෙනවද කියල සොයාගෙන ඇති"

"අපිට කරන්න පුලුවන් දෙයක් නැද්ද?" ඇය ඇසුවාය.

"හෙට මම අහල බලන්නං. බෙහෙත් බඩු එහෙම මොනවත් හොයන්න ඕනද කියල. අපි ඉතින් වෙන මොනව කරන්නද?"

"මටත් ඕන එයාට උදව් කරන්න" කිතා කීවේය.

"අපි හෙට පංසලට ගිහිල්ල මල් පූජ කරල සෙත් පතමු" අම්මා ඔහුට කීවාය.

"එයා අපේ කෙනෙක් නෙවෙයි නෙ?" බිරිඳ මඳ වෙලාවකට පසු ඇසුවාය.

"වෙන්න බැහැ. අපේ රටේ කෙනෙක් නෙවෙයි. අපේ උපන් රටෙන් වෙන්නත් බැහැ. සමහර විට ඈත රටකින් වෙන්න ඇති, නැවකින් ආපු"

"ඉතින් මේ පුංචි ඔරුවක් ඇතුලෙ මොනව කළාද?"

"මටත් හිතාගන්න බැහැ. නැවෙන් පැනල යන්න හැදුවද දන්නෙ නැහැ. නැත්නම් මහ නැවියො නැවෙන් එළව ගත්තද දන්නෙ නැහැ දඩුවමකට"

"හොඳ වෙලාවට මේ පැත්තට පාවෙලා ආවෙ ඔරුව"

"දැන් පුතා ගිහිල්ල නිදාගන්න. උදෙන්ම යන්නත් තියෙනව නෙ"

## බෙහෙත් කන්න එපා

"කොහෙන්ද ඔය අලුත් ටී ෂර්ට් එක?" කාමරයෙන් එළියට ආ දුවගෙන් රාජු ඇසුවේය.

"මේක පුණ්‍ය ගෙන් හම්බ උනේ. එයාගෙ හස්බන්ඩ් ඕස්ට්‍රේලියා ගිහින් ආවනෙ" භානු උත්තර දුන්නාය.

"මොකක්ද ඉතින් ඔය ගහල තියෙන්නෙ? සේ නෝ ටු ඩ්‍රග්ස් කියල?"

"ඔය ඩැඩීල බෙදන ජරාව ගන්න එපා කියන එක තමයි"

"ජරාව? මොන ජරාවද? අපි මත් කුඩු බෙදන්නෙ නැහැ" රාජු ටිකක් සැරෙන් කිව්වේය.

"ඩ්‍රග්ස් කිව්වම තාත්තල විකුණන ඒවත් අහුවෙනව. ඒව මත් කුඩු වලට වැඩිය භයානකයිනේ"

"බහුබූත කතා කියන්න එපා. අපි විකුණන හැම බෙහෙතක්ම සෞඛ්‍ය අමාත්‍යාංශෙන් අනුමත වෙලා තියෙනව. ඒ බෙහෙත් මුලු ලෝකෙම පිළිගත් ඒව"

"අප්පා එහෙම කීවට ඔය දොස්තරල ලියල දෙන බෙහෙත් බීල මිනිස්සු මැරෙනව, අරක්කු, සිගරට්, මත්කුඩු නිසා මැරෙණවට වඩා" භානු කීවේය "ඔය බහු ජාතික බෙහෙත් ජාවාරම් කාරයො ඕව හදන්නෙ අපට ආදරේකට නෙවෙයිනෙ"

"මගේ යකා අවුස්සන්නෙ නැතුව ඉන්න" ඉවසීමේ සීමාවටම ඇවිත් සිටි රාජු කෑ ගැසුවේය.

"මෙතන ඔය දොස්තරලටත් පණිවිඩයක් තියෙනව" භානු යලිත් පැවසුවාය.

"ඒ මොකක්ද?"

"ලෙඩුන්ට බෙහෙත් නොදී ඉන්න කියල"

"මේ ළමයට නං පිස්සු. බෙහෙත් නොදී ලෙඩ සනීප කරන්න පුලුවන්ද?"

"බෙහෙත් බීල තමයි ලෙඩ්ඩු මැරෙන්නෙ"

"ඔය වගේ මෝඩ කතා ගෙදරදි කිවුවට පිට අය ඉන්න තැනක එහෙම කියන්න එපා, මිනිස්සු හිනාවෙයි, මටත් එක්කම. මේවද මේ හැමදාම ෆාමසි ඩිප්ලෝමා

පංතියට ගිහිල්ල ඉගෙන ගන්නෙ? ඔයිට වඩා හොඳයි මැහුම් පංතියකට ඇරියනං"

"ඩැඩි දන්නෙ නැතුවට මට මහන්නත් පුලුවන්, උයන්නත් පුලුවන්"

"එහෙනං ගිහිල්ල අම්මට උදවු කරන එකනෙ ඇත්තෙ මගේ ඔලුව අවුල් නොකර""

රාජු ආපසු පත්තරය කියවන්නට ගත්තත් එහි තිබූ අකුරු ඔහුට පෙනුණේ නැත. ඔවුන්ගේ එකම දරුවාගේ මේ හදිසි වෙනස ඔහුට තේරුම් ගන්නට බැරිවිය. භානු ඉස්සර කොයි තරම් විනීත කීකරු අහිංසක දැරියක වුවාදැයි ඔහු සිතුවේය. මේ වගේ දෙමාපියන්ට කිසිම ගරු සරුවක් නැතුව කතා කරන ළමයින් ඔහු දැක තිබුණේය. ඒත් ඒ ළමයි බොහෝ විට එක්කෝ කොළඹ ජාත්‍යන්තර පාසල් වල ඉගෙන ගන්නා උන්ය, නැත්නම් දෙමාපියන්ට සල්ලි වලට කරන්න දෙයක් නැතිකමට ඇමරිකාවට, එංගලන්තයට හෝ ඕස්ට්‍රේලියාවට යවා උගැන්වූ ළමයින්ය. රාජුගේ බිරිඳත් දෙමාපියනුත් විසින් සම්ප්‍රදායික ද්‍රවිඩ පරිසරයක හදා වඩාගත් දැරියක් මෙසේ වෙනස් වෙන්නට කිසියම් බාහිර හේතුවක් තිබිය යුතුය. භානු ඔවුන්ගේ ඒ සංස්කෘතිය ඉතා අගේ කරන බව ඔහුට සහතිකය.

පත්තරය පසෙකට දමා නැගිටගත් ඔහු දොර හැරගෙන කුඩා බැල්කනිය උඩට ගියේ කාමරය තුළ ඔහු සිරවී ඇතැයි හැගුණ නිසාය. භානුගේ මේ හදිසි වෙනස්වීම ඔහුගේ සිතට වදයක් විය. දුවට මොනවා වෙලාද? ඔවුන්ගේ පවුලට මොනවා වෙන්න යනවාද? චිත්‍රා එක්ක මේ ගැන කතා කරන්නට සිතුනත් තව ටික දවසක් බලන්නට ඕනෑයැයි ඊළගට ඔහුට සිතා ගත්තේය.

ඔවුන් පදිංචිව සිටියේ වත්තල පිහිටි නිවාස සංකීර්ණයක තෙවන මහලක වූ නිවසකය. මේ වන විට ඔහුගේ දෙමාපියන් නම් එහි පදිංචි හැම කෙනෙකුම වාගේ දැන හඳුනාගෙන සිටියත්, තම අසල්වැසියන් තුන් හතර දෙනෙකුට වඩා රාජු දැන සිටියේ නැත.

පහළ පාරේ සෙල්ලම් කරන ළමයි රාජුගේ ඇස ගැටුනේය. ඉතා කුඩා ළමුන් ඒ මේ අත දුවමින් පනිමින් හෝ බයිසිකල් පදිමින් සිටි අතර වඩා ලොකු ළමෝ ක්‍රිකට් සෙල්ලම් කළහ. මේ අතර හැමදාම වාගේ පැවැත්වෙන රැස්වීම ද පිහිඹියා ගහ යට පැවැත්වුණේය.

මේ මිනිස්සුන්ට ගෙවල් වල වැඩක් නැද්දැයි රාජුට ඔවුන් දකින හැම විටම සිතුණේය. හවසට පිරිමි හතර පස් දෙනෙක් මේ ගහ යටට රැස්වී පැය කිහිපයක් ඔපාදූප දොඩමින් කාලය ගතකළහ.

"උඹලගෙ ස්කීම් එකේ මල් කඩන්නෙ ගෑණු නෙවෙයි පිරිමි නෙ" දවසක් සුමනදාස මේ බැල්කනියේ සිට කීවා ඔහුට මතක් විය. මේ හැම ගෙයකම සිදුවන හැම දෙයක්ම, මේ ගෙවල් වලට යන එන හැම කෙනෙක්ම, ගැන ඔවුන් කතා කරන බව රාජු දැන සිටියේය. රාජුගේ පවුලත් මෙහි පදිංචිවී සිටි තවත්

දුර්වඩ පවුල් කිහිපයත් ගැන ඔවුන් විශේෂ අවධානයක් යොමු කළ බවත් ඔහුට සහතිකය.

රාජුට ඔහුගේ ළමා කාලය සිහිවිය. තේ වත්තක මැද වූ ඔවුන්ගේ කුඩා නිවසත්, බණ්ඩාරවෙල සාන්ත තෝමස් විද්‍යාහලත්, ඔහුගේ සිතට ආවේය.

ඔහුගේ පියා තේ කම්හල් නිලධාරියෙක් ලෙස සේවය කළ නිසා ඔවුන්ට එකල ජීවත් වෙන්නට සිදුවූයේ තේ වතු වලය. තාත්තා මාරුවී යන විට ඔවුන්ට වත්තත් නිවසත් මාරුවිය. වෙනස් නොවූයේ පාසල පමණකි. තාත්තා විශ්‍රාම ගිය පසුය ඔවුන් කොළඹ පදිංචියට ආවේ.

රාජුගේ දෙමාපියන්ට මේ අලුත් ජීවිතයට හැඩ ගැහෙන්නට සෑහෙන කාලයක් ගතවිය. ඔවුන්ට මුහුණ දෙන්නට වූයේ මුලුමණින්ම ආගන්තුක වූ සමාජයකට පමණක් නොව, නුහුරුවූ පරිසරයකටත් ය. සුවදායක සිසිල් වූ වටපිටාවක, සුන්දරවූ මලින් බර ගෙමිදුලක් සහිතව, තමන් විසින්ම වවා ගත් අලුත් එළවලු පළතුරු රස බලමින්, ජීවිත කාලයක් ගෙවා සිටි ඔවුනට අද ඉතා දැඩි කාස්ටක අව්වත්, දූවිලි පිරුණු වටපිටාවකුත් මැද බිත්ති හතරකට කොටුවී, මදුරුවන් තළමින් දවස ගෙවන්නට වීම පහසු දෙයක් නොවිය. එහෙත් කරදර වලට, ජීවිතයේ විවිධ ගැටලු වලට, සාර්ථකව මුහුණ දීමේ ශක්තියක් සහජයෙන්ම ලද ඔවුන්ට මේවා එතරම් ලොකු ප්‍රශ්ණ නොවිය.

කෙතරම් මේ සමාජයට හුරුවූවත්, එලිවෙනතුරු මදුරුවන් තලමින් ඉන්නවා මිස මදුරුදැල තුලට වී නිදාගැනීමට ඔවුන් කැමති වූයේ නැත. රාජු මුල් දවස් වලම ගෙනැවිත් එල්වූ මදුරු දැල තවමත් ඇඳට උඩින් එල්ලී ඇත.

උසස් පෙළ විභාගය අවසන් වී, අරමුණක් නැතිව ගෙදරට වී ගතකළ කාලය රාජුට සිහිවිය. ඔහු මෙන් වූ තරුණයන් ලක්‍ෂ ගණනාවකට මේ කාලය මෙසේ ගෙවී යන්නට ඇති බවත්, ඉදිරියටත් එසේ ගෙවී යන බවත්, දැන් ඔහුට වැටහේ. එහෙත් අන් බොහො තරුණයින්ට වඩා ඔහුට ගැටලුවක් වූයේ මෙතරම් දිගු කාලයක් ගෙදර හිඳ පුරුද්දක් නොවීමය. වැඩ හතරම සමත් වන බව ඔහුට සහතික වූවත්, වෛද්‍ය පීඨයට කෙසේ වෙතත් විද්‍යා පීඨයටවත් ඇතුලුවන්නට තරම් ලකුණු ලැබේදැයි රාජුට සැක සහිත විය. යලිත් වරක් විභාගය ගැනීමටත් ඔහුට ආසාවක් තිබුණේ නැත.

තාත්තාගේ සිහිනය වූයේ රාජු දොස්තර කෙනෙකු කිරීමය. ඒත් එකල රාජු සිහින මැවූයේ ක්‍රීපර් කෙනෙකු ලෙස වැවිලි සංස්ථාවට බැඳීමටය. තාත්තා එයට කැමතී කරවා ගන්නට බැරි බවත් ඔහු හොඳටම දැන සිටියේය. තාත්තා මගින් ඔවුන් සිටි වත්තේ පී ඩී ට කියා මිස, ඔහුට වත්තකට බැඳෙන්නට අවස්ථාවක් සාදාගැනීමට වෙනත් මගක් ඔහු දැන සිටියේ නැත. තාත්තාට මේ අදහස කියන්නට හොඳ වෙලාවක් එන තුරු ඔහු බලා සිටියේය.

ඔහුට පාසලින් ලිපියක් ලැබුනේ මේ අතර තුරදිය. පාසලට පැමිණ තමා හමුවෙන ලෙස දන්වා විද්‍යාහල්පතිවරයා විසින් ලිපිය එවා තිබුණේය.

''ගුඩ් මෝනින් සර්'' කියාගෙන ඔහු විදුහල් පතිවරයාගේ කාමරයේ දොරකඩ නැවතුනේ එතුල අමුත්තෙක් සිටිනවා දැකීමෙනි.

''හා රාජු ගුඩ් මොනිං, එන්න ඇතුලට''

''මේ මිස්ටර් ගුණසීලන්, කළම්බු ෆාමසූටිකල් කොම්පැණියෙ මැනේජින් ඩිරෙක්ටර්'' විදුහල්පතිවරයා එහි වාඩාවී සිටි අමුත්තා රාජුට හඳුන්වා දුන්නේය. ''මේ රාජු තවපාලන්''

''ගුඩ් මොනින් සර්''

''මොනිං''

''ලංකාවෙ ලොකුම බෙහෙත් කොම්පැණිය අයිති මිස්ටර් ගුණසීලන් ට තමයි, මෙයා අපේ ආදි ශිෂ්‍යයෙක්'' විදුහල්පතිවරයා ආඩම්බරයෙන් යුතුව හඳුන්වා දුන්නේය.

''අපේ ව්‍යාපාරය තව පුලුල් කරන්නයි අපේ අදහස. ඒකට අපට තව තරුණ අය කීප දෙනෙක් උවමනා කරනව''

''මිස්ටර් ගුණසීලන්ට ඕන අපේ පාසලින්ම ළමයි තෝර ගන්න'' විදුහල්පති ඊට එකතු කළේය, ''අපේ පාසලේ දෙන අධ්‍යාපනයත් විනයත් ගැන දන්න නිසා''

''අපි හොයන්නෙ ඒ ලෙවල් බයෝ සයන්ස් කරපු ළමයි, විශ්ව විද්‍යාලෙට යන්නත් බලාපොරොත්තුවක් නැති''

''බෙහෙත් ගැනනම් මං මොනවත් දන්නෙ නැහැ'' රාජු මදක් පැකිලුණේය.

''ඔය ළමය ඒව ගැන කලබල වෙන්න එපා. ඒ ලෙවල් කෙමිස්ට්‍රි දැනුම තියෙනවා නම් ඒ ඇති පටන් ගැන්මට. අපි සම්පූර්ණ පුහුණුවක් දෙනවා''

''පිට රට පුහුණුවත් ලැබෙනව, ලංඩන් වගේ තැනක '' විදුහල් පති යලිත් එකතු කළේය, ''මම තව ළමයි කීප දෙනෙකුට එන්න කීව. මිසිටර් ගුනසීලන් පොඩි ටෙස්ට් එකක් දෙයි ඔය ළමයින්ට. ඒකෙ ප්‍රතිඵල අනුව කොළඹට කැඳවයි''

''ඒක බොහෙම සුලු බුද්ධි පරීක්‍ෂණයක්, ඒකෙන් අපි බලාපොරොත්තු වෙන්නෙ මේ ළමයි අපේ ආයතනයට ගැලපෙනවද කියල බලන එකයි. ප්‍රශ්ණ පත්‍ර එවල තියෙන්නෙ එංගලන්තෙ අපේ සැපයුම්කාර සමාගමෙන්''

බුද්ධි පරීක්‍ෂණයට විසිදෙනෙක් පැමිණ සිටියහ. ගුණසීලන් මහතා උත්තර පත්‍රත් රැගෙන ආපසු කොළඹ ගියේ සතියක් ඇතුළත ඔවුන්ට දන්වන බව පවසමින්ය.

"කොහොමද හොඳට කළාද?" සුගත් රාජුගෙන් ඇසුවේ විදුහල්පතිතුමාට ස්තුති කර පාසලෙන් එළියට එන ගමන්ය.

"ඔක්කොටම උත්තර ලිවුන්න, ඒත් මං දන්නෙ නැහැ කීයක් හරිද කියල"

"වැරදි උත්තර වලට ළකුණු කපයිද දන්නෙ නැහැ" පියල් කතාවට එකතු විය.

"ඇමරිකාවෙ නම් බහුවරණ ප්‍රශ්න වලට ලකුණු දෙන්නෙ එහෙම තමයි" හැම දෙයක්ම දන්න රවී එකතු කළේය.

"එහෙනං ඉතින් අපට බිංදුව තමයි" " ඔවුන්ගේ පරණ පුරුදු තේ කඩය දෙසට හැරෙන ගමන් කිවේ රාජුය.

"මේ ළමයි හුගක් දවසකින්" කඩේ මුදලාලි හිනාවෙවී ඔවුන් පිළිගත්තේය, "විභාගෙ ඉවර උනාට පස්සෙ මේ පැත්තෙ ආවෙ නැහැනෙ"

"අපිට ප්ලේන් ටී" කවුන්ටරෙන් සිගරට් ගන්න ගමන් සුගත් කිවේය. දෙර අසල එල්ලා තිබූ දැවෙන කොහු ලණුවෙන් ඔවුන් සිගරට් දල්වාගත්තේ හැමදාම සිගරට් බොන, හොඳ පුරුදු කාරයින් ලෙසය. පාසල් ජීවිතය අවසන්වී ඇති නිසා ගුරුවරයෙක් දුටුවත් කමක් නැතැයි ඔවුන් සිතන්නට ඇත. ගෙදරට ආරංචි වෙන්නට හේතුවක්ද නැත. ඒ නිසා එදා ඔවුහු එළියේ වූ මේසයක් වෙත හිඳ ගත්හ. වෙනදා නම් ඔවුන් සිගරට් බොන්නේ ඇතුලු කාමරයක දිය. ඒ කාමරය වෙන් කර තිබුනේ පාසල් ළමයින්ටමය.

මේ කණ්ඩායමේ සිටි එකම ද්‍රවිඩ ශිෂ්‍යයා රාජු ය. අනිත් අය අවට වතුවල සිංහල හෝ බර්ගර් නිලධාරින්ගේ පුතුන් වූහ. ද්‍රවිඩ ජාතිකයින් ඉතා විශාල වශයෙන් මේ අවට ජිවත් වුවත් මේ පාසලට ළමයකු ඇතුල් කරන්නට තරම් වත් කමක් ඔවුන්ට තිබුනේ නැත. තිබුනත් පාසලට ඇතුලු කර ගැනීම පහසු වූයේත් නැත.

"මේ ෆාමසුටිකල් බිස්නස් එක ගැන උඹල මොනවත් දන්නවද?" පියල් ඇසුවේය.

"ලෝකෙ නිශ්පාදන ව්‍යාපාර වලින් වැඩිම ලාභ ලැබෙන බිස්නස් එක තමයි මේක" රවී පැහැදිලි කළේය "ලොකුම සමාගම් දහයේ ලාභෙ විතරක් ඩොලර් කෝටි විසිපන්දාහක් වත් ඇති"

"එහෙනං නරක නෑ ඒ බිස්නස් එකට එකතු උනොත් " සුගත් එසේ පැවසුවේ මුහුණට නගාගත් සිනහවකින් යුතුවය.

"කොහොමද දිනුශි?" රවී පියල් ගෙන් ඇසුවේය.

"දැන් හම්බවෙන්න චාන්ස් එකක් නැහැ මචං. විභාගෙන් පස්සෙ දවස් දෙකයි දැක්කෙ"

"කුකරි කලාසස් යන්න කියපන්, එතකොට හැමදාම දකිනන් ත් පුලුවන්, දක්කන්නත් පුලුවන්" සුගත් ගේ උපදේශය විය.

"ඒක තමයි බං මාත් කියන්නෙ, කුකරි හරි ඩ්‍රෙස් මේකින් හරි කරන්න කියල"

"ඉතින් කෙලින්ම පලයංකො ගෙදර, එතකොට ඉවරයි නෙ" රවි කීවේය.

"උඹට පිස්සුද බං, අම්ම කෙලින්ම කොස්ස අතට ගනියි"

"උඹ කොහෙමෙද ඒක දන්නෙ? කවුද දන්නෙ නැන්දම්ම කොල්ලෙක් හොයනවද කියල දූ පොඩ්ත්ත ඇගේ ගහන්න" රවි කීවේය, "එතකොට දැවැද්දක් දෙන්න වෙන්නෙ නැහැනෙ"

"අම්ම කොහෙමෙද දන්නෙ මං දිනුගිව බඳියි ද නැද්ද කියල"

"මූ කොළඹ ගිය හැටියෙ ඒකි මතක නැති කරල දාවි" රාජු පැවසීය.

"අපොයි ඔව. අපේ රාජු වගේ නෙවෙයි, අපේ සත්‍ය ප්‍රේම භෘංග රාජය" පියල් රාජුගේ පිටට වැරෙන් පහරක් ගැසුවේය, "අපිත් බලමුකො මූ කොළඹ ගියාම මුගේ සත්‍ය ප්‍රේමයට මොකද වෙන්නෙ කියල"

"උඹේ මට්ටමින් අනිත් අය මනින්න හදන්න එපා" රාජුට තරහක් ඇතිවිය.

"ඉතින් මචං කොහෙමෙද චිත්‍රා එහෙමෙ?" සුගත් ඇසුවේය, "උඹට යන්න දෙයිද කොළඹ?"

"දන්නෙ නැහැ මචං මොනව කියාවිද කියල  අද හවස ගිහින් ඕන බලන්න"

"ඔන්න එපැයි කිවුවොත් මොකද කරන්නෙ?"

"ඒක සිම්පල්නෙ, උඹට තියෙන්නෙ ලවු එකද ජොබ් එකද කියල තීරණය කරන එක විතරයිනෙ?" රවි කතාවට එකතු විය.

"අපේ රාජුට චිත්‍රාගෙන් තොර අනාගතයක් නැත"

"වේදනාවෙන් තොර ආස්වාදයක් නැත කියල වඳුරත් කිව්වලු"

"මෙතෙන වඳුරත් එක්ක තියෙන සම්බන්දෙ මොකක් ද?"" රාජුට නැවතත් සියුම් කොපයක් ඇතිවිය, "මං කියන ඕන දේකට චිත්‍රා කැමතිවෙයි"

මේ වතාවේ සුගත් සිගරට් වලට ගෙවූ නිසා පියල් තේ සඳහා සල්ලි ගෙවිය. ඔවුහු සිගරටය අවසන් වූ පසු කඩෙන් පිටවී තම තමන්ගේ ගෙවල් බලා විසිර ගියහ.

වතු රස්සාව ගැන ඔහුගේ සිතේ ඇති ආසාව ගැනත්, මේ අලුත් අවස්ථාව ගැනත්, කෙසේ හෝ තාත්තාට කිව යුතුයැයි සිතමින් රාජු ගෙදර ගියේය. බස් රියේ කවුලුව තුලින් ඈත වතු බංගලාවක අසිරිය දකින විට, කවදා හෝ සුද්දෙක් විසින් සාදන ලද එවන් බංගලාවක පදිංචිවී, අතට පයට මෙහෙවරට අප්පුලා, තෝටකාරන්ලා ඇතිව රජ සැප විඳින සැටි ඔහු සිහින ලූටුවේය. හැන්දෑවට ජීප් රියේ නැගී, චිත්‍රාද සමග කලබ් එකට ගොස් හති වැටෙන තෙක් ටෙනිස් සෙල්ලම් කර අනතුරුව විස්කි වීදුරුවක් තොල ගාමින් කාඩ් ගසන හැටි ඔහු ලූටුවේය.

එදා හවස ඔහු චිත්‍රා බලන්නට ගියේය. ඇය පදිංචිව සිටියේ රාජුගේ නිවසේ සිට සැතපුමක් පමණ ඈතින්, නගරයට නුදුරුවය. ඇගේ පියා රැකියාව කළේ දුම්රිය ස්ථානාධිපතිවරයකු ලෙස පේරාදෙණිය දුම්රිය පොළේය. ඔහු ගෙදර පැමිණියේ සති දෙකකට වරක් පමණකි. දුම්රිය නිවාසයක පදිංචි වන්නට ඔහුට හැකි වුවත් මාරු වෙන හැම විටෙකම දුවගේ පාසල මාරු කරන්නට වෙන නිසා ඔහු සිය බිරිඳට හිමිවූ ඉඩමක කුඩා නිවසක් තනා ගත්තේය.

රාජු ට චිත්‍රා මුණගැසුණේ ඒ නිසා ය.

මදුලේ රෝස පැල වලට සාත්තු කරමින් සිටි චිත්‍රා රාජු එන බව දුටුවේ නැත. ඔහු හෙමිහිට ඈ පසුපසින් පැමිණ එක් වරම ඇගේ දෑස් වැසුවේය.

"රාජු  අම්ම දකියි" ඈ ඔහුගේ දෙඅත් ගසා දමමින් නැගිට සිටියා "මොනවටද හෙඩ්මාස්ටර් එන්න කිව්වෙ?"

"මට ඉස්කොලෙ උගන්නන එන්න කිව්ව"

"හොඳට හිටියි  ඔයාට මොනවද උගන්නන පුලුවන්?"

"එහෙම තමයි ඔයා හිතාන ඉන්නෙ ඒ උනාට හෙඩ්මාස්ටර් දන්නව මගේ දක්‍ෂ කම්"

"ඒ හරිය මොනවටද? මට ඕක අර අහිංසක ළමයි ටික ගැන. ඒක නෙවෙයිනෙ ඔයාට එන්න කිවුවෙ මොකටද කියන්නකො"

"මං කියන්නෙ නැහැ"

"කියන්න බැරි නං කුද ගහ ගන්න. මට පාඩු වෙයි ඔයා මොනව හරි ඉස්කොලෙ ඉන්න කාලෙ වැරැද්දක් කරපු එහෙකට වෙන්න ඇති. ඉතිං ඔයාට පනිෂ් කළාද?"

"හෙඩ්මාස්ටර් කිවුව මට එයාගෙ දුව බඳින්න කියල" රෝස අත්තකින් කොලයක් කඩාගන්නා අතර ඔහු කියද්දි චිත්‍රා අත තිබූ ලී කොටුවෙන් ඔහුගේ අතට පහරක් දුන්නාය.

"ඔයාට කොච්චර කිවුවත් අහන්නෙ නැහැනෙ මගේ රෝස පැල වලට අත තියන්න එපා කියල, ඔයා ඔතන හිටියොත් මල් ගස්වල එක කොළයක් වත් ඉතුරුවෙන එකක් නැහැ"

"මං එක කොලයයිනෙ කැඩුවෙ" අතේ ගැවුනු මඩ ගසා දමමින් රාජු කීවේය.

"දැන් එකයි. ඒ උනාට තව විනාඩියකින් තව එකක් කඩයි. මට දළඹුවන්ගෙනුයි පනුවන්ගෙනුයි මේ පැල ටික බේර ගන්න පුලුවන්, එ උනාට ඔයාගෙන් බේර ගන්න පුලුවන් කෘමි නාශක බෙහෙතක් තාම හම්බවෙලා නැහැ" ඇත්තටම තරහ වූ බවක් පෙන්වන්නට තැත් කරමින් කීවාය.

"ඔයා ගෙන් හරිම වදයක් නෙ මට තියෙන්නෙ" ඇය යලිත් කීවාය.

"හාං එහෙනම් මං යනව"

"ඉතින් යන එකනෙ ඇත්තෙ, හෙඩ්මාස්ටර්ගේ දූ බලාගෙන ඇතිනෙ"

"එහෙනං ඒකයි මේ ඉරිසියාවෙ"

"හපෝ ඉරිසියාවෙන්නම වැඩේ තමයි"

"පුතා කොයිවෙලාවෙද ආවෙ" කියනවා ඇසී පසු පස බැලූ රාජු දුටුවෙ චිත්‍රාගේ අම්මා මිදුලට පැමින සිටි බවයි, "මං මේ ආවෙ චිත්‍රා කතා කරනව ඇහිල"

"මං මේ දැන් ආවෙ"

"හෙඩ්මාස්ටර් හම්බඋනාද අද?"

"ඔවු ආන්ටි, කොළඹ කොම්පැණියක ලොක්කෙක් ඇවිත් හිටිය අපේ ඉස්කෝලෙන් ලමයි කීප දෙනෙක් තෝර ගන්න, අපට ටෙස්ට් එකක් දුන්න. ඒක පාස් උනොත් ගනියි"

"මොන වගේ රස්සාවක්ද?"

"ඒක ෆාමසූටිකල් කොම්පැණියක්. ඉංග්‍රීසි බෙහෙත් ජාතී ගෙන්නල බෙදා හරින තැනක්. ජොබ් එකට කියන්නෙ මෙඩිකල් රිප්රසන්ටේටිව්. ඒ ගොල්ලන්ට තියෙන්නෙ දොස්තරල හම්බවෙලා ඒ බෙහෙත් ජාතිවලට ප්‍රචාරයක් දෙන එක"

"බලන්නකො අම්මෙ මෙයා මට මේ මොනවත් කිව්වෙ නැහැනෙ" චිත්‍රා මැසිවිලි කීවාය.

"එයා ඇහුවයැ කියන්න"

"මං ඇහුව කී පාරක් ද, හුං"

"ඉතින් ඕකට සංඩු වෙන්න ඕන නැහැ, දුව ගිහිල්ල තේ එකක් හදන් එන්න" අම්මා රාජුට ගෙතුලට කතා කළාය.

"මොකද තාත්ත කියන්නෙ රස්සාව ගැන?"

"දන්නෙ නැහැ මොනව කියාවිද කියල, තාම තාත්තට කිව්වෙ නැහැ"

## වෙද හාමුදුරුවෝ

සිහින් කටහඬ කිහිපයක් ඉතා ඈතින් ඔහුට ඇසෙන්නට විය. එහෙත් ඒ වචන හඳුනා ගත නොහැකිවුයේ නාඳුනන බසෙකින් කතා කළ නිසා විය යුතුය. රෑ මැදියම ඉක්මවා ගොස් ඇති හෙයින්දෝ දැඩි හිරු රැස් පීඩනයක් දැනුණේ නැත. එහෙත් රාත්‍රියේ ඔහු වසා සිටි සීතලද දැනුණේ නැත. ඔහු මියගොස් ද? එසේ නම් මේ මළවුන්ගේ ලෝකය ක් ද? ඇස් හැර බලන්නට උවමනා වුවත් ඇසි පිය හරින්නට බැරි තරම් බරක් ඔහුට දැනුණේය. දැසේ කබ බැඳී ඇසි පිය ඇලී ඇතැයි සිතූ ඔහු ඇස පිසදැම්මට සිතාගෙන අත ඔස වන්නට තැත් කළත්, මහත් බරක් එල්ලා ඇත්තා සේ ඔහුට දැනුණේය. ඇඟිල්ලක් පමන වත් සෙලවීමට පවා නොහැකි විය. ඔහු සැබවින්ම මිය ඇදී ඇත. මරණින් පසු ලෝකය මෙවැනි ද? මේ ඇසෙන කටහඬ මළවුන්ගේ විය යුතුය. මේ ඔහු අසා තිබූ ස්වර්ගය විය හැකිද? එසේනම් ඔහුට කිසිත් නොපෙනෙන්නේ ඇයි? ඔහුගේ දෑස් අන්ධ වී ඇත. ඔහුට සියල්ල අන්ධකාරයක් සේ පෙනෙන්නේ ඒ නිසාය. මිය ගිය පසුත් අන්ධ වී සිටිය යුතුනම් සවර්ගයට යාමෙන් ඇති ඵලය කුමක් ද?

"අවදි වෙලා වගෙයි" එවර ඒ වදන් ඔහුට වැටහුණේ ඒවා දකුණු භාරතයේත්, ලංකාවේ උතුරු ප්‍රදේශයේත්, ව්‍යවහාරවූ ද්‍රවිඩ භාෂාව වීම නිසාය.

ඔහු මිය ගොස් නැත. වෙනත් ලෝකයක ඉපදිත් නැත. එහෙත් ඔහු තවමත් අන්ධය. උණුසුම් අතක් ඔහු ගේ අතින් අල්ලා ගත්තේය. ඇතැඟිලි යන්තමින් සැලෙනවා ඔහුට දැනුණේය.

සිනිඳු තෙත රෙදි කැබැල්ලක්, වියලී එකට ඇලී තිබූ තොල් මත යාන්තමින් තැවරෙනවා ඔහුට දැනුණේය. තොලෙහි ගෑවුණු තෙතමනය මුව තුලට සෙමින් උරා ගත්තේය. නොපෙනෙන අමුත්තන් දෙස සිනහවක් පාන්නට ඔහු තැත් කළත්, පිපිරී එකට ඇලී තිබූ දෙතොල් විවර වූයේ නැත. අල්ලා ගෙන සිටි අත යලිත් සෙමින් පහත් වෙනවා ඊළඟට ඔහුට දැනුණේය. ඇඟිලි තුඩු දෙකකින් ඉතා සෙමින් ඔහුගේ එක් ඇසක ඇස් පිය මෑත් කර බැලුවත් ඔහුට පෙණුනේ ඝන අන්ධකාරය පමනක්මය. අනිත් ඇසත් එසේමය.

තවත් කටහඬක් ඔහුට ඉතා ළඟින් ඇසුණේය. ඒ ඔහුගේම කටහඬදැයි මුලින් ඔහු සිතුවත් තමා ළඟින්ම සිටි තැනැත්තෙකුගේ බව වැටහුණේය. මුහුණ අසලින් උණුසුමක් දැනී එක් ඇසක් විවර කළ විට, සඳ නැති රැයක එක් හුදකලා තරුවක් ඈතින් ඔහුට දිස්විය. එහෙත් ඒ තරුව ඒ මේ අතට ගමන් කර, අනිත් ඇස විවර කළ විට ඒ අතට ගමන් කළේය, පහන් දැල්ලක් විය යුතුයැයි ඔහු අනුමාන කළේ එහෙයිනි.

"ඇස් දෙකේම පෙනීම නැති වා වගෙයි"

"ඔරුව තුලදී වුවක් ද කියා සිතන්නට පුලුවන් ද?" තවත් කටහඬක් ඇසුණේය, "තද හිරු එළියට පිලිස්සීම නිසාද?"

ඒ ගැන පැහැදිලි කරන්නට ඔහුට අවශ්‍ය වුවත් දෙතොල් විවර කර ගත නොහැකි විය.

"දැන්ම කිමට අපහසුයි. කෝකටත් කලින් ලෙඩාගෙ හාමත නිසා ඇතිවූ දුර්වලතාවය නැති කරල ඉන්න ඕන"

ඔහු සිටිනා තැනක් හො කාලයක් ගැන ඔහුට කිසිඳු හැගිමක් නොවිය. ඉඳහිට අවදි වූ විට ඇසෙන යමකින් මෙය කිසියම් ගිලන් හලක් ලෙස ඔහු වටහා ගත්තේය. ද්‍රවිඩ භාෂාව හැරුණ විට තවත් බසක් කතා කරනු ඇසී මඳ වෙලාවකින් ඒ ලංකාවට පමණක් ආවේණික වූ සිංහල බව ඔහු හඳුනා ගත්තේය. දෙමළත් සිංහලත් දෙකම භාවිතාවූ මේ ප්‍රදේශය ලංකාවේ උතුරුකරයේ කිසියම් තැනක් වියයුතුය. වෙළඳ චාරිකා වලදී යම් තරමකටවත් මේ භාෂා දෙකම ඉගෙන ගෙන සිටීම ඔහුගේ මහත් වාසනාවක් ලෙස ඔහුට වැටහුණේය.

එක් දිනක ඔහු අවදිවූ විට දෙතොල් විවර කරන්නට හැකි බව දැනී යමක් කියන්නට ඔහු තැත් කළේය.

"මේ කොහේද ඉන්නෙ මම?" ඔහු දන්නා දෙමළෙන් ඇසුවේය.

"ඔබ ඉන්නේ රෝහලක. බෞද්ධ පිරිවෙණක, උතුරුකරේ බදකර අටනෙ " වයස්ගත කරුණාභරිත කට හඬක් ඔහු අසලින් ඇසුණේය.

"ඉස්සෙල්ල මේ කැඳ බොන්න පුලුවන්ද කියල බලන්න, දැන් තොල් විවර කළහැකි නේ" කිසිවෙක් ඉතා සෙමින් ඔහුගේ හිස ඔසවා මුව වෙත ළං කළ කෝප්පයෙන් නැගුණ උණුසුම් සුවඳක් නිසා, එක්වරම මහත් සා ගින්නක් ඔහුට දැනුණේය. ඔහු දැඩි උත්සාහයකින් කැඳ උගුරු කිහිපයක් බීවේය.

"රෝහලේ මේ අංශය බාර වෙද්නා මමයි. මහ වෙද්නාත් මා ළගම ඉන්නවා"

"මගේ නම මිත්‍ර. පර්සියාවෙ ඉඳල එන්නෙ"

"ඔබ අපරදිග රටකින් කියා අප අනුමාන කළා. ඒත් කෙසේද ඔබ දෙමළ බස ඉගෙන ගත්තෙ?"

"මම අවුරුදු ගණනාවක් වෙළඳ නැව් වල සේවය කළා. ඉන් වැඩි කාලයක් ගත උනේ භාරත දේශය අවට මහ මුහුදෙ තමයි. ඒ ගමන් වලදී හමුවූ බොහොමයක් ආසියාතික වෙළඳුන් දෙමළ හෝ සිංහල කතා කරණ අයයි" ඔහු ආයාසයකින් කීවේය. ඔහුගේ දෙතොලෙහි වූ වේදනාව පෙනීම නිසා දෝ මහ වෙද්නා ඔහුට පසුව වැඩි විස්තර කතා කරමු යැයි පවසා, විවේක ගන්නට ඉඩහැර ඔහුගෙන් සමු ගත්තේය.

මහවෙද්නා පසුදින උදේ ඔහු පරීක්ෂාකර, බෙහෙත් කිරීම ආරම්භ කළහැකි බව තීරණය කළේය. හිරු රශ්මියෙන් පිලිස්සී ගිය ඔහුගේ සම හා ඒ නිසා ඇතිවූ උණ රෝගය ට පිළියම් කිරීම බව අනිත් වෙදනා පැහැදිලි කළේය.

ගලින් නෙලන ලද බෙහෙත් ඔරුව මිනිස් සිරුරේ හැඩය ගත්තේය. හිස රැඳෙන තැන මඳක් නොගැඹුරුවූ අතර දෙපයේ විඩඹ සඳහා පවා ඒ හැඩය ගෙන තිබුණේය. ඔරුව තිබුණේ කෙටි බිත්ති දෙකක් හා උස වහළ සහිත කාමරයකය. ඔරුව සෝදන ජලය බැස යාම සඳහා ඒ වටා කුඩා කානුවක් විය. ගල් ලැල්ලක් ඔරුව අසලින්ම තිබුණේ රෝගියා ඔරුවෙන් උඩට ගත්විට වැතිර සිටින්නටය.

බෙහෙත් ඔරුව පුරවා තිබුනේ කැඳ, බත්, කිරි හා ගිතෙල් මිශ්‍රවූ ඖෂධයකින්ය.

"හදිසි අවස්ථාවක හෝ අවශ්‍ය බෙහෙත් සොයාගත නොහැකි විටකදි ආදේශ කළ හැකි වෙනත් බෙහෙත් වර්‍ග ගැනත් දැන සිටිය යුතුයි" මහ වෙද්නා ඔහු කැටුව පැමිණ සිටි ශිෂ්‍ය හිමියන් තිදෙනාට පැවසීය.

"මාංශ වර්ග නැකි විටෙක අලුත් පිඳුරු, ගවයකු!ගේ ඇටකටු සමග තම්බා ඒ දියර ගත හැකිය. නැවුම් කිරි නැත්නම් අරලු, බැවිල, සිරිවැඩි බැවිල හා උඳු එකට තම්බා ගත යුතුය" ඔහු තවඳුරටත් කියා ඳුන්නේය.

රෝගියා එතැනට ගෙන ආවේ ගිලන් ඇඳක තබා ගෙනය. ඔහු ගල් ලැල්ල මත වැතිරවා මුලු සිරුරෙහිම තලතෙල් හා ඇඹුල් කිරි මිශ්‍රණයක් ආලේප කරණ ලදි. අඹරාගත් බැවිල හා උඳු තවරණ ලද පුලුන් කැබලි දෙකන් සිඳුරු වැසීමට යොදා ගත්තේය. බෙහෙත් ඔරුවේ බහා ලන්නට සුඳුසු නැකැත් වෙලාව එන තුරු සාත්තු සේවකයෝ මහ වෙද්නා දෙස බලා සිටියහ. නැකැත් වේලාව සකසා ගැනීම මේ වතාවේ මඳක් ගැටලුවක් වුයේ රෝගියා තමා උපන් තැනත්, දිනයත්, වෙලාවත් නිශ්චිතවම නොදැන සිටීම නිසාය. එබැවින් දවසේ සුභ හෝරාව මේ සඳහා යොදාගැනීමට මහ වෙද්නාට තීරණය කරන්නට සිදුවිය.

තමන්ට සිඳුවන්නේ කුමක්දැයි නොපෙනීම හේතුවෙන්, මේ නුහුරු වෙදකම මිත්‍රට මහත් බියක් ගෙනඳුන්නේය. එහෙත් වෛද්‍ය වරුන්ගේ කරුණාබර සැලකීම ඒ බිය මඳක් තුනී කළේය. ඔහු ඔසවා බෙහෙත් ඔරුවට පහත් කරණ බවත්, උනුසුම් සුවදෙන දියරක් ඔහුගේ සිරුර වෙළා ගන්නා බවත්, මිත්‍රට දැනුණේය. ඔහුට දැඩි නිදි මතක් දැනෙන්නට විය.

"මිත්‍ර බය නැතුව නිදා ගන්න. අපි හැමෝම මෙතන ඉන්නවා" වෙද්නා ඔහුට පැවසීය.

බෙහෙත් ඔරුව තුල නිශ්චිත වෙලාවෙක් ගල්වා තබා රෝගියා උඩට ගන්නා ලදි. තවත් බෙහෙත් ද්‍රව්‍ය එකතු කර, අවශ්‍ය උෂ්ණත්වයට පැමිණි පසු යලිත් එහි ගල්වන ලදි. මේ ආකාරයෙන් කිහිප විටක් වෙදකම සිඳුවිය. මේ අතර තුර දී මිත්‍රට බෙහෙත් කැඳ ස්වල්පයක් පොවනු ලැබිය. අවසන ඔහු කිරි වලින් හා උණු වතුරෙන් නහවා, පිරිසුඳු රෙදි කඩක් ඇග වට දවටා, ඔහුගේ ඇඳ වෙත ගෙනයනු ලැබිය.

පස් දිනක් තිස්සේ බෙහෙත් ඔරුවේ ගිල්වීමෙන් මිත්‍රගේ සිරුරේවූ තුවාල සියල්ලම සුවවී උණ බැස ගියේය.

රෝහලේදී ඔහු බැලීමට ආ අමුත්තන් අතර මින්දා, කිතා හා තවත් ගම් වැසියන්ට අමතරව සන්කර් ද විය. සන්කර් උතුරේ දමිළ ගම්බිම් බාරව සිටි දමිළ අධිකාරී බව මිත්‍රට දැනගන්නට ලැබුණේය. ඊට අමතරව සන්කර් වෙද්හල් කැමියන්ගේ මූලිකයා ලෙසද කටයුතු කළේය. මිත්‍ර ඔහුගේ දෙමළ සහ සිංහල දැනුම වැඩි කර ගැනීමට හැම අවස්ථාවක්ම උපයෝගී කර ගත්තේය. ඔහු ඔවුන් සමග පර්සියාව ගැනත්, ලංකාව ගැනත් ඔවුනොවුන්ගේ රටවල සිරිත් විරිත් පිවන රටාව ඇදහිලි විස්වාස ආදී බොහෝ දේ කතා කළේය.

ඔහුට සාත්තු කළ තරුණ වෛද්‍ය වරයා වූ වන්න ද විවේක ලද බොහෝ විට මිත්‍ර සමග සතුටු සාමීචියේ යෙදෙන්නට උත්සාහ කළේය. මිත්‍ර සංචාරය කළ රටවල් ගැන, විශේෂයෙන්ම ඉන්දියාව ගැන දැන ගැනීමට වෙදනා ටත් උවමනා විය. ඔහුත් බුදු දහම ගැනත්, පිරිවෙණ ගැනත්, රට තොට ගැනත් අසන්නට විය. සන්කර් හා වෙදනා ඔහුගෙන් ඇසූ ප්‍රශ්න හා ඔහුට දැන ගන්නට ලැබුණ දේ එකිනෙකට ඉතාමත් වෙනස් මාතෘකා වූයේය. ඔවුන් දෙදෙනාගේ සිතුම් පැතුම් වුවද ඉතාමත් වෙනස් විය.

"මම අහල තිබුණෙ වෛදික බ්‍රාහ්මණයො තමයි ආයුර්වේදය ප්‍රගුණ කළේ කියල. මං දැනගෙන හිටියෙ නැහැනෙ බෞද්ධ භික්‍ෂූන් වෙදකම් කරන බව" දිනක් ඔහු වෙදනා සමග කීවේය.

"ඊට බොහොම කලකට කලින් තමයි අපේ බෞද්ධ භික්ෂූන් වෙදකම් කරන්න ගත්තෙ. ඇත වෛදික යුගයෙ භාවිතා උනේ යාගහෝම සහ වත් පිලිවෙත් තමයි, වෛද්‍ය ක්‍රම කියල. මං හිතන්නෙ නැහැ ඒවයෙ කිසිම විද්‍යාත්මක පදනමක් තිබුණ කියල

"බ්‍රාහ්මණ වංශයේ මිනිස්සු වෛද්‍ය කර්මයේ යෙදෙන අය පහත් ලෙස සැලකීමයි මුලදී සිදුඋනේ. ලෙඩ රෝග වල කිළි නිසාත්, පහත් කුලයන්ට අයත් රෝගීන් ට සාත්තු කිරීම නිසාත් ඔවුන් කිළිටි වී ඇති නිසා, වෙදකම් කළ බ්‍රාහ්මණයින් පවා ඔවුන්ගේ පූජා යාග හෝම වලින් බැහැර කරන්නට යෙදුණ "

"කොහොමද ඒ අය වෙදකම ඉගෙනගත්තෙ"

"ඈත අතීතයෙ තැනින් තැන ඇවිද්ද පූජකවරු තමයි බොහෝවිට වෙදකමෙ යෙදුණෙ. ඔවුන් යන යන තැන අවශ්‍ය විටෙක රෝගීන්ට වෙදකම් කළ අතර මුණ ගැසෙන අනිකුත් පූජකයින් සමග අදහස් හා අත්දැකීම් හුවමාරු කර ගැනීමක් සිදුඋනා. වාද විවාද ඇති උනා. මේ අයුරින් මහා විසාල දැනුම සම්භාරයක් දවසින් දවස එකතු උනා"

"එතකොට මේ වගේ රෝහල් ඇතිඋනේ?"

"රෝග සුව කිරීම බුදු දහම හා එකතුවීමත් සමග මේ දැනුම සියල්ලම ආරාම වල එකතු වෙන්න පටන් ගෙන ආයතන ගතවුවා. බෙහෙත් හල් ලෙසට ඇරඹී, රෝහල් බවට වර්ධනය උනා?"

"එහෙනම් බෞද්ධ ආරාම වල තමයි ලෝකෙ ප්‍රථම ආරෝග්‍යශාලා බිහිවුණේ"

"මගේ විස්වාසය එහෙමයි. වෛද්‍ය විද්‍යාව බෞද්ධ විශ්වවිද්‍යාලවල පාඨමාලාවලට ඇතුලු වුනා. මම ඉගෙනගත්තෙ මේ ආරාමෙ තමයි. වැඩිදුර ඉගෙන ගන්න මට ළගදිම යන්න වෙනව මිස්සක පබ්බත රෝහලට" වන්න කිවේය. "වෛද්‍ය විද්‍යාව බුද්ධාගමට ඉතාමත්ම සම්පයි. ඒ නිසා සමහර ආචාර්ය වරු පවසනව චතුරාර්ය සත්‍ය පදනම් වුයේ වෛද්‍ය විද්‍යාවට අනුව, රෝග දුක, දුකට හේතුව, එය මර්දනය කිරීම, දුක නැති කිරීම වගේ කියල"

"ඉතින් ඒක ඇත්තද?"

"මම හිතන්නෙ නැහැ බුදුන් වහනසේ වෛද්‍ය විද්‍යාවෙන් උපුටා ගත්තා කියල. ඒ මතය ඇතිවෙන්න ඇත්තෙ පසු කාලෙක මහජනයාට චතුරාර්ය සත්‍ය පහදා දෙන්න"

"එතකොට බ්‍රාහ්මණයො ආයුර්වේදය අයිති කර ගත්තෙ කොහොමද?"

"බ්‍රාහ්මණයො දුටුව භාරතයේ වෛද්‍ය ක්‍රම දියුණුවත් සමග ඒ අයගේ යාගහෝම වලින් මිනිස්සු ටිකෙන් ටික ඈත් වෙනව. මේ නවින විද්‍යාව වෛදික ධර්මයත් එක්ක ඈඳා ගත්තොත් ඒකෙන් අත්වෙන වාසිය වටහා ගෙන ඔවුන් ප්‍රචාරය කළා, ආයුර්වේදය මිනිසාට ලැබුණෙ මහා බ්‍රහ්මයාගෙන් ප්‍රජාපතියට, ඊළගට ඉන්ද්‍රට, ඉන්ද්‍රගෙන් ධනවන්තරීට කියල. සුසෘත විසින් සුසෘත සංහිතාව ලෙසට රචනා කළේ මෙසේ උගත් දෙයයි කියල. ඒ උනාට මම නම් හිතන්නෙ සුසෘත සංහිතාවෙ තියෙන්නෙ එක පුද්ගලයෙකුගෙ දැනුම නෙවෙයි, දහස් ගණනක් වෛද්‍ය වරු දිග කාලයක් තිස්සෙ ලබා ගත් දැනුම එකතු කිරීමක් ලෙසටයි. බමුණො කළේ මේ වෙදකම් වලට එකතු කළා ඒ අයගෙ යාග හෝම විදි. ඊළගට මිනිස්සුන්ට කියන්න ඇති වෙදකම විතරක් මදි, මේ පුජාවිධිත් කරන්න ඕන කියල. බෙහෙත් පැලෑටි වල අනුහස වැඩිකරන්න අරුන්දතී දෙවගනත්, කුෂ්ට දෙවියනුත් ඇති කළා "

සමහර අවස්ථාවල ඔවුන්ගේ කතාව යොමුවුයේ ආගම විස්වාස කෙරෙහිය.

"බුදු දහම රාජකිය අනුග්‍රහය ඇතුව ලංකාවට ආවෙ දේවානම පියතිස්ස රජුගෙ කාලෙ. ශ්‍රී මහා බෝධියේ අංකුරයක් රැගෙන ආ සංගමිත්තා මෙහෙණිය ගොඩබැස්ස ජමුබුකොළ පටුන මේ අසලයි පිහිටියෙ. එතැන තැනූ විහාරය දැන් බොහොම අබලන් තත්වයකයි තියෙන්නෙ[1]"

"ඒ විහාරය ඇරුනම වෙනක් විහාර තියෙනවද මේ පළාතෙ"

---

[1] ii විජයභාහු 1186\1187 විසින් පිළිසකර කරණ ළදි

"ඒකත් හරියට මහින්ද හාමුදුරුවො තිස්ස ගෙන් ඇහුවය කියන ප්‍රශ්නෙ වගෙයිනෙ"

චන්නට මහින්දාගමනය වටා ගෙතුණු පුවත මිත්‍රට විස්තර කර දෙන්නට සිදුවිය

"ලංකාවට බුද්ධාගම ගෙනාවෙ මහින්ද හාමුදුරුවොද?"

"රාජ්‍ය අනුග්‍රහය ලැබුණෙ මහින්ද හාමුදුරුවන්ට. ඒ උනාට බුදුන් වහන්සේගෙ කාලෙ ඉඳලම මේ රටේ බෞද්ධයින් ඉඳල තියෙනව. භාරතයේ නොයෙක් දේස වලින් පැමිණි ජන කොට්ටාස අතර බෞද්ධයින් බොහොමයක් හිටිය"

"එතකොට දේවානම් පියතිස්සට කලින් මෙහේ වෙහෙර සාදන්නට ඇති නේද?"

"එහෙම විශාල විහාර හැදෙන්න නැතුව ඇති. භික්ෂූන් හිටියනම් වනගතව ගල්ලෙන් වල වාසය කරන්න ඇති. භාරතයෙත් අසෝකගෙ කාලෙ නෙ බුදු පිළිම, රූප තැනෙන්න ගත්තෙ"

ඔහුට තවත් ලෙඩුන් ගැන වගකීමක් ඇති බව සිහිවූ වෙදනා එදිනට ඔහුගෙන් සමුගත්තේය.

"මට ඔබ වහන්සේ ඊයෙ කිව්වෙ නැහැනෙ නාගදීපෙ තියෙන වෙනත් පංසල් ගැන"

"කොහේද මට කියන්න ඳුන්නයැ වෙන අතුරු ප්‍රශ්න නැගුවා මිසක. විහාර කීපයක්ම තියෙනව. දේවානම් පියතිස්ස හදල තියෙනව තිස්සමහ විහාරයයි, පාචීනාරාමයයි  තව කිහිපයක්ම තියෙනව"

"මම ස්වර්ණපුර ගිය වෙලාවක අහල තියෙනව ලංකාවෙ බුද්ධාගම විනෙ ආගමට වඩා වෙනස් කියල"

"ඒ ගැන මෙහෙම වචන කීපයකින් කියන්න බැහැ. මට ඉස්සෙල්ලම කියල දෙන්න වෙනව බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය ගැන. ඊට පස්සෙ තමයි එක එක වෙනස් මතවාද ගැන කියන්න පුලුවන් වෙන්නෙ"

"ඔබ වහන්සේට විවේක තියෙන වෙලාවට මට ටික ටික හරි බුදු දහම ගැන කියල දෙන්න පුලුවන්ද?"

"මම කොහොම හරි වෙලාව සොයා ගන්නම්. ඔබේ ප්‍රශ්න වලට උත්තර දෙන්න. සාමාන්‍ය ගැමියො බුද්ධාගම අදහන්නේ කොහොමද කියල ඇහුවොත්, මං හිතන්නෙ නැහැ ඒ අය ථේරවාදි ද මහායාන වාදිද එහෙම නැත්නම් වෙනත් නිකායක් අදහනවද කියල වෙන් කරන්න පුලුවන් කියල. ඔය සේරම වාද තියෙන්නෙ භික්ෂූන් අතරෙ. ඒකත් උගත් භික්ෂූන් අතරෙ තමයි. නිර්මල බුද්ධාගමක් ගැන අපේ ගැමියට කිසිම ගැටලුවක් නැහැ"

ඇඳෙන් බැසගන්නට තරම් ශක්තියක් ලද පසු මිත්‍රට උදේ ටත් සවසටත් මැද මිදුලේ ටික වේලාවකට ඇවිදින්නට අවසර ලැබුණේය.

ඇඳෙන් බසින්නට තැත් කළ පළමු සැඳෑවේ, හිස බමන්නට වූයෙන් මඳ වෙලාවක් ඇඳ අල්ලාගෙන සිටින්නට ඔහුට සිදුවිය. එහෙත් ඔහු සිතට දිරි ගෙන සැරයටියේ පිහිටෙන් කාමරයෙන් එළියට ආවේය. කාමරයේ සිට මැද මිදුලට ඇවදිම මෙතරම් වෙහෙසකර අමාරු කාර්යයක් වෙතැයි ඔහු නොසිතුවේය. ඉතා රළු කුණාටු මැද්දේ නැව මත ඇවිදි ඔහුට අද අඩි කිහිපයක් පොළොව මත ඇවිදින්නට මෙතරම් අමාරු වූයේ දුර්වල කම නිසාද, තවමත් සම්පූර්ණ සුවයක් නොලද නිසාද, නැත්නම් දෑස් අඳ නිසාද යන්න ඔහුට සිතා ගන්නට බැරි විය. කොයි මොහොතේ දෙපා පණ නැතිව ඇද වැටේද, නැතිනම් මග තිබූ යම් බාධාවක පය පැකිලෙනු ඇතැයිද කියා පියවරෙන් පියවර ඔහු සිත තුල චකිතයක් විය.

කෙසේ හෝ මැද මිදුලට පැමිණ ඇතැයි ඔහුට දැණුනේ හිරු රැසින් උණුසුම්වූ සිනිඳු වැල්ලක් දෙපතුලට කිතියක් දැනවූ පසුවය. සැඳෑ සුළග බොහො කලෙකට පසු හමුවූ මිතුරෙකු ලෙසින් ඔහුගේ සිරුරේ වෙලුණේය.

"එළියට ඇවිත් හුළං ටිකක් වදින කොට හරි සනීපයි නේද" සන්කර්ගේ කටහඩ ඔහුට සමිප විය.

"මට දැනෙන්නෙ හරියට ආපහු ඉපදුනා වගෙයි"

"එළිමහනෙ ඉන්න හොඳ වෙලාව. ඔබ සමග ටික වෙලාවක් ඉන්න තිබුණ නම් හොඳයි, ඒත් මම මේ හදිසි වැඩකට යන ගමන්. මං බලන්නං කවුරුවත් ඉන්නවද කියල මිත්‍ර එක්ක ටිකක් ඇවිදින්න"

"අනේ කරදර වෙන්න එපා. මට අද ඇවිදින්න ඕන නැහැ. ටිකක් මෙතනට වෙලා හිටියම ඇති"

"හෙට හවසට අපි යමු ඇවිදින්න. මම ඇවිත් කතා කරන්නම්" යැයි පවසා සන්කර් ඔහුගෙන් සමු ගත්තේය.

භාවනාවක යෙදුනාක් මෙන් මිදුලේ පසෙකට වී සිටි මිත්‍ර සමග එතැනින් ගමන් කළ වෛද්‍ය වරු, සේවකයින් හා රෝගීන් හැම කෙනෙක් ම වචනයක් හෝ දෙකක් කතා කරන්නට නැවතුණාහ. මිත්‍ර ගැන විස්තර අසා තිබූ හෙයින් ඔවුහු නුවුවමනා ප්‍රශ්න අසා ඔහු වෙහෙසට පත් කළේ නැත. ඔහුගේ අන්ධ භාවය ගැන සඳහන් නොකිරීමටත් ඔවුහු ප්‍රවේසම් වූහ.

පසුදින සවස සන්කර් ඔහු කැටුව එළිමහනේ ඇවිදින්නට පැමිණියේය. රෝහල් ගොඩනැගිලි වලින් පිටත වූ ගෙවත්තටය ඔවුන් පිවිසුනේ. ලා තණ තිල්ල සිහිලස ඔහුගේ දෙපතුල විනිවිද ගොස් මුලු සිරුරම ප්‍රබොධමත් කල සෙයක් ය මිත්‍රට දැණුනේ. තවත් කිහිප දෙනෙකුගේ කටහඩ ද ඔහුට ඇසුණේය.

"අපේ ශිෂ්‍යයො කීප දෙනෙක් මේ ගහ යට අශ්ඨපාද ක්‍රීඩාවෙ යෙදෙනව"

"එහෙම ක්‍රීඩාවක් මම අහල නැහැ"

"සමහර විට අහල ඇති චතුරංග ක්‍රීඩාව"

"අපේ රටේ තියෙනව ශට්රංග් කියල ක්‍රීඩාවක්"

"මං හිතන්නෙ ඒකම තමයි, මං අහල තියෙන හැටියට චතුරංග ක්‍රීඩාව පර්සියාවට හඳුන්වල දීල තියෙන්නෙ බොහොම ඉස්සර. චතුරංග ලෑල්ලක් මීට අවුරුදු සිය ගණනකට කලින් ඉන්දියාවෙන් පර්සියාවට ගිය දූත පිරිසක් ගෙන ගිය තෑගි අතර තිබුණ. පර්සියානු රජුගෙන් දූතයින් අහල තියෙනව මේ ගැටලුව විසඳන්න පුලුවන්ද කියල. රජුගෙ පුරෝහිතයො කාටවත් බැරි වුනාලු තේරුම් ගන්න. අන්තිමේදි ඇමතිවරයා අවසර ඉල්ලගෙන ගෙදර ගිහින් දිවා රෑ කල්පනා කරල කොහොමහරි විසඳුවලු"

"එහෙනම් මටත් පුලුවන් මේ ක්‍රීඩාව කරන්න. මේ ලෑල්ලෙ ඉන්නෙ ඇත්තු, අශ්වයො, අශ්ව කරත්ත, පාබල හමුදාව"

"හරි. සැබෑ යුද සේනාවලත් ඔය චතුරංගය තියෙනවනෙ"

"ඒ උනාට මට පේන්නෙ නැහැනෙ"

"ඉක්මනටම ඔබට පෙනිම ලැබෙයි. එතෙක් අපි ඉවසමු" සන්කර් ඔහුගේ සිත අස්වසන්නට කීවේය.

"කෙතරම් කලක් ඉන්න වෙයිද?"

"කලබල වෙන්න එපා දරුව. එක රැයින් ලෙඩක් සුව කරන්න අමාරුයිනෙ" සන්කර් යලිත් පවසා ඔහුගේ සිත වෙනතකට යොමුකරන්නට තැත් කළේය. "මේ ක්‍රීඩාව සම්බන්ධ කතාවක් කියන්නම්"

"ඔබ අසා ඇති නේද මහාභාරත කාව්‍ය ගැන, ඒකෙ සඳහන් වෙනව පාණ්ඩවයොත් කෞරවයොත් මේ ක්‍රීඩාවෙ යෙදිල තියෙනව කියල. පාණ්ඩවයන්ගෙ වැඩිමහල් යුදිස්තිර, ඔවුන්ගේ රාජ්‍යයත්, ඔහුගේ බිරිඳ ද්‍රවුපදි ත් පරදුවට තබා ක්‍රීඩා කරල පැරදුනා. කෞරවයන්ට. කෞරවයන්ගේ නපුරු සහොදරයෙකුවු දුශාසන, ද්‍රවුපදි අල්ලාගෙන රැස්ව සිටි පිරිස ඉදිරියේම බිසවගේ ඇඳිවත ගලවන්නට තැත් කළා. පාණ්ඩවයන්ට කර කියාගන්නට දෙයක් නැතිවුණේ ඔවුන් පැරදී සිටි නිසයි. ද්‍රවුපදි අසරණවී ශ්‍රී ක්‍රිෂ්ණ දෙවියන්ගෙන් අයැද සිටිය, ඇය බේරා ගන්න. එවේලේ ප්‍රාතිහාර්යක් වගේ දෙයක් උනා. ඇගේ ඇඳි වත ඉවත් කරත්ම තවත් වස්ත්‍රයක් ඇය වටා දැවටුණා. එය ඉවත් කරන විට තවත් වස්ත්‍රයක් මැවුනා. මෙසේ නොනැවතිම සිදුවුනා. අන්තිමේ ඒ නපුරු මිනිසා සිහිසුන්ව ඇද වැටුනා, දෙවියන්ට පැරදි. ද්‍රවුපදි ඇගේ ගෞරවය රැක ගත්

අතර කෞරවයින් ඇය නිදහස් කළා. ඒත් රාජ්‍ය අහිමි උනා වසර දහහතරකට. අන්තිමේදි මහ සටනකින් ඇයත් රාජ්‍යයත් ලබා ගත්තා"

"ඔබ කියන්න උත්සාහ කරන්නේ මේ ක්‍රීඩාව ඉතා ඈත කාලයේ සිටම කෙරෙන බවයි"

"මහාභාරතය කියන්නෙ මීට වසර දෙදහකට වඩා ඉහත[2], ඒත් ඒ කාලෙ මේ ක්‍රීඩාව කරන්න ඇත්තෙ දාදු කැටයක් භාවිතා කරල. මතයක් තියෙනව මේ අද තියෙන ක්‍රීඩාව බිහිඋනේ බෞද්ධයින් අතර කියල, යුද්ධ කිරීම වැරදි නිසා ඒ වෙනුවට"

"ඔබ මේ සඳහා තවත් නමක් කිවානේද"

"අශ්ඨපාද ඒ කියන්නෙ මේ ලෑල්ලෙ තියෙනව එක් අතකට කොටු අටක් බැගින්, කොටු හැටහතරක්"

තණ නිල්ලේ ඇවිද මිත්‍රට වෙහෙස දැනෙන්නට වූ විට ඔවුන් දෙදෙනා ආපසු රෝහල තුලට ගියහ.

"තව වැඩි දවසක් ඔබට රෝහලේ ඉන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. දැන් ඔබට හොඳටම සුව වෙලා. ඇස් දෙක ගැන මේ රෝහලේ වෛද්‍යවරුන්ට මොනවත් කරන්න අමාරුයි" දින කිහිපයකට පසු සවස වත්තේ ඇවිදින අතර සන්කර් පැවසීය.

"මම දන්නව"

"මීට කලින් ඔබව රෝහලින් මුදාහරින්නෙ, ඔබට යන්න තැනක් තිබුනා නම්. නැත්නම් ඔබ බලාගන්න කිසිවෙක් සිටියානම්"

"මම ඒ බවත් දන්නව. මම කියන්නයි ඉන්නෙ මෙතනින් පිටවෙන බව"

"පිටවෙලා කොහේ යන්නද?"

"කෙසේ හෝ මහාතිත්ත වෙත යා ගන්න බලනව. එතෙන්දි නැවක් එනකම් ඉන්න එකනෙ ඇත්තෙ"

"ඔබව නැවකට බාරගන්න කිසිම නැවියෙක් කැමති වෙන එකක් නැහැ, එය අසුබයි කියල. දැනටමත් ඔබ ඒ බව දන්නව. මුදල් ගෙවා මේ ගමන යන්න තරම් වත් කමක් ඔබට නැහැ" සන්කර් එසේ කීවේ සිත රිදුනත් යතාර්ථය වටහා දීම ඔහුගේ යුතුකමක් සේ හැගුන නිසාය.

"මට මොනව හරි කරගන්න පුලුවන්"

[2] 800 – 1100 B.C.

"හදිසි තීරණ ගන්න අවශ්‍ය නැහැ. තීරණයක් ගන්න තෙක් අපේ ගෙදර ඉන්න පුලුවන්. ඒ අතරෙ අපි උත්සාහ කරමු ඇස් දෙක සනීප කර ගන්න ක්‍රමයක් සොයා ගන්න. මට සහතිකයි ඔබට යලිත් පෙනීම ලබාගන්න පුලුවන් බව"

"මම කොහොමද ඔබේ පවුලේ අයට කරදර කරන්නෙ. ඒ අය මා අදුනන්නෙ වත් නැහැ. මං වගේ පිට දේශයකින් පැමිණි ආගන්තුකයෙක් ගෙදර නවත්වගන්න ඒ අය කැමති වෙන එකක් නැහැ. මං ඉන්න තත්වෙ නිසා ඒක අමතර කරදරයක්. අනික මං හිතුව ඔබ මට බොරු බලාපොරොත්තු දෙන එකක් නැහැ කියල"

"මම බොරු බලාපොරොත්තු දෙන්න කැමති නැහැ තමයි. මේක බොරුවක් නෙවෙයි. මම කිවුවෙ අපි උත්සාහ කරමු කියලයි. කෙසේ වෙතත් මම මහ වෙද්නාට කියලයි තියෙන්නෙ ඔබව මගේ භාරයට නිදහස් කරන්න කියල. මිත්‍ර ආපසු ඇඳ වෙත කැටුව ගොස් මෙසේ පවසා සන්කර් ඔහුගෙන් සමු ගත්තේය.

මැකීගෙන යන අඩි ශබ්දය අසා සිටි මිත්‍ර, සන්කර් ගේ ස්වරූපය සිතින් මවා ගන්නට උත්සාහ කළේය. ඔහු උසද මිටිද, සමේ වර්ණය පැහැපත් ද, තරබාරුද රැවුලක් වවා සිටිද? සන්කර් ගෙන් හෝ වෙනත් කිසිවෙකුගෙන් ඇසිමටත් නොහැකි මෙවන් දෙයක් ඔහු දැන ගන්නේ කෙසේද? මිත්‍ර දැන සිටියේ සන්කර්ගේ කාරුණික කටහඩත්, ඔහුගේ කඩිසර පා හඩත්ය. එවන් කටහඩක් හිමි තැනැත්තා සිහින් උස සිරුරක් ඇති කඩවසම් පුද්ගලයෙකු විය යුතුයැයි මිත්‍ර සිතා ගත්තේය.

"අද අපට තියෙනව ස්වේද කර්මයක් කරන්න" වෙද්නා දිනක් උදයේ මිත්‍රට කතා කළේය.

උතුරට මුහුණලා තැනූ කුටිය අගුරු කබල් දමා රත් කර එහි දුමාරය අඩුවූවිට මිත්‍ර එතුලට කැඳවාගෙන ගොස් එහි වාඩි කරවන ලදි.

"මේකට අපි කියන්නෙ ජන්තාගාරයක් කියල, හොඳට දහදිය දමයි, බය නැතුව ඉන්න. අපි එළියෙන් ඉන්නවා. උෂ්ණත්වය උවමනාවට වඩා වැඩි වෙන්න අපි ඉඩ දෙන්නෙ නැහැ"

## බෙහෙත් ජාවාරම

"මේ වතාවෙ රිසල්ට්ස් හොඳ මදි උනොත් ලබන පාරත් ගන්න ඕන. ඒ ගැන ආයිත් කතා කරන්න ඕන නැහැ" රාජුට කියන්න ආපු දේ කියල ඉවර වෙන්නත් කලින් තංගරාජා තීන්දු කළේය.

රාජු අම්මාගේ පිහිට පැතුවේ ඒ වෙලාවේය.

"අප්පා උඹව සෙන් තෝමස් එකට දාපු දවසෙ ඉඳලම දකින හීනයක් තමයි උඹ දොස්තර කෙනෙක් කරන එක. හැමදාම අප්පා මාත් එක්ක ඒ ගැන කියනව. වාරෙ අන්තිමට නිවාඩුවට ගෙදර ඇවිල්ල පංතියෙ පළමුවෙනිය උනා කියල රිපෝර්ට් එක පෙන්නුවාම, අප්පා ඒක දැක්කෙ එයාගෙ සිහිනය දවසින් දවස හැබෑ වෙනව වගේ" අම්මා ඔහුට මතක් කර දෙන්නට වූවාය. "අප්පා මාත් එක්ක කියනව කවදහරි දවසක පුතා නුවරඑළියෙ ඉස්පිරිතාලෙ වැඩට ආ දවසක අපිටත් පුලුවන් කියල දොස්තර බංගලාවෙ නවතින්න යන්න"

"ඉතින් අම්මට බැරිද අප්පට තෙරුම් කරල දෙන්න මෙඩිකල් කොලේජ් එකට යනඑක එච්චර ලේසි වැඩක් නෙවෙයි කියල. මට නම් කවදාවත් එච්චර ලකුණු ගන්න බැරිවෙයි කියල"

"මං කොහෙමෙද එහෙම කියන්නෙ? එයා කියටවත් මං කියන දේ පිලිගන්නෙ නැහැ. මං දන්නව අප්පා දෙන උත්තරේ. අප්පා කියාවි උඹ උනන්දු වෙනව මදි, තව ටිකක් උත්සාහ කළොත් උඩින්ම පාස් වෙන්න පුලුවන් කියල"

"මට නං බැහැ තව පාරක් පාඩං කරන්න" කියාගෙන රාජු මිදුලට බැස අඹ ගහ යට බංකුව උඩ වාඩිවිය. වතු රස්සාවට බැරි නම් කොළඹ රස්සාවටවත් තාත්තා කැමති කරවා ගත යුතුය.

ඊට දින කිහිපයකට පසු කළම්බු ෆාමසූටිකල්ස් සමාගමෙන් රාජුට ලිපියක් ලැබුනේය. සම්මුඛ පරීක්ෂණයක් සඳහා කොළඹ එන ලෙස ඉන් දන්වා තිබිණි. තාත්තා එදා හවස කම්හලේ සිට ඇවිත් නා ගෙන තේ කෝප්පයත් බී, පත්තරය බලන්නට වාඩිවූ පසුය රාජු ඔහුට ලිපිය පෙන්වූයේ.

"ඉන්ටව්ව් එකට යන්න ඕන නැහැ" ලිපිය දෙස එක් වරක් බලා ඔහු කිවේය.

"අප්පා මට මේකට දාන්න කිව්වෙ අපේ හෙඩ්මාස්ටර් ම තමයි"

"මං ගිහිල්ල කතා කරන්නම් හෙඩ්මාසිටර්ට"

"කවද්ද?" රාජු නොඉවසිල්ලෙන් ඇසුවේය.

"කවද්ද? කවද්ද? උඹ කවුද මගෙන් අහන්න කවද්ද මං යන්නෙ කියල?" තංගරාජා කෑ ගැසුවේය. ඔහුගේ මුලු ලොකයම කඩා වැටුනා වගේ රාජුට දැනුණේය.

"මං එහෙම ඇහුවෙ ඉන්ටවිව් එක තියෙන්නෙ ලබන අගහරුවාද හින්ද" රාජු පහත් හඩින් කිවේය. තාත්තාගේ කෑ ගැසීම නිසා එතැනට පැමිණි අම්මා කතාව එතැනින් නතර කරණ ලෙස රාජුට ඉගි කළත් එය නොඳුටුවාක්සේ රාජු යලිත් කතා කළේය. "මට චාන්ස් එකක් ලැබිල තියෙනව ලෝකෙ තියෙන දෙවෙනි විශාලම වෙළඳ කර්මාන්තයට එකතු වෙන්න"

"ඇයි ඉතින් දෙවනි එක තෝර ගත්තෙ. ඉහලම එක තෝර ගන්න තිබුනනෙ"

"මං ආස නැහැ කොහොමටවත් යුද අවි කර්මාන්තයට" ඒත් ඔහු කියූ දෙය තාත්තාට පැහැදිලි වුයේ නැත. ෆාමසුටිකල් කර්මාන්තය මිනිස්සුන්ට හොඳක් කරන්නෙ"

"මං හිතුවෙ උඹ දොස්තර කෙනෙක් කරන්න, දොස්තරලගෙ පස්සෙ යන එකෙක් කරන්න නෙවෙයි" තාත්තා බිඳුණු හඩකින් කිවෙය. අම්මා නිහඩව කුස්සිය පැත්තට ගියාය.

අම්මාගේ පෙරැත්තය නිසා තාත්තා අසලින් ඔහු ඉවතට ගියේ තාත්තා විදුහල්පති හමුවන්නට යන බව ඔහුට දැනුන නිසාය.

සෙනසුරාදා දවල් තාත්තා බණ්ඩාරවෙල සිට ආපසු එන තුරු රාජු මග බලා සිටියේය. විදුහල්පතිවරයා බැරි වෙලාවත් තාත්තාගේ කීමට එකග වී තව වතාවක් විභාගය කරන්නට ඔහුට කීවොත් යන බිය ඔහු සිත තුළ තිබුණේය. රාජු වාඩිවී සිටියේ නිවස ඉදිරිපිට පාර අයිනේ වූ ගල් තලාව මතය. ඔහු අසලින් මොන්ටි ලැග සිටියේය. රාජු ගෙදර සිටිනා විට මොන්ටි ඔහු ළගින් ඈත් වන්නෙ නැත. කෑම කන විට පුටුව අසල වාඩිවී සිටින්නටත්, පාඩම් කරද්දී දෙපා අසලින් නිදා ගන්නටත්, ඇඳට වන් විගසින් ඇඳට පනිනනටත් ඔහු පුරුදුවී සිටියේය. මොන්ටිට තිබුනේ බල්ලකුට වඩා මිනිසකු සතු ගුනාංග යැයි රාජුට සිතුණු අවස්ථා බොහෝ විය.

නළල මත වැසූ මදුරුවෙක් තලන්නට උත්සාහ කරද්දී රාජු යලිත් පියවි ලෝකයට ඇතුලු විය. චිත්‍රා කෑ ගසන්නට පෙර කවුලු පියන් වසා දැමිය යුතුය. මදුරුවන් ගෙතුළට ඒම වලක්වා ගන්නට ඈ හැකි හැම උත්සාහයක්ම ගත්තාය. පිහිඹියා ගහ යට මිනිස්සුන්ට නම් මදුරුවන් ගෙන් කරදරයක් නැද්දැයි රාජුට සිතුණේය.

රූපවාහිනිය ක්‍රියාත්මක කළත් රාජුගේ සිත ආපසු දිව්වේ ඔහු කොළඹ ආ මුල් දින කිහිපය වෙතය.

විදුහල් පතිගේත්, අම්මාගේත් පෙරැත්තය නිසා රාජුගේ රැකියාවට අන්තිමේ තංගරාජාගේ අශීර්වාදය ලැබුණේය.  ඒත් අඩුම ගණනේ ෆාමසි ඩිප්ලෝමාව වත් කරන බවට පොරොන්දු වන්නට රාජුට සිදුවිය. ෆාමසි ඩිප්ලොමාවට ඔහු ලියාපදිංචි වී මාස කිහිපයක් පංති ගියත්, අතට මුදල් ලැබෙන විට ඒ ගැන තිබූ උනන්දුව කෙමෙන් තුනීවී ගියේය. තාත්තා ද ඊට පසු ඒ ගැන එතරම් කරදර නොකළේ, ලද දෙයින් සතුටුවන්නට ඔහු පුරුදුවී සිටි නිසා විය යුතුය.

පාසලෙන් තවත් ළමුන් තිදෙනෙක් තේරී සිටි නිසා, හතරදෙනාම එකට කොළඹ විත් එක තැනක නවතින්නට ඔවුහු තීරණය කර ගත්හ. එක ළමයකුගේ පියා බත්තරමුල්ලෙන් බෝඩිමක් සොයා දුන්නේය. ඒ දවස් වල බත්තරමුල්ල රබර් වතු වලින් වැසීගිය පාලු පෙදෙසක් විය. එදත් අදත් අතර බත්තරමුල්ල පෙදෙසේ ඇතිවූ වෙනස එතරම් සුලු කාලයක් තුල සිදුවූවක්දැයි දැන් සිතාගන්නටත් අමාරුය.

ඔවුන්ගේ පුහුණුකිරීමේ පාඨමාලාව පැවැත්වූයේ සිංගපුරුවේ කළමනාකාරවරයා විසින්ය. ඔහු ඕස්ට්‍රේලියන් ජාතිකයෙකු විය. ඔහු ගේ දේශනයන්හි සමහර කොටස් රාජුට තවමත් මතකය.

"අපේ සමාගම හැමදාම විකුණන්නෙ අලුත් බෙහෙත් වර්ග විතරයි. ඔබලා විසින් වෛද්‍යවරුන්ට හඳුන්වාදෙන්නට යන බෙහෙත්, පහුගිය අවුරුදු දෙක තුන ඇතුලත නිපදවනු ලැබූ ඒවායි.. ඒ කියන්නෙ මේ වෛද්‍ය වරු වෛද්‍ය විද්‍යාලෙ ඉගෙනගන්න කාලෙ මේවා තිබුණේ නැහැ. ඒ අයට මේවා ගැන දැනගන්න තියෙන්නෙ වෛද්‍ය සගරා හා වාර්ත ප්‍රකාෂණ මගින්. ඉතින් අපි කවුරුත් දන්නව මේ තුන්වන ලෝකයේ රටවල් වල දොස්තරල කොයිතරම් දුරට මේ ප්‍රකාශණ කියවනවද කියල. ඒව කියෙව්ව කියලත් අපට ප්‍රශ්නයක් නැහැ. ඒ මොකද ඒ ප්‍රකාශන වල පළවෙන දේත්, පළනොකරන දේත් ගැන අපට යම්කිසි පාලනයක් තියෙනව. ඉතින් අපේ මේ අලුත් බෙහෙත් වර්ග ලෙඩුන්ට නියම කරන්න කියල දොස්තරල කැමති කර ගන්න එක ඒ තරම් අමාරු වැඩක් නෙවෙයි. මෙ අයට තියෙන්නෙ දොස්තරලට තේරුම් කරල දෙන එකයි මේ බෙහෙත් මොනතරම් බලවත්, මොනතරම් සාර්ථක ප්‍රතිඵල ලබාදෙන බෙහෙත් ද කියන එක. මිනිස් ජීවිත ගලවා ගන්න තියෙන එකම බෙහෙත මේක විතරයි කියන එක ඒ අයගෙ හිතට තදින්ම කාවදින්න ඕන"

මුලින්ම ටයි පටියක් දමාගෙන, කලුපාට බෑග්එක අතින් එල්ලාගෙන, ආධුනික වෛද්‍ය වෙළඳ නියෝජිතයෙක් ලෙස සේවය ඇරඹී දින රාජුට තමා ගැනම මහත් ආඩම්බරයක් ඇතිවිය. රෝහලකට ඇතුලුවී පිටත බලා සිටින ලෙඩුන් අතරින් තෙරපී ගොස් වෛද්‍යවරයකුගේ කාමරය තුලට යන විට ඔහුට දැනුණේ මහත් තේජසකි. මුලදී බස් රියකින් යන්නට ඔහු එතරම් මැලිවූයේ නැත. ඒත් අන් වෙළඳ නියෝජිතයින් නා නා මාදිලියේ කාර් වලින් බැස රෝහල තුලට යන විටය ඔහුට වැටහුණේ, මේ වෘත්තියේ තව කෙතරම් දුරක් ඔහුට යාමට තිබේදැයි කියා.

ඔහුට ලැබුන වැටුප ඔහුගේ මිතුරන්ට හා සම වයසේ වෙනත් රැකියාවල නිරතවූවන්ට වඩා බෙහෙවින් වැඩිවිය. පිටරට පුහුණුවක්ද ඔහුට ළගදීම ලැබෙන බව ඔහු දැන සිටියේය.

ඔහු පළමු වතාවට සිංගපූරුවට ගිය ගමනත් ඔහුට අද වගේ මතකය. විදේශ ගමන් බලපත්‍රය ලබාගැනීම, ගුවන් ටිකට් පතත් විදේශ මුදල් නෝට්ටු හා සංචාරක බිල් පත් ලබා ගැනීම හා ගමනට අවශ්‍ය වූ අනිකුත් දේ පිළියෙළ කර ගැනීම, මේ සියල්ල සඳහා කාර්යාලයේ පළපුරුදු නිලධාරීන්ගෙන් ලැබුණු සහයෝගයත් උපදේශත්, ඒ අතරම විඳින්නට සිදුවූ විහිලු තහලුත් ඔහුට අමතක වන්නේ නැත.

ඔහුගේ දෙමාපියෝ ගුවන් තොටුපලට පැමිණ ඔහුගේ යානය පිටත් වෙනතුරු අමුත්තන්ගේ මැදිරියේ සිටියහ. පිටරට දේ ඉතා අගය කළ, ඒවා ඉතා හිගවූ, කාලයක මෙවන් ගමනක යෙදි විට බොහො දෙනෙක් තෑගි බෝග බලාපොරොත්තු වූහ. ඔහුට ලැබුණ ගමන් වියදම් වලින් ඉතිරිකර ගත් මුදලින්, ඔහු අම්මාට රත්‍රං වළලු, තාත්තාට කමිසයක් සහ කලිසමක්, චිත්‍රාට අත් ඔරලෝසුවක් හා විදුහල්පතිතුමාට කැසට් රේඩියෝවක් ගෙන ආ බව ඔහුට මතක ඇත. ඔහුගේ මිතුරන් හා නෑදෑයින් ද ඔහු අමතක කර තිබුණේ නැත.

ඉඩ ලද සෑම සති අන්තයකම ඔහු ගෙදර ගියේය. සමහරවිට කඳුකරයේ ඔහුට වැඩ කරන්නට ලැබුණ දිනවලදිත් ගෙදර රැයක් ගතකරන්නට ඔහුට අවස්ථාව ලැබුණේය. ඔහු චිත්‍රාට දිනපතාම ලිපියක් යවන්නට උත්සාහ කළේය. එය වැරදුණොත් ඉතා කළාතුරකින් විය. කාර්යාලය ගැනත්, අලුත් මිතුරන් ගැනත්, නගරයේ සිදුවන දේ ගැනත් හිතට එන හැම දෙයක් ගැනම ඔහු චිත්‍රාට ලියා යැව්ය. චිත්‍රා ඔහුට ලිපියක් එව්වේ සතියකට පමණ වරක් වුවත් ඔහු දිනපතාම ඇයගෙන් ලිපියක් ඇතිදැයි සෙව්ය. ලිපියක් නැති දාට ඔහු මහත් බලාපොරොත්තු කඩවීමකින් කනස්සලුවිය. ඇය ඔහු මෙන් සෑමදාම නොලියන බව ඔහු දැන සිටියත්, ඔහු ගැන ඈ හැම මොහොතකම සිතන බව දැන සිටියත්, ලිපියක් නොලද දාට ඔහුට නින්ද ගියේ නැත.

රැකියාවට බැඳුණු පළමු වසරේ ඔහුට මොටර් රියක් තිබුණේ නැත. ගමට් යාමට සිදුවූයේ බස් රියෙනි. සෙනසුරාදා දවල් එකට පමන කාර්යාලයෙන් පිටවී, පිටකොටුවේ බස් නැවතුමට ගොස් මුලින්ම පිටත්වෙන බසයේ නැගීම ඔහුගේ පුරුද්ද විය. බොහෝවිට එම බස්රිය මගීන්ගෙන් පිරී තිබූ නිසා ගමට යන තුරු ඔහුට ආසනයක් ලැබුනේ නැත. එහෙත් තවත් පැය භාගයක්, පැයක් බස් පෝලිමේ හිටගෙන ඉන්නවාට වඩා බසිරිය තුල හිටගෙන යාමෙන් වඩාත් කලින් ගමට මා හැකි වන්නේය. වැඩිවෙලාවක් චිත්‍රා සමග ගත කරන්නට හැකි වන්නේය. පුද්ගලික බස රථවත් නොතිබූ ඒ කාලයේ මේ ගමන කෙසේ කළේදැයි අද ඉන්නා තරුණයන්ට නම් හිතාගන්නවත් බැරි බව ඔහු දැන සිටියේය.

හපුතලේ නගරයට මදක් මෑතින් බසයෙන් බැස ගන්නා ඔහු මුලින්ම ගියේ චිත්‍රා බලන්නටය. චිත්‍රාගේ ගෙදර තිබුණේ ඔහුගේ ගෙදරට යන අතරමග වීම ඔහුට

නිදහසට කාරණයක් විය. චිත්‍රාට චොකලට් පෙත්තක් හෝ වෙනත් පැණි රස කෑමක් ඔහු හැමදාම ගෙනාවේය.

"ඒ දවස්වල මට පැණි බුන්දි කාල එපාවෙලා තිබුණෙ" ළඟදී දිනක චිත්‍රා ඔහුට කිවාය.

"මං හිතාහිටියෙ ඔයා ආසම කෑම පැණි බුන්දි කියල"

ඔහු ගෙදර යන්නේ චිත්‍රාගේ මව කිහිප වරක් "දැන් අම්මා බලාගෙන ඇති" කියා මතක් කළ පසුවය.

රාජු ගෙදර එන විට මොනවා හෝ ඔහු කැමති කෑමක් අම්මා පිළියෙල කර තැබුවාය. ඔහු ආ විගස ඇය සාදාදෙන තේ කෝප්පයත් ඔහුට බීමට සිදුවෙයි. චිත්‍රාගේ ගෙදරදී තේ බීවු බවක් කීවොත් අම්මාගේ සිත තැළෙතැයි ඔහු සිතුවේය.

රෑ කෑම මේසයේදී තාත්තා ඔහුගේ රැකියාව ගැනත්, කොළඹ ජීවිතය ගැනත් කතා කළේය. අම්මාද ඔවුන් දෙදෙනාට කෑම බෙදන අතර කතාවට එකතු වුවාය. තාත්තා ආපසු කම්හලට ගියපසු රාජු පොතක් රැගෙන ඇඳෙහි ගුලිවූයේ සතියක් පුරා නගරයේ දූහුවිලි පිරී අවු කාස්ටකය අමතක කරන්නටය.

ඔහු යලිත් වර්තමානයට ඇද දමමින් චිත්‍රා තේ කෝප්පයක් ගෙනැත් දුන්නාය.

යුවතියක් ඉදිරිපස නිවසක බැල්කණියේ වනා තිබූ ඇඳුම් එකතු කරන්නට වූවාය.

"මට මතක් උනේ ඒ දවස්වල ඔයාගෙ අම්ම මාව ගෙදර යවන්න හදන හැටි, මං කොළඹ ඉඳල ආ දවසට"

"ඒ ඉතින් ඔයා අමම බලන්න යන්නෙ නැතුව අපේ ගෙදරට වෙලා ඉන්න නිසානෙ, දැන් හදිස්සියෙ මොකද ඒක මතක් උනේ"

"මං කල්පනා කළේ දැන් ලෝකය කොච්චර වෙනස් වෙලාද කියල"

"මොනවද ඔය හැටි වෙනස් වෙලා තියෙන්නෙ"

"හැම දෙයක්ම වෙනස් වෙලා. අද අපට කොහේවත් යන්න බැහැ කාර් එක නැත්නම් ත්‍රී වීලර්එකකක් වත් නැතුව. රූට ටී වී බලන්නෙ නැතුව බැහැ. ඒ දවස් වල අපට මුණ ගැහිල කතා නොකළොත් ලියුමක් ලියන්න විතරයි පුලුවන් කම තිබුණෙ. අද ළමයින්ට රටේ ඕන තැනක ඉන්න කෙනෙක් එක්ක, ඕන වෙලාවක ඕන තරමක් වෙලා කතා කරන්න පුලුවන්. අපි දන්නෙ කොහොමද කවුරු එක්ක මොනව කතා කරනවද කියල"

"දූවට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් නැහැ"

"ඔයා දන්නෙ කොහොමද"

"මං දන්නව"

"ඒ උනාට දුව හරියට වෙනස් වෙලා"

"ඒ ළමයි රටේ ලෝකෙ වෙන දේවල් ගැන දැන් හොඳට දන්නව. තේරෙනව. පුතාල පොඩි කාලෙ වගේ නෙවෙයි" තාත්තා ඔවුන් සිටි තැනට පැමිණි බව දෙදෙනාටම වැටහුනේ ඔහු කතා කළ පසුය. "දැන් ළමයින්ට අවට වෙන හොඳ දේයි නරක දේයි සේරම පේනව. මිනිසුන්ගෙ තියෙන නපුරුකම්, කෑදරකම්, බල තණ්හාව, දූෂණය, භීෂණය  ඔය වචන අපේ කාලෙ අපි පාවිච්චි කළේවත් නැහැ"

"දැන් දුව ගෙදර ඉන්න වෙලාවට කොම්පියුටරේම තමයි, ඉන්ටර්නෙට් එකේ" චිත්‍රා එකතද කළාය," අප්පටත් තේ එකක් හදන්නද, තාම නිදි ඇති කියල මං හැදුවෙ නැහැ"

"හාං එහෙනම් නිකං කෝපි ටිකක්"

වෙනදා කෝපි කටේවත් නොතිබූ තංගරාජා, කොළඹ ආපසු කෝපි බීමට ඇබ්බැහිවූයේ මෙහිදී ලැබෙන තේ බොන්නට ඇති අකමැත්ත නිසාය. ජීවිත කාලයක්ම ඉස්තරම් තේ නිපදවමින්, ඒ තේ රස විඳි ඔහුට කඩයකින් මිලදී ගන්නා තේ බොනවාට වඩා නොබී සිටීම හොඳයැයි ඔහු සිතුවේය. ඉඳහිට හෝ තේ වත්තක සේවය කරණ ඔහුගේ මිතුරෙකු ඔහු හමුවන්නට එනවිට අනිවාර්යයයෙන්ම ගෙන එන තේ කොල පැකට් එක චිත්‍රා තාත්තාට බොන්නට පමනක් වෙන්කර තැබුවාය.

"පුතා භානු ගැන බය වෙන්න එපා, ඒ දරුවට හොඳට මොලේ තියෙනව, හොඳ නරක තේරෙනව" ඔහු රාජුට කීවේය.

"මං දන්නව ඒක  එත් මගේ හිතේ ලොකු බයක් තියෙනව"

"එහෙනම් පුතා දන්නවද  පුතා කොළඹ රස්සාවට එනකොට අම්මයි මමයි කොයිතරම් බයේ හිටියද කියල?"

"ඉතින් මට අප්ප මොනවත් කිව්වෙ නැහැනෙ. එදා හෙඩ්මාස්ටර් හම්බවෙලා ආවට පස්සෙ මට රස්සාව බාර ගන්න කිව්ව මිසක්"

"මං ඒ වෙලාවෙ මෙනවත් කිව්ව කියල වැඩක් නැහැනෙ, පුතාගෙත් හිත නරක්වෙන එක මිසක්" තංගරාජා කෝපි කෝප්පය දෙස බලාගෙන කීවේය. "අනික මං හිතුව පුතාගෙ ජීවිතය හදා ගන්න ඕන පුතාට කැමති විදිහට කියල, අපට ඕන දේ කරන්න කියල පුතා ආසා නැති දේකට බල කරන්න අපට අයිතියක් නැහැ කියල මං හිතුව"

## දෙමළ අධිකාරි

ඊට දින දෙකකට පසු මහ වෙද්නා වෙතට මිත්‍ර කැඳවාගෙන යන ලදි. ඔහු මහ වෙද්නා සිටි දිසාව අනුමාන කර පහත්වී දෑත් එකතුකර නමස්කාර කළේය.

"මගේ ජීවිතය බේරා ගත්තාට ඔබ වහන්සේට පිං අයිති වෙනව" ඔහු බිඳුනු හඬකින් කිවේ දෙනෙතට ගලා ආ කඳුලු පිසදා ගැනීමට කිසිදු උත්සාහයක් නොගෙනය. දෑස් නොපෙනී මේ ජීවිතයෙන් පලක් නැතැයි ඒ සමගම ඔහුට සිතට ආවේය.

"ඔබ ණයගැති මුහුදේ දී ඔබ ගලවාගෙන ප්‍රමාද නොවී මෙතැනට ගෙන ආ අයටයි. ඔබේ ජීවිතය බේරා ගත්තේ ඒ උදවියයි"

"ඔබ තුමාත් මෙහි සිටිනා හැම දෙනාමත් මා වෙනුවෙන් කළ දේ කිසි දවසක මට අමතක වෙන්නෙ නැහැ" ඔහු යලිත් ඔහුගේ කෘතඥතාවය පෙන්වන්නට තැත් කළේය. මේ මොහොත උදාවෙන බව ටික දිනක සිට දැන සිටි නිසා කියන්නට සිතා ගත් දේ කිසිවක් ඔහුට සිහියට ආවේ නැත.

"අපට ඔබව මුලුමණින්ම සුවපත් කිරීමට හැකිවුයේ නැහැ. ඔබේ දෙඇස් ගැන අපට කිසිවක් කරන්නට බැහැ. හැමදාම ඔබ මෙහි රඳවා ගන්නටත් බැහැ. වෙනත් රෝගීන්ට මෙතන පහසුකම් අවශ්‍ය වෙන නිසා"

"මට ඒ බව වැටහෙනවා ස්වාමින් වහන්ස" මිත්‍ර කීවේය.

"සන්කර් එකග වෙලා තියෙනව ඔබ ගෙදර එක්කගෙන යන්න. මෙහේ සිටියා වගේම ඔබේ සැපදුක් බලා ගනියි"

"ඒ උනත් ඒ අයට කරදරයක් බරක් වෙන්න මම කැමති නැහැ"

"සන්කර් වත් එයාගෙ පවුලේ අයවත් ඒක කරදරයක් ලෙසට සිතන්නෙ නැහැ. දැනටමත් ඔබ දන්නවා ඇති සන්කර් කෙතරම් කරුණාවන්ත කෙනෙක් ද කියල. ඒ නිසා තමයි ඔහු නාගදිපෙ ප්‍රථම දෙමළ අධිකාරි ලෙස පත් කෙරුණේ"

"මට මීට ඉහත ගමන් වලදි දෙමළ අධිකාරීන් මුණ ගැහිල තියෙනව" මිත්‍ර තවත් තොරතුරු දැන ගන්නා රිසියෙන් කීවේය.

"අනුරාධපුරයෙ දෙමළ ගම්බිම් කිහිපයක් තියෙනව. අනිත් වරාය අසලත් නැගෙනහිර වෙරළ තීරයෙත් තියෙනව. ඒත් මේක තමයි නාගදිපෙ මුල්ම දෙමළ ගම්මානය. මෙහේ ඉන්නෙ කවුරුත් දකුණු ඉන්දියාවෙන් පැමිණි ද්‍රවිඩ බෞද්ධයො"

''ඉතින් සිංහල ගම් අතර ජීවත්වෙන්න ප?ශ්නයක් නැදද?''

''ඇයි ඒක ප්‍රශ්නයක් වෙන්නෙ? මේ ප්‍රදේශයේ වසන අය අලුතින් පැමිණි අය පිළිඅරගෙන ඉවරයි''

''මටත් විස්වාසයි පහුගිය දවස්වල මා ලද අත්දැකීම්වල හැටියට කවුරුත් සාමයෙන් ඉන්නව ඇති කියල'' මිත්‍ර කිවේය.

''මෙහේ ඇවිත් පදිංචිවෙලා ඉන්නෙ දෙමළ බෞද්ධයින් විතරක් නෙවෙයි, ජෛන ආගමිකයොත්, විවිධ වෛදික දෙවිවරුන් අදහන අයත් මෙහි පදිංචියට ආව. කවුරුත් සතුටින් එකට ජීවත් වෙනව. අනිත් එක මේ විවිධ ආගම් වල ඒ තරම් වෙනසකුත් නැහැනෙ ''

''මේ ළඟක ක්‍රිස්තියානි දේවස්ථානයක් එහෙම තියෙනවද'' මිත්‍ර ඇසුවේය.

''මම දන්න තරමට නම් මේ නාගදිපෙ කොහේවත් නැහැ. ඒත් නාගදිපෙත් අනුරාධපුරෙත් අතර යන මග දේවස්ථානයක් තියෙන බව මම අහල තියෙනව. ඔබ දකුණු ප්‍රදේශයට යනකොට එතෙන පහුකර ගෙනයි යන්න වෙන්නෙ''

''දකුණට? ඇයි දකුණට? මම යන්න ඕන මාන්තොටට. එහේ නම් දේවස්ථානයක් තියෙන බව මම දන්නව''

''මං හිතා හිටිය ඔබේ ඇස් සුව කරගන්න උවමනායි කියල'' මහ වෙද්නා පැවසීය.

''ඒක තමයි මට තියෙන ලොක!ම උවමනාව, ඒත් මම ගමරට යන්නත් ඕන''

''මම බලාපොරොත්තුවෙන් ඉන්නව පිලිතුරක් රෝහණේ ඇස් රෝහලකින්. එහි වෛද්‍ය වරු ඔබේ ඇස් පරීක්‍ෂා කරන්න කැමති උනොත් ඔබේ වාසනාව ''

''ඔබ හරිම කරුනාවන්තයි. ඒත් මේ රෝහලේ එකතුව් ඇති දැනුම සම්භාරයයි කරුණාබර සාත්තුවයි දෙකෙන් මත් මගේ ඇස් සුව කරන්න බැරිඋනානම් මම කොහොමද බලාපොරොත්තු වෙන්නෙ වෙන තැනකදි සුවයක් ලැබෙයි කියල''

''ඔබ තවමත් දන්නෙ නැහැ අපේ වෛද්‍ය විද්‍යාවෙ පරිණත බව. අක්‍ෂි වෛද්‍ය විද්‍යාව ඉතාමත් ම දියුණුයි. වර්ග හතරකට අයත් අක්‍ෂි රෝග හැත්තෑ හයක් ගැන අපේ පොත් වල සඳහන් වෙනව. එක වෛද්‍ය වරයෙකුට මේ රෝග හැත්තෑහය ගැන ඉගෙන ගන්න පුලුවන් කමක් නැහැ. සමහර රෝග වලට ශල්‍ය කර්ම අවශ්‍ය වෙනව. සමහර ඒවට දීර්ග කාලයක් වෙදකම් කරන්න වෙනව''

''මම වත් මේ විස්තර අසා තිබුනෙ නැහැ'' සන්කර් කීවේය.

"ඒ නිසා තමයි වෙනම ඇස් රෝහල් බිහිවුනේ. මුලින්ම ඇස් රෝහලක් ඇති කළ බවට වාර්තා වෙන්නෙ මීට අවුරුදු හයසියකට විතර කලින් බුද්ධදාස[3] රජතුමාගෙ කාලෙ"

"එහෙනම් ස්ථිරවම මිත්‍රගේ ඇස් පෙණීම යලිත් ලබාගන්න පුලුවන් වෙනව" සන්කර් දැඩි විස්වාසයකින් යුතුව කීවේය.

"මම ත් එහෙම හිතනව. අක්‍ෂි වෛද්‍ය විද්‍යාව මීට අවුරුදු දහසකටත් වඩා පැරණියි. ඔබ අහල ඇති අපේ ශ්‍රේෂ්ට වෛද්‍යවරයා, සුශෘත මීට වසර 1800කට[4] පෙර ජිවත් වූ බව කියන"

"මට වන්න හාමුදුරුවො කිව්ව සුශෘත සංහිතාව ගැන"

"ඒක හරි. එතුමා අක්‍ෂි ශල්‍ය ක්‍රම ප්‍රගුන කර තිබුනා. විශේෂයෙන්ම කාච රෝගය. මම කියවල තියෙනව කොහෙමද එතුමා පිළියම් කළේ කියල. මුලින්ම ඇසට කටින් පිඹ මඳක් උනුසුම් කර ඇස පියා මහපට ඇඟිල්ලෙන් තැවීමෙන් පසු ඉතා සියුම් තුඩක් ඇසේ නිශ්චිත ස්ථානයක තබා සෙමින් තද කරනවා. කුඩා හඩක් නගමින් දිය බිඳුවක් එතනින් එළියට ආ පසුව ඇස යලිත් තද කර එහි වූ දියර නාසය තුළින් ඇද ඉවත දමන ලෙස රෝගියාට කියනවා. ඉන් පසු ඇස කිරි වලින් සෝදා සුලු බෙහෙතක් කරනවා. එපමනයි"

"මම අහල තියෙනව ජාතක කතාවක් ඇසක් බද්ධ කිරීමක් ගැන කියන" සන්කර් මහ වෙද්නාගෙන් ඇසුවේය.

"ඔබ කියන්නෙ සිවි ජාතකය ගැන. සිවි රජු අක්‍ෂි වෛද්‍ය වරයෙකු ලවා ඔහුගේ එක ඇසක් ගලවා අන්ධ බ්‍රාහ්මණයෙකුට පූජා කරනවා. වෛද්‍ය වරයා ඒ ඇස සවිකර බ්‍රහ්මණයාට පෙනුම ලබාදෙනවා"

"ඒක ප්‍රාතිහාර්යක් නෙ"

"එහෙම තමයි සාමාන්‍ය කෙනෙකුට පේන්නෙ. ඒ උනාට ඒකෙන් පේන්නෙ අපේ වෛද්‍ය විද්‍යාව කෙතරම් දියුණු තත්වයක ඒ කාලෙ ඉඳලම තිබුනද කියන එකයි" මහ වෙද්නා පැවසීය. "ඒ නිසා ඔබේ ඇස් පෙනීම ලබා දීම ඒ තරම් අමාරු කාර්‍යයක් නෙවෙයි. අවශ්‍ය වෙන්නෙ නියම රෝහලත් නියම වෛද්‍ය වරයාත් සොයා ගන්නා එක යි"

"ඔබ වහන්සේ මගේ ජීවිතයට යලිත් බලාපොරොත්තු ඇති කළා" මිත්‍ර යලිත් වතාවක් භික්‍ෂුවට වැඳ සන්කර් සමග රෝහලෙන් පිටත් විය.

රැගෙන යාමට තරම් කිසිවක් ඔහු සතු නොවිය. ඇඳ සිටි රෙදි කඩද රෝහලෙන් ඔහුට දෙනු ලැබූවකි. මින්දා විසින් සාදාදෙන ලද සැරයටියක් ඔහු අත විය. සන්කර් ඔහුගේ අනිත් අතින් අල්ලාගෙන, ඔවුන් ගමන් කළ වටපිටාව

---

[3] 362 – 409 A. D.
[4] 8th cent. B.C.

ගැන විස්තර කරමින් ඔහු අසලින්ම ගියේය. පෙර හුරු පුරුදු මුහුදු සුළඟ මුහුණේ වදිත්ම මුහුද ඔහුගේ දකුණු පසින් ඇති බව ඔහුට දැනුණේය.

නගරය වෙත වැටී ඇති පාරෙන් ඉවත් වී ගම දක්වා වැටී ඇති අඩි පාරට හැරුනු බව සන්කර් කියනවිට මිත්‍රගේ දෙපයට ද ඒ වෙනස වැටහිණ. තද සමතලා පොළොව වෙනුවට දැන් ඔහුට දැනුණේ වල ගොඩැලි සහිත වැලි පසකි. වැඩි දුරක් යන්නට පෙර ඔහුට ළමයින් ගේ කටහඬත් බල්ලන් බුරන හඬත් ඇසෙන්නට විය. ගමේ වැසියන් ඔහු දෙස බලා සිටිනවා ඇති බවත් ඔහු කෙබඳු කෙනෙක් ද, ඔහු කෙතෙක් කල් මේ ගමේ සිටීද වැනි ප්‍රශ්න ඔවුන්ගේ සිත්තුල ඇතැයි මිත්‍රට හැගුනේය. ඔවුන් විසින් මිත්‍ර කෙසේ පිළිගනු ලැබේදැයි දැන ගන්නට ඔහුට උවමනා විය. වෙනත් රටක සිට පැමිණි, වෙනත් ජාතියක, වෙනත් ආගමක වුවා පමණක් නොව, අන්ධයකු වීම ඔවුන්ට ප්‍රශ්නයක් විය හැකිද. ඔහු අසුබ නිමිත්තක් හැටියට ගැනේවිද?

"ඔන්න අපි ආව අපේ කුඩා නිවසට. මේ ඉන්නෙ මගේ පුතා බාසු" සන්කර් කියත්ම උණුසුම් කුඩා අතක ඇගිලි ඔහුගේ අතින් අල්ලාගන්නවා මිත්‍රට දැනුණේය.

"මෙතන පඩියක් තියෙනව. ඔලුව පහත් කරල ඇතුල්වෙන්න, වහලත් ටිකක් පහතයි"

"නමස්කාර්" ඔහුට ගැහැණු කටහඬක් ඇසුණේය.

"මේ මගේ බිරිඳ" සන්කර් කීවේය.

"නමස්කාර්" කටහඬ ආ දෙසට හැරී මිත්‍ර කීවේය.

"මේ පැදුර උඩ වාඩිවෙන්න" බාසු ඔහු පිල මතවූ පැදුර වෙත ගෙනගොස් ඔහුට වාඩිවෙන්නට උදවු විය.

මිත්‍ර ඔහු සිටිනා මේ නිවස කෙබඳු විය හැකිදැයි සිතන්නට උත්සාහ කළේය. ඔහුට තමා කෙරෙහිම කෝපයක් ඇතිවූයේ මේ නිවස වත්, මෙහි ජීවත්වෙන කාරුණික පවුල වත් කිසිදාක දැක ගන්නට ඔහුට වාසනාවක් නැති බව සිහි වීම නිසාය.

ගෙතුලින් දැරියකගේ කටහඬක් ඇසුනේය. ඒ සන්කර්ගේ දුවක හෝ නැගනියක විය යුතුයැයි මිත්‍ර අනුමාන කළේය. මේ පවුලේ කී දෙනෙක් සිටිදැයි ඔහු තවමත් දැන සිටියේ නැත. මේ අතර අම්මා ගෙනැවිත් දුන් වතුර කෝප්පය භානු ඔහු අතට දුන්නේය. වතුර බොන විටය ඔහුට දැණුනේ ඔහු තද පිපාසාවකින් සිටි බව. පා සළඹ සැලෙනා හඬක් ඔහු වෙත ළගාවෙනු ඇසුණ ඔහුට ඒ සන්කර් ගේ බිරිඳ වියයුතු යැයි සිතුනේය.

"ඔබ එන බව දැන ගත්තාම මම මේ අතුරුපසක් හැදුව, කාල බලන්න" ඇය ඔහු අසලින් තැටියක් තබනවා ඔහුට ඇසුනේය.

මිත්‍රට තැටිය මත තරමක් උණුසුම් වූ යමක් අතට අසුවිය. එය ඇළෙන සුලු වුවත් ඉතා රසවත් වූයෙන් එකක් කා හමාරවී ඔහු තව එකක් ගත්තේය.

"සේරම හැදුවෙ මිත්‍රට තමයි, කන්න" සන්කර් කීවේය.

"හාසු එකක් කනවද?" ඔහු ඇසුවේය.

"අපෝ එයා ඇති වෙන්න කාල ඉන්නෙ, මම ඕව හදන කොටම"

"හුගක් කාලෙකින් මේ වගේ රස කෑමක් කෑවෙ. මම මේ වගේ දෙයක කාල තියෙනව දවසක් අරිකමේඩු[5] වලදි"

"වෙන්නැති. අපේ මුල් ගම් තිබුනෙ කේරල ජනපදයෙ මහීසමන්ඩ[6] වල" සන්කර් කීවේය.

"කෙසෙල් ගෙඩියක් කන්න. මේව අපේම ගොවිපලේ හැදුන ඒව" ඔහුගේ බිරිඳ පෙරැත්ත කළාය.

මිත්‍රට වෙහෙස දැනෙනැයි සිතා පැදුර සකසා ගෙපිලේම ටික වේලාවකට සැතපී ඉන්නට ඔවුහු සැලසූහ. මිත්‍ර පුරුද්ද නිසා දැස් පියා ගත්තේය.

මිත්‍ර ඔහුගේ අනාගතය ගැන යලිත් සිතන්නට විය. රෝහලේදි පියවි සිහිය ආ දා සිටම ඔහුගේ සිත සෑම විටම යොමුවූයේ මේ ගැනය. ඔහු සම්පූර්ණ සුවය ලබන බව දැන ගත් දා ඔහුට අසන්නට මුවගට ආවේ, දැස් අඳ මිනිසෙකුට ජීවත් වීමෙන් ඵලක් ඇතිදැයි කියාය. එහෙත් ඔහුගේ දිවි ගලවා දී ඔහුට මෙතරම් සාත්තු කරණ රෝහල් වෛද්‍යවරුන්ගෙන් එවැන්නක් ඇසීමට ඔහුට කිසිසේත් නොහැකිය. රෝහලින් පිටත ජීවිතයක් ගැන අද වෙනතෙක් ඔහු සිතුවේ නැත.

ඔහුගේ දැනුමත් පළපුරුද්දත් තිබුනේ නාවික කටයුතු සඳහා පමණක් විය. එහෙත් අන්ධයෙකුට එම වෘත්තියේ කිසිදාක තැනක් ලැබෙන්නේ නැත. වෙනත් වෘත්තියක් ඔහු නොදත් අතර ඇස් පෙනීම අවශ්‍ය නොවූ, ඔහුට උගත හැකි වෘත්තියක් ගැනද ඔහුට සිතාගත නොහැකි විය. දිවා රෑ ඔහු මේ ගැන සිත වෙහෙසුවේය. නින්දට ගිය පසු ඔහු බොහෝ විට සිහිනෙන් දුටුවේ නැවක ගමන් කරනා අයුරු හෝ වරායකට ගොඩබැස වෙළඳාම් කරනා අයුරුය.

සන්කර්ට වත් වෛද්‍යවරුන්ටවත් සන්කර්ගේ අනාගත ජීවිතය ගැන කිසිත් උපදෙසක් දෙන්නට බැරවුවත්, ඔවුන් ගේ විස්වාසය වූයේ මිත්‍රට යලිත් පෙනීම ලැබෙන බවයි.

---

[5] දකුණු ඉන්දියාවේ පොන්ඩිචෙරි අසල ඉතා පැරණ වෙළද වරායක්
[6] මයිසූර්

රෝහලේ දිගටම නැවති ඔහුට හැකි පමණින් සේවය කරන්නට ඔහුට උවමනා විය. ඒ අයුරුන් හෝ ඔහුගේ ජීවිතය ගලවා දීම වෙනුවෙන් නය ගෙවීමටය ඔහුට සිතුණේ. ළඟම ඇති දේවස්ථානය සොයාගොස් පූජක පදවි ලබා දෙවියන් හා මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ජීවිතය කැප කිරීම තවත් අදහසක් විය. දේශනා කරන්නටත්, දෙවියන් වෙනුවෙන් සේවය කරන්නටත් ඇස් පෙනීම අනවශ්‍ය බවයි ඔහු සිතුවේ. එහෙත් ඒ බලාපොරොත්තු බිඳ වැටුනේ පූජකත්වය ලබන්නට නම් නිරෝගී ශරීරයක් හා කිසිත් ශාරීරික හෝ මානසික දුබලතාවක් හෝ අංග විකල භාවයක් නැති අයෙකු විය යුතු බවයි සිහිපත් වූ පසුවය.

ඔහු අතේ මුදල් තිබුනේ නැත. මාන්තොට යන තෙක් මුදල් අවශ්‍ය වන්නේ නැත. ලංකාවේදී කිසිම තැනක ආගන්තුකයෙකුට කුස ගින්නේ ඉඳීමට සිදුවිය නොහැකිය. ගැටලුව මතු වෙන්නේ මුහුදින් එතෙර යාමේදිය. නැවක සේවය කළ නොහැකි හෙයින් මුදල් ගෙවා ගමන් කරන්නට ඔහුට සිදුවේ. එතරම් මුදලක් ඔහු සොයාගන්නේ කෙසේද? කාගෙන් යදින්නද? ඔහු සිටි ඔරුවේ වටිනාකමක් ඇති කිසිවක් තිබුණේදැයි මින්දා ගෙන් අසන්නට, මිත්‍ර බැලීමට ඔහු රෝහලට පැමිණි කිහිප විටෙක සිතුනත්, එය මින්දාට කරන මහත් අපහාසයක් ලෙසද, ගුනමකු කමක් ලෙසද සිතා ඔහු නිහඬ විය. ඔරුවේ කිසිවක් තිබුනේ නම් ඔහු අසන්නට පෙර ඒවා ඔහුට ලැබෙන බව ඔහුට විශ්වාසය. මින්දා එක් දිනක් ඔහුගේ ඔරුවට කුමක් කළ යුතුදැයි ඇසූ විට මිත්‍රට සිනා ගියේය. ඔහුට දැන් ඔරුවකින් ඇති ප්‍රයොජනය කුමක් දැයි ඇසූ මිත්‍ර, ඔරුව මින්දාටම බාර දුන්නේය.

අද මහ වෙද්නා ඔහුට අලුත් බලාපොරොත්තු ඇති කළේය. ඔහුගේ දෑස සුවපත් කිරීමට ක්‍රමයක් ඔවුන් සොයනා බව මෙතෙක් කල් ඔහුට නොකීවේ කඩවියහැකි බලාපොරොත්තු නොදීමට විය හැකිය. දැන් ඔහුට ජීවිතයේ අරමුනක් තිබේ. පෙනීම ලබා ගත හැකි නම් ලෝකයේ ඒ වෙනුවෙන් ඕනෑම තැනකට යන්නට, ඕනෑම කැප කිරීමක් කරන්නට ඔහු තීරණය කළේය. එහෙත් ඔහුට කැප කිරීමට ඉතිරිව තිබුණේ ඔහුගේ ජීවිතයත් ආත්මයත් පමණක් ය.

"මුදු වෙරලට යමුද?" භානුගේ හඬ ඔහුගේ අඳුරු ලෝකයට ඇතුලු විය.

මිත්‍ර නැගිට සිටියේය.

"හා, යමු"

භානු ඔහුගේ අතින් අල්ලා ගෙපිලෙන් මිදුලට බසින්නට ඔහුට උදව් කර හැරමිටිය ඔහුගේ අතට දුන්නේය.

මඳ වේලාවකින් ළමයින් සෙල්ලම් කරන හඬත් සමග ඔහුගේ පා රත්වූ වැල්ලේ එරෙන විට ඔහුගේ ගතට කිසියම් ප්‍රබෝධයක් ඇතිවිය.

"මා රළ බිඳෙන හරියට ගෙනිහින් භානු අනීත් ළමයි එක්ක සෙල්ලම් කරන්න. මම ටිකක් රළ පාගන්න ආසයි"

"තනියම යන්න පුලුවන්ද?"

"ඇයි බැරි? මං මේ තෙත වැල්ල පැගෙන හරියෙන් ඉන්නම්. මේ බා දිය වෙලාව වගෙයි  ඔයා බය වෙන්න එපා"

"මං ඔයාට ඈතට යන්න දෙන්නෙ නැහැ. සෙල්ලම් කළාට මෙහේ බලාගෙන ඉන්නම්" කියමින් භානු සෙල්ලමට එකතු විය.

"බලා ගන්න මම පොඩි ළමයෙක් නෙමෙයි" මිත්‍ර ඔහුවෙතින් ඈතට ඇදෙන දරුවාට කෑගසා කීවේය.

රැල්ලක් ගලා ඇවිත් මිත්‍රගේ දෙපයේ දැවටී ඔහු පසුකර ගලා යනවා ඔහුට දැණුනේය. සති කිහිපයකට පෙර ඔහුගේ ජීවිතය ගිල ගන්නට සැදුවේත් මේ මහ සයුරම නොවේදැයි ඔහුට සිහිවිය. ඔහු මුහුද මැද දී මියගියේ නම් ඔහුගේ සිරුරට කුමක් විය හැකිද? දිය වැළකට හසුවී එය දියඹට ඇදී ගියේනම් මසුන්ට හා පක්ෂීන්ගේ ගොදුරක් වන්නට තිබිණ. මේ අසල වෙරළට පාවී ආවේ නම් ගම් වැසියන් විසින් ඔහුගේ සිරුර වළ දැම්මක් හෝ පුලුස්සා දැම්මක්, පළාතේ සිරිත් අනුව සිදු කෙරන්නට ඉඩ තිබිණ. එහෙත් ජන ශූන්‍ය වෙරළකට පා වී ගියේනම් බල්ලන්ටත්, කබරුන්ටත්, කපුටන්ටත් ගොදුරක් වන්නේය. ඒ සිතිවිල්ලත් සමග ඔහුගේ ගත කිළිපොලා ගියේය. දැඩි හිරුරැස් පතිතවුවත් ඔහුට මුලු ශරීරයම සීතල වන්නාක්සේ දැනුනේය.

තවත් රැල්ලක් ඔහුගේ දෙපයේ වෙලුනේය. එය ආපසු ගලන විට ඔහු පාගිලි වැල්ලේ ඔබා ගත්තේය. තවත් රළ කිහිපයක් වැදී ආපසු ගලන විට ඔහුගේ දෙපා ටිකින් ටික වැල්ලේ එරී ගියේය. ඇස් වටය දක්වා එරෙන විට ඔහු ඇඳ සිටි රෙදි කඩ තෙමෙන්නට නොදී උස් කර ගත්තේ ඔහු ඇඳ සිටිනා රෙදි කඩ තෙමුනොත් ඇඳ ගන්නට වෙන ඇඳුමක් නැති බව සිහිවීමෙන්ය. හෙට මෙය සෝදා වියළෙන තුරුවත් ඇඳගෙන ඉන්නට වත් කිසිවක් ඔහුට නොතිබුනේය. රෝහලේදී ඔහුට අඳින්නට ලැබුනාවූ රෙදි රෝහල සතු ඒවා විය. සන්කර් නිසැකවම ඔහුට ඇඳුමක් දෙනවා ඇත. එහෙත් හැම දෙයක්ම සන්කර් ගෙන් බලාපොරොත්තුවීම ඔහුගේ සිතට මහත් බරක් වූයේය.

"අපි එහෙනම් ආපසු යමුද?" ඔහුට භානුගේ කටහඬ ඇසුනේය.

"දැන්මම සෙල්ලම් කරල ඉවර උනාද?"

"කලුවර වේගෙන එනව, අප්පාත් ගෙදර ඇවිත් ඇති දැන්"

අනිත් ළමයින් කිහිප දෙනාත් ඔවුන්ට එකතු වූහ. ඔහුගේ අතක එල්ලුනු වැලි තැවරුන කුඩා අතක තෙතමනය තුලින් මිත්‍රට දැණුනේ ළයාන්විත උනුසුමකි. ඔහු තවදුරටත් මේ ගමට ආගන්තුකයෙක්! නොවිය. වැඩිහිටියන් පමනක් නොව කුඩා ළමුන් පවා ඔහු පිළිගෙන ඇත. දැන් නම් ඔහුට සිතුනේ යලිත් ඔහු උපන් ගමට ගියාසේය. වෙනසකට ඔහුට දැනුනේ කතා කරන බස පමනක් විය. එයත් ඔහුට දැන් හුරුවී ඇති නිසා ආගන්තුක බවක් නොදැණුනේය.

අන්ධ වීමේත් වාසියක් ඇතැයි ඔහුට සිතුනේ, අවට කිසිවක් නොපෙනෙනන නිසා මේ ඔහුගේ උපන් ගමයැයි මද වේලාවකට හෝ සිතන්නට උවමනාවූ හෙයින් ය.

ඔහුගේ අත අල්ලාගෙන සිටි කුඩා දරුවා ඔහු කැඳවාගෙන ගියේ ළිඳ අසලටය.

"මේ තරම් මුහුදට ළඟින් ළිඳක් තියෙනවද?" මිත්‍ර ඇසුවේය.

"වැල්ලෙම තිබුනත් මේකෙ වතුර බොන්න පුලුවන්. බීල බලනවද" භානු ඔහුගෙන් ඇසුවේය.

"ගමේ කවුරුත් බීමට වතුර ගෙනියන්නෙ මේ ළිඳෙන් තමයි" ඔහු අසලින්ම ඇසුනු කුඩා කටහඬ ඔහුගේ අතින් අල්ලාගෙන ආ දරුවාගේ විය යුතුය.

මිත්‍ර දෑත අල්ලා ඒ මතට හැලූ වතුර උගුරක් බී මුහුණ සෝදා ගෙන පහතට නැමී ඇඳිවතින්ම මුහුණ පිසදා ගත්තේය.

"තව ළිඳක් තියෙනව, නාන්නයි රෙදි සෝදන්නයි" තවත් දරුවෙක් කීවේය.

මේ ගමේ තිබූ වැසිකිලි පහසුකම් කෙසේදැයි දැන ගැනීමට මිත්‍රට අවශ්‍ය විය. ඈත ගම්මාන වල පදිංචිකරුවෝ ගමවටා වූ තිස් බඹයෙන් එපිට කැළය මේ සඳහා යොදා ගත්හ. මුහුද අයිනේ සමහර ගම් වල වැසියෝ මුහුදු වෙරල ට ගියහ. එහෙත් මෙවන් ධීවර ගම්මානයක වෙරළේ පිරිසිඳු බව අවශ්‍ය නිසා ඔවුන්ට වෙනත් විකල්පයක් තිබියයුතුය. ඔහු පසුව ඒ ගැන භානු ගෙන් ඇසිය යුතුය.

මිත්‍ර සන්කර් සහ භාසු සමග රාත්‍රී ආහාර ගත්තේ පිල මත එලා තිබූ පැදුරක් මත හිඳ ගෙනය. සන්කර් ගේ බිරිඳ ඔවුන් අසලින් වාඩිවී ඔවුන්ට කෑම බෙදුවාය. මිත්‍රට බෙදන අතර ඒ ඒ කෑම වර්‍ගය කුමක්දැයි හඳුන්වන්නට ඇය අමතක නොකළාය. විරින් වර ඇගේ දුව මුලුතැන් ගෙහි සිට අවශ්‍ය දේ ගෙන ආවාය. සන්කර්ගේ දුවගේ නම පාලි බව පමනක් මිත්‍රට දැන ගන්නට ලැබුනේ. ඇය භානුට වඩා වයසින් වැඩිද, අඩුද ඇගේ හැඩ රුව කෙසේද ආදිවූ මේ කිසිවක් ඔහු නොදත්තේය. ඔහුට දැණුනාවූ එකම දේ ඇගේ මිහිරිවූ කටහඬ පමණක් විය.

"මට ඉන්නෙ දුවයි පුතයි විතරයි, පාලි වැඩිමලා, පිරිවෙන් ඉගෙනීම අවසන් කරල දැන් අම්මට උදවු වෙනව ගෙදර ඉඳගෙන" මිත්‍ර නොඇසූ ප්‍රශ්නයට සන්කර පිළිතුරු දුන්නේය.

"භාසු තවම ඉගෙන ගන්නවද?"

"ඔව්. එයාගෙ ඉගෙනීම සම්පූර්ණ උනාම මං හිතනව රෝහලේ සේවය කරන්න ලැබෙයි"

ළඟදීම ගමේ තරුණියකු සමග පාලි විවාහ වෙනවා ඇතැයි මිත්‍රට සිතුණේය.

රෑ කෑම අවසන්වී ඔවුහු පිල මත වාඩිවී කතා කරමින් සිටියහ. සන්කර් පිළිගැන්වූ බුලත් වට්ටියෙන් මිත්‍ර ගත්තේ බුලත් කොලයක් පමනය. බුලත් කෑමට පුරුදුවූවත් පුවක් හුණු හෝ අනිත් කිසිවක් එයට එකතු කරගන්නට මිත්‍ර අකමැති විය.

සන්කර් ඔහුට බුලතේ උපත කියාදුන්නේ රෝහලේදී බුලත් විටක රස බලද්දීය. එය සුරලොව සිට ගෙනැවිත් මෙහි පැල කරන ලද්දේ අර්ජුන විසින් බවයි ඔහු කීවේ.

මිනිසුන් බුලත් කෑමට මෙතරම් ප්‍රියක් දැක්වූයේ ඇයිදැයි මිත්‍ර එදා ඔහුගෙන් ඇසුවේය.

බුලත් පවිත්‍රකාරක, රුචිකාරක, බලකාරක, වශීකාරක, තියුණු, කසට ඖෂධයක් බවත්, එය විඩාපත් බව, නරක්වූ සෙම, කටේ දුගඳ බව හා මැලියම් ඉවත් කරන බවත් සන්කර් පැහැදිලි කළේය. දෙව්ලොවින් සොරා ගෙනවුත් බුලත් ලොකයට හඳුන්වා දෙන ලද්දේ අර්ජුන විසින් බවත් ඔහු විස්තර කළේය.

මුහුදින් හමා ආ සිසිල් සුළඟ වැදෙමින් මෙතැන සිටිනා විට, මිත්‍රට ඔහුගේ ජිවන ප්‍රශ්නය මොහොතකට අමතක විය.

එදා රෑ ඔහුට නින්ද පහසුවෙන් ළගාවූයේ නැත. රෝහලේ සුවදායක ඇඳක් මත, නිරන්තර භික්ෂූන්ගේ රැකවරනය යට සුව නින්දක් ලබන්නට ක්‍රමයෙන් ඔහු පුරුදුවී සිටියේය. මෙතැනදී නිදිපල මාරුවීමටත් වඩා ඔහුට යලිත් ඔහු සිටිනා අසරන තත්වය සිහිවීම නින්ද නොයාමට හේතුවන්නට ඇත. මුහුදේ රළ බිඳෙනා හඩ කැටුව ආ සුළඟත්, තල් පත් සැළෙනා හඩත්, ගෙපිල මත වැතිරී සිටි ඔහු වෙළාගෙන සිටියේය. ඉඳහිට ගමේ නිවසක බල්ලෙක් බුරනවා ඔහුට ඇසුනේය. අහසේ දිලෙන තරු කිහිපයක් ඔහුට තනිවට සිටියා සේය. ඔහුගේ දෙමාපියන් සමහර විට මේ තරු දෙස බලාගෙන, කවදා ඔහු ආපසු එත්දැයි දින ගණිනවා විය හැකිය.

රෑ කොයි වේලේ ඔහුට නින්දට වැටුනාදැයි මිත්‍රට දැනුනේ නැත. පාන්දර අවදිවූවිට එක් වරම ඔහුට සිතුනේ ඔහු රෝහලේ ඇඳෙන් බිමට වැටී ඇතැයි කියාය. ඔහු සිටියේ කොතැනදැයි හඳුනාගත හැකිවූයේ සන්කර්ගේ බිරිඳගේ කටහඩ ගෙතුලින් ඇසුනාට පසුවය. කුරුලු ගී හඩත්, ගෙතුලින් නැගුනු හඩත් නිසා හිරු උදාවෙන්නට සමීප බව දැනී මිත්‍ර නැගිට සිටියේය. කිසිවෙක් ඔහු අසල නිදා සිටි බව ඔහුට දැනුනේය.

"තව ටිකක් නිදාගන්න" භානු ඔහුට කීවේය.

"මට ඉර පෑව්වට පස්සෙ නිදාගන්න බැහැ"

"එහෙනම් අපි ගිහින් මුන සෝද ගනිමු" භානු එලා තිබූ පැදුරු අකුලන තෙක් මිත්‍ර මිදුලට බැස්සේය.

මින්දාත් ඔහුගේ බිරිඳත් පුතාත් සමග එදින මිත්‍ර බලන්නට පැමැණියහ. මින්දාගේ බිරිඳ රැගෙන ආ කරවල කුරියා සන්කර්ගේ බිරිඳට දෙන්නට මුලුතැන් ගෙය දෙසට ගියාය. රෝහලට යන්නට සැරසී සිටි සන්කර් ඔවුන් හා මද වේලාවක් කතා කර පිටත්ව ගියේය. මිත්‍රට ගිරය ගැටෙනා හඩ ඇසුනෙන්, මින්දා බුලත් විඩක් සපන්නට සැරසී පුවක් ගෙඩියක් කපනා බව සිතා ගත්තේය. මේ ගැමියන් අතර තිබූ සමීප බවත්, ගෙදරකට පැමැණි විට පිලේ ඇති බුලත් වට්ටියෙන් බුලත් විටක් කැමට ආරාධනාවක් අනවශ්‍ය බවත් ඔහුට ආගන්තුක දේ විය.

"මට හිතා ගන්නට බැහැ මේ ඉන්නෙ එදා අපි ඔරුවෙ දැකපු එක්කෙනාමද කියල" කිතා පැවසුවේය.

"එහෙම දේවල් කියන්න හොඳ නැහැ" මින්දා පුතාට කීවේය, "කිතා කියපු දේ ගණන් ගන්න එපා"

"ඒකට කමක් නැහැ. මටත් හිතා ගන්නවත් බැහැ මම එදා කොහොම ඉන්න ඇතිද කියල. කොහොම හරි එදා ඔබගේ පුතා මගේ ඔරුව දුටුවේ නැත්නම් මම අද ජිවතුන් අතර නැහැ. ඔබත් කිතාත් මගේ ජිවිතය බේර ගත්ත එකට කවදාවත් මට නය ගෙවන්න බැහැ" ඔහු ඒ වචන මීට ඉහත සියක් වාරයක් කීයා තිබුනත් එය නැවත නැවතත් කියන්නට ඔහුට උවමනා විය.

"මම ඉස්සෙල්ල හොඳදටම බය උනා ඔබ මැරිල කියල හිතාගෙන" මිත්‍රගේ සිතේ අසතුටක් නැති බව දැනී කිතා යලිත් පැවසීය.

"දන්නෙ කොහොමද මම ඇත්තටම මැරුනද කියල? මේ දැන් ඉන්නෙ අවතාරයක් ද කියල"

"මම දන්නව ඔබ අවතාරයක් නෙවෙයි කියල. අවතාර වලට කතාකරන්න පුලුවන්ද?" පැවසූ කිතා ඒ හුස්මටම මෙසේ ද ඇසුවේය. "ඔබ විශාල නැව් වල ගිය ගමන් ගැන විස්තර ටිකක් අහන්න ආසයි. මමත් කවදා හරි ලොකු නැවක යනව"

"හවසට එන්න, වැඩ අවසන් කරල, එතකොට අපට නිදහසේ කතා කරතැකි"

රෝහලට මාලු බාරදී කිතා එදා සවස මිත්‍ර හමුවන්නට ආවේ මාලුවෙක්ද වලිගයෙන් එල්ලාගෙනය. ගෙතුල සිටි පාලිගේ අතට මාලුවා දී කිතා පැමිණ මිත්‍ර අසලින් වාඩිවිය. ඔවුන්ගේ කතා කරන හඩ ඇසී භානු ඔවුන් හා එක්විය.

මහ මුහුද මැද අත්දැකීම් හා ඔහු සංචාරය කළ විවිධ රටවල් ගැන ළමුන් දෙදෙනා දහසක් ප්‍රශ්න අසන්නට විය.

"ඔබ සිටි නැව හුගක් විසාලද"

"ඔව් ඒකෙ නැවියො සියයකට වඩා හිටිය"

"ගොඩබිමෙන් හුගාක් ඈත ගියාම රෑට අහසෙ තරුපේන්නෙත් නැති දවසට කොහොමද යන දිසාව දැන ගන්නෙ"

"ඔබ මාලු අල්ලන්න ගියාම කොහොමද දිසාව දැන ගන්නෙ" ඔහු පෙරලා ඇසුවේය.

"අපේ තාත්තට බුදුරුව පේන තෙක් මානයෙන් එහාට අපි යන්නෙ නැහැ කවදාවත්. ඉතින් අපි අතරමං වෙන්නෙ නැහැ"

"හැම නැවකම උපකරනයක් තියෙනව උතුර සොයාගන්න"

"ඒක කොහොමද වැඩ කරන්නෙ"

"මම සේරම හරියට කියන්න දන්නෙ නැහැ. යකඩ වලින් සෑදූ මත්සයයෙක් තෙල් භාජනයක දමා තියෙනව. නැව මොන දිසාවට හැරුනත් මාලුවා උතුරට හැරෙනව. මේ පලාතෙ ඒකට කියන්නෙ මච්ච යන්ත්‍රය[7] කියල"

"ඒකෙන් ඔය තරම් දුර යන්න මග පෙන්වනවද?"

"නෑ තවත් උපකරන තියෙනව. එකකට කියන්නෙ වෘත්තශංග භාග[8] කියල"

"ඒ මොන වගේ එකක්ද?" භාසු ඇසුවේය.

"මට ඒක ඇඳල පෙන්වන්න තිබුන නම් තමයි ලේසි. ඒක විස්තර කරන්න හරි අමාරුයි. නාවිකයො මම දැකල තියෙනව අහසෙ තාරකා දිහාවට එල්ල කරල මොනවද මනිනව" මිත්‍ර එය විස්තර කිරීමට උත්සාහ කළේය.

"මං අහල තියෙනව සමහර නැව් වල කාක්කො ගෙනියනව කියල ගොඩබිම සොයා ගන්න"

"ඒ ඉන්දියානු නැව් වල තමයි"

---

[7] compass
[8] sextant

## අතුරු ආබාධය

"සුනිතා හොස්පිටල් ඇඩ්මිට් කරළ" දොර හැරගෙන ගෙට ඇතුලුවූ භානු හුස්ම අල්ලන්නේත් නැතුව කීවාය.

"සුනිත? මොනව වෙලාද?" රාජු ඇසුවේය.

"හුගක් අමාරුද?" චිත්‍රා ඒ එක්කම ඇසුවාය.

භානු හති අරින තුරු දෙදෙනාම පිළිතුරක් බලාගෙන සිටියහ.

"මං විස්තර මොනවත් දන්නෙ නැහැ. මට සුනිතගෙ අම්ම හම්බඋනා බොරැල්ලෙදි, කුමාරි ඇන්ටි බස් එකට නගින්න හදනකොට"

"මොන හොස්පිටල් එකේද?"

"ගෙට්වෙල් එකේ"

"අනේ රාජු අපි දැන්මම යමුද?" චිත්‍රා ඇසුවාය.

"අනේ යං ඩැඩ්" භානුද පෙරැත්ත කළාය, "නැත්නං අපි දෙන්න බස් එකේ යන්නද?"

"මේ පිස්සු නැතුව ගිහිල්ල ඇඳගන්න, මං කලිසමක් දා ගන්නකම්"

හවසට ගෙදර ආ පසු යලිත් එළියට යන්නට රාජු කැමති නැත. තරුණ කාලයේ රෑ නමය දහය වෙනතුරු රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථාන වල රස්තියාදු වූ කාලය ඔහුට තාමත් මතකය. දැන් ඒකටත් එක්ක විවේක ගතයුතුය.

රාජු රොහලේ ගේට්ටුව අසලට ළගාවෙත්ම රිය හඳුනාගත් ආරක්ෂක භටයා ගේට්ටුව හැරියේය. රථගාලේ කාරය නවතා ඔවුහු රෝහල දෙසට ගමන් කළහ.

"ඔය රෙඩ් ක්‍රොස් ස්ටිකර් එක කාර් එකේ ගහන එක වැරදිනේද?" භානු තාත්තාගෙන් ඇසුවාය.

"මොකක්ද ඒකෙ තියෙන වැරැද්ද?"

"ඒක දීල තියෙන්නෙ දොස්තරලට, හදිසි අවශ්‍යතාවලට නේද?" ඉතින් ඒකෙන් අයුතු ප්‍රයොජන ගන්න එක වැරදි නැද්ද? අනිත් එක මේක දොස්තරලට වෙන් කරපු කාර් පාක් එක නේද?"

"අපිත් මෙක ගහගෙන ඉන්නෙ අවශ්‍ය නිසා. අපට නැත්නම් ඉස්පිරිතාල ඇතුලට මෙහෙම එන්න පුලුවන්ද?" අනිත් එක හොඳට බලන්න මං ගහල තියෙන්නෙ රෙඩ් ක්‍රොස් එක විතරයි. ඩොක්ටර් ස්ටිකර් එකේ ඩොක්ටර් කියල ගහල තියෙනව"

"අපිට ඔය ස්ටිකර් එක නැතුව අනිත් මිනිස්සු වගේ එළියෙ නවත්තල එන්න තිබුනනෙ"

"අනේ මගේ යකා අවුස්සන්නෙ නැතුව යන්න, නොදන්න දේවල් ගැන කතා නොකර. මෙතන ඉඳල හැතැක්ම භාගයකින් මෙහා කාර්එක නවත්තන්න තැනක් හොයාගක්ක පුලුවන් කියල හිතනවද? ආපහු යන කොට කාර් එකේ රෝද හතර වත් තියෙයිද?"

චිත්‍රා දුවගේ අත මිරිකා නිහඩ වෙන්නැයි කියන්නට උත්සාහ කළාය..

ඔහු වැනි කළමනාකරුවන්ගේ පමනක් නොව වෙළඳ නියොජිතයන්ගේ වාහන පවා එතැන නවතා ඇති බවත් ඉන් සමහරක වෛද්‍ය ලේබලය පවා අලවා ඇති සැටිත් දුවට පෙන්වන්නට ඔහුට සිතුනේය.

"අපට මෙතෙන්ට එන්නෙ නැතුව අපේ රාජකාරිය කරන්න බැහැ, දුව දන්නවද සමහර දොස්තරල හම්බවෙන්න අපට චාන්ස් එකක් ලැබෙන්නෙ මේ වගේ කාර් පාක් එහෙකදි විතරයි කියල" ඔහු තේරුම් කරන්නට උත්සාහ කළේය.

"කාර් පාක් එකකදි කොහොමද තාත්තලගෙ බෙහෙත් ගැන විස්තර කරන්නෙ?"

"හැම විස්තරයක්ම දෙන්න නං බැහැ, ඒ උනාට අඩු ගණනෙ අපේ විස්තර පත්‍රිකා ටිකයි සාම්පලයි දෙන්න පුලුවන්නෙ?"

"තාත්තල බෙදන ඔය පල්හෑලි සෙරම දොස්තරල කියවනවද?" භානු ඇසුවාය.

"අපේ සාම්පල් ටික ලැබෙනවනෙ"

"ඇයි පගාවට දෙන තෑගි?" අම්මාගේ නෙත නොගැටී භානු කීවාය. තාත්තා සමග මෙසේ වාද කිරීම නුසුදුසු බව ඇය දැන සිටියත් කෙසේ හෝ තාත්තාගේ අදහස් වෙනස් කරන්නට ඇය ඉටා ගෙන සිටියාය.

රාජුට අඩියෙන් අඩියට නවතින්ට වුයේ, වෛද්‍ය වරයකුට හෝ රෝහලේ නිලධාරියක!ට හෝ සහෝදර වෘත්තිකයෙක!ට කතාකරන්නට සිදුවු නිසාය. තමා මේ තරම් වැදගත් පිළිගත් පිරිසක් දැන හඳුනාගෙන සිටින්නේ මේ කරන රැකියාව නිසා බව භානුට තේරුම් යනු ඇතැයි ඔහු බලාපොරොත්තු විය. කවදාහෝ ඇගේ මෝඩ වැරදි අදහස් අත්හරිනු ලැබෙතැයි ඔහු විස්වාස කළේය.

සුනීතා සිටියේ දෙවන මහලේ වූ කාමරයකය. ඇයගේ නෑදෑ හිතවතුන් කිහිපදෙනෙක්ම කාමරය තුල සිටියහ. භානු ඔවුන් අතරින් ඇදී ගොස් සුනීතා අසලට ළංවූවාය. ඇය දුටු සුනීතා ඇගේ අත අල්ලාගෙන තදින් මිරිකා ගත්තාය. භානු ඇගේ අනිත් අත ඒ මත තබා ගත්තාය. රාජු සුනීතාගේ පියාවූ සුමනදාස අසලට ගියේය.

"කවද්ද එක්ක ආවෙ?" ඔහු සුමනදාස ගෙන් ඇසුවේය.

"අද උදේ"

"මොකක්ද අසනීපෙ"

"දන්නෙ නැහැ රාජු  දුව ටික දවසක ඉඳල අසනීප ගතියෙන් හිටියෙ"

"මොකක්ද කියන්න දන්නෙ නැද්ද?" රාජු යලිත් ඇසුවේය.

"හිතා ගන්න බැහැ, නිකම්ම ඇගට සනීප නැහැ වගෙයි කිය කියා ඉඳල ඒ පාර වමනෙ කරන්න ගත්ත. කුමාරි හොඳටම බය උනා වෙන ප්‍රශ්නයක් ද කියල. ඒ උනාට මං කිව්ව ඒක වෙන්න බැහැ, අපේ දුව එච්චර මෝඩ නැහැ කියල" සුමනදාස ඔහුට කීවේය, "ඉතින් අපි ගෙදර ළඟ දොස්තර ගාවට එක්ක ගියා. එයා දීපු බෙහෙත් වලින් කිසි වැඩක් උනේ නැහැ. පස්සෙ ටික ටික දුවගෙ සිහි කල්පනාවත් අඩුවේන්න වගේ දැණුනහම තමයි මෙහාට එක්ක ආවෙ "

"දැන් මොකද ඩොක්ටර්ස් ල කියන්නෙ?"

"එක පාරටම කිව්වෙ ලිවර් එක නරක් වෙලා කියල" සුමනදාස කිව්වෙ සුනීතාට නොඇසෙන්නට ඉතා පහත් හඬින්.

"කව්ද ඩොක්ටර්?"

"ඩොක්ටර් සිල්වා. ලැබ් රිපෝර්ටස් තාම ඇවිල්ල නැහැ, ඒ උනාට නර්ස් ල කිව්වෙ ලිවර් ඩැමේජ් කියල තමයි බෙහෙත් නියම කරල තියෙන්නෙ කියල" සුමනදාස දිග හුස්මක් හෙලුවේය.

"ඩොක්ටර් සිල්ව නං දැන් වෝඩ් රවුන්ඩ්ස් කරනව ඇති" අතේ බැඳි ඔරලෝසුව දෙස බලමින් රාජු කීවේය. ඕනෑම විශේෂඥ වෛද්‍යවරයෙකුගේ දෛනික කාල සටහන වෛද්‍ය වරයාටත් වඩා හොඳින් රාජු දන්නා බවයි බෙහෙත් ද්‍රව්‍ය වෙළඳ ක්ෂේත්‍රයේ බොහෝ දෙනෙකුගේ මතය වූයේ "මං ගිහිල්ල කතා කරල බලන්නං, සුමනෙත් එනවද?"

ඔවුන්ට වෛද්‍ය වරයා හමුඋනේ තුන්වන මහලේ සාත්තුසේවිකා මැදිරියේදිය.

"ගුඩ් ඊව්නිං ඩොක්ටර්" රාජු වෛද්‍යවරයා ඇමතිය.

"ප්වනිං" රෝගියෙකුගේ වාර්තාවක් බලමින් ඔහු පිළිතුරු දුන්නේය.

"205 ඉන්න සුනිත ගැන පොඩ්ඩක් කතා කරන්න ආවෙ"

"සුනිත?" දොස්තර නළල හැකුලුවේය.

"මේ දැන් සර් බලල ආවෙ ඒ ළමයව, ලිවර් එක ඩැමේජ් කියල හිතන" සුමනදාස කීවේය. දොස්තර ඔහු දෙස බැලුවේ අමුතු සතෙකු දෙස බලන්නා වගේය.

"මේ ඒ ළමයගෙ තාත්ත  මිස්ටර් සුමනදාස" රාජු ඔහු හඳුන්වාදීමට තැත් කළේය.

"ආ, ඒ ලෙඩා ගැන බය වෙන්න දෙයක් නැහැ. රිපෝර්ට්ස් ලැබුන හැටියෙ ට්‍රිට්මන්ට් පටන් ගන්න පුලුවන්" දොස්තරගෙන් දැන ගන්නට හැකිවූයේ එපමණකි.

ආපසු සුනිතා සිටි කාමරයට යන අතර රාජු දොස්තර ගැන කියන්නට උත්සාහ කළේ සුමනදාසගේ හිත හදන්නටය.

"ඩොක්ටර් සිලවා ඔහොම තමයි, වැඩි කතාවක් නැහැ. ලෙඩ්ඩුනගෙ නෑයො ඇවිත් කතා කරනවට කැමති නැහැ. ඒ උනාට දැනට ඉන්න හොඳම ෆිසිෂන් කෙනෙක්"

"ඇයි ඉතින් ඒ ගොල්ලන්ට ඔය තරම් අමාරු අපි එක්ක ටිකක් කතා කරන්න? අපේ දුවට මොනවද වෙලා තියෙන්නෙ කියල කියන්න, මොනවද අපි කරන්න ඕන කියල කියන්න"

"එයාට දවසට ලෙඩ්ඩු කී දෙනෙක් බලන්න තියෙනවද? ඉස්පිරිතාල කීයකට යන්න තියෙනවද ? ඉතින් ඔය අස්සෙ ලෙඩ්ඩුන්ගෙ පවුලවල අය අහන ප්‍රශ්ණ වලටත් උත්තර දිදී ඉන්න ගියොත් වෙන වැඩක් කරන්න වෙන්නෙ නැහැ. අනිත් එක හුගක් මිනිස්සු අහන්නෙ හරි මෝඩ ප්‍රශ්න"

"උඹ කියන්නෙ මාත් ඇහුවෙ මෝඩ ප්‍රශ්නයක් කියලද?" සුමනදාසට කේන්ති ගියේය, "ඉස්සර නං ලෙඩෙක් එක්ක ගියහම ලෙඩා එක්කයි ලෙඩා ගෙ පවුලෙ කෙනෙක් එක්කයි හොඳට කතා කරල, ලෙඩේ ගැන කියා දීල, පරිස්සම් වෙන්න ඕන හැටි කියල, ආපහු යවන්නෙ කතාවෙන්ම බාගයක් ලෙඩේ සනීප කරලයි. දැන් අපි මොනවත් දන්නෙ නැහැ. නිකන් ඇවිත් ඇඳ උඩ ඉන්න දරුව දිහා බලාගෙන ඉඳල යන්න ඕන. දරුවට කොච්චර අමාරු ද, ලෙඩේ මොකක්ද, සනීප කරන්න පුලුවන්ද, කොච්චර කල් යාවිද, මේ මොනවත් දන්නෙ නැහැ. උඹ හිතන්නෙ නැද්ද අපට මේ ගැන දැන ගන්න අයිතියක් තියෙනව කියල?"

"උඹ කලබල නොවී හිටපන්. මං හෙම්හිට සේරම විස්තර හොයාගන්නං. අපට රටේ ඉන්න දොස්තරලා හඳුනන්න බැහැ. අපි ඉක්මනට දුව සනීප කර ගන්න බලමු" රාජු සුමනදාසගේ පිටට තට්ටු කළේය.

සුමනදාස ආපසු සුනීතාගේ කාමරයට ගිය අතර රාජු නේවාසික වෛද්‍ය නිලධාරියා සොයාගෙන ගියේය.

"ලිවර් එක තමයි" ඒ දොස්තර කීවේය.

"එක තමයි හැමෝම කියන්නෙ. මං හිතුව ඔයාට පුලුවන් වෙයි කියල ඊට වැඩි යමක් කියන්න" රාජුට තවමත් මේ ගැන විස්වාසයක් නැත. දොස්තරලාගේ වැරදි නිගමන ගැන ඔහු ඕනෑතරම් අසා තිබුනේය. "මේ ළමයට එහෙම දෙයක් වෙන්න බැහැ"

"දැන් රිපෝර්ටස් වගයක් ආව, පොඩ්ඩක් ඉන්න බලන්න" දොස්තර ලිපිගොමුවක් පෙරලන්නට විය. "මේ තියෙන්නෙ" ඔහු වාර්තා කිහිපයක් ගෙන රාජුට පෙන්විය "අපි මේක ඩොක්ටර් සිල්වට යවනව. රාජු ගිහිල්ල කතා කරල බලන්න"

"එයාට කතා කරල වැඩක් නැහැ. මං දැන් එක පාරක් කතා කළා. ආයිත් අහන්න ගියොත් තද වෙයි"

"මං හෙට ආවම අහන්නං. අද නම් ආයිත් මේ පැත්තෙ එන එකක් නැහැ" දොස්තර කීවේය, "දැන් මං ගියත් ඕක ගැන අහන්න මාවත් එලව ගනියි"

රාජු මැද මිදුලට බැස එතැන ගලාගෙන යන දිය දහර දෙස බලාගෙන සිටියේය. ඒ මේ අත පීනන පාට පාට මාලු කීපදෙනාත්, සෙළවෙන පැලෑටි දෙසත් ඔහු බලා සිටියේය. ඔහුත් ඒ මාලුන් වගේම අසරණ නේදැයි ඔහුට සිතුනේය. මේ වෛද්‍ය ක්ෂේත්‍රයේ මේ තරම් දැන හැඳුනුම් කම තිබියදිත්, මේ රෝහලේ හැම කෙනෙකුන්ම දැන සිටියදිත්, තමාගේ හොඳම මිතුරාගේ එකම දියණියගේ අසනීපය ඉදිරියේ ඔහු කිසිවක් කර කියාගන්නට නොදන්නා තත්වයකට පත්වී ඇත.

"ඩැඩී අපි හැම තැනම හෙව්ව" භානුගේ කටහඬ ඔහු අවදි කළේය.

"අපි දැන් මොකද කරන්නෙ?" ඔහු නිහඬව සිටිවිට ඇය ඇසුවාය.

"මං දන්නෙ නැහැ පුතා. මට හිතා ගන්න බැහැ" ඔහු ඇගේ අතින් අල්ලාගෙන කීවේය.

"සුනීතට හුගක් අමාරුද? සනීප කරන්න අමාරු ද?" ඈ තාත්තාගේ මුහුණ දෙස බලාගෙන ඇසුවාය.

"බයවෙන්න එපා. සුනීතට ඉක්මනට සනීප වෙයි. කරන්න පුලුවන් හැම දෙයක්ම අපි කරමු" සමහර විට දොස්තරලාටත්, රසායනාගාරයටත් වැරදි ඇතැයි

කියන්නට ඔහුට සිතුනත්, එවැනි බලාපොරොත්තුවක් දීම හොඳ නැතැයි ඔහු යලිත් කල්පනා කළේය.

රාජු දුවත් සමග ආපසු සුනිතා සිටි කාමරයට යන විට එහි සිටියේ සුමනදාසත්, කුමාරිත්, චිත්‍රාත් පමණි.

"ඔයා කොහෙද ගියෙ? " චිත්‍රා ඇසුවාය.

"මං ගියා හවුස් ඔෆිසර් හම්බවෙන්න. එයා කිව්ව බය වෙන්න දෙයක් නැහැ කියල. ඩොක්ටර් සිල්ව රිපෝර්ටස් ටික බලපු ගමන් ප්‍රතිකාර පටන් ගනියි කියල" රාජු සුනිතාගේ හිස අත ගාමින් කීවේය. "දුව බය නැතුව ඉන්න, තව ටික දවසකින් ටිකට් කපාගෙන ගෙදර යන්න පුලුවන් වෙයි"

"මොකක්ද මට වෙලා තියෙන්නෙ?"

"පොඩි ලිවර් ඉන්ෆෙක්ශන් එකක්. ඇන්ටිබයෝටික්ස් කෝස් එකක් දෙනකොට ඇරිල යයි"

සුනිතා දිහා බලාගෙන ඉන්න බැරි කමට භානු කාමරයේ කුඩා බැල්කනිය උඩට ගියාය. අනිත් පැත්තේ ඇති කාමර බැල්කනියට පෙනේ. ලෙඩුන් බැලීමට පැමිණි අමුත්තන් සහ සමහර බැල්කනි වල තරමක් සුවපත් වූ ලෙඩුන් පවා පෙනෙන්ට සිටියහ. උස් හඬින් සිනාවත් සතුටු කතාබහත් ඇහෙන්නෙ අද උපන් සිගිත්තෙක් ඉන්නා කාමරයකින් විය යුතුය.

අම්මා කතා කරනවා ඇසී භානු ආපසු ඇතුලට ආවාය. සුමනදාස තව ටික වෙලාවක් ඉන්නා බව කීවේය. කුමාරි දුවත් සමග රාත්‍රිය එහි ගත කරනවා ඇත.

"අම්මිත් යන්න ගෙදර, මට තනියම ඉන්න පුලුවන්" සුනිතා කීවාය.

"කමක් නැහැ, මට මේ ඇඳේ නිදාගන්න පුලුවන්" ඈ පසෙක වූ කුඩා ඇඳ පෙන්වූවාය.

"මං දන්නව අම්ම නිදාගන්න එකක් නැහැ, එලිවෙනකම් මගේ දිහා බලාගෙන ඉඳියි"

"ඒ මොනවටද? මං දුට නින්ද යන කං පිරිත් ටිකක් කියල මාත් නිදාගන්නව"

"මං හෙට ඔයාට මගේ වෝක්මන් එක අරගෙන එන්නම්. එතකොට පිරිත් කැසට් එක දාල තියන්න බැරිය"

"අනේ ඒක නං හොඳයි දුවේ" කුමාරි කීවාය.

"මොනවටද ඔච්චර පිරිත් කියන්නෙ? මොකද සේරම මේ හැටි බයවෙලා?"

"පිරිත් කියන එක කොයි වෙලාවටත් හොඳයිනෙ, අනිත් එක දූට හොඳට නිදාගන්නත් පුලුවන් නෙ, මෙහෙම තැනක ඉන්න කොට" කුමාරි කීවාය.

"එතකොට සිත සන්සුන් වෙනව. අසනීපෙ හොඳ කරගන්න ඔයාගෙ ඇගට ශක්තියක් ලැබෙනව" භානු සිය මිතුරියගේ සිත සනහන්නට උත්සාහ කළාය.

ආපසු රථ ගාලට යන අතර සුනීතාගේ රෝගී තත්තවය කුමක්දැයි චිත්‍රා ඇසුවාය. වෛද්‍ය වාර්තා නිවැරදි නම් රෝගය බරපතල බවත්, සමහරවිට ලබාදියහැකි එකම ප්‍රතිකාරය වෙනත් අක්මාවක් බද්ධ කිරීම බවත්, රාජු බිඳුණු හඬකින් ඔවුන්ට පැවසීය.

## පාලි

ඔවුන් එළවලු කොටුව දෙසට එනු දුටු පාලි වැට අසලට පැමිණියාය. හාසු කඩුල්ල මෑත් කර මිත්‍රට ඇතුලට එන්නට සහාය විය.

"හැම කොරටුවක් වටාම වැටක් බැඳල තියෙනව. හරක් ගෙනුයි, එළුවන් ගෙනුයි බේර ගන්න. අපි ඒ සත්තු හදන්නෙ නිදැල්ලෙ" හාසු පැහැදිලි කළාය.

"සත්තු ටික කොටු කරල තියන එක වඩා ලේසියි නෙ" මිත්‍ර ඇසුවේය.

"මං දන්නෙ නැහැ. සමහර වෙලාවට සත්තු එහෙම හිරකරල තියාගන්න එක වැරදි නිසා වෙන්න ඇති. අනිත් එක එතකොට උන්ට කන්න හොයල දෙන්නත් ඕන නෙ" හාසු කීවේ වැඩි විස්වාසයකින් නොවේ, "මොනවද අක්ක අද කඩන්නෙ" ඔහු පාලිගෙන් අසුවේය.

"කීරයි, තක්කාලියි" ඇය කීවාය. "එළුවන් කොටු කරල හදන්න හොඳ නැහැ. එලු කිරි හරිම ගුණයි. ඒ ගුනය තියෙන්නෙ උන් නිදැල්ලෙ උලා කාල හිටියහම තමයි. එතකොට තමයි උන්ට අවශ්‍ය නියම කෑම වර්‍ග සොයාගන්න උන්ට පුලුවන් වෙන්නෙ" ඇය හාසු කී දෙයට එකතු කළාය. ඇය කතා කරාවියැයි මිත්‍ර බලාපොරොත්තු වූයේ නැත. මෙතෙක් ඇය ඔහු හා කතා කර තිබුණේ නැත.

"ඔබ කොහොමද ඔය විස්තර දන්නෙ?" මිත්‍ර ඇසුවේ පාලි සමග කතා කරන මුල් වතාව බව සිහිපත් කරමිනි.

"අපේ අම්ම තමයි මට කියල දෙන්නෙ"

"වෙන මොනවද කොරටුවෙ තියෙන්නෙ?" ඔහුට එහි වගාකර ඇති දේ නොපෙනෙන බව සිහි කරමින් කීවේය.

"ඔබ හිටගෙන ඉන්නෙ ලූනු පාත්තිය ළග. එහායින් තියෙන්නෙ ඉගුරු. ඊළගට කහ. ළිඳෙන් එහා පැත්තෙ තියෙනව වම්බටු, මුං ඇට" හාසු කීවේය.

"හාසු, එක්ක එන්නකො මේ වම්බටු පාත්තිය ළගට" පාලි කීවාය.

"අපි ඇවිදින්න ඕන පාත්ති අතරෙ තියෙන කාණු දිගේ. අපි පෙන්නනම්කො පාත්ති වලට වතුර දාන හැටි" හාසු ඔහුට කීවේය.

"බලන්න මේකෙ සුවඳ" පාලි, තක්කාලි ගසක කොළයක් කඩා පොඩිකර මිත්‍රගේ නාසය වෙත ළං කළාය "අපි ඉන්නෙ තක්කාලි පාත්තිය ළග"

ඇය මෙතරම් ඉක්මනින් ඔහු සමග මෙසේ නිදහසේ කතා කිරීම ඔහු බලාපොරොත්තු නොවීය. ඇය ඉතා යහපත් කාරුණික යුවතියක වියයුතු යැයි ඔහු සිතුවේය. දෑස් අඳවූ හෙයින් අනිත් ඉන්ද්‍රිය වල සංවේදිතාව වඩා ප්‍රබල වී ඇති නිසා, අවට ඇති දේ සුවඳ ඔහුට හොඳින් දැනුණේය. ඒ අතර දැනුණාවූ මල් සුවඳ පාලිගේ හිස සරසා තිබූ මල් වැලක් වියයුතුයැයි ඔහු අනුමාන කළේ, ද්‍රවිඩ තරුණියන් කොයි වේලේත් හිස මලින් සරසා සිටිනා බව මීට ඉහත දී ඔහු දැක සිටි නිසාය.

"හාසු, අයියට වම්බටු ගෙඩියක් කඩන්න දෙන්න" පාලි කියනවා ඇසී, මේ අය විසින් ඔවුන්ගේ පවුලේ කෙනෙකු ලෙස තමා පිළිගෙන ඇතැයි මිත්‍රට මහත් සතුටක් සමගම වේදනාවක්ද ඇතිවුයේ, ඔහුගේ මා පියන් ඔහුට කිසිදාක දකින්නට ලැබේදැයි සිතිවිල්ලක් ඒ සමගම මතුවු හෙයිනි. හාසු ඔහුගේ අතින් අල්ලා වම්බටු ගසක් වෙත යොමු කළේය. ඔහු ඉත්තක් දිගේ අතගාගෙන යනවිට ගෙඩියක් අතට අසු විය. එහෙත් පැසුණු ගෙඩියක් ද නැද්දැයි හැගීමක් නොවූයෙන් ඔහු තවත් ගෙඩි කිහිපයක් අල්ලා බැලුවේය. එක් ගෙඩියක් අනික්වාට වඩා ප්‍රමාණයෙන් විශාල බව දැනී ඔහු අනිත් දෙදෙනා සිටි දිසාවට හිස හැරවූයේ එය කඩන්නදැයි දැනගැනීමටය.

"ඒක හොඳයි  කඩන්න" පාලි ඔහුට කීවාය. ඔහු එය දෑතම යොදා කඩාගෙන සිනහ මුහුණකින් යුතුව පෙන්වූයේය.

"අම්ම අපට කියල දීල තියෙන්නෙ ගහටත් ගෙඩියටත් වේදනාවක් නොදී තමයි පලතුරු එහෙම කඩන්න ඕන කියල. අපි අතින් ඇදල අඹරල කඩන කොට ඇතිවෙන කම්පනය වැඩියි, එක පාරට පිහියකින් කපනවාට වඩා. එහෙම කඩන පළතුරු ඉක්මනට නරක් වෙන්නෙත් ඒ නිසා ලු" පාලි කීවාය.

"අයියට පිහියක් දෙන්නද" හාසු ඇසුවේය.

"එපා මල්ලි, අත කැපුනොත් එහෙම"

"මම පොඩි ළමයෙක් නෙමෙයි නෙ, කෝ දෙන්න පිහිය" මිත්‍ර අත පෑවේය. හාසු කුඩා පිහියේ මිට ඔහුගේ අතේ තැබුවේය.

"ඔය දෙන්න ඕන එකක් කර ගන්න" පාලි කතුරුමුරුංගා ගහ වෙතට ගියාය.

"මල්ලි මේ උඩ තියෙන මල් ටිකක් කඩනවද" ඇය ටික වෙලාවකින් ඇසුවාය. "වම්බටු ඔය ඇතිවෙයි"

"කතුරුමුරුංග මල් මම කාල නැහැ. කොළ නම් කන්න ඇති රෝහලේදි" මිත්‍ර කීවේය.

"අද රෑට අපි මල් උයමු. කොල මැල්ලුමක් දවල්ට බත් කන්න හදතැකි" පාලි කීවාය, "රොහලේ බෙහෙත් වලට මේ ගහේ කොළයි, පොතුයි දෙකම ගන්නවා.

ඔබේ සමේ ආලේප කළ බෙහෙත් වලටත් ගන්නැති. දකුණු භාරතයෙ මේ ගසට කියන්නෙ අගස්ති කියල. ඒ නමින් සෘශිවරයෙක් හිටියනෙ"

"අපි වතුර දාන්න ඕන නේ දැන්" භාසු කීවේ තරමක නොඉවසිල්ලකින්දැයි මිත්‍රට සිතුණේය.

"හැම එළවලු කොරටුවකම ළිඳක් තියෙනව මේ වගේ" පාලි ළිද දෙසට අත දිගු කරත්ම, මිත්‍රට එය නොපෙනෙන බව සිහිවී වහාම අත පහළට දැම්මාය. " ළිඳ හුගක් ගැඹුරු නිසා වතුර ගන්න අපි දිග ලියක් ළිඳ අයිනෙ සවි කරල තියෙනව. එක කෙළවරක ගලක් ගැට ගසා තියෙනව. අනිත් කෙළවරේ ලොකු කළයක් ගැට ගහල තියෙනව, දිග කඹයක අග " ඇය ආඩියා ළිද විස්තර කිරීමට උත්සාහ කළාය.

ළිඳෙන් ගත් ජලය කාණු දිගේ ගලා යන සැටිත්, භාසු එක් කාණුවකින් තවත් කාණුවකට ජලය හරවන සැටිත්, සෑහෙන පමණ ජලය ලැබුණ පසු එක් කානුවක් පස් පිඩැල්ලකින් අහුරන සැටිත් ඇය විස්තර කළේ ළිඳෙන් දිය අදින්නට භාසුට සහාය වෙන අතරය. භාසු ලමා වයසේදීම ජලයේ ඇති වටිනාකම හැ□දින සිටි නිසා ළිඳෙන් ලැබෙන ජලයෙන් උපරිම ප?යෝජන ලබන්නට වෑයම් කරනා බව ඇය කීවාය.

ඔහුගේ රටේ ගොවිපොලවල වතුර දමනා අයුරු විස්තර කරන්නට මිත්‍ර තැත් කළේය. සමින් සැඳූ මල්ලක පතුලේ සිදුරු සාදා, එයට එකතුකර ගත් ජලය ගස් වලට වත් කරනා අන්දම ඔහු විස්තර කළේය.

පාලිට ඕනෑ තරම් වේලාවක් මිත්‍ර දෙස බලා සිටිය හැකි විය. ඔහුගේ මුහුණේ, පෙර දිනවලදී අව්වටත් වැස්සටත් පුරුදුවූ එඩිතර පෙනුමක් තිබෙන්නට ඇතැයි ඇය සිතුවාය. එහෙත් අද එය සුදුමැළි මළානික බවක් පළ කළේය. ඝන රැවුලට උඩින් අන්ධ වූ දෙඇස් ඇතුලට ගිලාබැස ඇති සෙයක් දක්නට තිබුණේය. මනා ලෙස කපා පීරා තිබූ තාත්තාගේ රැවුල හා සැසඳූ විට මිත්‍රගේ රැවුලේ ගොරහැඩි බවක් ඇත්තේ ඒ ගැන ඔහුට දැන් උනන්දුවක් නැති නිසා විය යුතුය. ඉඳහිට සිනාසෙන විට ඔහුගේ පිරුණු දෙතොල් අතරින් සවිමත් සුදු දත් පෙළක් පෙනුණේය. මුහුදේ අතරමං වී සිටි දිනවල විඳි පීඩා නිසා මුහුණේ කිසියම් කැළල් ඉතිරිවී ඇතිදැයි ඇය බැලුවේ රෝහලේ වෛද්‍ය ප්‍රතිකාර වලින් පසු එවන් කැළැල් ඉතිරිවිය නොහැකි බව දැන දැනත්ය.

ඔහුගේ ඇස් පාලි සිටිනා දෙසට හැරෙනවා ඳුටු ඇය ලැජ්ජාවෙන් වහා ඉවත බලා ගත්තාය. මොහොතකට ඇ සිත තුල මහත් චකිතයක් ඇති කරමින් සිතට ආ හැගීම වුයේ, මිත්‍රගේ ඇස් පෙනෙනා බවත්, ඔහු ඔවුන් සියලුදෙනාම රවටාගෙන සිටින බවත්ය. එහෙත් ඒ හා සමගම ඇයට සිහිවූයේ ඔවුන් කවුරුන් රැවැට්ටුවත් රෝහලේ මහ වෙද්නා රැවටීම කිසිසේත් කළ නොහැකි බවය. රෝහලේ වෛද්‍යවරුන් කෙරෙහි ඇ තුල අසීමිත විස්වාසයක් හා ගෞරවයක් තිබුණේය. කවදා හෝ වෙදකම ඉගෙන ගෙන කුඩා දරුවන්ගේත් කාන්තාවන්ගේත් ලෙඩ සුව කිරීම ඇගේ ආසාව විය.

"මොනවද බලාගෙන ඉන්නෙ" ඇගේ සිත දුටුවාක්මෙන් මිත්‍ර ඇසුවේය.

"මම වතුර ගලාගෙන යන දිහා බලා හිටිය"

"ඔබට මා දිහා බලා ඉන්න පුලුවන්. ඒ උනාට මට ඔබ පේන්නෙ නැහැ"

"මගේ ඒ හැටි බලන්න දෙයක් නැහැ. මම සාමාන්‍ය ගැමි කෙල්ලෙක් විතරයි, මල්ලිට වඩා ටිකක් උසයි මම" ඇය බිම බලාගෙන කීවාය.

භාසු පැමිණ ඔවුන්ට කතා කරන තෙක් දෙදෙනාම නිහඬව සිටියෝය.

"අපි යමුද?"

"දැන් අප්පත් එනව ඇති එහෙනම් යමු" පාලි කැඩූ එළවලු එකතු කරන්නට වූවාය.

භාසු මිත්‍රගේ අතින් අල්ලගෙන ඉදිරියෙන් ගමන් කළ අතර, පාලි එළවලු කුඩයත් රැගෙන පසුපසින් ආවාය. අසල නිවෙසක යුවතියක් ඈතින් එනවා දුටු පාලි ඈ එනතුරු නැවතුණාය.

"අරය ඉන්නෙ ඔයාලගෙ ගෙදරද?" මිතුරිය පාලිගෙන් ඇසුවාය.

"ටික දවසකට අප්ප එක්කගෙන ආව, එයාගෙ ඇස් වලට වෙදකම් කරන්න යන කම්"

"හරි කඩවසම් කොල්ලෙක් වගෙයි"

"හරි අවාසනාවන්ත මිනිහෙක්. මට සිතා ගන්න බැහැ ඇස් පෙන්නෙ නැතුව ජිවත් වෙන්නෙ කොහොමද කියල" පාලි කීවාය.

"ඔයා දන්නෙ කොහොමද මිනිහ බොරුවට ඇස් පේන්නෙ නැහැයි කියනවද කියල"

"එයාට අප්පවයි, මහ වෙද්නා වයි රවට්ටන්න බැහැ"

"මොන රටක එක්කෙනෙක් ද, මොනවත්ම විස්තර දන්නෙ නැද්ද එයා ගැන"

"මම දන්නෙ කොහොමද" පාලි නොසතුටු හඬකින් කීවාය.

"ඇයි අප්ප කීවෙ නැද්ද"

"අප්ප මොනවටද මාත් එක්ක ඒ විස්තර කියන්නෙ. අනිත් එක අප්ප එහෙම භාර භාර විස්තර අහන්න නැතුව ඇති. එයාගෙ පුද්ගලික ජිවිතය ගැන අපට වැඩක් නැහැනෙ"

''මම මෙතනින් හැරෙනව, මේ කොමඩු ගෙඩියක් නැන්දට දෙන්න'' යුවතිය වෙන දිසාවකට හැරුණ පසු පාලි අඩිය ඉක්මන් කර හාසු හා මිත්‍රට එකතු වූවාය.

ඔවුන් ආපසු එනවිට සන්කර් පිල මත වාඩිවී මුදවූ මී කිරි කෝප්පයක් රස විඳිමින් සිටියේය. මිත්‍රටත් කිරි කෝප්පයක් ගෙනෙන ලෙස ඔහු බිරිඳට කීවේය. ළමයි දෙදෙනා පියාට නමස්කාර කර ගෙතුලට ගියහ.

අම්මා රාත්‍රී ආහාර පිළියෙළ කරමින් සිටි නිසා පාලි මැටි කෝප්ප දෙකකට කිරි බෙදා ගෙන එළියට විත් හාසු අතට දී, ආපසු අම්මාගේ සහායට ගෙතුලට ගියාය. හාසු එක කෝප්පයක් මිත්‍රට දී ඔහුට වතුර කෝපපයකුත් ගෙනැවිත් දුන්නේය.

''මොනවද මෙච්චර වෙලා කළේ'' අම්මා මඳක් කෝපයෙන් ඇසුවාය.

''මිත්‍ර ආව කොරටුවට හාසු එක්ක. ඉතින් හාසු වතුර දාල ඉවර වෙන කං මාත් හිටිය''

''නන්නාඳුනන කෙනෙකුට නම කියල කතා කරන එක හරි නැතිබව දන්නෙ නැද්ද''

''එයා අපේ ගෙදර නැවතිලා ඉන්නෙ. ඉතින් එයා නාඳුනන කෙනෙක් වෙන්නෙ කොහොමද?''

''අප්ප එයාව ගෙනැල්ල නවත්ත ගත්තට අපි එයා ගැන මොනවත් දන්නෙ නැහැ. අපේ ගමේ වත් අපේ රටේවත් කෙනෙක් නෙවෙයිනෙ''

තාත්තාට බීමට වතුර ඉල්ලනවා ඇසී ලද අවසරයෙන් පාලි ඔහුට දෙන්නට වතුර කෝප්පයක් පුරවන්නට වූවත් අම්මා එය ඇගේ අතින් ගෙන තාත්තා වෙත ගෙන ගියාය. ඔවුන් කතා කරන හඬ පාලිට ඇසුණේය. ඔවුන්ගේ කතාවට ඇයට එකතුවන්නට බැරි ඇයිදැයි ඇය සිතුවාය. ඇගේ සෙහොයුරාටත් ගමේ අනිත් තරුණයිනටත් තිබූ නිදහස ඇයට නැති බවත්, ඒ ගැන ඇගේ සිත තුල අසතුටක් ඇතිවෙතැයි කියාවත්, මේ වන තෙක් ඇයට සිතුණේ නැත. දැන් ඇයට මෙවැනි හැඟීමක් ඇති වන්නේ ඇයිදැයි ඇයට තේරුම් ගත නොහැකි විය. මිත්‍ර සමග කතා කරන්නට හෝ අඩුම වශයෙන් ඔවුන්ගේ කතාව අසා සිටීමට, ඔහුගේ මුහුණ දිහා බලා සිටින්නට ඇයට උන්නදුවක් ඇති වීමත්, ඇයටම ගැටලුවක් සේ දැනුණේය. සමහරවිට ඇය දන්නා තරුණයින් අතරෙන් ඔහුට නොදැනේනට ඔහුගේ මුහුණ දිහා බලා සිටින්නට අවස්ථාවක් ඇත්තේ මිත්‍ර සමග පමණක් නිසා විය හැකිය.

ගමේ තරුණයින්ට වඩා මිත්‍ර කඩවසම් දැයි සිතන්නට ඇය උත්සාහ කළාය. ගමේ කිසිම තරුණයෙකු දෙස මෙතෙක් දිනකට හොඳින් බලා නැති බවත්, එම නිසාම ඒ කිසිවෙකුගේ මුහුණක් ඇයට මතක නැති බවත් ඇයට සිහිවූයේ දැන්ය. මිත්‍රගේ මුහුණ දෙස බලා සිටි ලෙසටම අනිත් තරුණයන්ගේ මුහුණුද

බලන්නට ඇය සිතා ගත්තාය, එහෙත් ඔවුන්ගේ ඇසට හසු නොවී එසේ බලන්නේ කෙසේදැයි ඇයට සිතාගත නොහැකිවිය.

රාත්‍රී ආහාරෙයෙන් පසු සන්කර්, මිත්‍ර සමග බුලත් සපමින් කතා කරමින් මිදුලේ වාඩිවී සිටියේය. පාලි ඔවුන්ගේ කතා අසා සිටින්නට ආසා කළේ ඇය නොදැන සිටි ලෝකයකට ඇයට ඇතුල්විය හැකිවූ හෙයිනි. ඈත රටවල් ගැන, ඒ රටවල ජීවත්වෙන මිනිසුන් ගැන, ඔවුන්ගේ ඇදහිලි විශ්වාස, ඇඳුම් පැලඳුම්, කෑම බීම ආදිය ගැන, අති විශාල නැව් හා ඒවායේ මුහුදු ගමන් ගැන, අසන්නට ඇයට අවස්ථාවක් ලැබුණේය. මිත්‍රගේ කටහඩ අසාගෙන ඉන්නටත් ඇගේ සිතේ සියුම් වූ හෝ ආසාවක් ඇතැයි පිළිගන්නට ඇය අකමැති වූවාය.

පාලි මවත් සමග ඇතුල් දොරකඩ වාඩිවී ඒ කතා අසා සිටි අතර ඔවුහු යමක් ඉල්ලුවහොත් ගෙනැවිත් දෙන්නට සැරසී සිටියහ.

"අද අහසෙ තරු පිරිල තියෙනව" මෙවන් එක් රැයක, සන්කර් මිත්‍ර සමග කීවේය.

"මම මුහුද මැද ඉන්නකොට සමහර වෙලාවට අහස දිහා බලාගෙන කල්පනා කරනව කවුද මේව මැව්වෙ කියල"

"විවිධ ජන කොටස් අතර විවිධ අදහස් විස්වාස තියෙනව මේව ඇතිවූ අන්දම ගැන"

"කොහොමද ඉතින් මේ හැම දෙයක්ම ඇති උනේ? මේ විශ්වයේ ඇති සේරටම පොදුවූ යම් දෙයක් තියෙනවද?"

"මම ඔවැනි දේවල් ගැන එතරම් ඉගෙනගෙන නැහැ. එත් මම දන්න තරමට සෑම වස්තුවක්ම සෑදී තියෙන්න ඉතා කුඩා අංශු වලින්. ඒවට කියනව පරම අණු කියල. ඒ බව පැහැදිලි කරල තියෙනව කණද කියල දාර්ශනිකයෙක්"

"මම ඒ නම අහල තියෙනව" සන්කර් විස්මයට පත් කරමින් මිත්‍ර කීවේය.

"ඔබ මේ පෙරදිග ලොකය ගැන හුගක් දන්නවනෙ. එහෙනම් මම කනද ගැන පුංචි කතාවක් කියන්නම. මීට අවුරුදු 1500කට විතර ඉස්සර[9] ඉන්දියාවෙ උල්කා කියල දාර්ශනිකයෙක්'ට, කාශ්‍යප කියල පුතෙක් සිටිය. එක දවසක් මේ ළමය තාත්තත් එක්ක ගංගා නදිය වෙත වන්දනා ගමනක ගිය අවස්ථාවෙ දැකල තිබුණ, දහස් ගණන් වන්දනාකරුවන් සහල් සහ මල් පාර දිගේ ඉසිනව. අනිත් අය වඳින්නට හෝ ස්නානය කිරීමට ගිය අතර කාශ්‍යප අර සහල් ඇට ඇහිඳින්නට පටන් ගත්තා. මේ දුටු බොහොමයක් උදවිය නැවතිලා බලා හිටිය, මේ හොඳට ඇඳ පැළඳ ගත්, වැදගත් පවුලකින් කියා අනුමාන කළහැකි මේ ළමයා, බීම වැටී ඇති සහල් ඇට එකතු කරන්නෙ ඇයි කියා කුතහලයෙන්. ඒ අසලින් ගිය සෘෂිවරයෙක් මේ ළමයගෙන් ඇහුව, ඇයි මේ යාචකයෙක්වත් අහුලන්නෙ නැති සහල් එකතු කරන්නෙ කියල"

---

[9] ක්‍රි පූ 600

"මොනවටද ඒ ළමය සහල් එකතු කළේ"

"මම දෙන්නම් පුංචි කාශ්‍යප දිපු උත්තරේම. මේ එක එක සහල් ඇටය දිහා බැලුවොත් එහි වටිනාකමක් නැති උනත්, මෙයින් සහල් ඇට සියයක් පමණ ගතහොත් එක මිනිසෙකුගේ කුසගිනි නිවන්නට සෑහෙනවා. ඒ වගේ කිපයක් එකතු කළොත් එක පවුලක් සඳහා සෑහෙනවා. ඉතින් මුලු ලොකයම සෑදිලා තියෙන්නෙ පුංචි පවුල් වලින්, ඒ නිසා මේ එක සහල් ඇටයක් උනත් ලෝකයේ තියෙන අනිත් වටිනා දේ තරමටම අගෙයි. මේ කතාව අහපු සෘෂිවරය අනාවැකියක් පළකලා, කවද හරි මේ දරුව මහා ප්‍රාඥයෙක් වෙනව කියල. එදා ඉඳල ඒ ළමයට කනද තියල කිව්වෙ සහල් ඇටයට කී නම නිසා"

"ඒ ළමය දාර්ශනිකයෙක් උනාද ඉතින්"

"මම මුලින්ම කීවෙ ඒකනෙ. කනද තමයි මුලින්ම කීවෙ ඕනම දෙයක් කොටස් වලට වෙන් කරගෙන කරගෙන ගියොත්, යම් අවස්ථාවක් එනව ඒක තවත් ඊට වඩා කුඩාවට වෙන් කරන්න බැරි. ඒ අංශුවට එයා නමක් තැබුව පරම අණු කියල. මේක සිඳු උනේ යවන දේශයේ දෘර්ශනිකයො මේ ගැන සිතන්න ට බොහෝම ඉස්සර"

"අපි මේ හැම දෙයක්ම ඉගෙන ගත්තෙ ආර්යයන්ගෙන් නෙවෙයිද?" මිත්‍ර ඇසුවේය.

"නැහැ. ආර්යයන් ඉන්දියාවට එන කොට උන් දඩයම් කරගෙන ජිවත්වු ම්ලේච්ඡයො. ඒ වෙනකොට අපේ බොහොම දියුණු ශිෂ්ඨාචාරයක්, දර්ශනයක්, ගොවිතැන් ක්‍රම, විද්‍යා තාක්‍ෂණයක් තිබුන"

ඊට පසු දිනක සන්කර් ඔහුගේ පියා බැලීමට ගියේ ටික දිනකින් එහි නොයෑම තමා අතින් වූ වරදක් බව සිතමින්ය.

"මොකද මේ නන්නාඳුනන කෙනෙක් ගෙදර නවත්තගෙන ඉන්නවා කියන්නෙ?" සන්කර් ගෙට ගොඩවූ සැණින් පියා ඇසුවේය. වයස්ගත වීම නිසා වෙනදා මෙන් නිවසින් පිට යා නොහැකි වුවත්, මිත්‍ර ගැන ඔහුට ආරංචිවීම නිසා සන්කර් එනතුරුය ඔහු බලා සිටියේ.

"ඒ මනුස්සයට යන්න තැනක් නැති නිසා මම ගෙදර එක්කගෙන ආව"

"එහෙම කතා කරන්න කලියෙන් මගෙන් අහන්න තිබුණනෙ උඹට"

"මම අහන්න තමයි හිතා හිටියෙ, වැඩ නිසා එන්න විවේකයක් ලැබුණෙ නැහැ"

"ඔව් උඹට අප්පා බලන්න එන්න තමයි වෙලාවක් නැත්තෙ. පිට ඇයින්ට සලකන්න වෙලාව තියෙනව"

"අප්පච්චි එහෙම කියන එක වැරදියිනෙ. මම ඉඩක් ලැබෙන හැම වෙලාවෙම අප්පච්චි බලන්න එනව. ඊටත් ළමයින්ගෙ අම්ම හැමදාම ඇවිත් බලල යනවනෙ. අප්පච්චි අපේ ගෙදර ඇවිත් නවතින්නෙ නැතුවට මං මොනව කරන්නද"

"මම මේ ගෙදරින් යන්නෙ නැහැ. උඹටනෙ ඕන උනේ වෙනම ගෙයක් හදාගෙන යන්න, අපි යන්න කිව්වයැ" කියා පැවසූ පියා ඒ එක්කම මෙසේ ඇසුවේය, "ඔය මිනිහ ගැන මොනවත් වගතුග සොයල බලලද නවත්ත ගත්තෙ"

"වැඩිය මොනවත් දන්නෙ නැහැ, එයා අසරණයෙක් බව ඇරෙන්න. දන්නෙ නැවක සේවය කළ බවත්, උපන් රට පර්සියාව කියලත් විතරයි"

"එච්චරයි දන්නෙ?"

"ඔව්. මං හිතන්නෙ එයා ක්‍රිස්තියානි ධර්මය විශ්වාස කරන කෙනෙක්"

"ඉතින් උඹ එහෙම මිත්‍යාදෘෂ්ටිකයෙක් ගෙදර නවත්ත ගත්ත, ලොකු මහත් වෙච්ච දැරිවියෙකුත් ගෙදර ඉන්දද්දි?"

"පාලි හිටිය කියල මොකද වෙන්නෙ? ඒකි තාම පුංචි කෙල්ල"

"අර මිනිහගෙ නෙවෙයි, උඹෙයි ඇස් පේන්නෙ නැත්තෙ. ඔය රෝහලේ වැඩයි, දෙමළ අධිකාරි තනතුරේ වැඩයි හින්ද උඹෙන් ගෙදරට කෙරෙන්න ඕන යුතුකම් මග හැරෙනව. ඒ දැරිවි දැන් දිග දෙන වයස ඇවිත්. හොඳ තැනකින් සොයල ඒ කටයුතු කළානම් හොඳයි දැන" තාත්තා මඳක් උස් හඬින් කීවේය.

"ඕවට තව කල් තියෙනව"

"එහෙම කියන්න එපා පුතා. මම උඹලගේ හොඳටයි මේ කියන්නෙ. ඔය මිනිහ ගෙදර තියාගන්න එපා ගම්මු පද හදයි"

"මට මොකද ගමේ උන් මොනව කිව්වාම. මිත්‍ර හොඳ හැදිච්ච එකා. ඒ දෙන්නට දෙන්න කැමති නම් මගේ බෑන උනාට කමක් නැහැ කියල මට හිතෙනව"

"මොනව?" මෙවර තාත්තා සැබවින්ම කොපයට පත්විය, "උඹට පිස්සු හැදිගෙන එනවද? උඹ ඒ මිනිහ ගැන මොනවත් දන්නෙ නැහැ, අම්ම අප්පච්චි ගැන දන්නෙ නැහැ, පරම්පරාවක් ගැන දන්නෙ නැහැ, අපේ පවුල් වලට ගැලපෙනවද දන්නෙ නැහැ, අඩු ගණනෙ කේන්දරය වත් තියෙනවද?" ඔහු කෝපයෙන් වෙවුලන්නට විය.

"මම නිකන් විහිලුවට වගේ හෙම කිවුවෙ. අප්පච්චි කළබලවෙන්න එපා" සන්කර් වහා හුන් තැනින් නැගිට තාත්තාගේ උරයට අත තබා ඔහු සන්සුන් කරන්නට උත්සාහ කළේය.

"එයාව වෙන කොහේ හරි නවත්තපන්. ගෙදර තියාගන්න එපා" තාත්තා මඳක් සන්සුන්ව් කීවේය.

"කානගම රෝහලෙන් උත්තරයක් ලැබුණ හැටියෙ එයා යාවි. මම ඉක්මනටම මොනව හරි කරන්නම" කියා සන්කර් අම්මා සොයාගෙන ගෙතුලට පිවිසියේය. ඇය තාත්තාගේ කෑම පිළියෙළ කරමින් සිටියාය.

"උඹ හැමදාම ආවොත් අප්පව තරහ ගස්සනව" තැටියක් මත තිබූ බදින ලද කෙසෙල් පෙත්තක් ගන්නට සැරසුනු සන්කර්ගේ අතට පහරක් දෙමින් කීවාය. "උඹට කන්න ඕන නම් පැණි දාපුව ඇති අතන"

"මම අප්පට තරහ යන්න මොනවත් කිවෙ නැහැ. අප්ප කියනව මිත්‍ර ගෙදර තියාගන්න එපා කියල"

"මෙහාට එක්ක වරෙන් එයාව, මටත් බලන්න ඕන මිනිහව"

"අපෝ. අප්පට තවත් කේන්ති යයි" කී ඔහුට තවත් අදහසක් ආවේය. "අම්මලට බැරිද එයා මෙහේ නවත්ත ගන්න"

"අපි කොහොමද ඇස් පේන්නෙත් නැති පිට කෙනෙක් මෙහේ නවත්ත ගන්නෙ? කවුද එයා බලා ගන්නෙ, මට මේ තියෙන වැඩ මදිවටද?"

"මම ළමයින්ගෙ අම්මට කියන්නම් ඇවිත් උදවු කරන්න කියල. භාසුට බැරිය මිත්‍රගේ වැඩ කරල දෙන්න, දැන් කරනව වගේ"

"මං දන්නෙ නැහැ. මම හෙට එන්නම් බලන්න ඒ පැත්තෙ"

පසුදා සන්කර්ගේ මව ඔවුන්ගේ නිවසට පැමිණෙන විට භාසු හා මිත්‍ර පිල මත වාඩිවී කතා කරමින් සිටියහ. ඇය මිත්‍ර දෙස හොඳින් බැලුවේ ඔහුට ඒ බව නොදැනෙන බව වැටහීම නිසාය.

"මෙන්න මේව කපාගෙන දෙන්න එක්ක බොන්න" ඇය ලපටි තල් ගෙඩි කිහිපයක් ඔවුන් අසලින් තැබුවාය. භාසු වහා ගෙතුලට දුවගොස් පිහියක් රැගෙන ආවේය.

"ඒ අපෙ ආත්තම්ම. අපට තල් ගෙඩි ගෙනැත්" ඔහු තල් ගෙඩියක් කපමින් කීවේය. "මේව තාම මෝරල නැති නිසා අපට බොන්න පුලුවන්"

ඔහු කැපූ ගෙඩිය මිත්‍ර අතට දී එහි එක් බෑයක සිදුර තුලට ඇඟිල්ලක් දමා එහි ලොදය සූරාගන්නා අන්දම කියා දුන්නේය. ඇඟිල්ලට ගත් ලොඳ රස බැලූ මිත්‍ර වඩාත් කැමැත්තෙන් එය සූරාගන්නට විය. "හරිම රසයි නෙ"

"අයියා ඔය ගෙඩියම කන්න, මම තව එකක් කපන්නම්"

"එතකොට අනිත් අයට" මිත්‍ර ඇසුවේය.

"මේ ගෙඩි ටික අපි සේරටම ඇති"

"මේව මෙහෙම විතරද කන්න පුලුවන්"

"නැහැ. හුගක් මේරුවම පිට පැත්තත් සූරගෙන කන්න පුලුවන්. අපි වෙලාවක කමු" තල් ලොඳ රස විඳින අතර භාසු කීවේය. දැන් හුගක් තල් ගස් වලින් රා මදින නිසා ගෙඩි ලැබෙනව අඩුය"

සන්කර්ගේ මව බොහෝ වෙලාවක් ඔහුගේ බිරිඳ සමග කතා කරමින් සිටියාය.

"මම එහෙනම් යනව, සන්කර්ට කියන්න හවසට ඒ පැත්තෙ එන්න කියල" පිටව යන ගමනේ ඈ කිවාය.

සන්කර් පසුදා සවස දෙමාපියන් හමුවන්නට ගියවිට තාත්තා මුලින්ම ඔහුගෙන් ඇසුවේ මිත්‍ර ගෙදරින් පිට කළේද යන වගයි.

"තාම මොනවත් තීරණය කළේ නැහැ"

"මොනවද ඔය හැටි හිත හිතා ඉන්නෙ, යන්න කියන එකනෙ ඇත්තෙ?" තාත්තා කෑ ගැසුවේය.

"එහෙම යන්න කියන්න බැනෙ මට, මම මහ වෙද්නට වචනයක් දීල තියෙනවනෙ එයා බලා ගන්නව කියල"

"එහෙනම් ඉතින් වෙන තැනක් හොයල දෙන එකනෙ ඇත්තෙ එයාට නවතින්න"

"ඒක තමයි අද මෙහේ ආවෙ"

"ඇයි තැනක් හම්බ උනාද?"

"තාම දන්නෙ නැහැ" කියමින් තාත්තාගෙන් ගැලවීමට ඔහු අම්මා සොයාගෙන ගියේය.

"මිත්‍ර දැක්කද?"

"හ්ම්"

"ඉතින්"

"ඉතින් මොකද?"

"එයා හොඳද?, අම්මගෙ හිතට ඇල්ලුවද?"

"මං දන්නෙ නැහැ, මම කතා කළේ නැහැ"

"එහෙනම් මෙහේ එක්කගෙන එන්නද?"

"අප්පගෙන් අහන්න"

"ඔය ඉතින් අම්ම හදන්නෙ මට ආයෙත් බැනුම් අහගන්න වැඩක්. අම්ම කැමති නම් අප්ප මොනවත් කියන එකක් නැහැ, එතකොට අප්ප මට බනින්නෙත් නැහැ, මට මිත්‍ර ගැන බය වෙන්න ඕනත් නැහැ. අම්මටයි අපේ එක්කෙනාටයි පාලි ගැන බය වෙන්න ඕනත් නැහැ"

"මටත් ඒ ළමයා ගැන හරි දුක හිතුණා. මම පස්සෙ අප්පට කතා කරල බලන්නම්"

"මම දැන් අප්පට මොකද කියන්නෙ"

"දැන් උඹ මොනවත් කියන්නෙ නැතුව පලයං"

අන්තිමේදි තාත්තා කැමතිවූ පසු සන්කර්ට ඊළඟ ගැටලුව වූයේ මිත්‍රට ඒ බව කියන්නේ කෙසේද යන්නය. ඔහු එදින රාත්‍රියේ බිරිඳ සමග ඒ ගැන බොහෝ වෙලාවක් කතා කළමුත් විසඳුමක් ලැබුණේ නැත.

"කියන්න බැරිද තාත්ත කියනව කියල එහේ ඇවිත් නවතින්න කියල" ඇය ඇසුවාය.

"එයා තාම තාත්ත දැකලවත් නැහැ. ඒ හින්ද සමහර විට විස්වාස කරන එකක් නැහැ"

"ඇත්ත කියන්න බැරිද, අපේ ගෙදර තරුණ ගෑනු ළමයෙක් ඉන්න නිසා එයා මෙහේ ඉන්න එක හරි නැහැ, ඒ හින්ද තාත්තලගෙ ගෙදර යමු කියල. මං හිතන්නෙ එයා අමනාප වෙන එකක් නැහැ"

"මටත් හිතෙන්නෙ එහෙම තමයි. කොයි එකටත් මම හෙට මහ වෙද්නා එක්කත් කතා කරල බලන්න ඕන"

පසුදා උදේ ඔහු මහ වෙද්නා මුණ ගැසී ඔහුගේ ගැටලුව කියා සිටියේය.

"ඉතින් ඔබේ තීරණය මොකක්ද?"

"හරි අමාරු වැඩක් ස්වාමීන්වහන්ස, ඔබතුමාගෙ උපදේශයක් ලැබුණොත් හොඳයි"

"මට කියන්න බැහැ කුමක්ද කළ යුත්තේ කියල. මට පුලුවන් ඔබට තීරණයක් ගන්න යම් පැහැදිළි කිරීමක් කරන එක පමණයි, මේ ගැන ඔබේ බිරිඳ එක්ක කතා කළාද?"

"එහෙමයි ස්වාමීන් වහන්ස. ඒත් එයා අපේ අප්පා කියන දෙයකට වඩා ඉහළින් යන්නෙ නැහැ. ඒ හින්ද තීරණය මගේ පිටිම තමයි තියෙන්න"

"ඒ ගැන ඇයට වරදක් කියන්න බැහැ. අපේ සමාජය ඇගෙන් බලාපොරොත්තු වෙන්නෙ ඒක තමයි. ඒ උනාට ඔබට තේරුම් ගන්න පුලුවන් වෙන්න ඕන ඇගේ සිතේ තියෙන අදහස ඒ මොකද පිරිමි කොයි විදිහට ගෘහණිය පාලනය කරන බව හිතුවත් අන්තිමේ හැම දෙයක්ම කෙරෙන්නෙ ගෘහණියට අවශ්‍ය විදිහට තමයි"

"ඇගේ හිතේ ලොකු බරක් හැටියට තියෙන්නෙ ගමේ උදවිය දුව ගැන මොනව හරි පදයක් හදාවි කියන එක තමයි. දැනටමත් කිහිප දෙනෙක් ඇගෙන් අහල තියෙනව මිත්‍ර ගැන මහ කුතුහලේකින්"

"ගමේ අය කියන්න පුලුවන් දේවල් ගැන ඒ තරම් සිතන්න ඕන නැහැ. ඒ කතා නවත්තන්නත් අපට බැහැ. ඒ වගේම ඔබගේ නව තනතුර ගැන ඉරිසියා කරන අයත් ඇති"

"මම ඒ බව දන්නව. ඒ උනාට අපේ අප්ප මේ ගැන හරිම කේන්තියෙන් ඉන්නෙ"

"ඔබ මිත්‍ර ගැන මොනවද හිතන්නෙ?" එක් වරම මහ වේදනා ඔහුගෙන් ඇසුවේය

"එක එල්ලෙ උත්තරයක් දෙන්න අමාරුයි. ඒ උනාට ඒ තරුණය රෝහලේදි හමුවූ දවසෙ ඉඳල මට ලොකු පැහැදීමක් තියෙනව. ඒ එක්කම එයා ඉන්න තත්වෙ නිසා ලොකු අනුකම්පාවකුත් හිතෙනව"

"මිත්‍රට ඔබේ දුව විවාහ කර දෙන්න එහෙම අදහසක් තියෙනවද?"

"එහෙමම හිතල නැහැ. ඒ උනාට මට හිතේ කනස්සල්ලක් තියෙනව ඒ දෙන්නට දෙන්න සිත් ඇදිල ගියොත් කියල"

"ඒ ගැන සිතන්න තිබුණෙ මිත්‍ර ඔබේ ගෙදර නවත්වගන්න කලින්. මම හිතුව ඔබ මේ සියල්ලම ගැන හිතල තමයි ඒ තීරණය ගත්තෙ කියල. ඒකයි මම ඒ වෙලාවෙ මේ ප්‍රශ්නය ඇහුවෙ නැත්තෙ"

"මම දන්නෙ නැහැ ස්වාමීන් වහන්ස"

"සමහරවිට ඔබේ යටි සිත කැමති ඇති එහෙම එක්වීමක් වෙනවට. ඔබ පිළිගන්න අකමැති උනාට"

සන්කර් නිහඬව කල්පනා වට වැටුනේය.

"ඔබට හිතෙනවද මේ ගමේ හරි, අවට ගම්වල හරි ඉන්න තරුණයින්ට වඩා මිත්‍ර හොඳයි කියල? එහෙම නැත්නම් හදිසියෙ සිංහල තරුණයෙකුට කැමතිවෙනවට වඩා මේ තරුණය හොඳයි කියල?"

"සිංහල අය ගැන මගේ හිතේ කිසිම ප්‍රශ්නයක් නැහැ"

"හොඳයි, මිත්‍ර ඔබෙන් ඇහුවොත් දුව විවාහ කර ගන්න ඔබ මොකද කියන්නෙ?"

"මම කෙළින්ම ඒ ගැන හිතල නැහැ. මම හිතන්නෙ මම ඒක පිළි ගනියි. ඒ උනාට අප්පා නම් කීයටවත් පිළිගන්නෙකක් නැහැ"

"පිළිනොගන්න හේතුව, මිත්‍ර අන්ධ නිසාද, වෙන රටක නිසාද, ක්‍රිස්තියානි ආගම අදහන්නෙක් නිසාද?"

"ඒ හේතු තුනම නිසා වෙන්න ඇති"

"ඔබට විශ්වාසද ඇත්තටම ඔබ ඔහුට කැමතියි කියල? හොඳට කල්පනා කරල බලන්න, ඔබේ හිතේ තියෙන්නෙ මිත්‍රගේ අන්ධ භාවය නිසා ඇතිවුන අනුකම්පාවක් විතරක් නොවෙයිද කියල"

"මට විශ්වාසයි ඇස් දෙක සුව උනේ නැතත් ඔහු තෝරාගන්න ඕනෑම වෘත්තියක් ඔහු සාර්ථකව කරයි කියල"

"ඔබ ඔය තරම් ඔහුට කැමති නම් මම අප්පට කතා කරන්නම්"

"ඇස් නොපෙනීම, කුලය, රට, ජාතිය, ආගම මේ හැම එකක්ම ගැන අප්පා කැමති කර ගත්තත් කේන්දර ගැලපෙනවද කියල බලන්නෙ නැතුව පාලි විවාහ කරල දෙන්නනම් කැමති වෙන එකක් නැහැ"

"හොඳයි, මම කතා කරල බලන්නම්. එතෙක් ඔබට කරන්න තියෙන හොඳම දේ තමයි අම්ම කී විදිහට මිත්‍ර ඒ ගෙදර නවත්වන එක. එතකොට ගමේ අයගෙ කතා හැදෙන්නෙත් නැහැ, අප්පා තරහ වෙන්නෙත් නැහැ. අනිත් එක කවුද දන්නෙ සමහරවිට අප්පත් මිත්‍රට කැමති වෙන්න පුලුවන්, ටිකක් ආශ්‍රය කරන කොට"

"මගේ ඔළුවෙ තිබුණ ලොකු බරක් හැල්ලු උනා" සන්කර් මහ වෙද්නාගෙන් සමු ගනිමින් කීවේය, "තව පොඩි ප්‍රශ්නයක් තියෙනව"

"මම හිතන්නෙ නැහැ ඒක ප්‍රශ්නයක් කරගන්න ඕන කියල. මිත්‍රට ඇත්ත කියන්න. එයා තේරුම් ගනියි. මට විශ්වාසයි මිත්‍ර ඔබේ දෙමාපියන්ගේ ගෙදරට යන්න කැමතිවෙයි"

## ස්මූත්

යුරෝපය ප්‍රධාන කොටගත් බහු ජාතික සමාගමක අලුත්ම සොයාගැනීම ”ස්මූත්” කියා නම් කරනලදි.. එම වෙළඳ සමාගමේ මෙරට කළමනාකාරවරයා රාජු වූ අතර ඔහු සේවයකළ වෙළඳ ආයතනය, බහුජාතික සමාගමේ දේශීය වෙළඳ නියෝජිතයා විය. ඇමරිකා එක්සත් ජනපදයේ අලෙවි කිරීම ඇරඹී මාස තුනක් ඇතුළත ස්මූත් ලංකාවේ ලියාපදිංචි කර ගන්නට රාජුට හැකිවිය.

**ස්මූත්** ලියාපදිංචිකර ගැනීම එතරම් පහසුවුයේ එය නිශ්පාදනය කළ සමාගම ගැන වෛද්‍යවරුන් අතර තිබූ පිළිගැනීමත්, රාජු බටහිර බෙහෙත් මණ්ඩලය සමග තිබුණු සමීප සම්බන්ධයත් වීය. ඒ අතර සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් අති විශාල ප්‍රචාරයක් මේ ඖෂධය ගැන ලබාදෙන්නත් ඔහුට හැකිවිය. බටහිර රටවල **ස්මූත්** හඳුන්වනු ලැබුවේ කුරුලෑ නිසා පීඩා විඳින යුවතියන්ගේ එකම ගැලවුම්කාරයා ලෙසය.

**ස්මූත්** පිළිබඳ ප්‍රචාරක කටයුතු ඇරඹුණේ බෙහෙත ලංකාවට ගෙන්වන්නට බොහෝ කලකට පෙර සිටය. ප්‍රධාන වෛද්‍ය විශේෂඥයින් සඳහා එක් ප්‍රචාරක වැඩ සටහනක් පවත්වනු ලැබුයේ දකුණු මුහුදුබඩ තරු පහේ හෝටලයකදිය. රාජු ඒ සඳහා විශේෂ වෙහෙසක් ගත්තේය. තෝරාගත් වෛද්‍ය වරුන් පමණක් නොව ඔවුන්ගේ පවුලේ සැමටත් ඇරාධනා කෙරුණු අතර, ඔවුන් රැගෙන යාම සඳහා විශේෂ සුඛොපභෝගී දුමරියද වෙන්කරවා ගන්නා ලදි. ස්මූත් පිළිබඳ හඳුන්වාදීම කරණු ලැබුවේ ඒ වෙනුවෙන්ම ලංඩන් නුවර සිටි පැමැණි කථිකයෙකු විසිනි.. දේශනය පැවැත්වෙන අතර දොස්තරලාගේ ළමයින්ට ක්‍රීඩා වල යෙදෙන්නට අවස්ථාව සලසා තිබුණේය. ගැහැණුන්ට ඇඳුම් මොස්තර ප්‍රදර්ශනයක් ද, ඉන් අනතුරුව නාන තටාකයේ බැස නාන්නට හෝ, ආනයනය කළ ඉතා මිල අධිකවූ මත්පැන් වල පිහිනන්නට තරම් සහභාගාවූ හැමටම අවස්ථාවක් ලැබුණේය. එහි පැමිණ සිටි මාධ්‍ය වේදීන්ට ස්මූත් පිළිබඳ ඉතා පරෙස්සමෙන් සකස් කරනා ලද විස්තරයක් සපයන ලදි. සියල්ල හමාර වෙනවිට ඉර බැස යන්නට ආසන්න විය. අමතක නොවන දිනයක් තවදුරටත් සිහිපත් කරන්නට අගනා තෑග්ගක් බැගින් පැමිණ සිටි ලොකු කුඩා බාල වැඩිහිටි සැමදෙනාටමත් පිළිගන්වන ලදි.

එහෙත් මොන තරම් පරෙස්සමෙන් පිළියෙළ කරන වැඩ සටහනක වුවත් අඩු ලුහුඩුකම් වැලැක්විය නොහැකි බව සනාථ කරන්නට මෙන් රාජුටද එක් ගැටලුවකට මුහුණ දෙන්නට සිදුවිය. උවමනාවෙන් හෝ අතපසුවීමකින් හෝ වෛද්‍ය වරුන් කිහිප දෙනෙකු මෙ වැඩ සටහනින් අත්හැරුණේය. එයින් උරණ වී සිටි අය පසුදා ඔවුන් මුණගැසීමට ආ රාජුගේ වෙළඳ නියෝජිතයින් ට කතා කිරීම ප්‍රතික්ෂේප කළෝය.

”ස්මූත් කෝච්චියෙ ගිය අයටම ඔය බෙහෙත් ගිහිල්ල දෙන්න” යනු ඔවුන්ගේ ප්‍රතිචාරය විය. එහෙත් ඒ ගැන රාජු එතරම් කළබල නොවුයේ සති කිහිපයක්

තුළ ඒ හැම කෙනෙකුටම ස්මූත් අවශ්‍ය වෙන බවට ඔහු තුළ තිබූ විශ්වාසය නිසාය.

රාජුටත් ඔහුගේ කාර්යාලයේ සැමටත්, ගැහැණු දැරියන්ගෙන් හා ඔවුන්ගේ අම්මලාගෙන් බේරෙන්නට බැරි තරම් තත්වයක් උදාවිය. ස්මූත් ලංකාවට ගෙන්වන්නේ කවදාදැයි දැන ගන්නට ඔවුන්ට උවමනා විය. ඒ සඳහා නියම කරන ඕනෑම මිලක් ගෙවන්නට ඔවුහු ඉදිරිපත් වූහ. දන්නා අඳුණන අය මගින් රාජු අල්ලාගන්නට තවත් අය උත්සාහ කළහ. මේ අතර යාබද රට වලින් හොරෙන් ගෙන එන ලද ස්මූත් වෙළඳ පොළට ආවේය. ඒවා රුපියල් 1500 වැනි මිලකට අලෙවි විය. ස්මූත් ලංකාවට ආනයනය කළ විට පාලන මිල රුපියල් 700 කට වඩා වැඩි නොවන බවත්, නිශ්පාදන සමාගමටත් වෙළඳ සමාගමටත් වසර කිහිපයක් ගතවන තුරු අසීමිත ලාභයක් මෙයින් ලබාගත හැකි බවත්, රාජු දැන සිටියේය.

නීති විරෝධී ලෙස වෙළඳ පොළට ආ ස්මූත් ගැන රාජු යුරෝපයේ වූ ඔවුන්ගේ ප්‍රධාන කාර්‍යාලයට දැන්වූ විට ඒ ගැන කළබල නොවන ලෙසට ඔහුට උපදෙස් ලැබුනේය. ඒ වෙළඳාම නවත්වන්නට උත්සාහ නොකරන ලෙසත් පවසන ලදී. මොන රටෙන් ආවත් අනතිමට ලාභය යන්නේ මව් සමාගමටය. ඊටත් මේ නිසා තවත් ප්‍රචාරයක් බෙහෙතට ලැබෙන්නේය.

"ඔබේ වෙළඳ ප්‍රචාරක කටයුතු දිගටම කරගෙන යන්න, කවුරුහරි මාධ්‍ය කාරයෙක් එහෙම මේ හොර බඩු ගැන ඇහුවොත් ඒ ගැන මොනවත් දන්නේ නැතැයි කියන්න. ස්ථිරවම කියන්න පුලුවන් එකම දේ, ඔබේ සමාගම මගින් ස්මූත් ලංකාවට තවමත් ගෙන්වා නැති බව පමණයි" ඔහුට ලැබුනු උපදෙස් විය.

"ලියාපදිංචි සහතිකේ ලැබුණ හැටියෙම අපට බඩු ලැබෙයි නේද" රාජු බර්ලින් නුවර සේවය කළ ප්‍රධාන වෙළඳ අධ්‍යක්‍ෂක වරයාගෙන් ඇසුවේය.

"බඩු ලෑස්තියි, කොළඹින් එල්. සී. එක ලැබුණ ගමන් නැවට දාන්න පුලුවන්"

"ලබන සුමානෙ අනුමැතිය ලැබෙන්න ඕන. සහතිකය ගන්න තව සුමානයක් තියන්න පුලුවන්. ඒ කියන්නෙ තව ලබන මාසෙ මුල සතියෙ දියත් කරන්න පුලුවන්"

"ඒක හො□දයි. මටත් ඒ දවස් වෙන කොට කොළඹට එන්න පුලුවන් වෙයි"

හුස්ම ගැනීමටවත් විවේකයක් නොමැතිව රාජුට ඒ මාසයම පුරාම වැඩ කරන්නට සිදුවිය. අලුතින් වෙළඳ නියෝජිතයින් බඳවාගෙන, සිංගපූරුවට යවා ඔවුන්ට පුහුණුවක් ලබාදීම, ඔවුන්ට මොටර් රථ, හඳුනාගැනීමේ කාඩ්පත්, හා වෙනත් අවශ්‍ය දේ ලබාදීම ආදියට අමතරව, එකම දිනකදී මුලු ලංකාව පුරාම ස්මූත් බෙදා හැරීම ද සිඳුකිරීමට අවශ්‍ය වී තිබුණේය. ඔවුන්ගේ උප බෙදාහරින්නන් වෙත සෑම බෙහෙත් හලකින්ම වාගේ ඇනැවුම් සමග මුලු මුදලම ගෙවා තිබිණ. මෙය ඇසූ විට රාජුගේ මුහුණට මඳ සිනහවක් මතු වූයේ අනිකුත් බෙහෙත්

වෙළඳුන්ට, විශාල වට්ටම් සමග වුවත් ණයට මිස අත්පිට කිසිදාක විකිණිය නොහැකි බව සිහිවීමෙන්ය.

රාජු සේවය කළ සමාගමට වුවමනා වූයේ රුපියල් හත් සියයකට වඩා වැඩි මුදලකට ස්මූත් විකිණීමටය. ඒ මිළ මෙන් දෙගුණයක් වුවත් ගෙවන්නට මිනිසුන් කැමැත්තෙන් සිටිනා බව ඔවුහු දැන සිටියහ. එහෙත් ප්‍රධාන සමාගම එයට එකග වූයේ නැත. ඔවුන්ගේ එකගත්වය නැතිව මිළ පාලකගේ කණින් රිංගා මිල වැඩි කරන්නට ක්‍රමයක් නොවීය.

"ඩැඩි ඔය ස්මූත් කොච්චර සේෆ් ද?" දවසක් හැන්දෑවේ රාජු සැහැල්ලු සිතින් හා ගතින් යුතුව රූපවාහිනිය නරඹද්දි භානු ඇසුවාය.

"ඇයි? කවුද කියන්නෙ ඒක සේෆ් නැහැ කියල?" රාජුගේ කටහඬෙහි වූයේ අප්‍රසන්න බවකි. ඉතා සාර්ථක ලෙස ලංකාවෙ අස්සක් මුල්ලක් නොහැර ස්මූත් අලෙවි වෙමින් තිබූ වෙලාවකි මේ.

"ස්මූත් වල සයිඩ් ඉෆෙක්ටස් ගැන ඩැඩි දන්නවද?"

"ඒකෙ කිසිම සයිඩ් ඉෆෙක්ට් එකක් නැහැ. ඒක ඇමරිකාවෙ එෆ්. ඩී. ඒ. එකෙන් අනුමත වෙච්ච ඖෂධයක්. ස්මූත් සියයට සියයක් සේෆ්"

"ඩැඩි මට ඇමරිකන් ආහාර හා බෙහෙත් මණ්ඩලය ගැන කියන්න එන්න එපා. ඒගොල්ල අනුමත කරපු බෙහෙත් කොයි තරම්ක් පස්සෙ හකුලගෙන තියෙනවද, දොස්තරල ඉදිරියෙම ලෙඩ්ඩු මැරිල වැටෙන්න පටන් ගෙන"

"දුව මේ පත්තර කාරයො කියන ඒවට රැවටිලා. ඒ වගේ අවස්ථා දෙක තුනකට වඩා ඇති වෙලා නැහැ"

"මං ලැයිස්තුවක් අරගෙන දෙන්නද, ඉන්ටර්නෙට් එකෙන්"

"හ්ම්, එතකොට මෙකෙන් තමයි මෙයා මේ ඔක්කොම බහුබූත හොයාගන්නෙ. ඔය ඉන්ටර්නෙට් එකට මහ පට්ට පල් බොරු ලියල දාන පිස්සො හරියට ඉන්නව" රාජුගේ කේන්තිය වැඩි වන්නට විය.

"ඩැඩි මං විහිලුවට නෙවෙයි කියන්නෙ මේ. මම මේ දැන් කියෙව්ව ස්මූත් වලින් ලිවර් එක හොඳටම ඩැමේජ් වෙන්න පුලුවන් කියල. මට හරි බයයි සුනීතා ගැන. එයා ස්මූත් පාවිච්චි කළාද?"

"මොනවද මේ දූ කියන්නෙ?" එතැනට ආ චිත්‍රාට භානු අන්තිමට කී වචන ටික ඇහෙන්නට ඇත.

"මං මේ ඩැඩිට කියන්න හැදුවෙ සමහරවිට සුනීතගෙ අසනීපෙට මුල මේ ඩැඩිලගෙ මහඖෂධය වෙන්නැති කියල" භානු අම්මාට කීවාය.

"ඇත්තද මේ දුව කියන්නෙ?"

"ඒක කොහොමටවත් වෙන්න බැහැ. ස්මුත් හරිම ආරක්‍ෂා සහිත බෙහෙතක්"

"ස්මුත් ආරක්‍ෂා සහිත බෙහෙතක් නෙවෙයි. ඒකෙන් ලිවර් එකේ සෛල පටල විනාශ වෙනව. ඒ වගේ භයානක බෙහෙතක් අපේ රටට ගෙනා එක වැරදියි. මූනෙ කුරුලෑ එක්ක ජීවත් වෙන එක හොඳයි, ලිවර් එක දියවෙලා මැරෙනවට වඩා. ඩැඩීල හදන්නෙ ලංකාවෙ ඉන්න අහිංසක කෙල්ලන්ව මරන්න"

"භානු" චිත්‍රා මදක් උස් හඩින් දුවට කතා කළාය, "ඩැඩීට එහෙම කතා කරනවද? ඩැඩී දැනගෙන කරපු දෙයක් නෙවෙයිනෙ"

"ඒකෙ කිසිම භයානක කමක් නැහැ" රාජු යළිත් කීවේය.

"මම්, මං වැරැද්දක් කිව්වෙ නැහැනෙ. මං කවදාවත් ඩැඩීට වැරදියට කතා කරන්නෙ නැහැ. ඒත් සුනීත කියන්නෙ මගේ හොඳම යාලුව. මගේම නංගි වගෙයි මං එයා ගැන හිතෙන්නෙ. ඉතින් මගේ නංගි අපේ ඩැඩී විකුණන බෙහෙතක් හින්ද මැරෙන්න යන කොට මට තරහ යන්නෙ නැද්ද?" ඇය පෙරලා ඇසුවාය, "ඩැඩී දැනගන්න ඕන නේද බෙහෙතක් විකුණන්න ඉස්සෙල්ල ඒකෙ මොනවත් අතුරු රොග හැදෙන්න ඉඩ තියෙනවද කියල සොයන්න"

"දැන් අපි සුනීතට මොනවද කියන්නෙ, අපි කොහොමද කුමාරි ඇන්ටිගෙ මූණ බලන්නෙ?" අම්මාත් තාත්තාත් ගල් ගැසුණාක්මෙන් නිහඬව සිටිනා විට භානු ඇසුවාය.

"ඩැඩී දන්නවනෙ සියයට විසිපහකට වඩා ෆුල්මිනන්ට් හෙපැටික් ෆේලියර්[10] වෙන්නෙ ඔය බටහිර බෙහෙත් වලින් කියල" තවමත් නිහඬව සිටින පියාට ඇය යළිත් කීවාය.

"ඔයා ඇත්තටම සොයල බැලුවද මේ බෙහෙතෙන් මොකවත් වෙන අසනීප හැදෙනවද කියල?" භානු කතාකරන්නේ මොනවා ගැනදැයි නිසි අවබෝධයක් නොතිබුනත්, මේ බෙහෙත නිසා සුනීතාට යම් කිසි හානියක් වී ඇති බව වැටහීම නිසා චිත්‍රා සිය සැමියාගෙන් ඇසුවාය.

"මං එහෙම දෙයක් දැනගෙන හිටියනං මේ බෙහෙත ලංකාවට ගෙනේවි කියලද ඔයා හිතන්නෙ?" රාජු කවදාවත් නැතුව චිත්‍රාටත් සැර කළේය.

යළිත් ඔවුන් අතර නිහැඬියාවක් ඇතිවිය.

"ඩැඩී දැන් කරන්න තියෙන හොඳම දේ තමයි ඩැඩීලගෙ හෙඩ් ඔෆිස් එකට කතා කරල මේ ගැන අහන එක. ඒ ගොල්ල මේ වගේ කේසස් ගැන දැන් ඕන තරම් අහල ඇතිනේ. කරන්න ඕන මොනවද කියලත් ඒ හින්ද දන්නව ඇති.

[10] fulminant hepatic failure

ලංකාවට ගේන්න කලින් වෙන හුගක් රටවල මේ බෙහෙත විකුණුනානෙ. ඒ රට වල ගර්ල්ස්ලත් ලෙඩ වෙන්න ඇතිනෙ"

"එහෙම දේවල් උනානං මට දැනගන්න ලැබෙනව"

"සමහරවිට මාධ්‍ය කාරයින්ට පගාව දිල ඒ වගේ ප්‍රවෘත්ති සේරම යට ගහන්න ඇති. ඔය මහ ලොකු කොම්පැණි වලට ඒව සුලු වැඩනෙ"

"දැන් සුනිතගෙ තත්වෙ කොහොමද?" චිත්‍රා ඔවුන් දෙදෙනාට දැනට ඇති මූලික ප්‍රශ්නය සිහිපත් කළාය. "අපි දන්නෙ කොහොමද සුනිත ස්මූත් පාච්චි කළාද කියල"

"සමහරවිට සුනිතට ට්‍රාන්ස්ප්ලාන්ට් එකක් කරන්න වෙය" රාජු පහත් හඩින් කීවේය.

"මං හිතන්නෙ නැහැ ලංකාවෙ ලිවර් ට්‍රාන්ස්ප්ලාන්ට් එකක් කරන්න පුලුවන් කියල. ඇමරිකාවෙ එක්ක යන්න වෙයි නේද ඩැඩ්?" භානු කීවාය. "සුමනෙ අංකල්ට එහෙම සල්ලියක් නැත!ව ඇති"

"කොච්චර විතර යාවිද?" චිත්‍රා ඇසුවාය.

"ලක්‍ෂ දහයක් වත් යාවි අඩුම ගානෙ"

"තාත්තලගෙ කොම්පැණියට ගෙවන්න කියන්න. ඒ ගොල්ලන්ගෙ නෙ වගකීම"

"ඔයාට කියන්න නං ලේසියි" රාජුගෙන් එයට ලැබුණ පිළිතුර විය.

"මං මගේ රත්‍රං බඩු ටික සේරම විකුණල සුමනෙ අංකල්ට දෙනව ඒ සල්ලි"

"ඒව ඔයා හම්බ කරල ගත්තුවද එහෙම විකුණන්න " රාජු කෑ ගැසුවේය.

"නෑ. එක නිසා තමයි මං ඒව විකුණන්නෙ. මීට පස්සෙ මට කවදාවත් එව අඳින්න බැහැ, එව අර ගන්න ඩැඩ් සලිලි හම්බ කළේ කොහොමද කියල මතක් වෙනකොට"

"දූ කතා කරන්නෙ මං මහ අපරාධ කාරයෙක් වගේනෙ, පල් හොරෙක් කියල හිතාගෙන නෙ"

"ඔය විදිහට හම්බ කරන සල්ලි වලට ඉංග්‍රිසි බාසාවෙ නං හොඳ වචනයක් තියෙනව " ෆිල්ති ලූකර්[11] " කියල, මට දැන් තෙරෙනව සීය කියන කතාව "හම්බ කරනවයි, හරි හම්බ කරනවයි" කියන දෙක අතරෙ ලොකු වෙනසක් තියෙනව කියල"

---

[11] filthy lucre

මේ කතා කරන්නේ ඔවුන්ගේ සුරතල් දියණියදැයි අදහා ගත නොහැකිව රාජු ඇය දෙස බලා සිටියේය.

"ඩැඩ් මට ඕන සුනිත බේර ගන්න. ඩැඩ් එක්ක රංඩුවෙන්න නෙවෙයි. ඒකයි මං කියන්නෙ මේකෙ වගකීම ඩැඩීලගෙ කොම්පැණිය ගන්න ඕන කියල"

"අපි කිව්වෙ නැහැනෙ සුනීතට බෙහෙත පාවිච්චි කරන්න කියල"

"එහෙනං මොනවද ඩැඩීල මෙච්චර දවස් කළේ ? පත්තර වල කෙළවරක් නැති ලිපි පළ කරල, ටී. වී., රේඩියෝ චැනල් වල තොර තෝංචියක් නැතුව කියවල, දැන් කොහොමද ඩැඩ් කියන්නෙ කාටවත් බෙහෙත ගන්න කිව්වෙ නෑ කියල?"

"ඒ ප්‍රචාර කළේ මිනිස්සුන්ට අවබෝධයක් දෙන්න විතරයි. බෙහෙත් ගන්න ඕන, පාවිච්චි කරන්න ඕන දොස්තර කෙනෙක් නියම කළාට පස්සෙ. ආවට ගියාට කඩෙන් අරගෙන පාවිච්චි කරන්න නෙවෙයි අපි බෙහෙත් හදන්නෙ"

"සුනිත කවදාවත් ඩොක්ටර් කෙනෙක් කියන්නෙ නැතුව බෙහෙත් ගන්නෙ නැහැ. ඩැඩීත් හොඳටම දන්නව ඒක"

"එහෙනං එයා ඩොක්ටර් කියපු විදිහට බෙහෙත පාවිච්චි කළේ නැතුව ඇති. අඩු ගණනෙ පැකට් එක ඇතුලෙ තියෙන විස්තරයවත් කියවන්න ඕන නේ"

"ඩැඩ්, ඩැඩ් ඔය කියන්නෙ සුනිත ගැන. පුංචි කාලෙ ඩැඩ් වඩාගෙන හදපු, ඩැඩ්ගෙ පොඩි දුව ගැන" භානු හඩන්නට විය. "මං දන්නව මගේ ඩැඩ් ඔහොම කතා කරන්නෙ නැහැ. ඔය කතා කරන්නෙ ඩැඩ් නෙවෙයි. ඩැඩ්ගෙ කොම්පැණිය. උන් ඩැඩ් වත් බ්‍රේන් වොෂ් කරල"

"දැන් අපි මෙතන රංඩු කළා කියල ඒ ළමයට සනීප වෙන්නෙ නැහැනෙ. දැන් කරන්න තියෙන දෙයක් බලමු" චිත්‍රා කීවාය. "අපි මුලු ලෝකෙම බේර ගන්න ඉස්සෙල්ල අපේ දරුව බේරගන්න බලමු. මාත් හිතන්නෙ රාජු, ඔයාලගෙ කොම්පැණියට කතා කරන එක තමයි දැන් තියෙන්නෙ"

"මං උදේට ගියාම කියන්නං"

"අනේ ඩැඩ් හෙට උදේ වෙන කං ඉන්න එපා. හැම විනාඩියක්ම වටිනව. දැන් කතාකරන්නකො හෙඩ් ඔෆිස් එකට. ජර්මනියෙ තාම ඔෆිස් වැඩ ඇතිනෙ. මොනව හරි ඇන්ටිඩෝට් එකක් අහගත්තොත් දැන්මම ඒක දෙන්න පටන් ගන්න පුලුවන් නෙ. මෙහේ නැති එකක් නං ඒ ගොල්ලනට කීවොත් අදම කුරියර් කරල එවන්න කියන්න. නැත්නම් ඒකටත් හෙට හවස් වෙන කං ඉන්න වෙනවනෙ" භානු තාත්තා වාඩිවී සිටි පුටුව අසල බිම වාඩිවී ඔහුගේ උකුල මත හිස තබාගෙන ඉල්ලා සිටියාය.

"නැත්නං අපේ දොස්තරල මොන පිස්සු නටයිද දන්නෙ නැහැ, අපි නිකං වත් කිව්වොත් මෙක ඩ්‍රග් රිඇක්‍ෂන් එකක් කියල" තාත්තා නිහඬව සිටිනා විට ඈය යලිත් කීවාය.

රාජු චිත්‍රා දෙස බැලුවේය. වචන දහසකින් වත් කියන්නට බැරි දේ ඈගේ නිහැඬියාව තුල ගැබ්ව තිබුණේය. ඔහු හෙමහිට පුටුවෙන් නැගිට දුර කථනය වෙත ගියේය.

"මං අපේ වෙයාර්මන්ට කියල බලන්නං ඉස්සෙල්ල. මේක අපිටත් බලපාන ප්‍රශ්නයක්නෙ"

"රාජු" ඔහු දුරකථනයෙන් කතා කළේය, "පොඩි ප්‍රශ්නයක්, ස්මූත් පාවිච්චි කරපු ගෑණු ළමයෙක් අසනීප වෙලා... ඔව්........ ලිවර් ඩැමේජ් කියලයි හිතන්නෙ .......... නෑ නෑ ස්මූත් නිසාමදැයි කියල හරියටම කියන්න දන්නෙ නැහැ ...... ඒ උනාට ස්මූත් නිසා ලිවර් ඩැමේජ් වෙච්ච කේසස් වාර්ථා වෙලා තියෙනව ..... මේ ඉන්ටර්නේට් එකේ ........ ඉතින් අපි මොකද කරන්නෙ, නිකම් ඉන්නත් බැහැනෙ .......මං බර්ලින් වලින් අහල බලන්න ද .......... ඒ ගොල්ල දන්නව ඇතිනෙ ඇන්ටිඩෝට් එකක් තියෙනවනං .......... ඒ උනාට මේ ළමයට හුගක් අමාරුයි ........... අනිත් එක මගේ හොඳම යාලුවෙකුගෙ දුව ........." ඔහු දුර කථනය ආපසු තබා හෙමිහිට කලින් වාඩාවී සිට පුටුව වෙතට ගොස් වාඩිවිය. අම්මාත් දුවත් ඔහු කතා කරන තෙක් බලා සිටියහ.

"මොනවද කිවුවෙ" අන්තිමේ චිත්‍රා ඇසුවාය.

"හෙට ඔෆිස් එකේදි කතා කරමු කිව්ව" ඔහු බිඳුණු හඬකින් කීවේය.

"මොන අපරාධයක් ද මේක. සුනීතට අද රෑට මොනව හරි උනොත්" භානු කෑ ගැසුවාය.

"එහෙම අසුභ කතා කියන්න එපා දුව, අපි දෙවියන්ට කියමු" චිත්‍රා ඈය සනසන්නට තැත් කළාය.

රාජු නිහඬව කාමරය තුලට ගොස් මොහොතකින් එළියට ආවේ කලිසමකින් හා කමිසයකින් සැරසීගෙනය. ඔහු මෝටර් රියේ යතුර අතට ගන්නවා දුටු චිත්‍රා කලබලවිය.

"ඔයා ඉතින් මේ රෑ කොහේ යන්නද?"

"මං යනව හොස්පිටල් එකට"

"එහෙනං මාත් එනව" භානු වහා නැගිට්ටාය.

"ඔයාල එක්ක යන්න බැහැ දැන්. මේ වෙලාවට විසිටර්ස් ලට යන්න දෙන්නෙ නැහැ. අනික මං යන්නෙ සුනීත බලන්න නෙවෙයි. මං අඳුනන ඩොක්ටර් කෙනෙක් හම්බවෙන්න, මේ ගැන කතා කරන්න"

රාජු පිටව ගිය පසු භානු ඇගේ කාමරයට වැදී යලිත් අන්තර්ජාලයට ඇතුලු වුවාය. සුනීතාගේ රෝගය සොයා ගත් ලෙසටම එයට ප්‍රතිකර්මයකුත් මේ තුලින්ම සොයාගත හැකියැයි ඇය සිතුවාය. ස්මූත් නිසා රෝගීවූ තරුණියන් තව තවත් ඇයට හමු විය. ඔවුන් අතරින් සුවය ලැබූ එක් අයෙකු ගැනවත් විස්තර ඇතිදැයි ඇය සොයන්නට වූවාය. විනාඩියෙන් විනාඩිය ඉහළ යන අන්තර්ජාල බිල වත් දුරකථන බිල වත් ගැන ඇයට සිහිවූයේ නැත. ඔවුන්ගේ එකම දුර කථනය මේ සඳහා යොදාගෙන ඇති නිසා කිසිවෙකුටත් මේ වෙලාවෙ ඔවුන් අමතන්නට නෙහැකිවන බවත් ඇය නොතැකුවාය.

චිත්‍රා සිටි තැනම වාඩිවී රූපවාහිණිය දෙස බලා සිටියාය. එය ක්‍රියාත්මක කර නැති බව ඇයට දැනුණේ නැත. අම්මාත් තාත්තාත් වේලාසනින් නින්දට ගොස් තිබීම ගැන පමණක්ය ඇයට සිතට සැනසීමක් වූයේ.

වාහනය පදවන අතර රාජු කල්පනා කළේ ඔහුගේ සමාගමේ සභාපතිවරයා ගැනය. ඔහුගේ සිත මේ තරම් දරුණු යැයි ඔහු මෙතෙක් දැන සිටියේ නැද්ද යන්න රාජුගේ සිතට මතුවූ ගැටලුවයි. සුනීතා ලබාගත් බෙහෙත ඔවුන් ආනයනය කර බෙදා හැරී තොගයෙන්ද, නැත්නම් රටට හොරෙන් ගෙන ආ ඒවාදැයි යන ප්‍රශ්නය සභාපති විසින් මතු කිරීම ඔහුට විස්වාස කළ නොහැකි විය. ඒ මතින් දමා මේ ප්‍රශ්නයෙන් ඔහු ගැලවෙන්නට හදනවායැයි රාජුට සැකයක් ඇතිවය. ඒ ගැන භානුට පමණක් නොව චිත්‍රාටවත් නොකියන්නට ඔහු සිතාගත්තේ ඒ නිසාය.

පසුදා ඔවුන් සුනීතා බලන්නට ගිය විට ඇගේ රෝගයේ බරපතල බව නොහගවන්නට උත්සාහ කළෝය. විහිලුවෙන්. සිනහවෙන් ඇගේ තත්වය සැහැල්ලු කර පෙන්වන්නට ඔවුහු උත්සාහ කළහ. සුනීතාත් ඔවුන් හා සිනාවෙමින් සිටියත් ඈ සිටි අසාධ්‍ය තත්වය ගැන දැනසිටිනා බව භානුට දැනුණේය.

භානුගේ සිත තුල බුර බුරා නැගෙන කෝපය මුලින්ම යොමුවූයේ සිය පියා සේවය කළ සමාගම වෙතත්, ඔවුන් නියෝජනය කළ බහුජාතික සමාගමත් කෙරෙහිය. ඊළගට එය යොමුවූයේ තාත්තා වෙතය. එහෙත් ඒ සියල්ලටම වඩා ඇයට ඈ කෙරෙහිම තද කෝපයත් ඇතිවූයේ සුනීතාට වත් ඇගේ පියාටවත් ස්මූත් ගැන කියන්නට ඇගේ පියා විසින් පැනවූ තහංචිය නිසාය. මෙතෙක් කලකට සුනීතාත් ඇයත් අතර කිසිම රහසක් නොතිබූ බව සිහිවන විට ඇයට ඇගේ කෝපය ඉවසා සිටිය නොහැකි විය. තාත්තා ඔහුගේ සමාගමේ අයිතිකරුවන් සමග කතා කරන තුරු මෙය රහසක් සේ තබාගන්නා බවට ඇය තාත්තාට පොරොන්දු වූයේ ඇයිදැයි ඇයට දැන් සිතාගත නොහැකි විය.

ඇය සුනීතාට මුහුණ දෙන්නට බැරි නිසාවෙන් බැල්කනිය වෙත ළංවූවාය.

"දොස්තරලයි කියන ජාතිය ළගට නොගිහින් ඉන්න තරමට ලෙඩ නැතුව ඉන්න පුලුවන්" කිසිවෙක් කියනවා ඇයට ඇසුණේය. ඇගේ හා සමාන අදහස් ඇති කෙනෙක් මෙතැන සිටිදැයි කුතුහලයෙන් යුතුව ඇය ඒ දෙසට ඇඳුණාය. එතැන සිටියේ සුමනදාසගේ මල්ලි, ගුණදාසය.

"අන්කල් කියෙව්වද අර පහු ගිය දවසක ඩේලි නිවුස් එකේ තිබුණ ලිපිය, ඩොක්ටර්ස්ල ස්ට්‍රයික් කරපු දවස්වලට ලෙඩ්ඩු මැරෙනව අඩුයි කියල?" ඇය ගුණදාස ගෙන් ඇසුවාය.

"ආ, මේ අපේ භානු දුවනේ. මං කියෙව්ව ඒ ලිපිය. ඒ කියල තියෙන එක හරියටම හරි. අපේ රටේ විතරක් නෙවෙයි මීට අවුරුදු කීපෙකට ඉස්සෙල්ල ඉස්රායෙල් වල දොස්තරල මාසයක් වැඩ වර්ජනය කරල, ඒ මාසෙ ඇතුලත රෝහල් වල මැරුණ සංඛ්‍යාව බාගෙකින් අඩුවෙලා. කොලොම්බියාවෙ මාස දෙකක ස්ට්‍රයික් එකක් වෙලාවෙ සියයට තිස් පහකින් මරණ අඩුවෙලා" ගුණදාස කීවේය.
"මම නම් හරි කැමතියි මුන් ස්ට්‍රයික් කරනවානම් හැමදාම, එතකොට අපේ දුප්පත් මිනිස්සුන්ගෙ තුට්ටු දෙකත් ඉතුරුවෙයි, ලෙඩත් ඉක්මනට සනීප වෙයි"

"එතකොට ආංඩුවෙ ඉස්පිරිතාල වලත් හිස් ඇඳන් තියෙයි. ටික කාලෙකින් දොස්තරලට මිනිස්සු පස්සෙ එන්න වෙයි, බෙහෙත් දෙන්න" භානු කීවාය.

"එතකොට උසාවිය වගේ තියෙයි ඉස්පිරිතාල ළගත්. ලෙඩෙක් එනකොට කාක්කො වගේ දොස්තරල එයි පස්සෙන්, බෙහෙත් දෙන්න අල්ලගන්න" ගුණදාස සිනාසෙමින් එකතු කළේය.

"කොහෙන්ද ගුණේ මේ විස්තර හොයාගන්නෙ?" ඔහු හා කතා කරමින් සිටි තැනැත්තා ඇසුවේය. කලින් දැක තිබුනත් ඒ කවුදැයි භානු දැන සිටියේ නැත.

"මේව ගැන පළවෙන් සගරා, පොත් හරියට තියෙනවනෙ"

"එක දවසක් මං දැක්ක කවුද පත්තරේකට ලියල තිබුන, මිනිස්සු උපදින්නෙ කිසි ලෙඩක් නැතුව, එදා ඉඳල ජීවත් වෙන්නෙත් ලෙඩ නැතුව, ලෙඩ හැදෙන්නෙ දොස්තර ළගට යන්න පටන් ගත්තාම කියල"

"ඒක බොහොම හරි. මිනිස් වර්ගයා අවුරුදු ලක්ෂ ගණනක් මේ ලෝකෙ ජීවත් වෙලා තියෙනව, මොකෝ ඒ කාලෙ දොස්තරල හිටියද? මේ දොස්තරලයි කියන ජාතිය බෝ උනේ මෑතකදි නෙ. නිරොගීව ජීවත් වෙන්න නම් කෑම බීම හරියට අරගෙන, පිරිසිදු කම තියාගෙන, යහපත් ජීවිතයක් ගත කරනවා නම් දොස්තරල ඕන නැහැ. දොස්තරල ඉන්නෙ නැති ලෙඩ ඇති කරන්න. තියෙන ලෙඩ වැඩි කරන්න" ගුණදාස ඔහුගේ මතය ඉදිරිපත් කළේය.

"අනේ ඔය විකාර කතාව නවත්තන්නකො. ඔයා මේ ඉන්නෙ හොස්පිටල් එකක. මිනිස්සු මෙතෙන්ට එන්නෙ ඩොක්ටර්ස්ල හම්බවෙලා බෙහෙත් ගන්න. ඔය කියන තරම් ඩොක්ටර්ස්ල නරක නම් මේ තරම් මිනිස්සු එව්ව බෙහෙත් ගන්න. බෙහෙත් අරගෙන ලෙඩ සනීප වෙන අය ගැන ඔයාල කතා කරන්නෙ නැහැ"

ගුණදාසගේ බිරිඳ මදක් උරණවූ ලෙසින් කීවාය, "ඩොක්ටර් කෙනෙකුට ඇහුනොත් එහෙම"

"ඉතින් මට මොකද කාට ඇහුනම, ඒ ගොල්ල මට මොනව කරන්නද, මට බෙහෙත් කරන්න බැහැයි කියන්න ද? ඒක තමයි උන් මට කරන ලොකුම උදව්ව එහෙනං" ඔහු බිරිඳ කී දෙය නොතකා කතා කළේය, "ඔය දොස්තරලගෙ තියෙන ලොකුම ප්‍රශ්නෙ තමයි ඒ ගොල්ල නිරොගී කම ගැන දන්නෙ නැති එක. එයාල දන්නෙ ලෙඩ ගැන විතරයි"

"සේරම ඩොක්ටර්ස්ලට බනින එක වැරදියිනෙ, එක්කෙනෙක් දෙන්නෙක් නරක උනාට. කොයිතරම් හොඳ ඩොක්ටර්ස්ල අපේ රටේ ඉන්නවද?" ඔහුගේ බිරිඳ යලිත් තර්ක කළාය.

"මොනව? මේ අපේ රටේ? හොඳ දොස්තරල?" ඔහු මහත් විමතියෙන් මෙන් ඇසුවේය.

"ඇයි ඩොක්ටර් රාජසිංහ? දෙවියෙක් වගේ මනුස්සයෙක් නේ ඒ මහත්තය"

"ආ එයා ද" ගුණදාස වැඩි තැකීමක් නැතිව කීවේය.

"ඔයාට මෙච්චර ඉක්මනට ඒ මනුස්සය අමතක උනාද? ඇයි ඔයාට මතක නැද්ද එයා අපේ දුවට නිකං බොරු ඔපරේෂන් එකක් කරන්න හදන කොට නැවැත්තුවෙ"

"ඒ කවදද ඇන්ටි?" භානු ඇසුවාය.

"දැන් ටික කලක් වෙනව" ඇය කීවාය, "අපේ දුවට උණ ගැනිල දවස් කීපයක් යන කම් බහින්නෙ නැතුව තිබුණා. ඒ තරම් තද උණක් නෙවෙයි නිසා අපිත් ඔයි පැනඩෝල් දිදී හිටිය"

"ඔයි ඉතින් අපේ මිනිස්සුට වෙලා තියෙන්නෙ ඕකනෙ, මගුලට මනමාලි එක්ක යනකොට ගෙනියන්නෙත් ඔය මළ ඉලව්ව. ගෙදර අලමාරියෙත් තියාගන්නෙ ත් පැනඩෝල්. පොලිඩෝල් බොන එක ඊට හොඳයි, එක පාරට මැරෙන්න පුලුවන් විඳවන්නෙ නැතුව" ග!ණදාස ඒ අතරට පැන්නේය.

"ඔයා ඉන්නකො පැත්තකට වෙලා" බිරිඳ ගැස්සුවාය, "දවස් දෙක තුනකින් උණ බැස්සෙ නැතුවාම අපි එක්ක ගියා සුවසෙත හොස්පිටල් එකට. එතන හිටපු ලේඩි ඩොක්ටර් කෙනෙක් දුව පරීක්‍ෂා කරල කිව්ව ඇපෙන්ඩිසයිටිස් කියල. හොඳටම සීරියස් නිසා ඒ වෙලාවෙම ඇඩ්මිට් කරල ඔපරේට් කරන්න ඕන කියල"

"ඉතින්"

"මං ගුණේ අන්කල්ට කෝල් එකක් දීල එයත් ආව" ඇය භානුට කීවාය.

"මං ඇවිල්ල කිව්ව පිස්සු නැතුව දරුව ගෙදර එක්ක යමු කියල. යූරින් ටෙස්ට් එකක් කර ගන්න කියල තිබුණ, ඉතින් ඒකට සාම්පලය දීල අපි ගියා ගෙදර. මෙයාත් ඉතින් මට බැන බැන ගියා" ගුණදාස ශීලාට ඇඟිල්ලෙන් අනිමින් කීවේය.

"ඊට පස්සෙ මොකද උනේ?"

"හවස මං ගියා යූරින් රිපෝර්ට් එකත් අරගෙන ඩොක්ටර් රාජසිංහ ළඟට" ගුණදාස කීවේය. "මොකක්ද දන්නවද ඩොක්ටර් රාජසිංහ කීවෙ?"

"ඉතිං කියන්නකො අන්කල්, බෙහෙත් ජාති සියක් විතර දුන්නද?"

"මොන පිස්සුද, ඩොක්ටර් රිපෝට් එක බලල හිනාවෙලා කිව්ව මේ දරුවට තියෙන්නෙ පොඩි යූරින් ඉන්ෆෙක්ෂන් එකක්, ගෙදර ගිහිල්ල කොත්තමල්ලි ටිකක් තම්බල දෙන්න කියල"

"ඉතින් අර අනිත් ඩොක්ටර් කිව්වෙ ඇපන්ඩිසයිටිස් කියල"

"ඒ ඩොක්ටර්ගෙ තාත්ත තමයි ඒ හොස්පිටල් එකේ සර්ජන්. මිනිහට අහු උනොත්, සල්ලි ටිකක් තියෙනව කියලත් පෙනුනොත් කැපුව තමයි"

"ඉතින් ඒකනෙ මං කියන්නෙ ඩොක්ටර් රාජසිංහ තමයි අද ලංකාවෙ ඉන්න හොඳම ඩොක්ටර් කියල. සමහර අය කියනව ඩොක්ටර් රාජසිංහ ළඟට ගිහිල්ල කතා කළත් ඇති කියල ලෙඩ සනීප වෙන්න" ශීලා කීවාය.

"ඇත්ත. මිනිහ වැඩිය බෙහෙත් දෙන්නෙත් නැහැනෙ. සමහර වෙලාවට බෙහෙත් ලියන්නෙම නැහැ. බොරුවට අර ටෙස්ට් එකයි මේ ස්කෑන් එකයි කරන්න කියන්නෙත් නැහැ" ගුනදාස එකතු කළේය.

"මටත් ආසයි ඒ ඩොක්ටර් අඳුන ගන්න" භානු කීවාය.

"දැන් එයා කොළඹ නැහැනෙ. දැන් ප්‍රැක්ටිස් කරන්නෙ හෝමගම. එහේනෙ එයාගෙ ගම. ඒ උනාට තාම සමහරු කොළඹ ඉඳල එහේ යනව. දූවට බෙහෙත් ගන්න ඕන වෙලාවක කියන්න මං එක්ක යන්නම්" ශීලා කීවාය.

"අපෝ මං කවදාවත් දොස්තරල ගාවට යන්නෙ නැහැනෙ"

"මේ දරුවට විතරයි මොළේ තියෙන්නෙ" ගුනදාස ඇගේ හිස අතගෑවේය.

"මේ ඩොක්ටර් අනිත් අය වගේ නෙවෙයි නෙ"

"ඉස්සර කාලෙත් ඉඳල තියෙනව, මීට අවුරුදු දෙදාහකටත් වඩා කලින් අද වගේම සල්ලි වලට පෙරේත දොස්තරල, යන්තම් ටිකක් වෙදකම් මොනව හරි අහුල ගෙන සල්ලි හොයන්නම වෙදකම් කරපු අය"

"කියන්නකො අන්කල් ඒ අය ගැන"

"මේ වෙද්දු අතින් උනත් අහම්බෙන් වගේ ලෙඩෙක් දෙන්නෙක් හොඳ වෙනව. ඒ ගොල්ලන්ගෙ දක්‍ෂ කමක් නිසා නෙමෙයි, අර ලෙඩාගෙ වාසනාවක් තිබිල. දැන් වගේම තමයි. ඉතින් වෙදා හිතනව එයත් ජීවකයෙක් කියල"

"ඉතින් එක ලෙඩෙක් හොඳ කරල සල්ලි ගරන්නෙ කොහොමද?"

"මෙහෙමනෙ ඒක කරන්නෙ. මේ වෙද්දු යන යන තැන කයිවාරු ගහනව එයා කරපු හපන්කම් ගැන. මැරෙන්නම ගියපු ලෙඩෙක්, වෙන වෙද්දු සනීප කරන්න බැහැයි කියපු ලෙඩෙක්, එක බෙහෙත් වේලෙන් හොඳ කළා, අරෙහෙම කළා, මෙහෙම කළා කියල. හොඳ සල්ලි කාරයෙක් එහෙම ලෙඩ වෙලා කියල ආරංචි උනහම ඒ පැත්තෙ ටිකක් කරකැවෙනව. නැත්නම් තැරැව් කාරයෙක් දෙන්නෙක් යවනව, වෙදාගෙ හපන්කම් ලෙඩාට හරි, ලෙඩාගෙ පවුලෙ අයට හරි දන්වන්න"

"එහෙනං මේ අවුරුදු දෙදාහටම දොස්තරල කියන ජාතිය වෙනස් වෙලා නැහැ" භානු කිවාය.

"ඒ කාලෙ වගේම අදත් උන්ට වෙස්සන් කියන්න පුලුවන්. ඒ වචනෙ තේරුම් දෙකම උන්ට ගැලපෙනව"

"ඒ කිව්වෙ?"

"වෙස්සන් කියල වෙළඳුන්ට කියන්නත් පුළුවන් වෛශ්‍යාවන්ට කියන්නත් පුළුවන්"

"මේ පොඩි ළමයෙකුත් ඉන්න තැන මොනව කියවනවද මං දන්නෙ නැහැ" කියා ගුණදාසගේ බිරිඳ එතැණින් ඉවත් වූවාය

සුනිතා ඇමරිකාවට රැගෙන යාමට මුදල් සෙවීම සුමනදාසට මහත් ගැටලුවක් විය. අක්මාවක් බද්ධ කිරීමකට නම් යායුතුවූ එකම තැන ඇමරිකාව බව කාගේත් අදහස විය.

"ඇමරිකාවෙ මරණ සිඳුවන හේතු වලින් හත් වෙනි තැන තියෙන්නෙ ලිවර් ඩැමේජ්, ඒ හින්ද එහේ මේ ප්‍රතිකාර හුගක් දියුණුයි" ඔහු දන්නා හඳුනන එක් වෛද්‍ය වරයෙක් ඔහුට පැවසිය.

"සෑහෙන මුදලක් යාවි නේද, ටිකට් වලට විතරක් යාවි ට්‍රීට්මන්ට් වලට වඩා මගෙ හිතේ"

"ඊට වඩා ප්‍රශ්ණයක් වෙන්න පුලුවන් ලිවර් එකක් හොයාගන්න එක. මැරුණ කෙනෙකුගෙ එකක් හොයා ගන්න හරි අමාරුයි මං හිතන්නෙ" දොස්තර තව දුරටත් කිවේය.

"ඒකට මොකද කරන්නෙ"

"මං අහල තියෙනව ඇමරිකාවෙ නිපදවල තියෙනව කියල බයො ආර්ටිෆිෂල් ලිවර් එකක්[12] ඒක මුලින්ම හදල තිබුණෙ තාවකාලිකව හදිසි අවස්ථාවලට යොදාගන්න. මං සොයල බලන්නං දැන් ඒක වැඩිදියුණු කරල තියෙනවද කියල දිගටම පාවිච්චි කරන්න " දොස්තර කිව්වේය.

"ඒ කියන්නෙ මගේ දුව මොකක් හරි මැෂින් එකකට සම්බන්ධ කරල තියන්න වෙයි කියලද" සුමනදාස කලබල විය.

"නෑ. නෑ. එහෙම දෙයක් නෙවෙයි. මං සේරම විස්තර සොයල කියන්නම්" පැවසූ දොස්තර ඔහුගේ සිත අන් අතකට යොමු කරන්නට උත්සාහ කළේය. "ජනාධිපති අරමුදලෙන් ඇධාරයක් ඉල්ලුවෙ නැද්ද"

"මං දේශපාලනේ කරණ ඇයො කවුරුවත් අඳුනන්නෙ නැහැනෙ"

"ඒකට දේශපාලනෙත් එක්ක තියෙන සම්බන්දෙ මොකක්ද"

"ඩොක්ටර් හිතනවද ඇමති කෙනෙක් හරි උන්ගෙ හෙංචයියෙක් හරි අල්ලගන්නෙ නැතුව ඔය වගේ අරමුදලකින් සල්ලි ගන්න පුලුවන් කියල?"

"ඉතිං ඒ අරමුදල තියෙන්නෙ මිනිස්සුන්ට උදව් කරන්නනෙ"

"ඔව්, හැබැයි උන්ගෙ මිනිස්සුන්ට උදවු කරන්න, අපි වගේ අයට නෙවෙයි"

"ඒ උනාට මං අහල තියෙනව හුගක් කේසස් පිටරට ගිහින් වෛද්‍ය ප්‍රතිකාර ගන්න ජනාධිපති අරමුදලෙන් සල්ලි ලබාගනිපු අය"

"මාත් ඒක නම් අහල තියෙනව"

"ඉතින් ඇයි ඉල්ලන්නෙ නැත්තෙ"

"මං හිතන්නෙ නැහැ වැඩක් වෙයි කියල. ආධාර වැඩි හරියක්ම යන්නෙ ඒ ගොල්ලන්ගෙ හිතවත් උදවියට විතරයි. සමහර වෙලාවට ඒ ගොල්ලන්ගෙ ළමයි ඇමරිකාවෙ ඇරල උගන්නනත් එකෙන් සල්ලි දෙන්නෙ"

"ඒ හුගක් ඉස්සරනෙ. ඒකත් අර හරිම දක්ෂ ළමයෙකුට කොම්පියුටර් ඩිග්‍රී එකක් කරන්න යන්නනෙ ඒක දුන්නෙ"

"මොන පිස්සුද, ඒක රටේ මිනිස්සු ගොනාට අන්දල කරපු වැඩක්. ඉස්සෙල්ල පත්තර වලින් ලොකු ප්‍රචාරයක් දුන්න හරියට මේ ළමය එයින්සටයින්ටත් වඩා මොළ කාරයෙක් කියල. ඊ ළගට මෙහෙම දක්ෂයෙකුට ඉගෙන ගන්න ලංකාවෙ

[12] කෘතිම ජෛව අක්මාවක්

කිසිම පහසුකමක් නැහැ කියල. ඉතින් ජනාධිපති අරමුදලෙන් මෙහෙම කෙනෙකුට උදව් කරන එක හරි හොඳ වැඩක් කියල අන්තිමේ මිනිස්සු හිතුව"

"ඉතින් ඒක සාධාරණ නැද්ද"

"සාධාරණයි, ඇත්තටම ඒ ළමය එහෙම මොළ කාරයෙක් නං. ඒත් එවගේ, එහෙම නැත්නම් ඊට වඩා දහස් ගණනක් මොළේ තියෙන ළමයි ඉන්නව අපේ ගම් වල, පොඩි ඉස්කෝල වල. අනිත් එක කෝ අද ඒ ළමය? ඇමරිකාවෙ ගිහිල්ල අපේ සල්ලි වලින් ඉගෙන ගෙන දැන් ඉන්නෙ කොහෙද, මොනවද කරන්නනෙ? මොනවද අපේ රටට කරන සේවය?" සුමනදාස කියාගෙන කියාගෙන ගියේය.

"එක ජනාධිපති කෙනෙක් එහෙම දෙයක් කළා කියල හැමොම එහෙම කරනව කියන්න බැහැනෙ"

"අනේ මං දන්නෙ නැහැ"

"කොහොමහරි කමක් නැහැ. සල්ලි ලැබෙනවනං ඒකනෙ ඕන. පාඩුවක් වෙන්නෙ නැහැනෙ ඉල්ලුම් කළා කියල. මං උදව් කරන්නං සෙරම මෙඩිකල් රිපෝර්ට්ස් ටික හදාගන්න. ඉතුරු ටික රාජු අල්ල ගත්තම පුලුවන් වෙයි නෙ"

සුමනදාස මේ ගැන රාජුගෙන් ඇසුවිට ඔහු එයට සම්පූර්ණ සහයෝගය දෙන්නට කැමති විය.

"හෙට උදේම ඇප්ලිකේෂන් එක අරගෙන පුරවල දෙන්න. ඉතුරු හරිය මට බාර දෙන්න" රාජු ඔහුට කීවේය.

සුමනදාස මුලින්ම මුණ ගැසුණු හැටි රාජුට මතක් විය.

**ප්‍රජාපත්‍ය**

එදා සවස සන්කර් මිත්‍ර සමග මුහුදු වෙරළේ ඇවිදිමට ගියේය. මිත්‍රගේ සිත නොරිදෙන ලෙස ඉතා සැලකිල්ලෙන් වචන තෝරා ගනිමින් ඔහු තාත්තා ගැනත්, ගමේ සිදුවන කතා බහ ගැනත් කීවේය. දෙමාපියන්ගේ නිවසේ නැවතීම සඳහා පිළියෙළ කළ හැකි බව සන්කර් කී පසු මිත්‍ර මඳ වේලාවක් නිහඬව සිටියේය. ඔහුගේ නිහඬතාවය නිසා සන්කර්ට මිත්‍රගේ සිත රිදෙන්නට ඇතැයි කනස්සල්ලක් ඇතිවිය.

"සමාවෙන්න, මම නිසා ඔබට කරදරයක් උනාට. මම දැන සිටියේ නැහැ ඔබේ දුව එතරම් ලොකු මහත් වෙච්ච කෙනෙක් බව. දැන සිටියා නම් මම මුලින්ම මේ නිවසට ඒම ප්‍රතික්ෂේප කරනවා. දැන ගත් පසුත් මම ඒ ගැන නොතැකීම මගේ අතින් වුන වැරැද්දක්" මිත්‍ර පැවසුවේය. "මම දැනගෙන ඉන්න තිබුණ මිනිස්සු කතා හදයි කියල, ලෝකෙ කොහේ ගියත් මිනිස්සු එක වගෙයි. හමේ පාට, හැඩරුව, කතාබහ, ඇදහිලි විස්වාස වෙනස් උනාට ඔපාඳුප දෙඩීමටත් අනුන්ගේ දේවලට ඇඟිලි ගැහීමටත් ගියාම කවුරුත් එකයි" නොපෙනෙන දෑස් ඈත ක්ෂිතිජය දෙස යොමාගෙන තව දුරටත් ඔහු කීවේය.

"ඔබ කිසිම වරදක් කළේ නැහැ. මමනෙ ඔබට ආරාධනා කළේ අපේ ගෙදර නවතින්න"

"මම දන්නව. මම අද හවසම අප්පලාගෙ ගෙදර නවතින්න යන්නම්" මිත්‍ර සන්කර්ගේ අත අල්ලා ගනිමින් කීවේය.

"අද ඔබ කොහේවත් යන්නෙ නැහැ. එහෙම හදිසියක් නැහැ. හෙට වෙසක් පෝය. අපි හෙට ඈත පන්සලකට යන්නයි හිතාගෙන ඉන්නෙ. ඉතින් නිවි සැනසිල්ලෙ අපි අනිද්ද විතර අප්පලගෙ ගෙදර යමු"

පසුදා පෝය දා සන්කර් පවුලේ අයත් මිත්‍රත් කැටුව කඳුරුගොඩ[13] නාග විහාරය බලා පිටත්වුහ. මිත්‍ර කැටුව යාම ගැන සන්කර්ගේ බිරිඳ එතරම් සතුටක් නොදැක්වුවද ඒ ගැන කිසිත් නොකීවාය. භාසු මිත්‍ර අසලින් ගමන් කරමින් මග දෙපස දක්නට තිබූ දෑ විස්තර කරමින්, වරායේ සිට අනුරාධපුරය දක්වා දිවෙන මහා මාර්ගය ට අවතීර්ණ විය.

චුල්ලනාගගම[14] නම්වූ කුඩා ගම්මානය දක්වා පැමිණි ඔවුහු එතැනින් දකුණ දෙසට වූ අතුරු පාරකට හැරුණහ. ඔවුන් යන දිසාවටම ගමන් කරනා සෙනග ටිකින් ටික වැඩි වන්නට වූයේ සිද්ධස්ථානය නුඳුරේ ඇතැයි කියන්නාක් මෙනි.

---

[13] කන්දරෝඩෙයි
[14] චුන්නාකම්

"මල්ලි අහල තියෙනවද රෝහණයෙ ඉඳල ආපු කපුටා ගැන" පාලි අතරමගදී ඇසුවාය.

"නැහැ අක්කෙ, කියන්නකො ඒ කතාව, මමනෙ මෙච්චරවෙලා කතා කළේ"

"එකොමත් එක කාලෙක මහගම මහවැව කණ්ඩියෙ වැවුණු ඇසටු බෝ ගසක කපුටෙක් වාසය කළා"

"කොහෙද මහගම තියෙන්නෙ" භානු ඇසුවේය.

"බාදා කරන්නෙ නැතුව ඉන්න මල්ලි කියන කම්. මහගම තියෙන්නෙ රෝහණ ජනපදයෙ, ඈත දකුණු මුහුදු තීරයෙ " ඇය මිත්‍ර දෙස ඇස් කොණින් බලමින් කීවාය, " මේ කපුටා කෑම සොයාගෙන යන කොට රට පුරාම ගිහින් අන්තිමේ නාගදිපෙට[15] ආව. මෙහේදි ඔහුට හමුඋන කෙව්ළියක් එක්ක යාලුවෙලා ඇයව කැමති කරගෙන ඇයත් කැටුව ආපහු මහගමටම ගියා" අම්මාට නොඇසෙන්නට ඇය කීවාය.

"ඉතින්"

"ඉතින් එච්චරයි"

"අයියෝ, මම හිතුවෙ අක්ක කතාවක් කියන්න හදනව කියල"

එහි අවසානය දුක්මුසු බවත්, කෙව්ළිය මහගම පැමිණි පසු, කපුටාට තවත් පෙම්වතියන් කිහිපදෙනෙකුම සිටින බව දැනගන්නට ලැබීම නිසා ඇය කපුටා අත්හැර ආපසු නාගදිපයේ සුපුරුදු තල් ගසටම පැමිණි බවත්, ඇයට සිහිවූයේ කතාව කියන්නට ඇරඹූ පසුවය.

"මේ තමයි නාගදිපෙ තියෙන ලොකුම පන්සල" භානු මිත්‍රට පැවසීය.

"මම හිතා හිටියෙ අපේ ගමේ විහාරය හුගක් විශාලයි කියල" මිත්‍ර කීවේය.

"අපේ ගම අසල තියෙන්නෙ විශාල පිරිවෙණක්. මේ පළාතටම තියෙන විශාලම බුද්ධ ප්‍රතිමාව තියෙන්නෙත් එතැන. ඒ උනාට විශාලම දාගබ තියෙන්නෙ මෙතන" සන්කර් පැහැදිළි කළේය.

"නාගදිපෙ හුගක් විහාර තියෙනවද"

"ඔව්. අපි ගිහිල්ල තියෙනව ඒ හුගක් ඒවට" සන්කර්ගේ බිරිඳ කතාවට එකතු වෙමින් කීවාය.

---

[15] යාපනය

"ශ්‍රී මහා බෝධි අංකුරය ගෙන ආ තැන තිස්ස රජතුමා සමුද්‍ර විහාරය හැදුව, මීට අවුරුදු එක්දහස් දෙසීයකට ඉස්සර. ඒ රජ තුමා තව විහාර දෙකක් හැදෙව්ව තිස්ස විහාරයයි, පාචීනාරාමයයි" සන්කර් කීවේය.

"අපි ගිහිල්ල තියෙනව මංගන, ථූපවති, ධාතුසේන කියන විහාර වලට, නේද අප්පා" පාලි එකතු කළේ මෙවන් අවස්ථාවක අම්මා ඒගැන කිසිත් නොකියතැයි සිතාය.

සඳ එළියෙන් නැහැවී තිබූ මහා ස්ථූපයේ අසිරියත්, ඒ වටා දැල්වෙන පහන් වැට බැබළෙන අන්දමත්, දකින්නට මිත්‍රට නොහැකිවීම ගැන පාලිගේ සිත තුල ඇතිවූයේ තේරුම් ගත නොහැකි ශෝකයකි.

"ඉතාම සිහින්ව ඔය ඇහෙන සිරි සිරි සද්දෙ එන්නෙ මේ බෝ ගසේ කොළ සුළගට සෙලවෙන කොට. තල් කොල සෙලවෙන සද්දෙට වඩා හුගක් වෙනස් නේද? මේ බෝධිය හැදුනෙත් ශ්‍රීමහා බොධියෙ අංකුරයකින්. බුදුන් වහන්සේ බුද්ධත්වය ලැබුවෙ ශ්‍රී මහා බොධිය යටදි නිසයි අපි මේ ගසටත් වඳින්නෙ" ඇය විස්තර කළාය.

පසුදින සන්කර් හා භාසු සමග මිත්‍ර තාත්තාගේ නිවසට පිටත්වූයේ නොඑන්නට යන ගමනක් සේ පාලිටත් ඇගේ මවටත් පින් දී, දෑත් එකතු කර සමු ගැනීමෙන් පසුවය. මේ වතාවේ සැරයටියට අමතරව ඔහු සතුව සන්කර් විසින් දෙන ලද තවත් රෙදි කඩ දෙකක් තිබුණේය.

කිසිඳු වෙනසක් නොපෙන්වා සන්කර්ගේ පියා විසින් මිත්‍ර පිළිගන්නා ලදි. මිත්‍ර ගෙන් තාත්තා දහසකුත් එකක් ප්‍රශ්න අසතැයි සන්කර් තුල තිබූ බිය පලවා හරිමින් තාත්තා ඔහුට පිල මත වාඩිවෙන්නට උදව් වී, බුලත් හෙප්පුව අතට දුන්නේය.

"දැන් ඔබට සම්පූර්ණයෙන්ම සුව පාටයි. මට ආරංචි ඔබ මුහුදෙදි හමුවෙනකොට ඉතාම අසාධ්‍ය තත්වෙකයි හිටියෙ කියල"

"මින්දා මාව බේර ගත්තෙ නැත්නම් මම ඒ ඔරුව ඇතුලෙම මැරෙනව"

"මේ තරම් නුදුරින් රෝහල තිබුණ එක ඔබේ වාසනාව. නැත්නම් මම හිතන්නෙ නැහැ අපේ ගමේ කාටවත් පුලුවන් වෙයි කියල ඔබට බෙහෙත් කරන්න"

තාත්තාත් මිත්‍රත් කතාවට වැටුණ පසු සන්කර් අම්මාට කතා කරන්නට ගියේ මිත්‍ර ගේ අවශ්‍යතාවයන් ගැන සොයා බලන්නටය. මිත්‍රට මේ නිවෙස පුරුදු වෙනතුරු එදින භාසු එහි නවත්වන්නට ඔහු තීරණය කළේය. මිත්‍ර ඔහුගේ දෙමාපියන්ට කිසිම අයුරකින් බරක් නොවන්නට ඔහු වග බලාගත යුතු විය. මිත්‍ර හොඳින් බලා ගන්නා බවට ඔහුගේ මව සහතික වූවාය.

"මට හිතෙන්නෙ පාලිට හොඳ ගැටයෙක් උඹලට ලැබිල තියෙනව" ඇය පුතාගේ කණට ළංවී කීවාය.

"ඒකි තාම පුංචි කෙල්ල අම්මලට පිස්සු" ඔහු ආපසු යන ගමන් කීවේය. අම්මාගේ මුවග රැඳුනු සිහින් සිනහව ඔහු දුටුවේ නැත.

සන්කර් ඔහුට විවේක ලද දිනවල රාත්‍රියට පැමිණ සුපුරුදු පරිදි මිත්‍ර සමග කතා කරමින් සිටියේය. දැන් ඔහුගේ පියාද ඒ කතාබහට හවුල් විය.

පාලිට මේ කතා අසාගෙන සිටින්නට අවස්ථාවක් ලැබුණේ නැත.

භාසු සවසට පැමිණ මිත්‍ර සමග ඇවිදින්නට ගියේය. සමහර දිනෙක මුහුදු වෙරළටත් අනිත් දිනෙක එළවළු කොටුව වෙත හෝ පන්සල වෙතත් යාම ඔවුන්ගේ පුරුද්ද විය. පාලිට ඔහු හමුවූයේ කොරටුවට ආ දිනෙක පමණය. අම්මා සමග මුත්තනුවන්ගෙ 'ගෙදරට පැමිණියත් මිත්‍ර සමග කතා කිරීමට ඇයට අවස්ථාවක් ලැබුණේ නැත.

මිත්‍ර දුටුවිට එතරම් සතුටක් ඇයට ඇතිවූයෙත් ඇයිද කියාවත්, ඔහු නොපැමිණි දිනයක ඇගේ සිතට ශෝකයක් හා ඒ සමගම මල්ලීත් ඇගේ දෙමාපියනුත් කෙරෙහි කෝපයකුත් ඇතිවූයේ ඇයි කියාවත් තේරුම් ගන්නට පාලිට අපහසු විය. මිත්‍ර කොරටුවට ආ විට භාසු ඇයට කතා කරන තෙක් ඇය ඔවුන් නුදුටුවාක් මෙන් සිටියේ එතෙක් වේලා ඔවුන් එන තුරු මග බලබලා සිටි බව සඟවා ගන්නටය.

එක් දිනක් සැඳෑවක මිත්‍ර භාසු සහ පාලි මුහුදු වෙරළේ හුණුගල් තලාවක් මත වාඩිවී සිටියහ. එදා සන්කර් වේලාසණින් ගෙදර ආ දිනයක් විය. භාසු මිත්‍ර සමග වෙරළේ ඇවිදීමට යන්නදැයි තාත්තාගෙන් ඇසූ විට ඔහු ඊට එකග විය. පාලි තාත්තාගේ මුහුණ බලා ඇයත් යන්නදැයි නිහඬ පැනයක් නැගුවාය. සන්කර් අකමැත්තක් නැතැයි හිස සැලුවේ පාලි තවමත් ඔහුගේ දගකාර පුංචි කෙල්ල නේදැයි දැනුණ නිසා විය යුතුය.

මුලු බටහිර අහසම රතු පැහැයක් ගන්වමින් ඉර මුහුදේ ගිලෙන්නට විය.

"දැන් අහස මොන වගේද කියල කියන්න" මිත්‍ර ඉල්ලා සිටියේය.

"හරිම ලස්සනයි. ඉර දැන් මුහුදෙ ගෑවෙන්න ළගයි, වළාකුලු එකක් දෙකක් විතරයි අහසෙ තියෙන්නෙ" පාලි කීවාය.

"මුදෙ ඔරු තියෙනවද ඉර බහින තැන කිට්ටුව"

"දෙකක් තියෙනව" භාසු කීවේය.

"එයින් එකක් ඉර තියෙන දිසාවටයි යන්නෙ. ඉර බහින කොට සමහර විට ඒ හරහා යාවි" පාලි එකතු කළාය.

"වළාකුලුවල පාට වෙනස් වෙන කොට මට විස්තර කියනවද"

"ඒකට තව ටික වෙලාවක් යාවි"

"මම මුහුද මැද ඉන්න කොට හරි ආසයි ඉර බහිනව බලාගෙන ඉන්න. මට වැඩක් නැති වෙලාවක් උනොත් නිස්කලංක තැනක වාඩිවෙලා, ඒ වෙලාවට අහස දිහා බලා ඉන්නව"

"එතකොට මීට වඩා ලස්සන ඇති නේද" පාලි ඇසුවාය.

"ඔව්. ගොඩබිමදිට වඩා ලස්සනයි. ඒත් ඒ දිහා බලා ඉන්න කොට හරිම පාලුවකුත් කණගාටුවකුත් ඇති වෙනව"

"ඔයාගෙ ඇස් දෙකට මොකද උනේ කියල කියන්න බැරිද" පාලි පහත් හඬකින් මිත්‍රගෙන් ඇසුවාය.

"මම ඒ ගැන කතා කරන්න ආස නැහැ. අනිත් එක අහන්න ප්‍රසන්න දෙයකුත් නෙවෙයි"

"ඒකට කමක් නැහැ. ඊටත් ඒ ගැන කතා කරන එක ඔයාගෙ හිතට සහනයක් ගෙනදේවි"

"ඔයත් කතා කරන්නෙ අපේ අම්ම වගෙයි නෙ. ඇත්තටම ඔයා තාම ලාබාල කෙල්ලෙක්ද"

"නෑ. මම ඔයාගෙ අම්මටත් වඩා වයස ඇති" පාලි කීවේ ඔහුගේ සිත සැහැල්ලු කරන්නට සේය.

"එහෙනම් මම කියන්නම. ඔයා ඔය තරම් ජීවිතේ ගැන දන්නවනම් සමහරවිට මට මෙහෙම සිදු උනේ ඇයිද කියල තේරුම් කරන්නත් පුලුවන් වෙයි" ඔහු සිදුවූ දෙය විස්තර කරන්නට විය.

මිත්‍ර පර්සියාවෙන් නැව් නැංගේ, අශ්වයින් රැගෙන සුවර්ණපුර බලා යන්නටය. එක් දිනක ඔහු උදයේ අවදිවෙනවිට ඝන මීදුමක් පැතිරී ඇති බවක් දැනුණත් ඒ දිනවල මීදුම ඇති විය නොහැකි බව ඔහුට සිහිවිය. ඔහු දෑස් පිසදා යලිත් බැලුවත් වෙනසක් නොවීය. දැල්වෙමින් තිබූ පහන් එළිය වටා දේදුන්නක වර්ණ ඇති වලල්ලක් ඔහු දුටුවේය. නැව මතුපිටට ආවිට උදේ හිරු එළිය ඔහුගේ දෑසට මහත් වේදනාවක් ගෙන දුන්නේය. එහෙත් මඳ වේලාවකින් පෙනුම යලිත් පැහැදිලි වුයෙන් ඔහු සුපුරුදු වැඩ කටයුතු වල යෙදුණේය.

එය සිතින් බැහැර කර සිටියත් පසුදා උදේ අවදි වූ විටත් පෙරදිනයේ සේම මදඳුමක් සේ වූ අතර පහන වටා වලල්ලක් පෙනුණේය. ටික වෙලාවකින් අවට පැහැදිලිවූ හෙයින් ඔහු එය අමතක කළේය. දිනෙන් දින එය සිදුවන කාලය දික් වන්නට විය. වේදනාවත් වැඩිවිය. ඉන් පසු, දිනකට කිහිප විටක් ඇස් වල වේදනාව ඇති වුයෙන්, හුන් තැනම වාඩිවී හෝ යමක් අල්ලාගෙන වේදනාව පහවී යන තුරු ඔහු දෑස් පියාගෙන සිටින්නට ඔහුට සිඳුවුයේය. නොපැහැදිලි බවත් ක්‍රමයෙන් වැඩි වත්ම, දවසේ වැඩි වෙලාවක් ඇස් පිරිමදිමින් සිටින්නට ඔහුට සිදුවිය.

ඊළගට ඔහුට දැනුණේ ඇස් කොණින් කිසිවක් නොපෙනී යන බවත්, දිනෙන් දින ඇස් වලින් පෙනෙනා ක්ෂේත්‍රය අඩුවී, යතුරු සිදුරකින් බලන්නාක් මෙන් ඉදිරියේ ඇති යමක් පමනක් දැකිය හැකි බවත්ය. නැවේ සිටි කිසිවෙකුට මේ ගැන කළ හැකි යමක් නොවිය. මහ නැවියා ඔහු වැඩ පැහැර හරින්නට බොරු කරතැයි ඔහුගේ කතාව විස්වාස කළේ නැත. ඔහුට නැවේ ඇවිදින්නට සිදුවූයේ අතට අසුවෙන යමක ආධාරයෙන්ය. සමහර විට ඔහු අතවූ ආයුධයක් බිම වැටුන විට එය අහුලා ගැනීම ඉතා අපහසු විය. විටෙක ඔහු පය පැකිළි වැටුණේය.

නැවේ කිසිවෙක් ඔහුට අනුකම්පා කළේ නැත. ඇත්තටම ඔහුගේ පෙනීම අඩුවිගෙන යන බව ඔවුන්ට තහවුරු කරන්නට ක්‍රමයක් මිත්‍රට තිබුණේ නැත. ඔහු හිනිමගක කරුවක් අත්හැරී හෝ කඹයක පැටලී වැටුණ විටකදී, අනිත් නැවියන් ඔහුට සිනාසුනා මිස ඔහුගේ පිහිටට නොආවේය. ඔහුගේ උත්සාහයෙන්ම වැටුනු තැණින් නැගිටින්නට තැත් කරනවා බලමින් මිත්‍ර වටේ සිට ඔවුහු සිනාසුණහ.

රාත්‍රී නින්දට ගිය පසු ඔහුට නොදැනුවත්වම හැඩුනේ ගෙදර සිටියා නම් අම්මා ඔහුගේ ඇසට පිළියම් සොයන්නට වෙහෙසෙන බව සිහිවීමෙනි.

සති කිහිපයකට පසු දිනක උදේ ඔහු අවදිවූ විට මුලු ලොකයම තද අඳුරේ ඇති බව දැනුණේය. ඔහු සම්පූර්ණයෙන්ම අන්ධ වී ඇති බව වැටහෙන්නට මද වෙලාවක් ගත විය. ඔහු කෙසේහෝ නැව මතුපිට තට්ටුවට නැග ගත්තේය. අනිත් නැවියන් සිටිනා බව දැනුණ විට ඔහුට සිදුවී ඇති දේ මිත්‍ර කීවේය. එය විස්වාස නොකළ නැවියෝ මහ මඩින් සිනාසෙන්නට වුහ. මහ නැවියා මේ අසා එතැනට පැමිණි විට නැවියන් කිහිප දෙනෙක්ම එක වර කියා සිටියේ නැවේ අන්ධයෙක් සිටිනා බවයි.

මහ නැවියා ඔහුගේ දෙඋර අල්ලාගෙන දෑස දෙස හොඳින් බලා මහත් කෝපයෙන් ඔහු තල්ලු කර දමා ඔහුට සාප කරන්නට විය. මුලු දවස පුරාම ඔහුට නැව මත ඉන්නට සිදුවිය. එක් වරක් වයස්ගත නැවියෙක් ඔහුට කෑමට යමකුත් වතුර කොප්පයකුත් ගෙනැවිත් දුන්නේය. කිසිවක් කර කියාගත නොහී මිත්‍ර අසරණව වැතිර සිටියේය. ඔහුට කුමක් වේදැයි ඔහු නොදත්තේය. එහෙත් එදා සවස් වනවිට ඔහුගේ ඉරණම ඔහුට දැන ගන්නට ලැබුණේය.

මහ නැවියා ඔහු වෙත පැමිණ තව දුරටත් ඔහු නැවේ රඳවා ගත නොහැකි බව මිත්‍රට දන්වන ලදි. ඔහු නැවට අනවශ්‍ය හිරිහැරයක් බවත්, ඔහුට අහාර

හා ජලය වෙන් කිරීම පාඩුවක් බවත්, අනිත් නැවියන් ඔහු නැවටත් වෙළඳාමටත් අසුබ නිමිත්තක් සේ සළකන බවත් මහ නැවියා පැවසුවේය. මිත්‍ර කුඩා ඔරුවක නංවා අහාර සවල්පයකුත් වතුර භාජනයකුත් සමග මුහුදට පහත් කරන ලද්දේ ඉන් අනතුරුවය.

"මොන තරම් පිරිමහ ගන්න හැදුවත් දවස් දෙකකින් කෑමත් වතුරත් අවසන් උනා. මට හිතුණ මුහුදට පැනල මැරෙන්න. ඒත මගේ හිත ඇතුලෙන් මට ඇහුණ එහෙම කරන්න එපා කියල"

"ඔයා කොයිතරම් දුක් විඳල තියෙනවද" පාලි නොදැනුවත්වම මිත5ගේ අතින් අල්ලාගෙන හෙම්හිට අත ගෑවාය. භාසු කුමක් කියන්නදැයි නොදැන බලා සිටියේය.

"ඔයා දැන් අපේ පවුලෙ කෙනෙක් වගෙයිනෙ. දැන් දුක් වෙන්න එපා, දැන් ඉතින් අපි ඉන්නවනෙ" පාලි කීවාය.

"අප්පා කොහොම හරි ඔයාගෙ ඇස් සනීප කරන්න තැනක් සොයා ගනිවි" භාසු ඔහු සනසන්නට උත්සාහ කළේය.

"සමහරවිට කීරිමළේ පොකුණෙන් නැවොත් සනීප වෙයි" භාසු ඔවුන් අතර ඇතිවූ නිහැඩියාව බිඳලමින් යළිත් කීවේය.

"කොහෙද කීරිමළේ කියන්නෙ?" මිත්‍ර ඇසුවේය.

"මෙහේ ඉඳල වරුවක විතර දුර අවිදගෙන ගියාම පොකුනක් තියෙනව මුහුද අයිනෙම, ඉස්සර සොලි දේසෙ කුමාරිකාවක් ඇවිත් ඔය පොකුණෙන් නාල එයාට සුව උනාලු " භාසු කීවේය.

"එයාගෙත් ඇස් පෙනිල නැද්ද?"

"නැහැ, එයාට ඇස් අමාරුවක් තිබ්ල නැහැ මං හිතන්නෙ. කුමාරියට තිබුණෙ අශ්වයකුගෙ මුණක්. ඒත් මෙතන නෑවට පස්සෙ ලස්සන මූණක් ලැබුණලු, ඒ ළග තියෙනව කෝවිලක්, කුමාරිය හැඳුවයි කියන. එතෙන්ට කියන්නෙ මාවිට්ටපුරම් කියල. කෝවිලේ ඉඳල කීරිමලේට රහස් උමගක් තියෙනව"

"ඔය ඇත්තද?"

"මම නම් දන්නෙ නැහැ. කීරිමළේ පොකුණ කිට්ටුව කොවිලක් නම් තියෙනව මාවිට්ටපුරම් කියල. මාවිට්ටපුරම් කියන්නෙ අශ්ව මූණ මැකීගිය තැන" පාලි කීවාය. "ඒ උනාට ඔය රහස් උමගක් ගැන නම් මම දන්නෙ නැහැ"

"රහස් උමගක් තියෙනව" භාසු යලිත් කියා සිටියේය.

මේ වනවිට ඉර බැස ගොස් තිබුණේය. අහසේ ලස්සන දකින්නට ඔවුන්ට අමතක විය. සීතල සුළං පහරක් ඔවුන්ගේ ඇගේ වැදුනෙන් ආපසු ගෙදර යාමට වෙලාව ඇවිත් බව ඔවුන්ට වැටහින.

"කානගමින් ලිපියක් ලැබුණා" සන්කර් දිනක් මහත් කඩිනමින් පියාගේ නිවසට පැමැණියේය. මිත්‍ර එහි සිටියේ නැත.

"කෝ?" ඔහු තාත්තාගෙන් ඇසුවේය.

"මං දන්නෙ නැහැ"

මිත්‍ර භාසු සමග පිටවී ගිය බවත්, එළවලු කොරටුවේ සිටිය හැකි බවත් අම්මා ඔහුට කීවාය.

මිත්‍ර සිටියේ කොරටුවේය. පාලි පැවසූ කිසිවක් නිසා මිත්‍ර සිනාසෙනවා ඔහුට දුරටම ඇසුණේය. මිත්‍ර සිනාසෙන හඩ ඔහු ඇසූ මුල් වතාවය මේ.

"සුභ ආරංචියක් තියෙනව ඔබට" සන්කර් මිත්‍ර අසලට විත් පැවසීය.

"මොකක්ද?" මිත්‍රට කලින් එසේ ඇසුවේ පාලිය.

"කානගම රෝහලේ වෛද්‍යවරු කියා එවල තියෙනව මහ වෙද්නාට, මිත්‍රගේ ඇස් පරීක්‍ෂා කරල බලල වෙද කම් කරන්න පුලුවන් වෙයි කියල"

"හොඳ කරන්න පුලුවන් වෙයිද?" මිත්‍ර ඇසුවේය.

"මට විස්වාසයි. නැත්නම් එන්න කියන්නෙ නැහැ ඔය තරම් දුරක්"

"ඉතින් අයිය යන්නෙ කොහොමද? තනියම යන්න බැහැනෙ" භාසු ඇසුවේය.

"අප්පා මම යන්නද මිත්‍රට තනිවට?" පාලි නොදැනුවත්මවම වාගේ කියවුණේය.

"දුව වගේ පොඩි ළමයෙක් කොහොමද ඔය තරම් ඈුර ගමනක් යන්නෙ?" ඔහුට ඇසුණ දේ අදහා ගන්නට බැරිව සන්කර් පෙරළා ඇසුවේය.

"මට තනියම යන්න පුලුවන්. කවුරුවත් කරදර වෙන්න ඕන නැහැ. කවද්ද යන්න තියෙන්නෙ?"

"අපි දැන් ගෙදර යමු. මිත්‍ර එක්ක මම මහ වෙද්නා හමුවෙන්න යනව. උන් වහන්සේ අපට කියාවි කරන්න හොඳම දේ"

හැකි ඉක්මනින් මිත්‍ර ඇස් රෝහල වෙත යා යුතු බවත්, ඔහු හා තනියට කිසිවෙක් යා යුතු බවත් මහ වෙද්නාගේ අදහස විය.

"මට වැඩ රාජකාරි නැති උනානම් මම යනව" සන්කර් කීවේය.

"ඒක කරන්න බැහැනෙ. ඒ තරම් දිග කාලයක් ඔබට ගමෙන් වත් රෝහලෙන් වත් පිටවී ඉන්න බැහැ"

"හාසුත් තාම පොඩි වැඩියි"

"මට තනියම යන්න පුලුවන්" මිත්‍ර කියා සිටියේය.

"ඔබට තනිවම යන්න දෙන්න බැහැ. ඊටත් සමහරවිට රෝහලේදි සමහර ප්‍රතිකාර කරනකොට කවුරු හරි ළග ඉන්න අවශ්‍ය වෙනව" මහ වෙද්නා ඔහුගේ අදහසට එකග නොවීය.

"ගමේ කාට හරි කතා කරල බලන්න ඕන"

"රෑට තව ටිකක් කල්පනා කරල බලන්න. අපි හෙට උදේ තීරණයක් ගනිමු" මහ වෙද්නා උපදෙස් දුන්නේය.

සන්කර් මිත්‍ර ඇරලවන්නට ගිය වේලේ අම්මාට මේ ගැන පැවසුවේය. මිත්‍ර කැටුව යන්නට පාලි ඉදිරිපත් වූ බව ඔහු සිනාසෙමින් කීවේය.

"ඒක හිනාවෙන්න දෙයක් නෙවෙයි, මං හිතන්නෙ දූව එහෙම කිව්වෙ විහිළුවට නෙවෙයි" මව කීවාය.

"ඒ උනාට දූව කොහොමද යවන්නෙ?"

"ඉතින් ඒ ඉලන්දාරියට උඹ ඔය තරම් කැමතිනම් යන්න ඉස්සෙල්ල බන්දල දුන්නම ඉවරයිනෙ" ඇය ඇගට නොදැනී මෙන් කීවාය.

"දූව තාම පොඩි වැඩියි එහෙම දෙයක් ගැන හිතන්න"

"නෑ. දැන් පාලි බඳින වයස ඇවිත්. මාත් කැමතියි මගේ ඇස් දෙක පියවෙන්න කලින් මුනුපුරෙක්ව දකින්න"

"එයා දූව බැන්දොත් පර්සියාවට අරගෙන යාවි"

"මං හිතන්නෙ නැහැ, ඒ දරුව දැන් අපේ රටට කැමතියි"

සන්කර් ආපසු ගෙදර ගියේ මහත් අවුල්වූ මනසකින් යුතුවය. බිරිඳ සමග මේ ගැන කතා කළත්, පාලි විවාහ කරදීම ගැන හිත හදා ගැනීමට ඔහුට අපහසු විය. බිරිඳ ඊට අකමැතිවූයේ මිත්‍ර පිටරැටියෙකු වීමත්, ඔහු විසින් දියණිය ඔහුගේ රටට එක්කගෙන යතැයි ඇතිවූ බියත් නිසාය.

මහ වෙද්නා මේ ගැන ඇසූ විට මිත්‍ර හා පාලිගේ විවාහය ගැන ඔහුගේ අකමැත්තක් නැතැයි කිවූ බව ඔහුට සිහිවුවත්, දැන් තීරණයකට පැමැණිය යුතු අවස්ථාවේ ඔහුගේ සිතේ දෙගෙඩියාවක් අතිවූයේ ඇයි? සමහරවිට ඔහුගේ අකමැත්ත තිබුණේ රෝහණයට යන මේ ගමන දූව පිටත් කර යැවීම විය හැකිය.

පසුදා උදේ, ඔහුගේ සිතට ආ හැගීම් ඔහු මහ වෙද්නාට විස්තර කළේය. කවදා හෝ පාලි විවාහ කර දීමට ඔහුට සිදුවෙන බවත්, ඇය ඔහු සිතා සිටි කුඩා දැරිය නොවන බවත්, පාලි ට ඇගේම කියා අනාගත ජීවිතයක් තිබිය යුතු බවත් මහ වෙද්නා සන්කර්ට පහදා දුන්නේය. ඒ සමගම ඔහු කියා සිටියේ මිත්‍ර වැනි යහපත් තරුණයෙකු ලැබීම වාසනාවක් ලෙස සැලකිය යුතු බවයි. ඔහු පාලිට හොඳ සැමියෙකු වෙතැයි වෙද්නා විස්වාස කරන බවත් මහ වෙද්නා අවධාරනය කළේය.

සිංහල ජනපද හරහා දමිළ තරුණියකට ගමන් කරන්නට වීම ගැන ඇති බිය පිළිබඳව වෙද්නා පැවසුවේ, නාගදීපයත් මහගමත් අතර මහා මාර්ගය, ලෝකයේ ඉතාමත් ආරක්‍ෂා සහිත මාර්ගයක් බවයි. මිත්‍ර සමග නොව පාලිට තනිවම වුවත් මේ ගමන යන්නට බිය වය යුතුනැති බවයි ඔහු පැවසුවේ.

සන්කර්ට එදින රෝහලේ වැඩ කටයුතු ගැන සිත යෙදීම අපහසු විය. මේ ගැන කතා කරන්නට ඔහුට වෙනත් සමීප හිතවතුන් සිටියේ නැත. සිටියත් මහ වෙද්නාට වඩා උපදෙස් දිය හැකි කෙනෙක් ගැන ඔහුට සිතා ගන්නට බැරිය. ඔහු වෙනදාට වඩා කලින් රෝහලෙන් පිටවී තනිවම මුහුඳු වෙරළට පා නැගුවේය. ඔහු තල් ගසක් යට වාඩිවී අහසේ පාවෙන වළාකුලු දිහා බලාගෙන සිටියේය. ඔහු අනිත් සියලු සිතිවිලි පසෙක ලා පාවී යන වලාකුලු වල හැඩරුව වෙනස්වෙන අයුරු ගැන සිත යොමු කළේය.

බොහෝ වේලාවකට පසු එතැනින් නැගිට, හිරිවැටී තිබූ දෙපා ගසා දමා, පා නියපොතු වැල්ලේ අතුල්ලමින් ඔහු රළ බිඳෙන ඉසව්වට ගමන් කළේය. ඈත සෙල්ලම් කරන ළමුන් අතර භාසු සිටිදැයි ඔහු ඕනෑකමින් බැලුවේය.

"අප්පා, අපි මෙච්චර වෙලා ගෙදර බලාගෙන හිටිය අප්පා එනකම්" භාසුගේ කටහඩ ඇසී පසුපස හැරුණු විට ඔහු නෙත් ගැටුණේ ඔහු දෙසට එන භාසු, පාලි හා මිත්‍ර ය. ඔවුන් දැනටමත් එක පවුලක අය වගේ නේදැයි ඒ මොහොතේ ඔහුට සිතුණේය.

ඔහු තීරණයකට පැමිණියේය.

"පාලි ඇත්තටම මිත්‍ර එක්ක මේ ගමන යන්න කැමතිද?"

"ඔව් අප්පා. මට පුලුවන් මෙයා බලා ගන්න" ඈ ඉතා සතුටින් කීවාය.

"මිත්‍ර මොකද කියන්නෙ, පාලි එක්ක යන්න කැමතිද?"

"මම හැම තිස්සෙම කිව්වෙ මට තනිවම යන්න පුලුවන් කියල. ඒ උනත් පාලි එනව නම් මම හරි කැමතියි. මම ඔබට තවත් ණය ගැතියි" මිත්‍ර කීවේය "ඒත් මම පාලි එක්ක යන එක හරිද?"

"මම අම්ම එක්කත්, අපේ අප්ප එක්කත් කතා කරන්නම්. දූව විවාහ කටයුතු වලට සූදානම් වෙන්න" සන්කර් එක් වරම කීවේය.

"විවාහ වෙන්න?" පාලි තිගැස්සී සිටියාය.

"නැතුව දූව හිතුවද අම්ම යන්න දෙයි කියල මේ ගමන මිත්‍ර එක්ක" සන්කර් කෝපවූ බවක් පෙන්වීමට තැත් කරත් ඔහුගේ මුහුණේ වූ සිනහව මකා ගන්නට ඔහුට බැරිවිය.

තාත්තාගේ හෝ මිත්‍රගේ මුහුණ බැලීමට නොහැකිව පාලි බිම බලාගෙන පා ඇගිලි වලින් වැලි හාරන්නට තැත් කළාය. හාසු කුමක් සිඳුවන්නේදැයි සිතා ගත නොහැකිව එකානෙකා දෙස බලන්නට වූයේය.

ඔවුහු ආපසු නිවස දෙසට හැරුණෝය. හාසු එක අතකින් මිත්‍රගේ අතත් අනිකෙන් පාලිගේ අතත් අල්ලාගෙන, දෙදෙනාට මැදින් ගමන් කළේ ඔවුන් ගෙන් වෙන් වන්නට වෙතැයි ඇතිවූ බිය නිසා විය යුතුය.

සන්කර්ගේ හා ඔහුගේ බිරිඳගේ දෙමාපියන් හැරුණු විට විවාහෝත්සවයට සහභාගී වූයේ මහ වෙද්නාත් වන්නත් පමණක් විය.

විවාහය සිදු කරන ලද්දේ ඉතා සුලු චාරිත්‍ර කිහිපයක් අනුගමනය කිරීමෙන්ය. මිත්‍ර සන්කර්ගේ නිවසට පැමිණියේ මහ වෙද්නා සහ වන්න සමගය. හාසු පැන් කෙණ්ඩියකින් ඔහුගේ දෙපා දෝවනය කළේය. මිත්‍ර ඒ භාජනයට කාසියක් දැමුවේය. හොඳින් අතුගා තිබූ මිදුලේ එලූ තිබූ පැදුරක් මත ඉන් අනතුරුව ඔවුන් වාඩිවූහ. පාලි, අම්මා කැටුව ගෙයින් එළියට පැමිණියාය. මිත්‍ර ඈ එනු දැක නැගී සිටියේය. සන්කර් නව යුවලගේ දෑත් එකතු කර මිත්‍රට ඔහුගේ දියණිය එතැන් සිට බාර කරන බවත්, ඇය හොඳින් රැක බලා ගතයුතු බවත් කියා පාලිටද එසේම පැවසුවේය. දෙදෙනාම සන්කර් ඉදිරියේ දණින් නැමී වැඳ ඔහුගේ ආශීර්වාද ලදහ. ඊට පසු ඔවුන් දෙදෙනා අම්මාටත් අනිත් වැඩිහිටියන්ටත් වැඳ අවසර ගත්හ.

විවිධ වූ රස කැවිලි වගී, කිරි හා කෙසෙල් සංග්‍රහ පිණිස පිළියෙළ කර තිබුණේය.

ඊළග දින දෙක කාටත් වැඩ බහුල දිනයන් වූයේ මේ දෙදෙනාට ගමනට අවශ්‍ය කලමනා සැකසීමට තිබූ නිසාය.

## ගාන්ධර්වී

රාජු කොළඹ රැකියාවට පැමිණ මුළින්ම නැවති සිටියේ බත්තරමුල්ලේය. හැමදාම උදේට සුමනදාසත් ආවේ රාජු පැමිණෙන බස් නැවතුමටමය. ඔහු ගැන රාජුගේ අවධානය විශේෂයෙන් යොමුවූයේ ඔහු සැමදාම එකම වෙලාවට බස් නැවතුමට පැමිණීම නිසාය. ඔහු නැංගේත් රාජු ගමන් කළ බසයේමය. සුමනදාස හැමදාමත් ඇන්දේ සුදු අත් දිග කමිසයත් කලු කලිසමකුත්ය. රජයේ කාර්යාල වල නිලධාරින් පාවිච්චි කළ කලු සම්න් කළ බ්‍රීෆ් කේස් එකක් ඔහු අතේ තිබුණේය.

ටික දවසකට පසු ඔහු රාජුට ''ගුඩ් මොනිං'' කියා කීවෙය. රාජුත් ''ගුඩ් මෝනිං'' කිවේය. ටික දිනක් යනතුරු දෙදෙනා අතර සම්බන්ධය එපමණක් විය.

පාලු දූපතක අතරමංවූ ඉංග්‍රිසි ජාතිකයන් දෙදෙනෙක් මාස ගණනාවක් එකිනෙකා හා කතා නොකර සිටි කතාවක් රාජුට සිහිවිය. ඔවුන් එසේ කතා නොකළේ කිසිවෙක් ඔවුන් දෙදෙනා එකිනෙකාට හඳුන්වා දි තිබුණේ නැති නිසාය.

''අද නං බස් එක පරක්කුයි වගේ '' දවසක් ඔහු රාජුට පැවසීය.

''ඔව්. ඒක තමයි, අද නං ලේට් වෙයි ඔෆිස් යන්න '' රාජු උත්තර ඳුන්නේය. ප්‍රමාදය ගැන ඒ වන විටත් රාජුගේ සිතට කනස්සල්ලකට හේතුව් තිබුණේය. ප්‍රථම රැකියාවේ මුල් දිනවලදිම ප්‍රමාදව් කාර්යාලයට යන්නට ඔහු සිත තුල බයක්ද හට ගත්තේය.

''මං හිතුවෙ බොරැල්ලට ගිහින් යන්න කියල, ඔයා කොහාටද යන්නෙ?''

''මං යන්නෙ බම්බලපිටියට'' රාජු පිළිතුරු ඳුන්නේය.

''බම්බලපිටියෙ කොයි හරියෙ ද?''

''සෙන් පීටර්ස් කිට්ටුව''

''එහෙනං බොරැල්ලට යමු. එතන ඉඳල 154 යන්න පුලුවන්. මාත් යන්නෙ ඒකෙ තමයි''

රාජු ඔහුගේ මිතුරන්ද සමග සුමනදාස නැගි බස් රියටම නැංගේය. ඔවුනට් එතරම් කොළඹ පාරවල් ගැන අවබෝධයක් නැති බව දැනී බොරැල්ලේදී සුමනදාස එතනින් බසින්නට ඔවුන්ට මතක් කළේය. බසයෙන් බැස 154 බස් නවතන තැනට ඔවුහු ගමන් කළහ. එතැන බස් රිය දෙකක් නවතා තිබුණත් ඒවා යන්නේ බම්බලපිටිය හංදිය දක්වා පමණක් බවත් ඔවුන්ට ගල්කිස්ස දක්වා යන බසයක් එනතුරු සිටිය යුතු බවත් සුමනදාස කීවේය.

"කොහේද වැඩකරන්නෙ ?"

"කළුබෝ ෆාමසුටිකල්ස් වල, අපි හතරදෙනාම ළඟදි ආවෙ, බණ්ඩාරවෙල ඉඳල" රාජු ඔහුගේ මිතුරන් දැක්විය.

"මං අඳුනනව මිස්ටර් ෆනැන්ඩු"

"අපි තාම අලුත්නෙ හුගක් අය අඳුනන්නෙ නැහැ" රාජු කීවේය.

"එයා වැඩ කරන්නෙ එකවුන්ට්ස් වල. මං වැඩ කරන්නෙ සිමෙන්ට් කොපරේෂන් එකේ" තවමත් ඔවුන් එකිනෙකාගේ නම් දැන සිටියේ නැත. ඔහුගේ නම සුමනදාස බව රාජු දැනගත්තේ ඊට දින කිහිපයකට පසු දිනක වෙනත් අයෙක් ඔහුට ඒ නමින් කතා කළ විටය. රාජුගේ මිතුරන් බස් නැවතුමේදී ඔහුට නමින් අමතන නිසා ඔහු රාජුගේ නම දැනගෙන සිටින්නට ඇත.

සුමනදාස රාජුට වඩා අවුරුදු කිහිපයක් වයසින් වැඩි බවක් පෙනුණේය. ඔහුගේ ගම මාතරය. ඉගෙන ගෙන තිබුනේ රාහුලේය. බී. ඒ. උපාධිය ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන්ය. සෙවය කළේ උපාධිධාරී අභ්‍යාසලාභියෙකු ලෙසය. උපාධියක් තිබුණත් එවකට සුමනදාසගේ වැටුප රුපියල් දෙදහසක් පමන බව රාජු පසු කලෙක දැනගත් විට තමා ඒ අතින් කොපමන වාසනාවන්තදැයි කියා ඔහුට සිතුනේය.

වාසනාවද, නැත්නම් සෙන් තෝමස් වැනි විද්‍යාලයක අධ්‍යාපනය ලැබීම් නිසා ලද වරප්‍රසාදයක්ද? එහිදී ලද ඉංග්‍රීසි දැනුමත්, කොළඹ සමාජයට උවමනා හැඩගැස්මත් නිසා නොවේද අද තමා මේ තරම් ඉහල වැටුපක් ලබමින් සැපවත් ජීවිතයක් ගත කරන්නේ? සුමනදාස තවමත් පිරිස් කළමනාකාරවරයෙකු ලෙස ලබන්නේ රුපියල් 15000 පමණය. තවමත් ගමන් කළේ බස් රියෙන්ය. නිවාස ණයක් ලබාගෙන තනන්නට ආරම්භ කළ නිවසේ තවමත් අඩක්වත් නිම කරගන්නට නොහැකිව ඇත.

මෙහෙම තත්වයක හිඳ සුමනදාස රුපියල් ලක්ෂ හතරක් සොයාගන්නේ කෙසේදැයි රාජුට සිතාගත නොහැකිය.

"අපට බැරිද සුමනෙලට සල්ලි ටිකක් හොයල දෙන්න?" එදා රෑ නින්දට ගිය පසු චිත්‍රා ඇසුවාය.

"මාත් මේ කල්පනා කළේ ඒක තමයි.. කීයක් විතරද ඔයා හිතුවෙ?"

"මං හිතුවෙ ලක්ෂයක් විතරවත් දෙන්න කියල. සුමනෙට පුලුවන් දවසක ආපහු දෙන්න"

"ඒ ගොල්ල ළඟ කීයක්වත් නැතුව ඇති"

"මං ඇහුව කුමාරි ගෙන්. රුපියල් පනස්දාහක් විතර සුනීතගෙ පොතේ තියෙනවලු  එච්චර තමයි. එයා අයියගෙන් ඇහුවලු සල්ලි ටිකක් ගැන. ඒත් ඉතින් සුමනෙ කැමති නැහැනෙ චිත්‍රගෙ අයියගෙන් සල්ලි ඉල්ලන්න"

"මං දන්නව. සුමනෙ තාම සමහරදාට කියනව ඒ දවස්වල කුමාරි බඳිනවට විරුද්ධ වෙච්ච හැටි" රාජු සිහි කළේය.

"ඒ උනාට මේ වෙලාවෙ සුමනෙත් ඔය පරන කොන්තර අමතක කරල කාගෙන් හරි සල්ලි ටිකක් හොයාගන්න නෙ බලන්න ඔන. මොනව හරි කරල දරුව සනීප කර ගන්න"

සුමනදාසටත් කුමාරිටත් විවාහ වෙන්නට ඔවුන් උදව් කළ හැටි චිත්‍රට අදවගේ මතකය.

චිත්‍රාගේත් රාජුගේත් විවාහයෙන් සති කිහිපයකට පසු දිනක සුමනදාස ඔවුන් දකින්නට පැමැණියේය.

"කොහොමද කුමාරි ගෙ තොරතුරු" චිත්‍රා ඔහුගෙන් ඇසුවාය.

"හුග දවසකින් හම්බ උනේ නැහැ" රාජුගේ අම්මා විසින් සාදන ලද වඩේ එකක් කමින් ඔහු කීවේය.

"ඇයි මොකක්ද ප්‍රශ්නෙ?" රාජු පිගානෙන් වඩයක් තෝරා ගනිමින් ඇසුවේය. "චිත්‍රා මටත් තව තේ එකක් බොන්න පුලුවන්"

"ඔයාට ඕන කිරි නැතුව නෙ. සුමනෙට කිරි දාල? සීනි?"

"හැඳි තුනක් වත් දාන්න ඕන" සුමනදාස සිනාසෙමින් කීවේය.

"එච්චර සිනි බොන්න හොඳ නැහැ" චිත්‍රා ගෙතුලට යන ගමන කීවාය.

"මටත් ඉතින් කසාදයක් බැඳ ගත්තු දවසක සීනි නැතුව තමයි බොන්න වෙන්නෙ. එතකන් ඒවටත් හරියන්න එක්ක බොන්න ඕන" සුමනදාස ගේ උත්තරය විය. "අනිත් එක අපි එහෙම කැවෙ බිව්වෙ නැත්නම් රාජුලට ජොබ් එකත් නැතිවෙනවනෙ"

"ඉතින් කුමාරිගෙ ප්‍රශ්නෙ කියන්නකො" චිත්‍රා තේ පිළිගන්වමින් ඇසුවාය.

"එයාගෙ අයිය තමයි තියෙන ප්‍රශ්නෙ. උඃ මට කිව්වනෙ තවත් උන්ගෙ ගෙදරට අඩියක් තියන්න එපා කියල"

"ඒක හරි වැඩක්නෙ එයා කොහොමද එහෙම කියන්නෙ? ඉතින් කුමාරිගෙ අම්ම මොනවද කිවෙ?"

"ඒ මනුස්සය මොනව කියන්නද. චන්ද්‍රපාල නෙ ගෙදර කෙරුම තාත්තවත් නැහැ උගේ කීමට ඉහළින් යන්නෙ"

"ඉතින් එළියෙදි හම්බවෙන එකනෙ ඇත්තෙ. හවසට වැඩ ඇරුනට පස්සෙ එහෙම"

"බැනෙ. චන්ද්‍රපාල එයාව උදේට ගෙනැත් බස්සල යනව. හවසට ආපහු එනව එක්ක යන්න"

"කෑම වෙලාව"

"එයාලගෙ ඔෆිස් එක දැන් තියෙන්නෙ කොටුවෙ. ඉතින් අපේ ඔෆිස් එකේ ඉඳල එතෙන්ට යන්න පැය භාගයක්වත් යනව. ආපහු එන්න පැය භාගයක් තිව්වම කොහෙද වෙලාවක් ඉතුරු වෙන්නෙ?"

"කොහෙත්ම හම්බවෙන්න බැරි එකේ විනාඩි දෙක තුනකටවත් හම්බවෙන එක ලොකු දෙයක්නෙ" චිත්‍රා කිවාය.

"මං ඉඳල හිටල එහෙම යනව. ඒත් මගේ ප්‍රශ්නෙ අපේ ජී. එම්. කාරයනෙ. ඒ යකා දවල්ට කන්න යන්නෙ නැහැ කාමරේටම වෙලා ඉන්නෙ. ඉතින් මං පරක්කුවෙලා ගියොත් එහෙම මිනිහ මාව කන්න වගේ බලා ඉන්නව"

"ටෙලිෆෝන් තියෙන්නෙ කතා කරන්නනෙ"

"මං ඔය හැමදෙයක්ම ට්‍රයි කරලයි තියෙන්නෙ. කුමාරිලගෙ ඔෆිස් එකේ ප්‍රයිවෙට් කෝල්ස් ගන්න දෙන්නෙත් නැහැ. පිටින් එන කෝල්ස් වලට ආන්සර් කරන්න දෙන්නෙත් නැහැ. ඉතින් ඉතුරුවෙලා තියෙන්නෙ ලියුම් ලියන එක විතරයි"

"හරි ශෝක් නෙ. ඉස්සර මෙයා මට දවස ගානෙ ලියනව" චිත්‍රා සිනාසුනාය.

"ඔයාල හිනාවෙයි. ඒත් කුමාරි ඉන්නෙ හැමදාම අඩ අඩා"

"සොරි අනේ. මං විහිලු කළේ නැහැ" චිත්‍රා වහා කිවාය. "ඉතින් අපි මොනව හරි කරමු"

"කුමාරිට මෙහේ එන්න කියන්න" රාජු කීවේය.

"අන්න ඒක හොඳයි. සෙනසුරාදට එන්න පුලුවන්නෙ" චිත්‍රා එකග වූවාය.

"මොනව කියලද මෙහෙ එන්නෙ"

"චිත්‍රා හම්බවෙන්න එනව කියලනෙ එන්නෙ, උඹ හම්බවෙන්න කියල නෙවෙයි නෙ"

"එක දවසක් එන්න පුලුවන් වෙයි. එත් හැදාම එන්න ගත්තොත් මොනව හරි හිතාවි"

"උඹට ඉතින් ප්‍රශ්නෙ සේරම එකපාරට විසඳගන්න බැහැ. දවසින් දවසට එන හැටියක් බලමු. එයත් මෙහේ ආවම ඒව කතා කරගනිමු"

"ඔයා කියන්නකො ලබන සෙනසුරාද කුමාරිට මෙහේ එන්න කියල" චිත්‍රා ඔහුට කීවාය, "චන්ද්‍රපාලගෙ ප්‍රශ්නයක් නැහැනෙ දෙමළ ගෙදරකට එනවට"

"ඒක නම් මිනිහට ප්‍රශ්නයක් වෙන එකක් නැහැ, උගෙ බිස්නස් කාර යාලුවො වැඩිහරියක් වගේ දෙමළ හරි මුස්ලිම් හරි තමයි" සුමනදාසගේ ඇගට මඳක් පණ ආ සෙයකින් කීවේය. "ඒත් රාජුගෙ අම්මයි තාත්තයි මොනව හිතයිද"

"ඒ ගොල්ල මොනවත් කියන්නෙ නැහැ. සිංහල දෙමළ කියල ප්‍රශ්නයක් ඇත්තේත් නැහැ. චිත්‍රගෙ යාලුවෙක් කිව්වම හරි"

"ඉතින් මාත් මෙතන ඇවිත් එයත් එක්ක කතා කරනකොට"

"මොකද්ද මිනිහො උඹට වෙලා තියෙන්නෙ? ගැනියෙකුටත් වඩා බයයිනෙ උඹ කැම්පස් ඉන්න කාලෙ මොනවද උඹ ඉගෙන ගත්තෙ?" රාජු ඇසුවේය.

"එතකොට අපට මෙහෙම ප්‍රශ්න තිබුණෙ නැහැනෙ. චන්ද්‍රපාලගෙ චංඩිකං එහේ බැහැනෙ"

ඊළඟ සෙනසුරාදා සුමනදාස රාජුලාගේ ගෙදර පැමිණ කුමාරි එනතෙක් බලා සිටියේය. අයියාත් ගෙතුලට එතැයි ඔහු තුල මහත් බියක් තිබුණේය. එත් චන්ද්‍රපාල ඇය ගෙදර ළග බස්වා ගියේය.

රාජු උදෙන්ම වැඩට ගිය අතර චිත්‍රා ඔවුන්ට කතා කරන්නට ඉඩදී ගෙතුලටවී සිටියාය. රාජුගේ අම්මා එක් වරක් පැමිණ කුමාරි හා වචනයක් දෙකක් කතා කර ඇතුළට ගියාය.

කුමාරිට හැම සෙනසුරාදාම ඔවුන්ගේ ගෙදර එන්නට සැලැස්මක් පිළියෙල කෙරුණේය. චිත්‍රාගෙන් සූප ශාස්ත්‍රය ඉගෙන ගන්නට යනවායැයි කුමාරි අයියාට කීවාය. අයියා එයට අකමැත්තක් පළ නොකළෙන් එදා සිට හැම සෙනසුරාදාකම උදේට දෙදෙනාට මුණ ගැහෙන්නට අවස්ථාවක් උදා වූයේය.

"මේක හැමදාම කරන්න බැහැනෙ" දවසක් රාජු ගෙදර නැවතී සිටි දවසක සුමනදාස ඔහුට කීවේය.

"මොකද බැරි? කුමාරිට මෙහේ එන්න කාගෙන්වත් තහනමක් නැහැනෙ"

"ඒක නෙවෙයි බං මම කියන්නෙ, හැමදාම සෙනසුරාදා මෙහෙම ඇවිත් කතා කර කර ඉඳල වැඩක් තියෙනවද"

"එයා කියන්න හදන්නෙ ඒ දෙන්න බඳින්න ඕන කියල" චිත්‍රා ඔහුගේ පිහිටට ආවාය.

"ඉතින් ඒක කුමාරිට නෙ කියන්න ඕන. අපට කියල වැඩක් තියෙනවයි"

"අයිය කැමති වෙන්නෙ නැහැ කීයටවත්" කුමාරි කීවාය.

"සුමනෙ බඳින්න හදන්නෙ අයිය නෙවෙයි නෙ, ඔයා මොකද කියන්නෙ" රාජු කුමාරිගෙන් ඇසුවේය.

"අයිය කැමති වෙන්නෙ නැහැ. එයා කැමති නැතුව අම්මයි තාත්තයි කැමති වෙන්නෙ නැහැ"

"මං කතා කරන්නද චන්ද්‍රපාලට" රාජු ඇසුවේය.

"එයා කවුරුවත් කියන දෙයක් අහන මිනිහෙක් නෙවෙයි"

"මොකක්ද එයා ඔච්චර අකමැති වෙන්න කාරණාව. මොකක් හරි තියෙන්න එපැයි ඔය තරම්ම විරුද්ධ වෙන්න"

"මිනිහ කියන්නෙ මේ දකුණු පළාතෙන් ආපු හිගන්නෙකුට එයාගෙ නංගිව දෙන්න බැහැ කියල, මට සල්ලි නැහැ, මං ඉස්තරම් පරම්පරාවකින් පැවතෙන්නෙ නැහැ, සේරටම වඩා මට කාර් එකක් තියා බයිසිකල් කට්ටක් වත් නැහැ, ඉන්න කියල ගෙයක් නැහැ, අනිත් එක මගේ කුලේ අඩුයි"

"මං දැනගෙන හිටියෙ නැහැ සිංහල මිනිස්සුත් කුලේ බලනව කියල ඔය තරම්" චිත්‍රා කීවාය.

"සමහරු ඒ ගැන හරියට ලොකුවට හිතනව, මගුල් තුලාවලදි විශේෂයෙන් ම" සුමනදාස පැහැදිලි කළේය.

"ඉතින් චන්ද්‍රපාල දන්නෙ කොහොමද සුමනෙ මොන කුලේද කියල"

"ඒක තමයි එයා ඉස්සෙල්ලම මගෙන් දැන ගත්තෙ, මං ගෙදර ගිය දවසෙ"

"කෙලින්ම ඇහුවද?" චිත්‍රා ඇසුවාය.

"නෑ එයා එච්චර නපුරු උනේ නැහැ එතකොට. ඒ උනාට කුලේ හොයන මිනිහට ඒක හරි ලේසියි. වාසගම ඇහුවම දැන ගන්න පුලුවන් හුගක් වෙලාවට. එහෙම බැරි උනොත් ගම මොකක්ද කියල අහනව, ඒත් ටිකක් සැක නම්

අහවලා නෑයොද කියල ප්‍රසිද්ධ පුද්ගලයෙකුගෙ නමක් කියනව, එතකොට අහුවෙනව" සුමනදාස කීවේය. "ඇයි ඔයාල කුලමල සොයන්නෙ නැද්ද"

"වයසක පරම්පරාව තමයි ටිකක් හොයන්නෙ"

"අපේ අයිය හුගක් දෙවල් අතින් වයසක විදිහට තමයි හිතන්නෙ"

"මං මෙච්චර කල් කොළඹ ඉ෴දලත් මට තාම තේරෙන්නෙ නැහැ උඹලගෙ කුල ක්‍රමය, කොයි එකද උසස් කොයි එකද පහළ" රාජු කිවේය

"ඒ ඉතින් වැඩි දෙනෙක් කැමති නැහැනෙ තමන්ගෙ කුලේ පහත්ය කියා ගන්න, ඒක හින්ද ඔය ටිකක් ඉහළයි කියල කියා ගන්න කුල වල ඇයො බොහොම දෙනෙක් කියාගන්නව තමන්ගෙ කුලේ තමයි උසස්ම කියල"

"ඉතින් ඒක කියල දීපන්කො කුමාරිගෙ අයියට"

"උඹට හැම එකක්ම විහිලු. කුමාරි ඉන්න තත්වෙ උඹට තේරෙන්නෙ නැහැ"

"ඉතින් ලබන සුමානෙ බඳිමු" රාජු එක වරම කීවේය.

"ඔයාට පිස්සුද? එහෙම එක පාරටම බඳින්න පුලුවන් යෑ?"" චිත්‍රා ඇසුවාය.

"මට පිස්සු නැහැ. ඒක තමයි කරන්න තියෙන හොඳම වැඩේ" රාජු කීවේය, " උඹල නැකැත් එහෙම විශ්වාස කරනවද"

"නෑ. ඇයි?" සුමනදාස ඇසුවේය.

"කුමාරි?" රාජු යලිත් ඇසුවේය.

"අනේ මං දන්නෙ නැහැ. සුමනෙ කියන දෙයක්" කුමාරි බිම බලාගෙන කීවාය.

"උඹ නං පුදුම ලක් කාරයෙක් බං. උඹ කියන ඕන දෙකට කැමති වෙන ගෑණියෙක් ලැබෙන්න" රාජු සුමනදාසගේ පිටට වැරෙන් පහරක් ගැසුවේය. "එහෙනං වැඩේ සිම්පල්. අගහරුවාද හෙඳ දවසක්. සුමනෙ, උඹ වරෙන් හරියට උදේ දහය වෙනකොට රෙජිස්ට්‍රාස් ඔෆිස් එක ළගට. කුමාරි වෙනද වගේ උදේට ඔෆිස් යන්න. මං එතෙන්ට එන්නං චිත්‍රත් එක්ක නමයහමාර වෙන කොට. ඔයා හාෆ් ඩේ එකක් දාල එන්න අපිත් එක්ක "

"මොනවද ඔයා කරන්න හදන්නෙ?" චිත්‍රා ඇසුවාය.

"ඉන්නකො මං කියල ඉවර වෙනකං. අපිට සුමනෙ හමු වෙනව රෙජිස්ට්‍රාර් ඔෆිස් එක ළගදි. මං දන්නව එතන චීෆ් කලාක්ව, ඉතින් අපි ස්පෙෂල් ලයිසන් එකක් අරගෙන බඳිනව"

"එහෙමත් කරන්න පුලුවන්ද මේ වගේ දෙයක්?" චිත්‍රා වැඩි කැමැත්තක් දැක්වූයේ නැත.

"මං මොනවද අම්මලට කියන්නෙ?" කුමාරි ඇසුවාය. ඇයට තවමත් මේ ගැන සිතා ගන්නට බැරිය.

"දැන්ම මොනවත් කියන්න ඕන නැහැ. ඒව පස්සෙ පුලුවනි. මං කියන විදිහට කරන්නකො. මං සේරම බලා ගන්නම්" රාජු ඇයට කීවේය.

"මං නං කැමති නැහැ. මේ දෙන්න බඳින්න ඕන තමයි. ඒත් මෙහෙම කරන්න ගිහින් කුමාරි තමයි අමාරුවෙ වැටෙන්නෙ" චිත්‍රා යලිත් විරුද්ධ වූවාය.

"කිසි ප්‍රශ්නයක් වෙන්නෙ නැහැ" රාජු තද විශ්වාසයකින් යුතුව කීවේය. "බැන්දට පස්සෙ හැමෝම කැමති වෙයි"

"එතකොට සුමනෙගෙ අම්ම තාත්ත" චිත්‍රා ඇසුවාය.

"ඒක ප්‍රශ්නයක් වෙන එක්ක නැහැ නේ ද සුමනෙ" රාජු ඇසුවේය, "ගල් ඉබ්බ වගේ ඉන්නෙ නැතුව කතා කරපන්"

"අම්මල මොනවත් කියන එකක් නැහැ. ඒත් මටත් බය කුමාරි ගැන"

"උඹට කුමාරි බඳින්න ඕනද, නැද්ද?"

"ඕන නිසානෙ බං මං මෙච්චර දවසක් කියන්නෙ"

"එහෙනං ආයි කතාවක් නැහැ. අඟහරුවාදා උදේ දහයට රෙජිස්ට්‍රාර් ඔෆිස් එක ගාවට වරෙන්" රාජු අවසාන තිරණය දුන්නේය. අනිත් තිදෙනාම රාජු දෙස නිහඬව බලා සිටියහ. ඔවුන්ට තවත් ඒ ගැන සිතන්නට ඉඩදී ඔහු එතැනින් නැගිට ගියේය. චිත්‍රාත් ගෙතුලට ගියාය.

"මොකද තනියම හිනාවෙන්නෙ" රාජුගේ කටහඬින් චිත්‍රා යලිත් පියවි ලෝකයට ආවාය.

"මට මතක් උනා ඒ දවස්වල සුමනෙයි කුමාරියි මෙහේ ආපු හැටි. ඔයා ඒ ගොල්ලන්ගෙ වෙඩිං එක ඇරේන්ජ් කරපු හැටි" ඇය කිවාය.

"මේ ඉතිහාස කතාවක්නෙ ඒක"

"මට තාම මතක් වෙනව අපි රෙජිස්ට්‍රාර් ඔෆිස් එක ඉස්සරහ බලාගෙන හිටි හැටි, කුමාරියි මමයි. ඔයා සුමනෙත් එක්ක ඇතුලට ගියාට පස්සෙ. බැරිවෙලාවත් එතෙන්ට කුමාරිගෙ අයිය ආවනම් එහෙම"

"චන්ද්‍රපාල ආවනං එහෙම මොකද කරන්නෙ" රාජු සිනාසෙමින් ඇසුවේය.

"අනේ මං දන්නෙ නැහැ. මං එහෙනං බයටම කලන්තවෙයි"

"ඉතින් අපි දැන් මොකද කරන්නෙ සුමනෙට" රාජු ඇසුවේය.

"සුමනෙට කීයක් විතර හොයාගන්න පුලුවන්ද කියල බලමු. ඉතිරි එකක් ණයක් වෙලා හරි හොයල දෙමු. ඒ දරුවගෙ ජීවිතේ ලොකුයිනෙ සල්ලි වලට වැඩිය" චිත්‍රා කිවාය.

"මං චන්ද්‍රපාලට කතා කරන්නං. සුනිත එයාගෙත් දුව නේ. අනිත් එක දැන් මිනිහ එහෙම තරහක් නැහැ. මං දැක්ක එදා හොස්පිටල් එකට ඇවිත් ඉන්නව"

"මාත් එක්ක කතා කළා. මං හිතන්නෙ එයා දන්නෙ නැහැ අපි සුමනෙලට උදවු කරපු හැටි " චිත්‍රා පැවසුවාය.

"මං කොහෙමෙහරි අපේ ඔෆිස් එකෙනෙකුත් කීයක් හරි ගන්න බලනව. ඒත් අපේ පිස්සු කෙල්ලට විතරක් මතක් කරන්න එපා. ආයි මාත් එක්ක රණ්ඩුවෙන්න එයි"

"ඒ දරුව සුනිත ගැන හරිම බයෙන් ඉන්නෙ. ඒකයි හැමොම එක්කම තරහ. දුවට මොනවත් කියන්න යන්න එපා ඔයත්"

## අක්ෂි වෛද්‍ය

සිහින් තල් ඉරුවකින් හය වරත් ඔතා ගැට ගසා තිබූ හසුන් පත දෙස කුඩා සාමණේර තැන හොඳින් බැලුවේය. අලුතින් පැමිණෙන ලෙඩුන් පරීක්ෂා කිරීම සඳහා යොමු කරන්නේ බාහිර රෝගී අංශය වෙත වුවත්, හිමිනම මේ අමුත්තන් දෙදෙනා ඇතුලු ගෙයක සිටි මහ වෙද්නා වෙත කැටුව ගියේය. මේ හසුන මහ වෙද්නා අතටම පත් කළ යුතු බවත්, දෑස් අඳ මේ තරුණයාත් ඔහු සමග සිටි එම වයසේම තරුණියත් මහ වෙද්නා වෙත කැටුව යා යුතු බවත් සාමණේර හිමියන් දැන ගත්තේ හසුන ඔතා තිබූ ආකාරයෙන්ය. සතුරෙකුට නම් හසුනක් ඔතන්නේ එක් වරක් පමණකි. මිතුරෙකුට නම් දෙවරක්ද, ඥාතියෙකුට තෙවරක්ද, පවුලේ කෙනෙකුට සිවු වරක්ද, දෙමාපියන්ට නම් පස් වරක්ද, ගුරුතුමෙකුට හය වරක්ද, රජෙකුට නම් සත් වරක්ද හසුන ඔතනු ලැබේ.

ඇතුලේ වූ ගොඩනැගිල්ලක් ඉදිරියේ තවත් ලෙඩුන් කිහිප දෙනෙක් වාඩිවී සිටි බංකුවක මිත්‍ර වාඩිවූ පසු පාලි ඔහු අසලින් සිට ඔවුන් අවට සිදුවන දෑ මිත්‍රට විස්තර කළාය.

තරුණ භික්ෂුවක් එළියට පැමිණ රෝගියෙක් ඇතුළට කැඳවාගෙන ගියේය. තවත් ලෙඩුන් පස් දෙනෙක් ඔවුන්ට පෙර එතැනට පැමිණ සිටියහ. ඔවුන් පරීක්ෂා කරන්නට කොපමණ වෙලාවක් ගත වෙයිදැයි සිතන්නට පාලි උත්සාහ කළාය. අන්තිමට ඇතුලුවූ රෝගියා ඇතුලේ සිටි වෙලාව මහලු හරකෙකුට වතුර කලයක් බොන්නට තරම් වෙලාවක් යැයි ඇය අනුමාන කළාය. ඊළඟට ඇතුලුවූ රෝගියා ඊට වඩා වැඩි වෙලාවක් ගත්තා සේය. ඔවුන්ට මෙතැන වරුවක් පමණ බලා ඉන්නට වෙතැයි ඇය සිතුවාය.

"ඔයාට බොන්න වතුර ටිකක් ගේන්නද?" ඇය මිත්‍ර ගෙන් ඇසුවාය.

"මට මොනවත් එපා. ඔයා එහොම ළඟින් හිටියාම ඇති"

"තව හතරදෙනෙක් ඉන්නව අපට කලින්. ඒ හින්ද ටිකක් වෙලා යාවි"

"අපි කොයි තරම් කල් බලා හිටියද? මෙහේ එන්න අපට දවස් කීයක් ගියාද? ඒ හින්ද තව ටික ලොවක් ඉන්න එක මොකක්ද"

ඇතුලේ සිටි රෝගියා භික්ෂුවක් සමග එළියට විත් වෙනත් ගොඩනැගිල්ලක් වෙත ගියේය. ඊළඟ රෝගියාට ඇතුලට කතා කරණු ලැබිණ.

ඔවුන්ගේ වාරය පැමිණි විට පාලි මිත්‍ර කැටුව ඇතුලට ගොස් එහි වාඩිවී සිටි වැඩිමහලු භික්ෂුවට ඔවුන් දෙදෙනාම වැඳ නමස්කාර කළහ. ඔවුන් ගෙන ආ හසුන් පත භික්ෂුව ඉදිරියේ විය.

"ඔබ බොහොම දුරක් ගෙවාගෙන ඇවිත් වගෙයි" ඔහු කීවේය, "හොඳයි අපි බලමු ඇස් දෙක දිහා"

මිත්‍ර කවුලුව අසල පුටුවක හිඳුවා භික්ෂුව ඔහුගේ ඇස් පරීක්ෂා කළේය. මේසය මතවූ පළිගු කාචයක් අතට ගෙන මිත්‍රගේ හිස ඒ අතට මේ අතට හරවමින් පළමුව දකුණු ඇසත් ඊළගට වම් ඇසත් ඔහු බොහෝ වෙලාවක් පරීක්ෂා කළේය. ඔහු මිත්‍රට උඩ බලන්නටත් බිම බලන්නටත් ඒ අතටත් මේ අතටත් ඇස් හරවන්නට කීවේය. පාලි නිහඬව දෙවියන් යදිමින් බලා සිටියාය.

බොහෝ වෙලාවකට පසු භික්ෂුව මේසය වෙත ගොස් යලිත් වාඩිවිය.

"මගේ මිත්‍ර ගොඩාභය උන්නාන්සෙගෙ සැප සනීප කොහොමද?" රෝගය ගැන කිසිත් නොකියා ඔහු විසින් අසන ලද්දේ ඇයිදැයි පාලි කල්පනා කළාය.

"මම ඇහුවෙ නාගදීප රෝහලේ මහ වෙද්නා ගැන" ඔහු සඳහන් කළේ කා ගැනදැයි මේ දෙදෙනාට වැටහීමක් නැතිබව දැනී ඔහු යලිත් කීවේය.

"එතුමා යහතින් ඉන්නව. ඔබ වහන්සේ ගැනත් බොහොම ඉහළින් කතා කළා. මම අද ජිවතුන් අතර ඉන්නෙ උන් වහන්සේට පින් සිද්ධ වෙන්නයි"

"මට සේරම විස්තර කියන්න, ඔබේ ඇස් වලට සිදුවූ දේ. මට හැම දෙයක්ම දැන ගෙන ඉන්න ඕනෑ, වෙලාව ගත්තට කමක් නැහැ"

මිත්‍ර ඔහුට සියලු විස්තර පැවසුවේය.

"මේ පාලි ගෙ ගමේ උදවිය තමයි මාව ගොඩ බිමට ගෙනැත් රෝහලට බාර දීල තිබුනෙ. මගේ ජිවිතය බේර ගත්තත් ඇස් දෙක පාදන්න ඔවුන් ට පුලුවන් කමක් තිබුනේ නැහැ. ඒකයි මහ වෙද්නා මට මෙහාට එන්න උපදෙස් දුන්නෙ. එතෙක් මා බලා ගත්තෙ පාලිගේ පවුලේ අය තමයි"

භික්ෂුව කිසිත් නොකියා මඳ වෙලාවක් කවුලුවෙන් පිටත බලාගෙන සිටියේය.

"මුලින්ම ඇස් වල අමුත්තක් දැනුණ හැටියෙම මෙහේ එන්න පුලුවන් වුවා නම් ඉතාමත් ලෙහෙසියෙන් සුව කරන්න තිබුණා. ඒත් දැන් ඒ ගැන කතා කරල එලක් නැහැ. ඇස් වලට වෙලා තියෙන හානිය හුගක් බරපතලයි. ආපසු පෙනීම ලබාදෙන්න ඒ තරම් බලාපොරොත්තු දෙන්න බැහැ. මෙහේ ටික කලක් නැවතී ප්‍රතිකාර ගන්න සූදානම් නම් අපි හැකි හැම දෙයක්ම කරන්නම්, අඩුම වශයෙන් තරමකට හෝ පෙනීම ලබා දෙන්න. කෙතරම් කාලයක් ගතවේද කියල දැන්ම කියන්න බැහැ"

මිත්‍ර පාලිගේ අත සොයාගෙන එය අල්ලා ගත්තේය. පාලි ඔහුගේ අත මිරිකා ගෙන ඔහුගේ උර හිස මත අනිත් අත තැබුවාය.

"අපි මෙහේ ඕන තරම් කාලයක් ඉන්න ලෑස්තියි. ඔබ වහන්සේට බුදු බව අත් වෙයි මෙයාගෙ ඇස් දෙක සනීප කරල දුන්නොත්" ඈය ඔහුගේ පා මුල වැඳ වැටුණාය.

"හොඳයි අපි ලෙඩාව බාර ගන්නම්. ඔබට පුලුවන් ආගන්තුක නේවාසිකාගාරෙ නවතින්න. මේ තරම් දුරක මේ ලෙඩා කැටුව ඇවිත් ඔබ දැන් ඔබට කරන්න පුලුවන් දේ කළා. ඔබ හරිම ධෛර්යමත් කෙනෙක්" වෙද්නා පාලිට පැවසීය, "දැන් මෙයා එක්ක ගෙන යන්න අනිත් ගොඩනැගිල්ලට, තව පරීක්ෂා කරන්න උවමනායි බෙහෙත් කරන්න කලින්"

වෛද්‍ය වරුන් විසින් මිත්‍රගේ ඇස් පරීක්ෂා කරන තුරු පාලිට බංකුවත් මත වාඩිවී තනිවම ඉන්නට සිදුවිය. ඇය දෙවියන් යදින්නට වූවාය. මහ වෙද්නා පැවසූ වදන් ඇයට නැවත නැවතත් සිහි විය. වැඩි බලාපොරොත්තු තබා ගන්නට එපා යැයි ඔහු කී දේ ඇගේ සිතට තදින්ම වැදුණේය. එහෙත් ඇගේ සිත තුල ලොකු බලාපොරොත්තුවකුත් ලොකු විශ්වාසයකුත් තිබුණේය. කවදා හෝ මිත්‍ර ට පෙනීම ලැබෙන බවත් කවදා හෝ ඇගේ මුහුණ දකින්නට ඔහුට හැකිවෙන බවත් ඇය විස්වාස කළාය.

කලබලෙන් දුවන තරුණ භික්ෂූන්, සාමනේර හිමිවරුන්, රෝගීන් හා ඔවුන්ගේ ඥාතීන් ඇය පසුකර ඒ මේ අත ගියත් ඇය ඔවුන් දුටුවේ නැත.

මිත්‍රගෙන් කිසිදු ගෙවීමක් ඉල්ලුවේ නැති අතර අනිත් රෝගීන්ද එවන් ගෙවීමක කරන බවක් ඇය දුටුවේ නැත. ආදායමක් නොමැතිව මෙතරම් විශාල රෝහලක් නඩත්තු කරන්නේ කෙසේදැයි ඇයට සිතා ගත නොහැකිවිය.

විවාහයෙන් පසු මුල් වතාවට ඇයට මිත්‍රගෙන් වෙන්වී රැය ගත කරන්නට සිදුවන බව ඇයට සිහිවිය. මිත්‍ර ගෙන් සමු ගන්නා විට ඔහු ඇගේ අත තදින් මිරිකා ගත්තේය.

"මම ඈත යන්නෙ නැහැනෙ, මේ ළඟම ඉන්නවා" ඇය ඊට වඩා කතා නොකලේ ඇයගේ හඬේ ගැබ්වූ ශෝකය ඔහුට දැනෙතැයි සිතඹ බැවිනි. මේ වෙලාවේ ඔහුගේ ඇස නොපනීම හොඳයැයි ඇයට මොහොතකට සිතුණේ තම දෑසේ වූ කඳුලු ඔහුට දැකගන්නට නොහැකි වන නිසාය.

"ඔයාට තනියම ඉන්න පුලුවන්ද?" මිත්‍ර සිතුවේ ඇගේ ආරක්ෂාව ගැනය.

"මම තනියම ඉන්නවයැ, එතන තව ගෑණු උදවිය හුගක් ඉන්නව, ඔයා බය වෙන්න එපා"

මිත්‍ර සිටි කුටියෙන් හා රෝහලෙන් පිටවී පාලි සෙමෙන් සෙමෙන් නවාතැන සොයා පිය නැගුවාය. මග සළකුණු අසන්නට වුවමනා නොවුයේ එහි නවාතැන වෙත යන කිහිප දෙනෙක්ම මගදී ඇයට හමුවූ නිසාය.

එහි විශාල ශාලා දෙකක් තිබුණේය. එකක් පිරිමි සඳහාත් අනික ගැහැණුන් හා ළමුන් සඳහාත් විය. ඇය ගැහැණුන්ගේ නවාතැන් ශාලාව වෙත පැමිණ වට පිට බලන්නට වුවාය. මෙහි සිටියේ සිංහල අය පමණක් යැයි බැලූ බැල්මට දුටු ඇය තුල හදිසියේම චකිතයක් ඇතිවිය. දෙමළ තරුණියක ලෙස ඇයට මෙතැන හිරිහැරයක් වෙතැයි ඇයට සැකයක් ඇතිවිය. ඒ මොහොතේම ඒ බිය පහ කරමින් වයස්ගත කාන්තාවක් ඇය වෙත පැමිණ කරුණාවෙන් ඈ සමග කතා කළාය.

රාත්‍රිය එහි ගත කරන්නට පැමැණියාදැයි මහලු කත ඇසුවාය.

"අද විතරක් නෙවෙයි, තව හුග දවසක් ඉන්න වෙයි මට, කවද යන්න පුලුවන් වේද දන්නෙ නැහැ "

"ඒ ගැන බය වෙන්න එපා දූව, මෙතන ඉන්න පුලුවන් ඕන දවසක්, ඒ උනාට දූව හිතනවට වඩා ඉක්මණින් ලෙඩාට සනීප වෙයි" ඇය කීවාය, "තැනක් හොයාගන්න නිදාගන්න"

පාලි වට පිට බැලුවාය. එහි කණ්ඩායම් කිහිපයක් ඇතැයි ඇයට සිතුණේය. එක් තැනක කුඩා දරුවෙකු සමග තරුණ යුවලක්ද, මැදිවියේ ගැහැණියක හා යුවතියක්ද, වයස්ගත කාන්තාවන් කිහිප දෙනෙක් වෙන වෙනම සිටියහ. තව තැනක ඇය හා සම වයසේ වූ යුවතියක දැක පාලි ඒ දෙසට ඇදුණාය. ඇය එනවා දුටු යුවතිය මඳ සිනාවක් පෑවාය.

"ඔයා අද වෙන්නැති මෙහේ එන්න ඇත්තෙ" යුවතිය ඇසුවාය.

"ඔව් අපි ආවෙ නාගදිපෙ ඉඳල, මගේ නම පාලි"

"මම සතියා. අපි ඇවිත් ඉන්නෙ බෙම්තොට ඉඳල" ඇය යලිත් කීවාය, "මම ආවෙ අපේ තාත්තට බෙහෙත් ගන්න. අද මට තනියම ඉන්න වෙයි කියල මම මේ වටපිට බල බලා හිටියෙ "සතියා ඇගේ කුඩා රෙදි පොදිය පෙන්වූවාය. පාලි ඇගේ පොදියත් ඒ අසලින් තැබුවාය.

"අපේ එක්කෙනා අද ඇතුලු කළේ රෝහලට. අපට කී දවසක් ඉන්න වෙයිද දන්නෙ නැහැ"

"අපි ඇවිත් දැන් දවස් අටක් වෙනව. හෙට දැන ගන්න පුලුවන් වෙයි කවද විතර යන්න පුලුවන්ද කියල"

"තාත්තට මොකද උනේ"

"තාත්ත හේන් කොටන්න ගිහින් කටුවක් ඇහේ ඇනුණා. ගමේ වෙද උන්දෑ බෙහෙත් කළා ඒත් ගුණයක් නැති උනාම අපට කිව්ව ඇහ බේරගන්න ඕන නම් මෙහේ එක්ක ගෙන එන්න කියල" ඇය විස්තර කළාය. "අපි ඉන්නෙ බෙම්තොට

තවලම ළඟ. එහේ ඇවිත් හිටි වෙළෙන්දො වගයක් අපට කිව්ව ඒ අයත් එක්ක අපට එන්න පුලුවන් කියල එයාල මේ පැත්තෙන් නැව් තොටට යනව කියල"

"මිත්‍රගෙ ඇස් දෙකම පේන්නෙ නැහැ, මෙහේ ආවට පස්සෙ තමයි මට යන්තමට හරි බලාපොරොත්තුවක් ඇති උනේ "

"මෙහෙදි හොඳ කරන්න බැරි උනොත් හොඳ කරන්න පුලුවන් තැනක් නැතුව ඇති, මෙහේ එන අය කියන්නෙ ලෝකෙම තියෙන හොඳම ඇස් රෝහල මේකයි කියල"

මුහුණ සෝදා ගැනීමට සතියා ඇය කැටුව මඳක් ඈතින් පිහිටි ළිඳ වෙත ගියාය. ඉන් පසු දෙදෙනා මුලුතැන් ගෙය වෙත ගියේ ඔවුන්ට සහාය විය හැකිදැයි බැලීමටය. එහෙත් එතැන සිටි වයස්ගත ගැහැණු, තරුණ කෙල්ලන් ට කළ හැකි දෙයක් නැතැයි දැක්වූහ.

"ඔය ළමයින්ට ඕන නම් කෑම ශාලාව ලෑහැස්ති කරන්න" එක කාන්තාවක් කීවාය.

ඇඳිරිවැටි ගෙන එන නිසා ඔවුන් දෙදෙනා ශාලාවේ වූ පහන් දැල්වූහ. පිරිසිදු කරන්නට දෙයක් නොවූයෙන් ඔවුන් මුල්ලක අකුලා තිබූ පැදුරු බිත්ති අයිනෙන් එලූහ.

පිටත සීනුවක් නාද වෙනවා ඇසුණේය.

"කෑම වෙලාව හරි"

කිහිපදෙනෙක! ගෙන් සැදුම් ලත් කණ්ඩායම් වශයෙන් ද, තවත් අය තනිවම ඔවුන්ගේම ලෝකයක සිරවී එතැනට එනවා පාලි බලා සිටියාය. ඔවුන්ගේ සිත් තුල මොනවා ඇතිදැයි සිතන්නට ඇය උත්සාහ කළාය. සමහරවිට රෝහලේ තනිකර ආ රෝගියා ගැන විය යුතුය. නැතිනම් ගෙදර තනිකර ආ දරුවන් හෝ මහලු දෙමාපියන් ගැන විය යුතුය. ඇගේ මවත් පියාත් ඔවුන් ගැන කිසිත් තොරතුරත් නැතිව දුක් වෙනවා ඇතැයි ඇයට සිතුණේය. ඔවුන් නිරුපද්‍රිතව මෙහි පැමිණි බව දන්වා පණිවිඩයකත් යවන්නට ක්‍රමයක් සොයා ගතයුතුය.

මිත්‍රට රාත්‍රී ආහාර ලැබෙන්නට ඇත්ද? පසුගිය කාලයේ ඔහුගේ සියලුම ඕනෑ එපාකම් ගැන ඇය විසින් සොයා බැලූ නිසා මිත්‍ර අද ඉතා අසරණවී ඇතැයි ඇය සිතුවාය. ඒ සිතිවිලි පසෙකට තල්ලු කර දැම්ම සඳහා ඇය මහලු අයට හා දරුවන්ට කෑම බෙදීම ගැන උනන්දු වූවාය.

කෑමට තිබුණේ පලා මැල්ලුමක්, වට්ටක්කා ව්‍යංජනයක්, මුරුංගා හොද්දක් සමග බත් ය. අනිත් අය කෑම බෙදා ගෙන අවසන් වෙන තුරු හිඳ සතියාත් පාලිත් කෑම බෙදා ගත්හ. සරල වුවත් කෑම වේල රසවත් බව පාලි කීවාය.

පැදුරු අකුලා තබා කෑම භාජන සෝදන්නට උදව් වී තරුණියන් දෙදෙනා එළි මහනට එනවිට පිරිමි අය බුලත් සපමින් මිදුලේ බංකු මත වාඩිවී කතා කරමින් සිටියහ. ගැහැණු උදවිය ගාලාවේ පඩිපෙළ මත වාඩිවී සිටියහ.

දවල් කාලය තුල වැඩිදෙනෙක් රෝහලේ සිටි රෝගීන්ගේ වෙත ගිය අතර විවේකයක් තිබූ අය ඔසු උයනේ හෝ ගොවිපලේ වැඩට උදව් කළ අතර තවත් සමහරෙක් කුලී වැඩක් සොයාගැනීමට අසල ගමට ගියහ.

පාලි සතියාත් සමග රෝහලට ගියාය. මිත්‍රගේ වෙදකම් ඇරඹෙන්නේ ඊට පසුදින බවත් එදින ඔහුට ළය විරේකයක් කරන බවත් ඔහු පැවසීය. ඔහු වඩාත් උනන්දු වූයේ පාලිගේ නවාතැන ගැන තොරතුරු දැන ගන්නටය.

ඉන් පසු පාලි සතියාත් සමග ඔසු උයන වෙත ගියේ එහි ඇති වැඩකට සහාය වෙන්නටය. නාගදීපයේ පසට වඩා මෙහි පස කෙතරම් සාරවත් දැයි ඇය සිතුවාය. එහි වූ පැලෑටි බොහොමයක් ඇයට හඳුනා ගන්නට බැරිවිය.

රෝහලට එදිනට අවශ්‍ය වූ බෙහෙත් පැල එකතු කරන්නට ඔවුන් ඉදිරිපත් වුවත් සතියාවත් ඒ හැම පැලයක්ම හඳුනා නොගත්තාය.

"මේ තියෙන්නෙ මුකුණුවැන්නා, මේ ඉස්ම ගන්නව ඇස් වලට දාන්න අපේ ගමේ උනත්. අපි පුංචි කාලෙ මේව ගිතෙල් සමග අපට කෑමට දෙනව" සතියා පෙන්වූවාය. සුදු තම්පලා, කිකිරිඳිය වැනි පැල වගී ඊළඟට ඇය හඳුනා ගත්තාය.

"මේව නම් අපේ ගම් වලත් තියෙනව" මුරුංගා ගසක් පෙන්වමින් පාලි කීවාය "මේවත් තියෙනව" ඇ පෙන්වූයේ පිට සුදු සාරණ පැලයකි.

මිත්‍ර කතා කරන හඬ ඇයට ඇසුණේය. එය ඉතා සිහින් කෙඳිරියක් මෙන් විය. ඇය ඔහු සොයා ගියාය. ඔහු ඇඳේ සිටියේ නැත. කුටිය තුළද නැත. පාලි එළියට දුවගෙන ආවාය. මිත්‍ර ආලින්දයේ කුලුණක් බදාගෙන සිහින් හඬින් පාලිගේ නම කොඳුරමින් සිටියේය. ඔහු සිටියේ ළුඹුරුවන් දියරක් මත සිටගෙනය. ඒ දියර ඔහුගේ ඇග දිගේ පහළට ගලා ආවේය. ඇය එක් වරම සිතුවේ ඔහුට මුත්‍රා පහවී ඇති ලෙසයි. එහෙත් සිරුරේ උඩ කොටසෙහිත් එය වැගිරෙනවා දුටු ඇ ඔහු ලේ වමනය කරනවාදැයි සිතුවාය. පාලි දුවගොස් ඔහු බදා ගත්තාය. ඔහුගේ මුහුණ බැලූ විටය ඇය දුටුවේ මේ දියර ගලා එන්නේ ඔහුගේ දෙනෙතින් බව. ඇය විලාප දෙන්නට වූවාය.

"පාලි. පාල " කිසිවෙක් ඇගේ උරයෙන් අල්ලා සොලවන බව ඇයට දැනුණේය. ඇස් හැර බැලූ ඇය දුටුවේ සතියා ඇය වෙත නැඹුරුවී ඇයට කතා කරන බවයි.

"ඔයා හීනෙන් කැගැහුව" සතියා කීවාය. පාලිට ඇය දුටු සිහිනය සතියාට කියන්නට සිතුනත් එසේ කීම අසුබ යැයි ඇය අසා තිබුණාය. ඇය යලිත් නින්දට සැරසුණාය.

"ඔයා පන්සිල් අරගෙන නිදාගන්න" කී සතියා මද වෙලාවක් ඇය දෙස බලා සිට ඇය අසලින් ඇල වුනාය.

පසුදා උදේ අන් අයට කලින් අවදිවූ පාලි මිදුලට බැස කටු සහිත ගසක් සොයන්නට වූවාය. ළිඳ අසල දොඩම් ගසක් දුටු ඇ ඒ අසලට ගොස් සිහින් හඬින් රෑ දුටු සිහිනය පැවසුවාය. ඉන් පසුවය ඇ සැනසුම් සුසුමක් හෙලුවේ, ඒ සිහිනය සැබෑ නොවෙන බවට ඇති විස්වාසය නිසාය. ඇයට රෝහල වෙත යන තුරු ඉවසිල්ලක් නැති වුවත් රෝගීන් බලන වෙලාව එන තුරු ඉන්නට සිදුවිය.

මහ වෙද්නා මිත්‍ර බැලිමට පැමිණියේ පාලි ඔහු අසල සිටියදිය. ඇය දණ නමා ඔහුට නමස්කාර කළාය.

ඔබ මුණ ගැසුණු එක හොඳයි. අපි අද බෙහෙත් පටන් ගන්නව. ඊයෙ ලෙඩාගෙ මුලු සර්වාංගයම ශුද්ධ කළා. මේ වෙද කමට සති දෙකක් යනව. හැමදාම උදේට ඇවිත් ලෙඩා ළග ඉන්න එක හොඳයි එයාගේ සාත්තුවට. බෙහෙත් ගල්වන්නෙ දවාලට පමණයි. රෑට ඔබට නවාතැනට යන්න පුලුවන් "

"මගෙන් කෙරෙන්න ඕන සෑම දෙයක්ම මම කරන්නම්"

රෝහල් ගොඩනැගිලි වලට බටහිර දෙසින් විශාල අතු පැතිර ගිය සියඹලා ගසක් යට පාලි වාඩිවී සිටීමට පුරුදු විය. ගලින් තැනූ ආසනයක් තිබුණත් රෝගීන් බැලිමට පැමිණෙන වැඩි දෙනෙකු මෙතැනට නොපැමිණියේ එය ප්‍රධාන දොරටුවට ඈතින් පිහිටීම නිසා විය හැකිය. බොහොවිට පාලිට එතැන ඇගේ සිතිවිලි සමග හුදකලාව වාඩිවී ඉන්නට අවස්ථාව ලැබුණේය. අවට දැඩි රශ්මියක් තිබුණත් ගස යට වූයේ සිසිල් බවකි. ගසේ කොළ අතරින් තැනින් තැන තද නිල් අහස දැක ගන්නට තිබිණ. ඉඳහිට අතු අතර සියඹලා කරලක් විය. සෙමින් සෙලවෙන අතු අතර කුරුල්ලෙක් කෘමීන් සොයමින් පියාසර කළේය. මේ ගස කරලින් බරවී ඇති විට කෙසේ විය හැකිදැයි සිතත්ම, දැන් ඉඳුනු සියඹලා කරලක් කන්නට තිබුණේ නම් යැයි ඇගේ කටට කෙළ ඉනුවාය. මල්ලීත් සමග හෝ මිතුරියන් සමග සියඹලා වාරයට සියඹලා කඩන සැටි ඇයට සිහි වය.

මිත්‍රගේ දෑසට බෙහෙත් ගල්වන තෙක් ඇයට පිටතට වී ඉන්නට සිදුවිය. එතෙක් ඇයට කළ හැකි කිසිවක් නොවිය.

ඇය දෙවියන් යදින්නට වූවාය. ඇය දන්නා, ඇය අසා තිබූ සෑම දෙවියෙකු ගෙන්ම ඇය අයැද සිටියේ මිත්‍රගේ දෙනෙත් පාදා දෙන ලෙසය. පිරිවෙණේ භික්ෂූන් ඔවුන්ට කියා දී තිබුණේ තමන්ට පිහිට විය හැක්කේ තමාටම පමනක් බවය. දෙවියන්ගේ පිහිට පැතිමෙන් ඵලක් නොවන බව ඇය ඉගෙන සිටියාය.

එහෙත් මේ මොහොතේ ඇයට කළ හැකි කිසිවක් නොවූයෙන්, ඇය ඇගේ මුතුන් මිත්තන් වැඳුම් පිදුම් කළ සිව දෙවියන්ටත්, කාලි මාතාවටත් යාඥා කළාය. සැමදා සවසට රෝහල අසල වූ අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිමයටද මල් පූජා කර වඳින්නට ඇය සිතා ගත්තාය. මිත්‍ර එතරම් ආගම් භක්තියක් ඇති කෙනෙකු නොවීම පාලිගේ කනස්සල්ලට හේතු වූවාය. ඔහු ඇය හා එක්ව දෙවියන් යදිනවා නම් වඩා යහපත් වෙතැයි ඇය සිතුවාය. නාගදීපයේ සිට එන අතරමග හමුවූ දේවස්ථානයට ඇතුලුවී, කුරුසයක ඇණ ගසා සිටි දෙවියෙකුට මිත්‍ර යාඥා කරන විට, පාලිද ඒ අසලින් දණ ගසාගෙන දෑත් එකතු කර හිස නමාගෙන වැඳගෙන සිටියාය. මිත්‍රගේ දෙවියන් ගෙන් පිහිටක් ලැබෙනු ඇතැයි ඇය බලාපොරොත්තු වූවාය.

කෙතරම් බෙහෙත් කළද අන්තිමේ ඉටු වන්නේ දෙවියන්ගේ කැමැත්ත බවය, පාලි විශ්වාස කළේ. එබැවින් දෙවියන් වැඳ කන්නලව් කිරීම ඉතා වැදගත් ලෙස ඇය සිතුවාය. මෙතැනට එන්නට ඔවුන්ට මග පෙන්වන්නට ඇත්තේත් දෙවියන් බව ඇය සිතුවාය.

ඇය කුඩා කළ ආත්තම්මා ගෙන් අසා තිබූ සෑම යාදින්නාවක්ම මෙහිදී සිහිපත් කිරීමට ඇය උත්සාහ කළාය. මෙසේ කන්නලව් කරන අතර ඇය දෑසෙහි බෙහෙත් ගල්වාගෙන සිටින මිත්‍ර සිතින් මවා ගත්තාය.

ඉර මුදුනට එත්ම සියඹලා ගසේ සෙවනැල්ල කෙටිවන්නට වුවත්, ගස යට තිබූ ආසනයට කොයි වෙලේත් සෙවනක් දීමට සියඹලා ගස සමත්විය.

සියඹලා ගස යට තනිවම හිඳගෙන සිටින පාලිට රෝහලේ ප්‍රධාන දොරටුව අසල වාඩිවී සිටිනා අය හොඳින් පෙනේ. ඔවුන් එතැන වාඩිවී සිටියේ ඔවුන්ගේ රෝගියා ඇතුලුවූයේ එතැණින් නිසාය. ඇතුලේ එහා මෙහා යන කෙනෙකුගේ සේයාවක් හෝ දුටුවිට මේ අය ගෙල හරවමින් ඉස්සී බලමින්, ඒ ඔවුන්ගේ රෝගියාදැයි කියා බලති. රෝගියා දැන් දැන් එතියි සිතුවත් තව බොහෝ වෙලාවකට ඒ අය නොඑනා බව ඔවුහු දැන සිටියහ.

නේවාසිකාගාරයේදී ඇය හඳුනාගත් අයෙක! ඒ අසලින් යන්නම් ඉඳහිට ඈ හා මොහොතකට නැවති කතා කළේය. එහෙත් ඒ හැම කෙනෙක්ම තම තමාගේ ප්‍රශ්න වලට මැදිවී සිටි නිසා පිළිසඳරක යෙදෙන්නට තරම් මානසික තත්වයක නොසිටියහ.

පළමු ශාලාවේ සිට ඇතුල් ගොඩනැගිලි තුළට යන රෝගීන් හා වෙදකම් ලබාගෙන රෝහලින් පිටවී යන අය දෙස පාලි බලා සිටියාය. ඔවුන්ගේ ඇඳුම් වලින් හෝ කතා බහෙන් ඒ ඒ අය පැමිණි පළාත හඳුනාගන්නට ඇය තැත් කළාය. එහෙත් රටතොට ගැන ඈ දන්නා දේ ඉතාමත් අල්ප බව ඇයට වැටහුණෙන්, පාලි ඒ අදහස අත් හැර දැමුවාය. ඊළඟට ඇය උත්සාහ කළේ ඔවුන්ගේ ඉරියව් වලින් හෝ මුහුණෙන් රෝගියාගේ තත්වය දැන ගත හැකිදැයි වටහා ගැනීමටය. රෝගයෙන් මුලුමණින්ම සුව ලබා ඇත්ද, සුව ලබමින් සිටිද, නැත්නම් පෙනීම ලබාදිය නොහැකියයි උසුලාගන්නට බැරි තීන්දුවක් ලැබීද, යන්න අනුමාන කරන්නට හැකිවේද? තමන්ගේ රෝගියාට බෙහෙත් කිරීම

නිමවෙන තුරු ඇතුලට යා නොහී එහි බලා සිටි ඇ වැනිම වූ තවත් අයද මෙහි සිටියහ.

සමහරුන් විටින් විට නැගිට ඒ මේ අත සක්මන් කළේ භාවනාවක යෙදී හෝ යාඥා කරමින් විය යුතුය. තවත් අය මහත් නොඉවසිල්ලෙන් සක්මන් කළේ උන් හිටි ගමන් ඔවුන්ගේ පවුලට මුහුණ පාන්නටවූ මේ අභාග්‍යසම්පන්න සිදුවීම උහුලාගෙන සිටින්නට අපහසු වී ඇතිවාක් ලෙසය. එසේ සක්මන් කරණ අතර වරක් දෙකක් ඔවුහු පාලි දෙසද බැලූහ. අයෙකු යන්තමින් සිනාවක් මුහුණට නගා ගන්නට තැත් කළත් අන් අයගේ බැල්මේ වෙනසක් නොවිය.

දෙපා හිරිවැටී ඇති බව දැනී ඇය අසුනෙන් නැගිට, පිපාසාවකුත් දැනුණ හෙයින් පිංතාලිය වෙතට ගමන් කළාය. එහි පියන මෑත් කර පොල් කටුවට පුරවා ගත් වතුර නොනවත්වා කටට වත්කරගෙන එක හුස්මට බීවාය. ඈ වතුර බොන දිහා කුඩා දැරියක බලාගෙන සිටියේ වතුර පොදක්වත් බිම නොහළා ඇය එක හුස්මට වතුර බීවේ කෙසේදැයි අදහා ගන්නට බැරිවය. උතුරුකරයේ කවුරුත් වතුර බීමට පුරුදුවී සිටියේ ඒ අයුරින් බව දැරියට කියන්නට පාලිට උවමනා වුවත් ඇය නිහඬව යලිත් සියඹලා ගහ යටට ගියාය.

වතුර බොන අතර ඇයට මතක් වුයේ මෙහි එන අතරමගදී වතුර බොන්නට නැවතුණ ගෙදරක මහලු කාන්තාවක් දුන් අවවාදයකි.

"හොඳටම පිපාසය ඇතිවූ විට රත් කළ වළන් කටු නිවාගත් ජලය බොන්න " යැයි මැහැලිය කීවා ඇයට සිහිවිය.

ආපසු නාගදීපයට ගිය විට, කොරටුවේ වැඩ කරන විට, එය මතක තබා ගත යුතුයැයි පාලි සිතා ගත්තාය.

## දේශ සංචාරකයෝ

විශෙෂ සාත්තු ඒකකය අසල තිබූ පුටු පේලියේ එකම පුටුවක දින දෙකක් තිස්සේ වාඩාවී සිටි සුදු ගැහැණිය දෙස භානුගේ දෑස් යොමුවිය ඈ, ඉදිරියේ වූ මැද මිදුල දෙස හිස් බැල්මෙන් යුතුව ඇය බලා සිටියාය.

භානුට ඇය කෙරෙහි දුකක් උපන්නාය. ඇය සංචාරිකාවක විය යුතුයැයි භානු සිතුවාය. එසේනම් ඈ දන්නා හඳුනන කිසිවෙක් මේ රටේ නැතිවිය හැකිය.

"ගුඩ් ඊව්නිං" භානු ගැහැණිය ඇමතුවාය.

"ගුඩ් ඊව්නිං" ගැහැණිය මොහොතකට භානු දෙස බලා යලිත් ඉවත බලා ගත්තාය.

"කවුරු හරි ලෙඩෙක් මෙහේ ඉන්නවද" භානු ඇසුවාය.

"ඔවු. මගේ මහත්තය, එයා එම්. අයි. සී. යූ. එකේ"

"මට මොනව හරි උදව්වක් කරන්න පුලුවන් ද"

"නෑ. බොහොම ස්තුතියි, මං හිතන්නෙ නැහැ දැන් කාටවත් උදව්වක් කරන්න පුලුවන් කියල, කරන්න පුලුවන් නම් එකම දේ තමයි අපේ දොස්තර සොයල දෙන එක. දැන් දවස් දෙකකින් එයා ආවෙ නැහැ"

"කව්ද දොස්තර?"

"මට හරියට නම කියන්න බැහැ මොකක්ද බතල.. වගේ නමක්"

"ඩොක්ටර් බතලගෙදර?"

"අන්න හරි, එයා නියුරෝ සර්ජන් කෙනෙක්[16]"

"මං අහන්නද බලන්න, රිසෙප්ෂන් එකෙන්"

"වැඩක් වෙන්නෙ නැහැ. එක්කො එ අය දන්නෙ නැහැ. නැත්නම් සොයන්න උවමනාවක් නැහැ. මම දැන් දවස් දෙකක් තිස්සෙ අහනවනෙ"

මාත් ට්‍රයි එකක් දෙන්නම් බලන්න" භානු එසේ කියා පිළිගන්නා මේසය වෙත ගොස් එහි සිටි යුවතියකගෙන් දොස්තර බතලගෙදර ගැන විමසුවාය.

---

[16] සනායු ශල්‍ය වෛද්‍ය වරයෙක්

"ඩොක්ටර් උදේ නං ඇවිල්ල ගියා. දැන් අදනං ආයිත් එන එකක් නැහැ අලුත් ලෙඩෙක් ඇඩ්මිට් කළොත් මිසක"

"එයාගෙ ලෙඩෙක් ඉන්නවනෙ එම් අයි සී යූ එකේ" භානු කීවාය.

"එහෙනං ඩොක්ටර් එයි" යුවතිය අහක බලාගෙන පැවසුවාය.

"ඒ උනාට ඩොක්ටර් ලෙඩාව බලන්න උදේ ඇවිත් නැහැ. කරුණාකරල කියන්න පුලුවන්ද ඩොක්ටර් භවසට ඒවිද කියල" භානු නැවතත් ඇසුවාය.

"අපට බැහැ ඩොක්ටර්ගෙන් එහෙම අහන්න, අපට බැනුම් අහන්න බැහැ "

"එහෙනං මම කෝල් එකක් දෙන්නද, මට ටෙලිෆෝන් නොම්මරේ දෙනවද "

"ඔයා ලෙඩාගෙ කවුද?"

"මගේ කවුරුවත් නෙවෙයි, මම අහන්නෙ පිට රට එක්කෙනෙක් ගැන එයාගෙ වයිෆ් වෙනුවෙන් "

"අපෝ, ඒ ගෑණි ද? හරිම වාතයක් තමයි ඊයෙ ඉඳලම "

"ඔය කියන්නෙ අර එම්. අයි. සී. යූ, එක ළග ඉන්න සුද්දි ගැනද?" එතැන සිටි තව යුවතියක් කතාවට එක් වූවාය.

"එයා තමයි. බේරිල්ලක් නැහැ එයාගෙන්, පිස්සුද කොහෙද ඒ ගෑණිට"

භානු අසරණවී එතැනින් ඉවත් වූවාය. එහෙත් ඈ ඒ සුදු කතට කුමක් කියන්නදැයි කල්පනා කළාය. දොස්තර උදේ රෝහලට පැමිණියත් මේ ලෙඩා පරීක්ෂා කරන්නේ නැතිව ගිය බව ඒ ගැහැණියට කිව නොහැක. තාත්තා පැමිණ ඇතැයි බලාපොරොත්තුවෙන් ඇය සුනීතාගේ කාමරයට ගියාය.

"ඩැඩී, පොඩි හෙල්ප් එකක් ඕන" ඈ රාජුට කීවාය.

"මොකක්ද? මං හිතුවෙ අද කාලෙ ළමයින්ට තාත්තලගෙ උදවු ඕන නැහැ කියල මොනවටවත් " ඔහු මුහුණට නගාගත් සිනහවකින් යුතුව ඇගෙන් ඇසුවේය.

"මට නෙවෙයි ඩැඩී, අර පල්ලෙහා එම්. අයි. සී. යූ. එක ළග වාඩිවෙලා ඉන්න ෆොරින් ලේඩි කෙනෙකුට, එයාගෙ හස්බන්ඩ්ට හුගක් අමාරුයි "

" ඉතින්?" රාජු ඇසුවේය "මොනවත් ඩ්‍රග් එකක් හොයල දෙන්නද?"

" නෑ. ඊට ඉස්සෙල්ල ලෙඩාගෙ දොස්තර හොයල දෙන්න. ඩොක්ටර් බතලගෙදර දැන් දවස් දෙකකින් ලෙඩා බලන්න ඇවිල්ල නැහැ. ඩැඩීට බැරිද ඩොක්ටර්ට කතා කරල කියන්න ඇවිත් ලෙඩා බලන්න කියල "

"මට බැහැ ලෙඩා බලන්න කියන්න. ඔන නං අහන්නං ලෙඩාගෙ තත්වෙ කොහොමද කියල "

"අනේ ඩැඩී මොනව හරි කරන්නකො පවු නේ" ඇය රාජුගේ අතේ එල්ලී ඔහුත් ඇදගෙන බැල්කණියට ගියාය.

රාජු ඔහු අත වූ දූරකථනයෙන් බතලගෙදරට කතාකරන්නට උත්සාහ කළේය. කුඩා කලදී මෙන් රාජුගේ අතේ එල්ලී ඔහුගේ පිහිට පැතූ දියණිය නිසා ඔහුට සියුම් සතුටක් දැනුණේය. ඇගේ සිතිවිලි දූෂ්‍ය කළේ මේ ඉන්ටර්නෙට් වසංගතය නේදැයි ඔහුට ඒ සමගම නව තාක්‍ෂණ ලොකය ගැන වෛරයක් ඇතිවිය. ඇමතූ නොම්මරයෙන් පිළිතුරක් නොලද නිසා දූරකථනයේ ගබඩා කර තිබූ නොම්මර අතරින් තවත් නොම්මරයක් සොයන්නට ඔහුට සිදුවිය.

"මොබයිල් එකට කතා කරල බලන්නකො ඩැඩී"

"එයා ඒකට උත්තර දෙන්නෙ එයාට ඔනනං විතරයි. කෝල් කරන එක්කෙනාගෙ නොම්මරේ පේනවනෙ එයාට. එයා කැමති නැහැ අපි අපේ වැඩකට මොබයිල් එකට කතා කරනවට. ඒක තියෙන්නෙ එයාගෙ ප්‍රයොජනේට මිසක් ගරු සේවයට නෙවෙයි කියලයි එයා කියන්නෙ "

සතරවෙනි නොම්මරය ඇමතූ විට දොස්තර එහි සිටියේය. රාජු දොස්තරට විස්තරය කියනවා භානු නොඉවසිලුලෙන් අසා සිටියාය. රාජු, "ඉයස් සර්, ඉයස් සර්", කියනවා කිහිප වරක් අසා සිටි භානුට තාත්තා කෙරෙහි යළිත් කෝපයක් ඇතිවිය. මේ දොස්තරට නයිට් පදවියක් කවදා ලැබුණාදැයි අසන්නට ඇගේ දිව අගටම ආවත් මේ වෙලාවේ තාත්තා තරහ කර ගෙන බැරි නිසා වචන ටික ගිල ගත්තාය.

"ඩොක්ටර් කියනව එයා ලෙඩා බැලුව කියල, කරන්න ඔන ඒව සෙරම නර්ස්ලට කියලයි තියෙන්නෙ කියල. එම්. අයි. සී. යූ. එකේ නර්සල එක්ක එයා ටෙලිෆෝන් එකෙන් සැරින් සැරේ චෙක් කරනව "

"ඩොක්ටර් කොහොමද එහෙම කියන්නෙ? දුර ඉඳගෙන බෙහෙත් කරන්න එයාගෙ ප්‍රයිවෙට්, ටෙලිමෙඩිසින් ක්‍රමයක් තියෙනවද?" භානුට ඉබේටම වාගේ ඇසුණේය.

"හැම තිස්සෙම ඩොක්ටර්ස්ලගෙ වැරදිම බලන්න එපා දුව" රාජු මහත් ඉවසීමකින් කියා සිටියේය. "එයා තමයි ලංකාවෙ ඉන්න හොඳම නියුරො සර්ජන්. එයා දන්නව මොනවද කරන්න ඕන කියල"

"හොඳයි ඩැඩී අපි එහෙම වත් හිත හදා ගනිමු. මං අර ලෙඩාට කතා කරල එන්නම් "

සුදු කාන්තාව හුන් තැනින් සෙලවුනු බවට ලකුණක් වත් තිබුණේ නැත. භානු ඇය අසලින් වාඩිවුවිට ඇය හිස ඔසවා බැලුවාය.

"මොනව හරි ආරංචියක් ලැබුණද?" ඇය උදාසීන ලෙස ඇසුවාය.

"මං අපේ තාත්තාට කියල ඩොක්ටර්ට කතා කළා. ඩොක්ටර් කිව්ව බය වෙන්න කිසිම දෙයක් නැහැ කියල. ලෙඩාගෙ තත්වය දැන් පාලනය කරලයි තියෙන්නෙ කියල" මේවන් අවස්ථාවක ඇත්තම නොකීවාට වරදක් නැතැයි ඇය සිතුවාය.

"ඇත්තටම ඩොක්ටර් එහෙම කිව්ව ද?" ඇය භානුගේ අතින් අල්ලාගෙන ඇසුවාය.

"ඔවු. දැන් ඉතින් බය වෙන්න ඕන නැහැනෙ" භානු ඇගේ අනිත් අත සුදු ගැහැණියගේ අත උඩින් තබාගෙන කීවාය.

"ඔයාට ගොඩක් ස්තුතියි" කියා එතැනින් නැගිට ගත් කාන්තාව සැමියා බලන්නට ඇතුලට ගියාය, "මං එනකම් ඔයා ඉන්නවද?" ඈ ආපසු හැරී, බැගෑපත් හඩකින් භානුගෙන් ඇසුවාය.

"මං ඉන්නම් "

ටික වේලාවකින් කාන්තාව යලිත් පැමිණ භානු අසලින් ඇගේ සුපුරුදු පුටුවේ වාඩිවුවාය.

"එයා එහෙම ඇඳේ ඉන්න විදිය මට බලා ඉන්න බැහැ " කඳුලක් පිසදමමින් ඇය කීවාය.

"මොකක්ද අසනීපෙ "

"ඒක තමයි දන්නෙ නැත්තෙ කවුරුවත්ම. ඩොක්ටර්වත් දන්නෙ නැහැ මං හිතන්නෙ. ඒ අය සැක කරන්නෙ මොකක් හරි විෂබීජයක් ඇතුල් වෙලා කියල., එයාගෙ මුලු ඇගම පන නැතිවෙලා. හදිසියෙම උනේ. කලින් කිසිම අසනීපයක් තිබුණෙ නැහැ. අපි රුවල් නැවකින් ඉන්දුනීසියාවෙ ඉඳල යාත්‍රා කළා. එක දවසක් උදේ එයා නාන කාමරයෙන් එළියට ආවෙ රැවුල කපාගන්න අමාරුයි අත පන නැහැ කියල. මං දැක්ක එයා ඇග පිසදා ගත්තෙත් හරිම අමාරුවෙන්. ඔලුව පිහදාන්න තුවාය ඉහළට ගන්නවත් අත උස්සන්න අමාරු උනා. මං නිකන් විහිලු කළා වයසට යන කොට ඔහොම තමයි කියල. එයත් හිනා උනා, දැන් ඉන්න තරුණයින්ට වඩා එයා තාමත් තරුණයි කියල " ඇගේ දෑසින් ගලා ආ කඳුලු පිසදා ගැනීමට ඇය මෙවර උත්සාහ කළේ නැත.

"එයා ඇමරිකන් ගුවන් හමුදාවෙ කර්නල් කෙනෙක් හැටියට ඉඳල විශ්‍රාම ගියෙ අවරුදු දෙකකට කලින්. එදා ඉඳල අපි ලෝකෙ හැම තැනම ඇවිද්දා. එයා මට පොරොන්දු වෙලා තිබුණ, කවදහරි විශ්‍රාම ගියාට පස්සෙ එයාගෙ මුලු කාලයම මාත් එක්ක ගත කරනව, එයා ගියපු හැම රටකටම මාත් එක්ක යනව කියල "

"ඔයාට හරි ආදරේ ඇති " කුමක් කියන්නදැයි නොදැන භානු කීවාය.

"පහුගිය අවුරුදු දෙක හරියට ඉවර නොවෙන මදුසමයක් වගෙයි අපි දෙන්නට දැනුණෙ" ඇය අත්බෑගයෙන් මුහුණ පිසදමන කඩදාසියක් ගෙන දෑසත් නහයත් පිසදා ගත්තාය. භානු නිහඬව සිටියාය.

"එදා එයා ෂර්ට් එකේ බොත්තම් දා ගත්තෙ කොයිතරම් අමාරුවෙන්ද කියල මං බලා හිටිය, අන්තිමේ මම බොත්තම් ටික දැම්ම සමහරවිට සීතලට අත් හිරිවැටිල වෙන්න ඇති කියල. ඒත් එන්න එන්නම එයාගෙ අතපය වලංගු නැතිවේගෙන ගියා. කීප වතාවක් කකුල පටලැවිල වැටෙන්න ගියා. මං දැක්ක එයා ඇවිද්දෙ කකුල අද්දවමින් අන්තිමේ එයා පුටුවක වාඩිඋනා ඇවිදගන්න අමාරුයි කියල" ඇය මෙහොතකට නැවතුනාය.

"ඊට පස්සෙ පුටුවෙන් නැගිට ගන්න බැරි උනා, එතකොට තමයි මම ඇත්තටම බය උනේ අපි හිටියෙ මහ සාගරය මැද, රේඩාර් එකට වත් ළග පාතක නැවක් තියා බෝට්ටුවක් වත් පේන්න තිබුණෙ නැහැ. මං කොහොමහරි එයාව වත්තන් කරගෙන ගිහිල්ල ඇඳකට දා ගත්ත "

"උදව් ඉල්ලන්න ක්‍රමයක් තිබුණෙ නැද්ද? "

"මං රේඩියෝ එකෙන් ආධාර ඉල්ලන්න පටන් ගත්තා. ඒවට පිළිතුරු ලැබුණා. ළගම ඇති වරාය ගාල්ල නිසා මට එහේට යාත්‍රා කරන්න පුලුවන්ද කියල එයාල ඇහුව. ඒ අය රේඩියොවෙන් උපදෙස් දුන්නොත් ගාල්ලට යන්නම් කියල මං කිව්ව. එන්න එන්නම පීම් ගෙ තත්තවය නරක අතට හැරුනා. දවල් වෙනකොට එයාගෙ අත් දෙකත් සම්පූර්ණයෙන්ම පණ නැති උනා. ගොත ගහන්නත් පටන් ගත්තා. මං දන්නෙ නැහැ මා කොහොම බෝට්ටුව පදවගෙන ගියාද කියල. ගාල්ලට ළං වුනාම වරායෙ ඉඳල ආපු බෝට්ටුවක එක්කෙනෙක් අපේ බෝට්ටුවට නැගල අපිව වරාය ඇතුලට ගත්ත. එතන ගිලන් රථයක් ඇවිත් තිබුණා. දැන් ඉතින් ඩොක්ටර් බතලගෙදරගෙ පිහිට තමයි අපට "

"මෙක තමයි ලංකාවෙ තියෙන හොඳම රෝහල, ඔයාගෙ මහත්තය බලාගන්නෙ අපේ රටේ ඉන්න හොඳම වෛද්‍ය විශේෂඥයෙක් " භානු ඇය සැනසීමට තැත් කළාය.

"මං අපේ තානාපති කාර්යයාලයට දැන්නුව, මට ඕන පීම්ව ඇමරිකාවට ගෙනියන්න, ඒ උනාට හෘද පෙනහලු යන්ත්‍රයක ඉන්න ලෙඩෙක්ව ගෙනියන්න ගුවන් යානා කැමති නැහැ. තානාපති කාර්යාලයෙන් ඒකයි මම පිහිටක් බලාගෙන ඉන්නෙ "

"මං දැන් යන්න ඕන. හෙට උදේටත් මං මෙහෙ එනව. මොනව හරි අපට කරන්න පුලුවන් දෙයක් තිබුණොත් මේ නොම්මරේට කතා කරන්න" ඇය ඔවුන්ගේ නිවසේ දුර කථන අංකය දුන්නාය, "සමාවෙන්න මට අමතක උනා කියන්න මගේ නම භානු"

"මම රෝඩා. රෝඩා වයිට්රිවර්" ඇය කීවාය, "මං තව ටික වෙලාවක් මෙතන ඉඳල හොටලේට යනව. මං ඉතින් වෙන මොනව කරන්නද"

ආපසු ගෙදර යන ගමනේදී භානු ඇගේ දෙමාපියන් හට රෝඩා ගේ කතාව කීවාය. දොස්තර බතලගෙදරට යලිත් වරක් පසුදා උදේ කතා කරන්නැයි චිත්‍රා රාජුගෙන් ඉල්ලා සිටියාය. රාජු තේරුම් කර දෙන්නට උත්සාහ කළේ බතලගෙදර එහෙම කාගෙවත් ඉල්ලීම් වලට කන් දෙන අයෙක් නොවන බවයි.

"එහෙනම් එයා මොන වගේ දොස්තර කෙනෙක්ද?" මෙතෙක් තාත්තා සමග වාද නොකර සිටි භානුට ඉබේටම වාගෙ ඇසුණේය.

"ඕකනෙ කියන්නෙ, මොනව හරි පොඩි දෙයක් අල්ලගෙන දූව කලබල වෙනව. අපේ දොස්තරලට බනින්න ගන්නව, මොනවද ඒගොල්ල දූට කරපු වැරැද්ද " රාජු ඇසුවේය. "මං කියන්න හැදුවෙ හැම දොස්තර කෙනෙක්ම එක වගේ නෙවෙයි කියන එකයි, එක එක්කෙනා එක එක විදිහටයි ලෙඩ්ඩු ගැන බලන්නෙත් ලෙඩාගෙ පවුලෙ අය ගැන බලන්නෙත්. මෙතන වැදගත් වෙන්නෙ ලෙඩා සනීප කර ගන්න එකයි. දොස්තරල වැඩ කරන හැටි නෙවෙයි "

"ඒ උනාට ඩැඩී එයාගෙ යුතුකමක් තියෙනවනෙ දවසට එක පාරක් වත් ලෙඩා බලන්න"

"ඒක එහෙම කියන්න බැහැ. සමහරවිට දවසට තුන් හතරපාරක් උනත් දොස්තරල එනව"

"එන එන වතාවට බිලත් එකතු වෙනවනෙ"

"ඉතිං ඒකත් වැරද්ද? දොස්තර ලෙඩාට බෙහෙත් කරනව, ලෙඩා ඒකට මුදල් ගෙවනව, සල්ලි ගෙවන්න බැරිනං ආණ්ඩුවෙ ඉස්පිරිතාලෙකට යන එකයි ඇත්තෙ"

"ආණ්ඩුවෙ ඉස්පිරිතාලෙ කියන්නෙ ඩොක්ටර්ස්ල කවදාවත් ලෙඩ්ඩු බලන්නෙ නැති තැනක් නෙ. එතන ඉතින් දොස්තරල විතරක් නෙමෙයි හැමෝම කාක්කො වගේ ලෙඩ්ඩුන්ගෙ ඉහ මොළ හූරගෙන කන තැනක්නෙ. බෙහෙත් ටික හොරකම් කරගෙන ගිහිල්ල ඉස්සරහ ෆාමසි එකට විකුණනව, ලෙඩාගෙ කිරිපිටි ටික බිත්තර ටික ගෙදර ගෙනියනව, එතෙන්ට ගන්න හැම දේකින්ම කොමිස් ගහනව, අන්තිමට හොස්ස ළඟින් මැස්සෙක් ගියත් ස්ට්‍රයික් කරනව" භානු කියාගෙන කියාගෙන ගියාය.

"හැම දේකම නරක පැත්ත විතරක් බලන්න එපා. ඉඳල හිටල හොඳ පැත්තත් බලන්න. හිතන්න ඒ අය දවසකට ජීවිත කීයක් බේර ගන්නවද කියල" චිත්‍රා ඇයට කීවාය.

"ඒකනෙ මම් ප්‍රශ්නෙ. මට හිතාගන්න බැහැ මේ මිනිස්සු ජිවිත බේර ගන්නෙ කොහොමද කියල. ඇහෙන දකින හැම දෙයක්ම නිසා මට හිතාගන්න බැරි මේවගේ මිනිස්සු වැඩ කරන ඉස්පිරිතාලවලත් කොහොමද ලෙඩ සනීප වෙන්නෙ කියල. හොඳයි මම් කියන්න මේ අය ඇත්තටම ලෙඩුන් සනීප කරන්න කැප වෙලා ඉන්නව නම් ඇයි ඔය වගේ ස්ට්‍රයික් කරන්නෙ හැමදාම. ඒ ගොල්ල දේශපාලකයො කරන වැරදි වලට පලි ගන්නෙ අහිංසක මිනිස්සුන්ගෙන් "

"මේ ළමය එක්ක කතා කරල වැඩක් නැහැ. මොඩ කමට බෙහෙත් නැහැනෙ" රාජු කීවේය.

පසුදා උදේ භානු සුනීතා බලන්නට යනවිට රෝඩා පුරුදු පුටුවේම වාඩිවී සිටියාය. ඇය හා කතා නොකරම භානු සුනීතාගේ කාමරයට ගියේ කතාවට වැටුණොත් ප?මාද වෙන නිසාය. භානු ටික වෙලාවක් සුනීතා සමග ගතකර රෝඩා හමුවීමට ගියාය.

"සුභ උදෑසනක්, ඉතින් කොහොමද මිස්ටර් පිම් ට?"

"සුභ උදෑසනක්. හැබැයි ඔය වචන ටිකම ඩොක්ටර්ගෙන් අහන්න ලැබුණ නං කොයිතරම් සැනසීමක්ද " රෝඩා පැවසුවාය.

"ඩොක්ටර් ආවෙ නැද්ද තාම?"

"නැහැනේ එක් තමයි මාත් මේ බලාගෙන ඉන්නෙ. අර ගෑනු ළමයින්ගෙන් අහලත් ඇතිවෙලයි මං ඉන්නෙ "

"වාට්ටුවෙ ඉන්න දොස්තරලගෙන් ඇහුවෙ නැද්ද?"

"ඇහුවට වැඩක් නැහැ. ඒ අය එක්කො මම වගේම අසරණයි නැත්නම් කිසිදෙයක් දන්නෙ නැහැ. නැත්නම් මහ කෙරුම්කාර දොස්තරට පණ බයයි "

"අද නම් සහතිකවම දොස්තර ඒවි "

"මට නම් එච්චර විශ්වාසයක් නැහැ. මට සහතික එකම දේ තමයි මගේ පිම් මැරෙන්න යනව කිසිම කෙනෙක් ඒ ගැන මොනවත් කරන්නෙ නැහැ කියන එක විතරයි "

"එහෙම හිතන්න එපා මේ රෝහලේ අය පුලුවන් හැමදෙයක්ම කරනව ඇති ලෙඩාට "භානු ඇගේ අවධානය වෙන අතකට යොමු කරන්නට තැත් කරමින් ඇසුවාය, "ලෙඩා ඇමරිකාවට එක්ක යන එක කොහොමද?"

"මං ඊයෙ රෑ පිම්ගෙ මල්ලිට කතා කළා. එයා උත්සාහ කරනව ගුවන් හමුදාවෙ යානයක් එවන්න "

"ඒක හරිම සුභ ආරංචියක් නෙ"

"ඒ උනාට ඒ වැඩේ ඒ තරම් ලේසි නැහැ. මං දන්නවනෙ ගුවන් හමුදාවෙ කී දෙනෙක් ළගට යන්න වෙනවද කියල ඒක අනුමත කරව ගන්න "

"ඒක කොහොමහරි කරගනියි එයා. ඉතින් මේක හමුදාවෙ හිටපු එක්කෙනෙක් වෙනුවෙන්ම නෙ "

"දන්නවද දුව මට ඔයා හමු උනාට පස්සෙ ඇත්තටම දැන් ආයිත් බලාපොරොත්තු ඇතිවේගෙන එනව. ඊයෙ වෙනකොට මම සේරම බලාපොරොත්තු අත් හැරලයි හිටියෙ "

"අපට කරන්න පුලුවන් දෙයක් තියෙනව නම් ඕන වෙලාවක කියන්න"

"මේ ළග පල්ලියක් තියෙනවද?" රෝඩා එක් වරම ඇසුවාය.

"පල්ලි කීපයක්ම තියෙනව, මොන පල්ලියටද යන්න ඕන"

"ඔයාට පුදුම හිතෙයි මං කිව්වොත් රෝමානු කතෝලික කියල ඇමරිකාවෙ ඉඳල ඇවිල්ලත් "

"පදුඳුම නැහැ. ලංකාවෙත් රෝමානු කතොලිකයො හුගක් ඉන්නව මාත් කතොලික ආගමේ තමයි. මේ ළගම පල්ලියක් තියෙනව. අපි දැන් යමුද"

"යන්න ඇත්නම් හොඳයි. කරදරයක් නෙවෙයිනම් මට පෙන්වන්න පුලුවන්ද තියෙන තැන"

"මාත් එන්නම් පිම් වෙනුවෙන් යාඥා කරන්න"

"මං ආසයි පයින් යන්න"

රොහල් ගේට්ටුවෙන් එළියට ආ භානු ඈත පෙනෙන කතෝලික දේවස්ථානය රෝඩාට පෙන්වූවාය. දෙදෙනා ම තම තමාගේ සිතිවිලි වලට ඉඩදී නිහඬව ඒ දෙසට ඇදුණහ. යාඥාවෙන් පසු භානු ඇගේ පංති සඳහා යාමට පිටත් වූ අතර රෝඩා ආපසු රෝහල වෙත ගියාය.

එදා සවස භානු දුටුවේ රෝඩා තවත් ගැහැණියක හා කතා කරමින් සිටිනා බවයි භානු දුටු විගස රෝඩා ඇය වෙත දුව ආවාය.

"ගුවන් යානයක් එවන්න අවසර දීල" ඇය කීවාය.

"එක නම් ඇත්තටම සුභ ආරංචියක්. කවද්ද එන්නෙ? "

"තාම ඒක නම් හරියට දන්නෙ නැහැ. දැන් ඉතින් ප්‍රමාද වෙන්න දෙයක් නැහැ" රෝඩා භානු ඇදගෙන ගොස් පුටුවක වාඩිවූවාය, " මට තානාපති කාර්යාලයෙන්

කතා කලා. වෛද්‍යවරුයි සේරම අවශ්‍ය උපකරණයි අරගෙන යානයක් එනවයි කියල"

"දැන් ඉතින් සේරම හරිනෙ. මං ගිහිල්ල මගේ යාලුව බලල එන්නම් ඉක්මනට" භානු නැගිට සිටියාය.

"මාත් එන්නද යාලුව බලන්න" රෝඩා ඇසුවාය.

"අනේ එන්න. එයත් පාලුවෙ ඉන්නෙ කතා කරන්නවත් කෙනෙක් නැතුව. අපේ තාත්ත හිටියොත් මං තාත්තත් අඳුන්වල දෙන්නම්. තාත්ත වැඩ කරන්නෙ යුරෝපීය බෙහෙත් සමාගමකට"

සුනීතා සමග සුලු වේලාවක් කතා කරමින් සිට රෝඩා සිය සැමියා බලන්නට ගියාය. සුනීතා වෙනුවෙනුත් යාඥා කරන්නට ඇය පොරොන්දු වූවාය.

"මං හිතා හිටියෙ සුදු හම තියෙන අය දූවට ජේන්න බැහැ කියල " රාජු රෝඩා ගියපසු ඇසුවේය.

"මං ද්වේශ කරන්නෙ අපේ රට සූරා කාපු සුදු හැතිකරේට. අපේ සංස්කෘතිය, අපේ සිරික් විරිත්, විනාස කරපු උන්ට. තාමත් අපේ සම්පත් අපේ ඉහ මොළ සූරා කන උන්වයි මට ජේන්න බැරි " භානු මහත් උද්වේගකර හඬකින් කීවාය.

"එහෙනං මේ ගෑණිට උදව් කරන්නෙ "

"මං එයාව දකින්නෙ පර සුද්දෙක් හැටියට නෙවෙයි. අපේ රට විනාස කරපු සුද්දො ගැන එයාට කරන්න දෙයක් නැහැ. මට එයාව ජේන්නෙ අපි වගේම අසරණ වුන ගැහැණියක් වගේ. එයාගෙ සැමියා මැරෙන්න යනව මෙහේ, එයා දන්න අඳුනන කවුරුවත් නැති ආගන්තුක ලෝකයක. සෙරටම වැඩිය මට දුක අපේ මහ ලොකු දොස්තරල ඒ ලෙඩාට සලකන හැටි දුටුවම "

භානු සුනීතාගෙන් සමුගෙන රෝඩා වෙත ආපසු ගියාය.

"මං පිම්ගෙ මල්ලිට කතා කළා, මල්ලි එහේ ගුවන් තොටුපලට එනව අපි මුණගැහෙන්න, එතනින් කෙලින්ම ගුවන් හමුදා රෝහලට යනව. වෛද්‍ය වරු දෙන්නෙක් යානයේම එනව. ආපු හැටියෙම බෙහෙත් කරන්න පටන් ගනියි " සිය විවාහ උත්සවය ගැන විස්තර කරනා ලාබාල කෙල්ලක මෙන් ඇය කියන්නට වූවාය.

"ලංකාවට එන වෙලාව කිව්වද?"

"තාම නැහැ හෙට උදෙ තමයි හරියටම දැන ගන්න පුලුවන් වෙන්නෙ මල්ලි මට කතා කරයි. මෙහේ ඉඳල ගුවන් තොටුපලට ගිලන් රථයක් ඕන වෙනව "

"ඒක මේ රෝහලෙන්ම ලෑස්ති කරයි "

"මම පිම්ටත් කිව්ව ඇතුලට ගිහිල්ල මේ ගැන තව දවසකින් එයාට අපේ රටට ගිහින් නියම ප්‍රතිකාර ගන්න පුලුවන් කියල "

"මිස්ටර් පිම්ට ඇහෙනවද කියන ඒව "

"මං දන්නව එයාට මං කියන දේ ඇහෙනව කියල, මං ළගට ගියාම මාව පේනව කියල, ඉතින් මං කිව්ව මල්ලි කතා කළා කියල. එහේ වෛද්‍යවරු කිව්ව බව පිම්ට ඉක්මනින්ම සනීප කරන්න පුලුවන් කියල අපිට ආයෙත් මුදු සංචාරය පටන් ගන්න පුලුවන් කියල"

"දැන් ප්‍රශ්න සේරම හරිනෙ. දැන් ඉතින් බතලගෙදර නාවත් කමක් නැහැනේද" භානු ඇසුවාය.

"එහෙම කියන්න එපා භානු. අපට තවමත් ඩොක්ටර් අවශ්‍ය වෙනව පිම් ගෙ තත්වය මේ ගානට හරි පවත්වාගෙන යන්න මීට වඩා අමාරු වෙන්න දෙන්නෙ නැතුව, ඒත් අදත් තාම ඩොක්ටර් ආවෙ නැහැනෙ " ඇය යලිත් දුක්මුසු හඩකින් කීවාය.

"මං කතා කරල බලන්නං" භානු කීවාය.

භානු පිළිගැනීමේ කවුලුව වෙත ගොස් යලිත් දොස්තර බතලගෙදර ගැන විමසුවාය. ඔහු රෝහලට පැමැණි බවත් දැන් රෝගීන් බලමින් යන බවත් එහි සිටි යුවතිය පැවසුවාය. භානු වහා දුව ගොස් මේ බව රෝඩාට කීවාය. රෝඩා වාට්ටුව ඇතුලට ගොස් දොස්තරට ලෙඩා බලන්නට එන්නට මතක් කරන්නැයි එහි හෙදියන්ගෙන් අයැද සිටියාය. භානු පිටත හිඳ දොස්තරගේ සලකුණක් බලාපොරොත්වෙන් සිටියාය.

"හෙදියන්ට බැහැනෙ දොස්තරව හොයාගන්න කොහේ ඉන්නවද කියල. හැම තැනම සෙව්ව. අර ළමයි බොරුවට කිව්වද දන්නෙ නැහැ " රෝඩා ආපසු ආවාය.

"අපි ගිහින් සොයමු " භානු නැගිට සිටියාය.

ඔවුහු බාහිර රොගීන් පරීක්‍ෂා කරන කොටසට ගියේ කොතනක සිටියත් මෙහි සිටිනා ලෙඩුන් බලන්නට ඔහු ආ යුතු නිසාය. රොගීන් කිහිප දෙනෙක් දොස්තර බතලගෙදර එනතුරු ඉන්නා බව එතැන සේවිකාවකගෙන් දැන ගැනීමට හැකිවිය. ඔවුහු දොස්තරට වෙන් කර තිබූ කුටිය අසලට ළං වූහ.

"මේ දොස්තරට තියෙන උපාධි ගණන" රෝඩා විමතියෙන් මෙන් දොරේ ගසා තිබූ නාම පුවරුව කියවන්නට වූවාය.

"මට නං තේරෙන්නෙ නැහැ මොනවටද මේ සේරම උපාධි තියෙන බව මෙතන ගහගෙන ඉන්නෙ "

"එකත් හරියට අපි ගැණු අපේ ඇගපත පෙන්නන් හදනව වගේ තමයි පිරිමි අල්ල ගන්න. මේ අය ලෙඩ්ඩු අල්ල ගන්න මේව කරනව " රෝඩා සිනාසෙමින් කීවාය. ඇය සිනාසෙනවා දුටු භානුටද මහත් සතුටක් ඇතිවිය. ඈ දුටු මුල් දිනයේ අය සිටි විලාසය භානුට සිහිවිය.

අඩ හොරාවක් පමණ ඔවුන් දෙදෙනාට එතැන බලා සිටින්නට සිදුවිය. එක් පැත්තකින් විදුලි සෝපානය දෙසත් අනිත් පැත්තෙන් පහළ තට්ටුවේ වාට්ටුවල සිට ඇතුලුවන දොර දෙසත් බලන්නට ඔවුන්ට සිදුවිය. දොස්තර ලෙඩුන් බලන්නට කාමරයට වදින්නට පෙර ඔහු අල්ලා ගත යුතුය.

විදුලි සොපානයෙන් ඔහු එළියට එනවා දුටු භානු රෝඩාත් සමග ඔහු වෙත ළගා වූවාය.

"සමාවෙන්න ඩොක්ටර්, මට විනාඩියකට කතා කරන්න පුලුවන්ද?" රෝඩා ඔහුගෙන් ඇසුවාය.

ඇගේ වදන් නොඇසුනාක් මෙන් යන්නට සැරසුනු දොස්තර යලිත් ඇය දෙස බලා ඇගේ සුදු හම නිසාදෝ මොහෙතකට නැවතුණේය.

"ඇයි? මට පරක්කු වෙනව ලෙඩ්ඩු බලා ඉන්නව " ඔහු පැවසීය.

"මගේ මහත්තය ගැන අහන්නයි, එම්. අයි. සී. යූ. එකේ ඉන්න ජේම්ස් වයිට්රිවර් ""

"ආ, මං දැන් බැලුව, තත්වය දැන් හොඳයි, මං තව පරීක්ෂණ කිහිපයක් නියම කළා. ඒවයෙ වාර්තා ආ ගමන් බෙහෙත් පටන් ගන්න පුලුවන් "

"එයාට සනීප වෙයි නේද ඩොක්ටර් "

"ඔව්. ඔව්. බය වෙන්න දෙයක් නැහැ " කියමින් ඔහු කාමරයට ඇතුලු විය.

"මට වෙලාවකට පව් කියල හිතෙන්නෙ දොස්තරල ගැන, ලෙඩ්ඩු ගැනට වඩා, මේ මැරෙන මැරිල්ලට " භානු කීවාය.

"කීයට විතරද දොස්තර වැඩ පටන් ගන්නව ඇත්තෙ " රෝඩා ඇසුවාය.

"මෙයා ගැන නං මං හරියට දන්නෙ නැහැ  සමහර විට හතහමාරට විතර වෙන්නැති, එත් සමහර දොස්තරල ඉන්නව පහටත් ලෙඩ්ඩු බලන "

"හවස පහට?" රෝඩා ඇසුවාය.

"නැහැ. උදේ පහට. ලෙඩ්ඩු එනව පාන්දර තුනේ විතර ඉඳල. ඒ පාර මේ දොස්තරල ආණ්ඩුවෙ රෝහලට යනව උදේ අටට. එතන හතර වෙනකං හරිනං

වැඩ කරන්න ඕන. ඊට පස්සෙ පිස්සු බල්ලො වගේ දුවනව පුද්ගලික රෝහලෙන් රෝහලට. එතන විසිදෙනයි, මෙතන විසිපහයි, අතන හතළිහයි. රෑ එක, දෙක වෙනකං සමහරවිට "

"හොඳ ගණනක් හම්බකරනව ඇති "

"එක ලෙඩෙකුගෙන් දෙසීයක් කියමු. දවසට සීයක් බැලුවොත්, විසිදාහයි. මාසෙට ලක්ෂ පහයි. ඒවට ආදායම් බදු ගෙවන්න වෙන්නෙත් නැහැ "

"ඉතින් එක ලෙඩෙකුට විනාඩි දෙක තුනකට වඩා දෙන්න බැහැනෙ. කොහොමද එතකොට හරියට ලෙඩේ සොයල බෙහෙත් දෙන්නෙ, ලෙඩා එක්ක කතා කරන්නෙ?"

"ඒ මොනවටද, අපේ මෝඩ මිනිස්සුත් ඔය ඕන දෙයක් ඉවසගෙන දොස්තරලට වැඳගෙන නෙ ඉන්නෙ. ලෙඩා ඇවිත් වාඩිවෙනකොටම බෙහෙත ලියල ඉවරයි. හොඳට සල්ලි තියෙන කෙනෙක් කියල පෙනුණොත් පරීක්ෂණ හත අටකුත් නියම කරනව. ඒකෙන් රෝහලටත් ආදායමක් එනව. සමහර දොස්තරලට කොමිස් එකකුත් ලැබෙනව. දොස්තරට එයාගෙ වෙලාව ඉතුරුකරගෙන ලෙඩෙත් සමහරවිට සොයා ගන්නව. ලෙඩාගෙ සල්ලිනෙ. නැත්නම් ලෙඩ දහයකට විතර හරියන්න බෙහෙත් ජාති ලියල දෙනව. ඒ එකකින් හරි ලෙඩේ හොඳවෙයි කියල."

"ලෙඩ්ඩුන්ට ඇත්තටම හොඳ වෙනවද ඉතින්?"

"හොඳ වෙනව. ඇයි ඉතින් ලියන්නෙ තියෙන සැරම බෙහෙත් ජාතිනෙ. එව බෙහෙතත් සැරයි. වටිනාකමත් සැරයි. හුගක් වෙලාවට දොස්තරට ලැබෙන බෙහෙත් විකුණන අයගෙන් ලැබෙන වාසිත් සැරයි. මෙ බෙහෙත් බීව්වම ලෙඩා ඉක්මනටම මැරෙනව, නැත්නම් සනීප වෙනව, පස්සෙ කාලෙක අර බෙහෙත් විසෙන් විඳවල මැරෙන්න "

"භානු ඔයාට නම් ඔයාලගෙ දොස්තරල ගැන කිසිම විස්වාසයක් නැති පාටයි"

"කොහොමද විස්වාස කරන්නෙ, මං දන්නවනෙ එයාලගෙ හැටි. අපේ තාත්තත් විස මත් ද්‍රව්‍ය ජාවාරම් කාරයෙක්නෙ. තාත්ත මුලින් පටන් ගත්තෙ විස බෙදන්න"

"විස මත් ද්‍රව්‍ය ජාවාරම් කාරයෙක් කිව්වෙ? "

"තාත්ත බටහිර බෙහෙත් ප්‍රචාරය කරනව. දෙකම එකයි "

"භානු එනවද අද රෑට මාත් එක්ක කෑමට යන්න. හුග දවසකින් මට අද මොනව හරි කන්න පුලුවන් වගේ "

"බෙහොම ස්තුතියි. ඒ උනාට රෑට එන්න අමාරුයි. අපිට තාම ඔයාලගෙ රටවල වාගෙ නිදහසක් නැහැනෙ. අපේ අම්මලල තාත්තල තාම අපට එහෙම යන්න දෙන්නෙ නැහැ ගෙදර කවුරුවත් නැතුව විශේෂයෙන්ම රෑට "

"එහෙනම් හෙට දවල්ට "

"දවල්ට පුලුවන් වෙයි. මම තාත්තගෙන් අහන්නම්. සමාවෙන්න අද එන්න බැරුවට"

"නෑ එකට කමක් නැහැ, මට තේරෙනව "

භානු ඇගෙන් සමුගෙන සුනිතා බලන්නට ගියේ මෙතෙක් වෙලා මේ ආගන්තුක ගැහැණියක සමග ගතකිරීමෙන් ඇය සුනිතා අමකත කළාදැයි හැගිමකින් යුතුවය. ඇගේ දෙමාපියන් ආපසු යන්නට සැරසී සිටියහ. ඒත් ඇගේ පෙරැත්තය නිසා ඇය සුනිතා සමග ටික වේලාවක් රැඳෙන තුරු ඉන්නට ඔවුහු කැමති වූහ. භානු සුනිතාටත් පිම් ගැනත් ඔහු රැගෙන යන්නට ගුවන් යානයක් පැමිණෙන සැටිත් විස්තර කළාය.

ආපසු යන ගමනේ භානු තකා කළේ සුදූ යුවල ගැනත් දොස්තර බතලගෙදර ඔවුන්ට සළකන ආකාරයත් ගැනය. ඇය පොදුවේ සියලුම දොස්තරවරුන්ට බැණ වැදුණාය. රාජු නිහඩව සිටියේ කතාවට ගියොත් භානු තව තවත් වාදයට එනු ඇති නිසාත් ඇය යම් තරමක් දුරට හෝ කියන්නේ ඇත්ත නේදැයි යටි සිතේ නැගිගෙන එන හැගීමත් නිසාය. තාත්තා වාදයට පැටලෙන්නේ නැති බව දැණුන නිසාදෝ භානු මද වේලාවකින් ඒ ගැන කතා කිරීම අත හළේය. චිත්‍රා සැනසුම් සුසුමක් හෙලුවාය.

පසුදා උදේ භානු ගෙදරින් පිටවූයේ වෙනදා අම්මා උයා දෙන දිවා කෑම පෙට්ටිය නැතුවය.. රෝඩා සමග දවල් කෑමට යන්නට ඇයට තාත්තාගේ අවසර ලැබී තිබිණ. සවස පංතියට ප්‍රමාද නොවී යන ලෙස පමණක්ය ඔහු කියා සිටියෙ.

"කොහේද යන්නෙ ලන්ච් වලට?" රාජු ඇසුවේය.

"දන්නෙ නැහැ. හුගක් දුරට ඉන්ටර්කොන් එකේම වෙන්නැති එයා නැවතිලා ඉන්නෙ එහේනෙ "

සුනිතා බලන්නට පෙර භානු රෝඩා සොයා ගියේ දවල් කෑමට එන බව යලි සනාථ කරන්නටය. ඇය ඇගේ පුරුදු පුටුවේ සිටියේ නැත. ඇය සැමියා බලන්නට ඇතුලට යන්නට ඇතැයි සිතා භානු සුනිතා බලන්නට ගියාය.

"ඔයාගෙ යාලුවට කොහොමද දැන් " සුනිතා ඇසුවාය.

"තාම දැක්කෙ නැහැ. එයාල දැන් යන්න ලෑස්තිවෙනව ඇති"

"රෝඩාට නම් සිතට සැහැල්ලුවක් දැනෙනව ඇති දැන් " කුමාරි කීවාය. භානු පැමිණි නිසා ඇය ආපන ශාලාවට යාමට සැරසුනාය.

"අනේ ඔව් ඇන්ටි, පහුගිය දවස්වල එයා හිටියෙ හැම තිස්සෙම අඩ අඩා " භානු කීවාය. " මං දැකල නැහැ අපේ පවුල් වලවත් ඒ වගේ එකකෙනෙක්. එයා පිමිට තියෙන්නෙ පුදුම ආදරයක්. බටහිර රටවල ගෑණු හස්බන්ඩ් ලට සලකන්නෙ නැතෙයි කියන එක බොරු කතාවක් නෙ "

"එයාගෙ හස්බන්ඩ් හරිම වාසනාවන්තයි නේද " සුනිතා ඇසුවාය.

"එයත් ඒ වගේම රෝඩට ආදරේ ඇති" භානු කීවාය. කුමාරි කාමරයේ නැතිදැයි සැක හැර ඇය මෙසේත් කීවාය. " උඹටයි මටයි ඒ වගේ හස්බන්ඩ්ස් ල හොයා ගන්න පුලුවන් උනෝත් නේ ද? "

"ඔයාට නම් පුලුවන් වෙයි. මං ඉතින් එච්චර කල් ජීවත් වෙයිද කියල කවුද දන්නෙ. නැති උනත් මොන පිරිමියද කැමති වෙන්නෙ මෙහෙම ලෙඩෙක් බැඳ ගන්න "

"එහෙම කියන්න එපා ඔයාට ඉක්මනට සනීප වෙනව. හොඳ කොල්ලෙකුත් හම්බවෙයි බඳින්න. ඊට පස්සෙ ළමයි දහයක් පහළොවක් හදාගෙන අවුරුදු සීයකවත් සතුටින් ඉඳිව් "

"මට අවුරුදු සීයක් ඉන්න ඕන නැහැ. මට එක දරුවෙක් හිටියහම ඇති" ඇය සිනාසෙමින් කීවාය, "ඔයාට ඕනනං හදාගන්න දරුවො දුසිමක් "

කුමාරි ආපසු පැමිණීමත් සමග ඔවුන්ගේ කතාව වෙන අතනට යොමු කරන්නට සිදුවිය. සුනිතා ඉ❑දහිට හෝ ඇගේ රෝගය අමතක කරන්නේ නම් හොඳ නේදැයි භානුට සිතුනාය.

භානු පහළට එනවිටත් රෝඩා පෙනෙන්නට සිටියේ නැත. එතැන වාඩිවී සිටි අයෙකුගෙන් ඇය රෝඩා ගැන ඇසුවාය.

"මම නං දන්නෙ නැහැ, අපි ආවෙ අද උදේ " ඔහු පිළිතුරු දුන්නේය.

භානු පිළිගැනීමේ කවුලුව වෙත ගියාය. ඔවුන්ද රෝඩා ගැන කිසිවක් නොදන්නා බව පැවසීම නිසා ඇය විශෙෂ සාත්තු ඒකකය වෙතට ගියාය. ඇය දොරට තට්ටු කළවිට හෙදියක් පැමිණ දොර මඳකට හැරියාය.

"මිසිස් වයිටරිවර් ඇතුලෙ ඉන්නව ද?"

"මෙහේ නැහැ" කියා හෙදිය දොර වැසුවාය.

භානු තව වරක් දොරට තට්ටු කළාය. හෙදිය දෙර ඇර ඇය දෙස නොරුස්නා මුහුණින් බැලුවාය.

"අනේ කරුණාකරල කියන්න මිසිස් වයිටරිවර් උදේ මෙහේ ආවද කියල"

"නැහැ "

"මිස්ටර් වයිට්රිවර් තාම මෙහේ ඉන්නව නේද" ඇය යලිත් ඇසුවාය.

"නැහැ" ඈට ලැබුණ පිළිතුර එපමණකි.

"මෙතරම් කලින් එයාපෝට් එකට ගියාද?" ඇය යළිත් ඇසුවාය.

"එයා මළා. ඊයෙ රෑ" හෙදිය දොර වසා ගත්තාය.

හානු වසා දැමූ දොර ඉදිරියේ ගල් ගැසුණාක් මෙන් බලා සිටියාය. කිසිවෙක් ඇගේ පිටට අත තබා ඇයට මෑත් වෙන්නැයි කීවෙන් හැරී බැලූ ඇතුලු වීමට ආ හෙදියකි. කොතෙක් වේලා ඇය දෙර අසල සිටියේදැයි ඇයට සිතාගත නොහැකි විය. ඇය බිත්තිය අල්ලාගෙන ගොස් පුටුවක් මතට පහත් වූවාය.

යලිත් දෙඇස් ඇරි විට හානු ළුටුවේ මැද මිදූලේ වූ මල් පැල හා ගලායන දිය පහරය. රෝඩාත් දින ගණනාවක් තිස්සේ දකින්නට ඇත්තේ මේ දර්ශනයම බව ඇයට සිහිවිය. එතැනින් නැගිට යන්නට තරම් තවමත් දෙපා පණ නැති බව ඇයට දැනුණෙන් තව ටික වෙලාවක් මෙතනම සිටින්නට ඇය සිතා ගත්තාය. පසුගිය දින දෙක තුල සිඳුවූ දේ ඇගේ මනැස ඉදිරියේ යලි පෙනෙන්නට විය. මුලින් දිනයේ රෝඩාගේ මුහුණේ තිබූ සියලු බලාපොරොත්තු කඩවූ ඉතා අසරණ පෙනුමත්, ඊයේ එම මුහුණම බලාපොරොත්තුවෙන් පිරී විකසිත වී තිබූ සැටිත් ඇය දුටුවාය. අවුරුදූ දහයක්න් වත් ඇය තරුණ වුවාසේ ඊයේ හානු දුටුවාය. ඇයට ඇසුණේ රෝඩා ඇමරිකාවට ගොස් තම සැමියා සුවපත් කරගෙන යලිත් ඔවුන්ගේ රුවල් නැවෙන් ලොව වටා සරණ ආකාරය විස්තර කළ අන්දමය.

"අපි දෙන්නට මැරෙන්න ඕන වෙලා හිටියෙ එකටයි කොහේ හරි සාගරයක් මැද" ඇය කීවාය.

දැන් ඇගේ සැමියා මියගොස්ය. ඇගේ සිහිනයද ඒ සමගම මියයන්නට ඇත.

"ඇයි දුව මොකද?" ඇය අවදි වූයේ තාත්තාගේ කටහඬ ඇසීමෙන්ය. ඇය කිසිත් නොකියා ඔහු දෙස බැලුවත් ඇගේ දෑසේ පිරී තිබූ කඳුලු නිසා සිඳුවී ඇත්තේ කුමක්දැයි රාජුට වැටහෙන්නට ඇත.

"දූවගෙ යාලුව කෝ?" ඔහු ඇසුවේය.

"මං දන්නෙ නැහැ ඩැඩී එයා ඊයෙ රෑ මැරිල මට රෝඩ හොයාගන්නත් බැහැ අද හවසටයි ප්ලේන් එක එන්න තිබුණෙ ඇමරිකාවට එයා ගෙනියන්න රෝඩාත් නැහැ නර්ස් ලත් හරිම නපුරුයි මං දන්නෙ නැහැ මොනව කරන්න ද කියල

මට රෝඩ හොයාගන්න ඕන මට රෝඩ හොයාගන්න ඕන" ඇය හුස්ම නොගෙන කියන්නට වූවාය.

"ඉතින් දුව අඩන්නෙ නැතුව ඉන්න. ඉස්සෙල්ල අපි හොයා ගනිමු මොකක්ද වෙලා තියෙන්නෙ කියල. දුව ඔහොම ඉන්න " ඔහු භානු එතැනම වාඩි කර විශෙෂ ප්‍රතිකාර ඒකකයට ඇතුලු විය. ඇය ඔහු ඇතුලුවූ දෙර දෙස බලා සිටියේ ඔහු යලිත් පිටතට නොඑතැයි ඇතිවූ අස්ථාන හිතියකිනි. රාජු සුලු වෙලාවකින් එළියට ආවේය.

"එයා නැතිවෙලා තියෙන්නෙ ඊයෙ රෑ දොළහට විතර, සිස්ටර් කියනව එයා හොඳ කරන්න පුලුවන් තත්වෙක නෙවෙයි කියල හිටියෙ මෙහේට ගේන කොටත්"

"තව එක දවසක් අල්ලගෙන ඉන්න පුලුවන් උනානම්. ඇයි අපේ අයට තව එක රැයක් ලෙඩා ජීවත් කරගන්න බැරිඋනේ ඇයි වෙන ඩොක්ටර් කෙනෙක් ගෙන්නුවෙ නැත්තෙ ඇයි රටේ ඉන්න හොඳම දොස්තර ගෙන්නුවෙ. ඊළගට ඉන්න එක්කෙනා ගෙන්නන්න තිබුණ නෙ. එහෙනම් ඒ දොස්තරට මීට වැඩිය වෙලාව තියෙයි නෙ එක සැරයක් හරි ඇවිත් ලෙඩා බලන්න " ඇය නොනවත්වාම කතා කරන්නට වූවාය.

"අපි යමු ගෙදර " රාජු කීවේය.

"බැහැ. මං රෝඩ හොයන්න ඕන, එයාට මෙහේ කාත් කවුරුවත් නැහැ. මොනව කරගනිද දන්නෙ නැහැ " කියමින් ඇය රාජුගේ අත ගසා දමා රෝහලෙන් එළියට දුවන්නට තැත් කළාය. රාජු ඇය පස්සේ ගොස් ඇය නවතා ගත්තාය.

"ඔහොම ඔලුව හැරුණ අතට දුවල ඒ මනුස්සය හොයාගන්න බැහැ. අපි එක තැනකින් පටන් ගමු " රාජු ඇයට කීවේය, " අපි ඉස්සෙල්ල ගිහින් බලමු හොටලෙ ඉන්නවද කියල, ඊළගට එම්බසියෙ බලමු " රාජු ඇයත් රියේ නංවාගෙන පිටත්විය.

ඇය කාමරයේ ඉන්නා බව හෝටලයේ පිළිගැනීමේ කවුන්ටරයෙන් ඔවුන්ට දැන ගන්නට ලැබිණ. භානුට ඇගට ලේ ඉනුවේ එවිටය. එහෙත් කාමරයේ දුරකථනයෙන් ඇමතුවත් රෝඩා උත්තර දුන්නේ නැත. සිදුවී ඇති දෙය හෝටලයේ අයට පැවසූ විට ඔවුන්ද මදක් කළබල විය. කලමනාකාර වරයා ඔවුන් දෙදෙනාටත් කතා කරගෙන ඈ සිටි කාමරය වෙත ගියේය.

දොරට කිහිප වරක් තට්ටු කරන තෙක් ඇය දොර හැරියේ නැත. ඇය දොර හැරියත් කිසිත් කතා නොකර යලිත් කවුලුව අයිනේ වූ පුටුවේ වාඩිවූවාය. පැමිණ සිටියේ කවුදැයි ඇය බැලුවේ නැත.

"රෝඩා, අපි ඔයාව හැම තැනම හෙව්ව " භානු කීවාය. එහෙත් ඇය ඔවුන් දෙස බැලුවේ නැත.

"රෝඩා " භානු යලි කතා කළාය.

"මිසිස් වයිටරිවර්.. මොනවද අපෙන් කෙරෙන්න ඕන " කළමනාකරු පහත්වී ඇසුවේය.

"ඔයාලට පුලුවන්ද මගේ හස්බන්ඩ් ආපහු ගෙන්න?" ඇය ඇසුවාය.

"අපට හරිම කනගාටුයි මේ වෙච්ච දේට. අපි කරන්න පුලුවන් උදවුවක් කරන්නම් " ඔහු යලිත් කීවේය.

"දැන් මොනව කරන්නද, දැන් ප්‍රමාද වැඩියි. කරුනාකරල මට නිදහසේ ඉන්න දෙන්න"

භානු ඇය අසලට ගොස් පුටුව අසලින් බිම වාඩිවී ඇගේ අත අල්ලා ගත්තාය. එහෙත් ඇය භානු දෙස බැලුවේ නැත.

"රෝඩා. මේ මම. භානු. අපි ඉන්නව මෙතන, ඔයා තනි උනේ නැහැ " ඇය ඉතා පහත් හඩින් කීවාය. පිරිමි දෙදෙනා කිසිවක් කර කියාගත නොහැකිව බලා සිටියහ. අන්තිමේ රෝඩා භානු දෙස බැලුවාය.

"අහස් යානය අද උදේ ආව " කියූ ඇය හඩන්නට වන්නේය. භානු ඇගේ හිස සිය ළය මැදට තබාගෙන ඇයට හඩන්නට හැරියාය. ඔවුන්ට බීමට කෝපි හෝ තේ එවන බව පවසා කළමනාකරු පිටව ගියේය. උවමනා වුවොත් ඔහුට අමතන ලෙස ඔහු රාජුට කීවේය. භානු රාජු දෙස බැලුවේය. රෝඩාට ඇති තරමක් අඩන්නට දෙන ලෙස රාජු ඇයට අතින් සඥා කළේය. භානුගේ දෑසේත් කඳුලු පිරී තිබෙනවා ඔහු දුටුවේය. මුලු වෛද්‍ය වෘත්තියම කෙරෙහි ඔහු සිත තුලද සියුම් කොපයක් නැග එන බව ඔහුට වැටහුනේය. මේ රටේ සෞඛ්‍ය සේවයේ මේ සිදුවී ඇති පරිහානියට ඔහුද යම් පමණකින් වගකිවයුතු නේදැයි ඔහුට සිතුණේය.

සේවකයෙක් දොරට තට්ටු කර කෝපි බන්දේසියක් රැගෙන ආවේය. ඒ හඩින් හිස ඔසවා බැලූ රෝඩා, රාජුත් හොටල් සේවකයාත් දැක කඳුලු පිසදමමින් නානකාමරයට වැදුණාය. භානු නැගිට දෙඇසි පිසදාගෙන යම් වැඩක යෙදීමේ උවමනාව නිසා කෝපි වත්කරන්නට වුවාය. සේවකයා පිටව ගියේය. මද වෙලාවකින් රෝඩා එළියට ආවාය.

"කොපි එකක් බොන්න " භානු ඇයට කීවාය. ඇය කතා නොකරන විට භානු කෝප්පය ඇගේ අත තැබුවාය. රෝඩා කෝප්පය අත ඇතිව වසා දැමූ කවුලු තිරය දෙස බලා සිටියාය.

"ප්ලීස් රෝඩා, කෝපි එක බොන්න " භානු අයැද සිටියාය. ඇය ඉතා සෙමින් කොපි කෝප්පය තොලට ළං කළාය. භානු තාත්තාටත් කොප්පයක් දී ඇයත් බොන්නට ගත්තේ හදිසියේම දැණුන විඩාපත් බව නිසාය.

"එම්බසි එකට කතා කලාද " භානු අනතුරුව ඇසුවාය.

"නැහැ, මං දන්නෙ නැහැ " රෝඩා සෙමින් කීවාය.

"නොම්මරේ තියෙනවනං මම කතා කරන්නද " භානු ඇසූ විට ඇය මේසය මතවූ කුඩා සටහන් පොත දෙසට හිස දිගුකළාය. එහි ලියා තිබූ ඇමරිකානු තානාපති කාර්යාලයේ නොම්මරයත්, ඒ අසලින් ලියා තිබූ නමකුත් දුටුවාය. රාජු ඒ නොම්මරය කරකවා නම සඳහන් තැනැත්තාට කතා කරන්නට ඉල්ලීය. ඔහු රෝඩාගේ හිතවතෙක් ලෙස හඳුන්වාගෙන සිදුවී ඇතිදේ කෙටියෙන් කීවේය. ඊළගට ගතයුතු පියවර ගැනත් අවසන් කටයුතු ගැනත් කුමක් කළ යුතුදැයි ඔහු නොදන්නා බව රාජු ඔහුට කීවේය. ඔහු වහාම හොටලය වෙත එන බව පවසා ඔහු එන තුරු ඉන්නා ලෙස රාජුගෙන් ඉල්ලීමක් කළේය.

විනාඩි දහයකින් පමණ, ඉතා උස් සිරුරක් ඇති තරුණයෙක් කාමරයට ආවේය.

"මම කලයිව් වින්ටර්ස්. තානාපති කාර්යාලයෙන් " ඔහු කීවේය.

"මම රාජු, මේ භානු,  මගේ දුව "

"මගේ කණගාටුව " ඔහු රෝඩාට කතා කළේය. රෝඩා ඔහුගේ අත ඇඟිලි තුඩින් අල්ලා අත්හැරියාය.

"මං ආවෙ කරන්න තියෙන දෙයක් බලන්න " ඔහු යලිත් කීවේය.

"දැන් ඉතින් මොනව කරන්නද " ඇය එවර ඇසුවාය.

"එහෙම කියන්න බැහැනෙ රෝඩා. පිම් ඔයාගෙන් බලාපොරොත්තු වෙන්නෙ එහෙම නෙවෙයිනෙ "

ඇය කලයිව් දෙස මෙහෙතෙක් බලා සිටියාය.

"ඔව්.  පිම් බලාපොරොත්තු වෙන්න ඇති මම එයාගෙ ජීවිතේ බේර ගනියි කියල" ඇය කීවාය.

"මං අදහස් කළේ එහෙම නෙවෙයි. රොඩා, ඔයාට කරන්න පුලුවන් හැම දෙයක්ම කළානෙ. දැන් වෙච්ච දේ ගැනවත් නෙවෙච්ච දේ ගැනවත් හිතල වැඩක් නැහැ. දැන් කරන්න තියෙන දේ ගැන බලමු "

"මොනවද මට කරන්න කියන්නෙ? " ඇය ඇසුවාය.

"අවසාන කටයුතු කොහොමද කෙරෙන්න ඕන, ගෙදර ගෙනියන්න ඕනද?"

"ගෙදර?" ඇය ඇසුවාය. "මට දැන් ගෙදරක් නැහැ. මගේ ගෙදර උනේ, හැමදාම පිම් එක්ක මම හිටපු තැන විතරයි "

"එහෙනම් අපි මොනවද කරන්නෙ " ඔහු යලිත් ඇසුවේය.

"මොනවත් නැහැ "

"ඒ උනාට අපි මොනව හරි කරන්න ඕන නෙ, පිම් වෙනුවෙන්. ඔයා ට පුලුවන්ද දැන් ගිහිල්ල බලන්න, බාර ගන්න " ඔහු ඉතා අපහසුවෙන් ඇසුවේය.

"මට යන්න බැහැ. මට කොහොමවත් එයා දිහා බලන්න බැහැ. දැන් එයා ඉන්න විදිහට මට මතක තියා ගන්න කොහොමටවත් බැහැ. මට ඕන පිම් සනීපෙන් හිටි කාලෙ විදිහට චිත්‍රයක් මතක තියා ගන්නයි. අනේ මට මෙහෙම ඉන්න දෙන්න " ඇය බැගෑපත් වූවාය.

"බය වෙන්න එපා, අපි සෙරම වැඩ කටයුතු බලා ගන්නම්. ඒ උනාට ඔයා කියන්න ඕන මොනවද අපි කරන්නෙ කියල "

"ආදාහන කරල මට අලු ටික ලැබෙන්න සලස්වන්න පුලුවන්ද?" මට බොට්ටුවකින් ගිහිල්ල මුදෙ මැද විසුරුවන්න ඕන අලු ටික. එතැන තමයි පිම්ට ඕන කම තිබුණෙ ජිවිතය අවසාන වෙන්න අපි දෙන්නගෙම"

"මම ඒ සේරම බලා ගන්නම් " තරුණයා කීවේය. " එතකොට ගුවන් බල පත්‍රය"

"මට තාම හිතාගන්න බැහැ, සමහරවිට මට ඩෙන්වර් යන්න පුලුවන්, අපේ අක්ක ඉන්න අහට "

"හොඳයි ඒක පස්සෙ හිතල කියන්න, මං ඔෆිස් එකේ ඉන්නව "

රාජුගෙන් හා භානුගෙන් සමුගෙන ඔහු පිටව ගියේය.

"අපි තව ටිකක් ඉඳල යනව. එච්චරයිනෙ මේ වෙලාවෙ අපට කරන්න පුලුවන් " රාජු ඔහුට කීවේය.

"මං ගැන කරදර වෙන්න එපා " රෝඩා කීවාය.

"ඔයා මොනවත් කෑවෙ නැහැනෙ. මං මොනව හරි ඔඩර් කරන්නද" රාජු ඇසුවේය.

"එපා මට බඩගිනි නැහැ " ඇය කීවාය. ඒ අතර ඇයට යමක් සිහිවිය, "අද අපි ලන්ච් වලට යන්න නේද හිටියෙ. ඔයා එනවනේද මාත් එක්ක ලන්ච් වලට? තාත්තගෙනුත් අහන්න "

"එන්න කැමතියි. ඒ උනාට මම අද දවසටම තාම ඔෆිස් එකට ගියෙ නැහැ. මම යන්න ඕන "

"මට කණගාටුයි මං හින්ද කරදර උනාට. සමාවෙන්න "

"කිසිම කරදරයක් නැහැ. අපටත් හරිම කණගාටුයි මේ වෙච්ච දේට. මොනව හරි ඕන උනොත් මට කතා කරන්න " ඔහු කීවේය, "මම යන්නද දුව එහෙනම්"

"මම එහෙනම් තව ටිකක් වෙලා ඉඳල එන්නම් ඩැඩී"

"මිස්ටර් රාජුට ගොඩක් ස්තූතියි මේ කරපු උදව්වට. මට කවුරුහරි ඉන්න ඕන වෙලාවට ඔය දෙන්න ළග හිටිය. ඒක මට ලොකු හයියක් උනා " රෝඩා කීවාය, " මේ වගේ යහපත් අය තාම ලෝකෙ ඉන්නව කියන එකත් සතුටක් "

"මට ඒ දොස්තරය දැන් අහු උනොත් මරන්න පුලුවන් " තාත්තා ගියපසු භානු රෝඩාට කිවාය.

"එහෙම කියන්න එපා. ඇත්තටම ඩොක්ටර්ට වැඩ වැඩි නිසා එන්න වෙලාවක් නැතිවෙන්න ඇති. එහෙම නැත්නම් එයාට තේරෙන්න ඇති පිම් පිවත් කරන්න බැහැ කියල. ඒ හීන්ද ඩොක්ටර්ගෙ වෙලාව ජිවත් කරන්න පුලුවන් ලෙඩෙක් වෙනුවෙන් යොදන්න එයා හිතන්න ඇති. ඩොක්ටර් ගැන වරදක් හිතන්න එපා. මාත් ඔය වයසෙදි ඔහොම තමයි. මාත් එහෙනම් ඔයා වගේ හිතාවි. ඒත් අපේ වයසට ආවම තමයි තේරෙන්නෙ මිනිස්සුන්ගෙ ඇතුලෙ අපි හිතනවාට වඩා හොඳ ගතිගුණ තියෙනවා කියල. ඇත්තටම හැම කෙනෙක්ම ඇතුලතින් හරිම කරුණාවන්තයි වෙනත් කෙනෙකුට උවමනාවෙන් වරදක් කරන්න කැමති නැහැ. කෙනකුගෙ හොඳ පැත්ත දිහා බලන්න පුරුදු උනහම පුලුවන් වෙනව එයාගෙ සුලු සුලු දුර්වල කම් ගණන් නොගෙන ඉන්න. එක එකකෙනා ඒ අයගෙ හැගිම් පෙන්නන්නෙ එක එක විදිහට. ඒ අයගෙ ප්‍රමුඛතාවන් සමහරවිට අපේ එවට වඩා වෙනස්වෙන්න පුලුවන්. ඔයාටයි මටයි මේ වෙලාවෙ වැදගත්ම දේ තව කෙනෙකුට වැදගත් නොවෙන්න පුලුවන්. ඒකට අපට ඒ අයට වරදක් කියන්න බැහැ" ඇය භානුට හෙම්හිට පැහැදිලි කළාය භානු නිහඩව අසා සිටියාය. රෝඩා යලි ජීවිතයට මුහුණ දෙන්නට පියවි තත්වයට පත්වීම ගැන භානුට මහත් සතුටක් ඇතිවුයේය.

"ඒ උනාට ඒ දොස්තරට සමාව දෙන්න පුලුවන්ද?" භානු ඇසුවාය.

"මං එයාට සමාව දීල ඉවරයි. ඒක සමහරවිට දෙවියන්ගෙ කැමැත්ත වෙන්න ඇති. අපට දෙවියන්ගෙ කැමැත්තට විරුද්ධව යන්න බැහැ. අපි ඒ අනුව අපේ ජිවිතේ හැඩ ගහගන්න එක තමයි කරන්න තියෙන්නෙ " ඇය පුටුවෙන් නැගිට සිටියාය, "මට විනාඩි පහක් දෙනවද වෙන ඇඳුමක් දා ගන්න " ඇය නාන කාමරයට යමින් කිවාය.

## වෙදකමක් සෙවීම

ඔහුගේ දුවට ස්මුත් නිසා වූ හානිය ගැන දැනගත් විට සුමනදාසගේ මනස මොහොතකට හිස් වුයේය. ඔහුගේ සිරුර වෙව්ලන්නට විය. පපුවේ හුස්ම තදවී ඇති සෙයක් ඔහුට දැණුනේය. කෝපයේ ඝණ කලු වළාවෙන් එසේ හිස්වූ මනස වැසී යන්නට විය. ඒ කෝපයේ කේන්ද්‍රස්ථානය වූයේ රාජුය. ඊළගට ස්මුත් නිර්දේශ කළ දොස්තරය. එතැනින් එය තව දුරටත් පැතිරෙන්නට විය. එම බෙහෙත ලංකාව තුල විකිණීමට ක්‍රියා කළ අයත්, ඒ සඳහා අනුමැතිය දුන් අයත්, එය නිෂ්පාදනය කළ අයත් කෙරෙහි කෝපය පැතිරෙන්නට විය. එහෙත් ඒ සැම අතුරින් ඔහු දැන සිටියේ රාජු පමනක් විය. එමනිසා ඔහු නොදැනුවත්වම යලිත් වරක් ඔහුගේ කෝපය රාජු වෙත ඉලක්ක විය. රාජු ඔහුට සිටි ඉතාමත් සමීපතම වුත්, හිතවත්ම වුත් මිත්‍රයා ලෙසයි ඔහු සිතා සිටියේ. රාජු මෙවන් අපරාධයක් ඔහුට කළේ ඇයි? අවුරුදු විසි ගණනක් තිස්සේ ඔහුගේ මිත්‍රයෙකුව සිටි රාජු. කුමාරි හා විවාහ වෙන්නට එතරම් ඔහුට පිහිට වූ රාජු.

මෙවැනි දෙයක් ඔහුගේ දුවට සිදුවුයේ ඇයි? ඔහුගේ කීම අසා ඇය ආයුර්වෙද ප්‍රතිකාර කළානම් අද මෙවන් විපතක් සිදුනොවන බව සුමනදාසට විස්වාසය.

සුමනදාසට දුව රෝහලේ නවතා සිටීම ගැන කිසිත් කැමැත්තක් නොවිය. මේ දොස්තර වරුන් ලවා ඇයට වෙදකම් කිරීමටත් ඔහු කැමති නොවිය. එහෙත් ඒ ගැන කිසිවක් කරන්නට ඔහුට පුලුවන් කමක් තිබුනේ නැත. ඔහුගේ අදහස් වලට පවුලේ අන් කිසිවෙක් එකග වුයේ නැත. ඔහුගේ බිරිඳත්, දෙමාපියනුත්, අනිත් සියලු නෑ හිතවතුනුත් ඔහුට බල කර සිටියේ දොස්තරලාගේ කීම පිළිගන්නා ලෙසය. අක්මාවක් බද්ධ කළ යුතුයැයි ඔවුන් පවසන්නේ නම් එය කළ යුතුය. මුදල් සොයා ගැනීමට කවුරුත් සහාය වන බව ඔවුන් පවසා සිටියහ. කුමාරිගේ අයියාත් ඔවුන්ට පිහිට වීමට ඉදිරිපත් විය.

ඔහුගේ අදහස් පිළිගත්තේ භානු විතරය. ඇය ඔහුගේම දියනියකයැයි ඔහුට හැගුනේය. සුනීතාට ආයුර්වේද පිළියම් කිරිම ගැන ඔවුන් දෙදෙනා බොහෝවිට කතා කළහ.

"අම්පාරෙ හොඳ වෙද මහත්තයෙක් ඉන්නව කියල මට ආරංචි උනා " සුනීතා එදින සවස රෝහලේදී හමුවූ විට සුමනදාස ඇයට කීවේය.

"එයා හුගක් හොඳයිලු ද?" කුමාරි ඇසුවාය.

"දොස්තරල හොඳ කරන්න බැහැ කියල ගෙදර අරගෙන ගියපු ලෙඩෙක් මේ වෙද මහත්තය සනීප කරල තියෙනව"

"මමත් ඔය වගේ අය කීප දෙනෙක් ගැනම ඇහුව, ඒත් සම්පූර්ණයෙන්ම සුව කරපු කෙනෙක් ගැන තවම අහල නැහැ" භානු කීවාය.

"ඔයාට ඉතින් කවුරුවත් ගැන විස්වාස නැහැනෙ " චිත්‍රා ඇගේ දුවට කීවාය.

"මම විස්වාස කරන දේවල් හුගක් තියෙනව. ආයුර්වේදය ගැන මට හොදටම විස්වාසයි. ඒ හින්ද මමත් කැමතියි මේ ආරංචි විස්වාස කරන්න. හැබැයි අද ආයුර්වේද වෙද්දුය කියල කියාගන්න හුගක් අය මහ පල් හොරු. උන් හුගක් අය කියයි එක්කො පරණ පුස්කොල පොතකින් බෙහෙත් වට්ටෝරුවක් ලැබුන කියල, නැත්නම් පුරාණ රිසිවරයෙකුගෙන් පරම්පරාගතව ආ රහසිගත වට්ටෝරුවක් කියයි. ඉතින් උන් කියනව උන්ට ඕනම ලෙඩක් හොද කරන්න පුලුවන් කියල" භානු උද්වේගකර හඩකින් කීවාය.

"ටිකක් හෙම්හිට කතා කරන්න. සුනීතට ඇහැරෙයි. ඊටත් එයා බයවෙයි " චිත්‍රා කීවාය.

"අනේ ඉතින් මම් නේ මාව තරහ ගස්සන්නෙ. මමත් හදන්නෙ කොහොමහරි සුනීතව ඉක්මනට සනීප කර ගන්නනෙ "

"අපි ඒක දන්නව දුව. ඒකනෙ මම ආපු හැටියෙම දුවට මේ ආරංචිය කිව්වෙ " සුමනදාස ඇගේ හිස අතගෑවේය.

"අපිට අම්පාර පැත්තෙ කෙනෙකුගෙන් තව විස්තර ටිකක් සොයාගන්න බැරිද?" කුමාරි ඇසුවාය.

"අපි රාජුට කියමු. එයාගෙ කස්ටමර්ල ඇති ඔය පැත්තෙ. නැත්නම් අඩු ගණනෙ එයාගෙ රෙජ් කෙනෙකුට හරි කියයි " චිත්‍රා ගේ අදහස විය.

"එයා අපට හිනාවෙයි " භානු කීවාය.

"නෑ. මම හිතන්නෙ නැහැ. ඉන්න මම කියල බලන්න " සුමනදාස බැලකනියේ සිටි රාජු වෙත ගියේය. රාජු සුමනදාසගේ මල්ලි සමග කතා කරමින් සිටියේය.

"අම්පාරෙ ඉන්නවලු වෙද මහත්තයෙක්, නරක් වුණු අක්මාවල් සනීප කරන. එයා ගැන තව විස්තර ටිකක් සොයා ගන්න ක්‍රමයක් නැද්ද " සුමනදාස ඔහුගෙන් ඇසුවේය.

"අම්පාරෙද?" සුමනදාස මොහොතකට කල්පනා කළේය. මගේ රෙජ් කෙනෙක් සඳුදා නම් අම්පාරෙ යැවෙනව. මිනිහට කියන්න පුලුවනි. ඇඩ්‍රස් එකක් තියෙනවද?"

"එහෙමට කියල නැහැ. එයාට කවුරුත් කියන්නෙ පොඩි වෙද මහත්තය කියල. අම්පාරෙ ටවුමට එන්න හැතැක්ම දෙකකට විතර කලින් පොලිස් චෙක් පොයින්ට් එක ලග හාල් මෝලක් තියෙනවලු. ඊට අල්ලපු ගෙදර තමයි වෙද මහත්තය ඉන්නව කියන්නෙ "

"මම කියන්නම් අපේ මිනිහට"

"ඒ විස්තර හොයාගන්න කම් අපි යමුද කැලණියෙ මම දන්න කෙනෙක් හම්බවෙන්න" ගුනදාස, අයියාගෙන් ඇසුවේය. "එයත් ලෙඩ්ඩු හුගක් සනීප කරල තියෙනව"

"ආයුර්වේද වෙද මහත්තයෙක්ද?"

"මම හරියටම දන්නෙ නැහැ. එයා හැම දේම කරනව. ආයුර්වෙද, හොමියෝපති, නක්‍ෂත්‍රය "

"එහෙනම් හොරෙක් තමයි ෂුවර් එකටම" සුමනදාසගේ ප්‍රතික්‍රියාව විය.

"අපි ගිහිල්ල බලමුකො" ගුනදාස යලිත් කිවේය.

පසුදා ඔවුන් දෙදෙනා ඩොක්ටර් රවි බැලීමට ගියහ. ඔහු සුමනදාස හිතින් මවා ගත් පුද්ගලයා නොවිය. ඔහු හැඳ සිටියේ සුදු කමිසයක් සහ කලු කලිසමකි. මුලුමනින්ම වාගේ සුදුවූ ගොරහැඩි රැවුලක් ඔහුගේ මුහුණ පුරා වසාගෙන සිටියේය. ඔහු සිටි නිවස විසාල නවීන පන්නයේ එකක් විය. ඔවුන් ඇතුලුවූ විසිත්ත කාමරය ඉතාමත් මනාලෙස සකසා තිබුනේය. එතැනට පෙනුන ඇතුල් කාමරයක බිම සිට වහලට තැනුනාවූ රාක්ක පොත් වලින් පිරී තිබුනේය.

ඩොක්ටර් රවි ගෙතුල සිටි අයෙකුට හඬගා තේ ගෙන එන්නැයි කීවේය.

"මොනවද මගෙන් කෙරෙන්න ඕන" ඉන් අනතුරුව ඔහු ඇසුවේ, ඔහුගේ බිස්නස් කාඩ් පත් දෙකක් අයිය මලෝ දෙදෙනාට දීමෙන් පසුවය.

"මගේ දුව ඉන්නෙ ඉස්පිරිතාලෙ, අක්මාව නරක්වෙලා" සුමනදාස කෙලින්ම ඔහු පැමිණි කාරණය පැවසුවේය.

"කොහෙමද ඒක උනේ කියල දන්නවද?" ඩොක්ටර් රවි ඇසුවේය.

"අපිට සැකයක් තියෙනව ඒක වෙන්න ඇත්තෙ එයා කුරුලෑ වලට ගනිපු බෙහෙතකින් කියල"

"මේ ළමයට කුරුලෑ නිසා ලොකු ප?ශ්නයක් තිබුන. ඉතින් දන්න දන්න, අහන අහන බෙහෙත කළා. ඒ අතරෙ තමයි මේ අලුත් බෙහෙතක් ආවෙ ස්මුත් කියල" ගුනදාස එකතු කළේය.

"මමත් අහල තියෙනව ස්මුත් ගැන. ඒක මේ එම්. එන්. සී ලගෙ ලාභ වැඩිකරන්න තවත් එක උප්පරවැට්ටියක් තමයි" රවි පවසු වේය, "මල්ටි නැෂනල් කොම්පැනි, බහු ජාතික සමාගම්. උන් අපේ රටවල් වල මිනිස්සු පාවිච්චි කරන්නෙ උන්ගෙ අලුත් බෙහෙත් වෙස්ට් කරන්න. අපේ මිනිස්සු ටිකක් මැරුනට පස්සෙ උන් ලේබල් වල අනතුරු ඇගවීම් ගහනව. තුන් වන ලෝකයේ රට වල මිනිසුන්ගෙන් සියයට හතලිහක් විතර දුක් විඳින්නෙ දොස්තරල ඇති කරපු

ලෙඩ වලින්. ඒකට ඉන්ග්‍රිසියෙන් නම් නමකුත් තියෙනව දැන්, අයට්‍රොජෙනික් ඉල්නස් කියල"

"බෙහෙත නිකම්ම ෆාමසි එකකින් අරගෙනද, නැත්නම් දොස්තරෙක් දීලද?" ඊලගට ඔහු ඇසුවේය.

"දොස්තරයෙක් තමයි දීල තියෙන්නෙ " සුමනදාස කීවේය.

"ඉතින් බෙහෙතෙන් වෙන්න පුලුවන් හානි ගැන කියල දීල තියෙනවද?"

"නැහැ "

"මේ වගේ උන් උළ තියන්න ඕන, රජ කාලෙ වගේ "

"ඒකත් මුන්ට හොඳ වැඩියි " සුමනදාසගේ අදහස විය.

"ඔය අයට්‍රොජෙනික් රෝග වලදි, තව තවත් බෙහෙත් දෙන්න වෙනව ලෙඩාට. ඒ බෙහෙත් වලින් තව ලෙඩ ඇති වෙනව. මේකත් සංසාරෙ වගේ කෙළවරක් නැහැ. ඒකයි දැන් බටහිර වෙදකම නිකම් පැලැස්තර දැම්මක් වෙලා තියෙන්නෙ. ඒක හොඳයි හදිසි අවස්ථාවලදි, අනතුරක් උන වෙලාවට එහෙම. ඒකනෙ අපි නම් හැම අවස්ථාවෙම ස්වාභාවික පිලියම් කරන්නෙ. ඒවයින් ලොඩට කිසිම හිනියක් වෙන්නෙ නැහැ" දොස්තර රවි ඔහුගේ දේශනය දිගටම කරගෙන ගියේය.

"ඔය හැම වෙදකමක්ම පටන් ගත්තෙ ආයුර්වෙදෙන්ද?"

"ඔවු" හදිසියේම මතක් වී ඔහු සුමනදාස දෙසට හැරුණේය. "ළමයගේ හඳහන ගෙනාවද?"

සුමනදාස සාක්කුවෙන් ඇදගත් හඳහන දෑතින් අල්ලා රවිට ඳුන්නේය. දෙදෙනාම ඩොක්ටර් රවි එය පරිකෂා කරන තුරු නිහඬව බලා සිටියහ. ටික වෙලාවක් ඒ දෙස බලා සිටි රවි, එක් වරම නැගිට ඇතුලු කාමරය වෙත ගියේය. සුමනදාස වට පිට බලමින් තේ කෝප්පය තොල ගාන්නට විය. රවි විසාල පොතක් පිටු පෙරලමින් ආපසු ආවේය.

"මේ හඳහන වැරදියි. අපේ ජ්‍යොතිෂ්‍යයට අද වෙලා තියෙන හෙණේ ඒක තමයි. ඒ ගොල්ලන්ට හරියකට ගණන් හදාගන්න බැහැ. ඒ මදිවට ඇපේ පංචාණ්ග ලිතත් වැරදියි "

"ඉතින් දැන් මොකද කරන්නෙ?" සුමනදාස කලබල විය.

"බය වෙන්න එපා. ඒවට විසඳුම් මගෙ ළඟ තියෙනව. මම ගෙන්න ගත්ත ඇමරිකන් එෆිමරික්ස්. ඒක තමයි නිවැරදි. ඉතින් මට විනාඩි පහක් දෙන්න මම මේක ආයිත් හදන කම් "

"අපි පිළිකා රෝගය දිහා බලමු. බටහිර වෛද්‍ය ක්‍රමයේ කිසිම සාර්ථක වෙදකමක් තියෙනවද?" රවි ගණන් හදන අතරම ඇසුවේය.

"නෑ. මං හිතන්නෙ නැහැ උන්ට කවදාවත් පිළියමක් හොයාගන්න පුලුවන් වෙයි කියල" ගුනදාස කිවේය.

"දන්නවද ඇයි කියල?" රවි ඇසුවේය. " එයට පිළිතුරක් නොලද විට ඔහුම පිළිතුරු දෙන්නට විය. "දැන් හදන පිළිකා බෙහෙත් වලින් උන්ට හොඳ ලාබයක් ලැබෙනව. ඩොලර් කෝටි ගණන්. උන් හදනව. මුන් බෙහෙත් ලියනව. ඒ බෙහෙත් බිල අහිංසක ලෙඩ්ඩු මැරෙනව. උන් සේරම හොඳටම දන්නව ඒ බෙහෙත් වලින් පිළිකාව හොඳ වෙන්නෙ නැති බව. ඒ උනාට ඒ බෙහෙත් බිව්වම නෙ උන්ගෙ සාක්කු පිරෙන්නෙ. ලෙඩා විඳවල මැරෙනව. ලෙඩාගෙ පවුලෙ අය හිගන්නො වෙනව"

"එතකොට ඔය පර්යේෂණ ආයතන වලින් මොනවද කරන්නෙ?" ගුනදාස ඇසුවේ අයියාගේ දෙස නොබලාය. සුමනදාසට උවමනා වූයේ හැකි ඉක්මනින් සුනීතා ගැන දැනගැනීමටය.

"ඒවයෙත් ගෙනියන්නෙ මහා ප්‍රෝඩාවක් "

"දැන් වෙනදට වඩා වැඩි කාලයක් ජීවත් වෙන්න පුලුවන්නෙ පිළිකා රෝගීන්ට "

"කවුද කියන්නෙ?" රවි සිනාසුනේය "දැන් ලෙඩ්ඩු වැඩි කලක් ජීවත් වෙන එක නෙවෙයි ඇත්තටම වෙන්නෙ. අද ඉස්සරට වඩා කලින් පිළිකාව හඳුනා ගන්න නිසා තමයි අපට පේන්නෙ ලෙඩා හුග කලක් ඉන්නව කියල. ඉස්සර පිළිකාව හඳුන ගන්නෙ රෝගයේ අන්තිම අවස්ථාවෙදි. ඉතින් එදා ඉඳල ටික දවසයි ලෙඩාට ජීවත් වෙන්න තිබුනෙ "

"හැමෝම කතා කරන්නෙ පිළිකාව හොඳ කරන්න බෙහෙත් ගැන. ඇයි කවුරුවත් පිළිකාවෙන් වළකින්න ක්‍රම හොයන්නෙ නැත්තෙ?" ගුනදාස යලිත් ඇසුවේය.

"ඒක ඉතාම පැහැදිලියි. රෝග වැලැක්වීමෙන් මුදල් උපයන්න බැහැ. මුදල් ගරන්න පුලුවන් ලෙඩ හැදෙන කම් ඉඳල ඒකට බෙහෙත් කරල විතරයි. පිළිකා වැලැක්වීමට තවත් බාධාවක් තියෙනව" රවි දේශනය කරගෙන ගියේය " පිළිකා වලට හේතුවන හුගක් දේවල් නවත්වන්න බැහැ. ඒවත් තව මහා පරිමාන ව්‍යාපාර නිසා. කවුරුත් දන්නව සිගරට් වලින් පිළිකා හැදෙනව කියල. ඒත් සිගරට් වෙළඳාම වත් විකිනීම වත් නවත්වන්න ලෝකෙ කිසිම රටක ආංඩුවකට පුලුවන්ද? ඒ වගේම අනිත් භයානක දේ වගාවට ගහන තෙල් බෙහෙත් පෝර ද්‍රව්‍ය, අපි හැමෝගෙම ඇගේ තැන්පත් වෙන විෂ විකුණන්නෙ කවුද?"

"මං හිතනව බොහොමයක් පිළිකා රෝගීන් මැරෙන්නෙ අසනීපෙ නිසා නෙවෙයි, ඒ දෙන බෙහෙත් වල විසට. දැකල ඇතිනෙ ටික කලක් පිළිකා බෙහෙත් ලෙඩ්ඩු "

"පිළිකා ලෙඩ්ඩු ඉක්මනින් මැරෙන්න හේතු දෙකක් තියෙනව. එකක් ඒ දෙන විස බෙහෙත්. අනිත් එක පිළිකාවක් කියල දැන ගත්තම මිනිස්සු හිතන්නෙ ඒක හොඳ කරන්න බැහැ කියල. ඉතින් ලෙඩා සියලු බලාපොරොත්තු අත් හරිනව. මැරෙන්න ලෑස්ති වෙනව. කරන බෙහෙත් වලින් සනීප වෙන්නෙ නැහැයි කියල හිතනව. පිළිකා රෝහලට ඇතුල්වෙන ලෙඩා හිතන්නෙ එයාට පනපිටින් ගෙදර යන්න වෙන්නෙ නැහැ කියල. කවුරුවත් නැහැ ලෙඩාගේ හිත හදන්න උත්සාහ කරන්නෙ නැහැ "

"මම ඒ ගැන හිතුවෙ නැහැ. ඒක තමයි මෙතරම් මිනිස්සු පිළිකා වලින් මැරෙන්නෙ. එහෙනම් මේ විස්මයජනක පිළිකා ප්‍රතිකාර කියල ඔය සමහර විට අහන්න ලැබෙන්නෙ ඒ කරන වෙද කම ගැන විශ්වාසයක් ඇති කර ගන්න හින්ද වෙන්න ඕන. ඒ විස්වාසය ඔය ජරා වස බොනවට වඩා කොයිතරම් හොඳද?"

"අන්න හරි. ඒකනෙ මම කොයිවෙලාවෙත් කියන්නෙ මගේ ලගට එන ලෙඩුන්ට, ඒ අය විස්වාස කරනව නම් සායි බාබා ගැන හරි, කතරගම දෙයියො ගැන හරි, දොලුකන්ද ගැන හරි, ඒක හොඳයි කියල. ඒ වගේ විස්වාස, භක්තිය බටහිර බෙහෙත් වලට වඩා හුගක් බලවත් "

"මමත් විස්වාස කරනව දැනට හොයාගෙන ඇති බෙහෙත් සේරටම වඩා භක්තිය නිසා ලෙඩ සුව වෙනව කියල" ගුනදාස කීවේය.

"ඒකටත් වග කියන්න ඕන මේ රටවලට ආපු යුරෝපීය මෙල්ජයො. උන්ට අපේ වෛද්‍ය ක්‍රම තේරුම් ගන්න බැරි උනාම උන් ඒවට හිනාවෙන්න පටන් ගත්ත. උන් ඒ දිහා බැලුවෙ කිසි වැදගැම්මකට නැති බහුබූත විදිහට "

"ඒක නම් ඇත්ත තමයි. මේ සුද්දා හැතිකරේට තේරුම් ගන්න බැරිඋනා අපේ ආයුර්වෙද ශාස්ත්‍රය පවතිනව කියල උන් ගල් ගුහා වලින් එලියට එන්නත් බොහොම කලකට ඉස්සර ඉඳල. ඔය සුද්දො නාන්නවත් පටන් ගත්තේ අපේ රටවලට ආවට පස්සෙනෙ. දැන් අපේ මෝඩයො හිතනව අපි පිරිසිඳු කම ඉගෙනගන්න ඕන ඕකුන්ගෙන් කියල "

"ඔයගොල්ල දන්නවද මීට අවුරුදු දෙදාහකටත් වැඩිය ඉස්සර චාරක වගේ උත්තමයො කියා තියෙන්නෙ රෝගය වළක්වාගැනීම හොඳයි කියල ඒකට බෙහෙත් කරනවට වඩා. ඒ වගේම වෛද්‍ය වරයෙක් උනාම ලෙඩෙකුට පිළියම් කරන්න කලින් ලෙඩා ගැන හැම දෙයක්ම සොයා දැනගන්න ඕන කියල, ලෙඩා ගෙ රෝග ඉතිහාසය, පවුලෙ අය ගැන, වට පිටාව ගැන මේ හැම දෙයක්ම "

"අද අපේ දොස්තරල ලෙඩා ඇවිත් වාඩිවෙන්නත් කලින් බෙහෙත් ලියලත් ඉවරයි. ඒකනෙ මේ ලගදි කවුද කියල තිබුනෙ අපේ දොස්තරල කොයි තරම් දක්ෂද කිව්වොත්, ලෙඩාගෙ අඩි සද්දෙ අහල ලෙඩේ අඳුන ගන්න පුලුවන් කියල "

"ඒ කොහොමද?" සුමනදාසට නොදැනුවත්වම වාගේ ඇසුනේය.

"නැත්නම් කොහොමද ලෙඩේ හොයාගන්නෙ, ලෙඩාගෙ මූනවත් බලන්නෙ නැතුව?"

"තවත් ප්‍රශ්නයක් තියෙනවනෙ. අපේ මිනිසුන්ට අද හැමදෙයක්ම ඕන ක්ෂණිකව නෙ. ක්ෂණික ආප්ප, ක්ෂණික නූඩ්ල්ස් වගේ. ඉතින් ඒ වගේ අයට ඉවසීමක් නැහැ ආයුර්වේදයට අනුව ප්‍රතිකාර ගන්න, ඒ විදිහට පිළිපදින්න. එක බෙහෙත් වේලෙන් ලෙඩ හොඳ කරගන්න ඉතින් දොස්තරල හොයාගෙන යනව" ගුනදාස ගේ අදහස විය.

"අපේ දේශීය වෛද්‍ය ක්‍රම වලදි ගන්න බෙහෙත් අපේ ශරීරයට කිසිම හානියක් කරන්නෙ නැහැ. ඒව ක්‍රියා කරන්නෙ හෙමිහිට ඒ උනාට සාර්ථකයි " රවි කීවේය.

"ඩොක්ටර් " සුමනදාස ඔවුන් පැමිණි කාරනාව මතක් කරන්නට තැත් කළේය.

"අහ්. මේ සබ්ජෙක්ට් එකට බැස්සම මට වැඩත් අමතක වෙනව" ඔහු සිනාසෙමින් පවසා යලිත් ගණන් හදන්නට පටන් ගත්තේය. අනිත් දෙදෙනා නිහඬව බලා සිටියහ. තවත් වරක් ඔවුන්ට තේ ගෙන එනු ලැබිය.

"මේක ටිකක් බරපතල කාරනයක්. මේ දරුව පහු කරන්නෙ බොහොම අපල කාලයක්. ඒත් තව සති තුනකින් අපල ගෙවිල යනව. මේ සති තුන ගෙවා ගන්න පුලුවන් නම් ලෙඩාට සනීප කර ගන්න පුලුවන් "

"මොනවද අපි කරන්න ඕන?" සුමනදාස කලබලව් ඇසුවේය.

"බෝධි පූජාවක් කරන්න ඕන වහාම. කතරගම දෙයියන්ට බාරයක් වෙන්න ඕන. මම දෙන්නම් ජීවම් කරපු තෙල් ටිකක්, ඒ තෙල් පොඩි පහණක දාල රෑට පත්තු කරන්න ළමයගෙ ඇගට එලිය වැටෙන විදිහට "

"හොඳමයි "

"බෝතලයක් තියෙනවද, තෙල් ගෙනියන්න?" රවි ඇසුවේය.

සහෝදරයින් දෙදෙනා එකිනෙකාගේ මුහුණ බලා හිස සැලූහ. "අපි බලාපොරොත්තු උනේ නැහැ " සුමනදාස අපහසුවෙන් කීවේය.

රවි ආපසු කාමරය තුලට ගොස් මඳ වේලාවකින් එලියට ආවේ කුඩා තෙල් බොතලයකුත් අතැතිවය. සුමනදාස වහා නැගිට එය දැතින්ම බාරගත්තේය. ඒ සඳහා මුදල් ගෙවන්නේ කෙසේදැයි දැනගන්නට සුමනදාස මල්ලි දෙස බැලුවේය.

"පිස්සුද, මං මේව කරන්නෙ සල්ලි හොයන්න නෙවෙයි " රවි කීවේය.

ඔවුන් ආපසු යන විට රවි ඔවුන් සමග මිඳුලට ආවේය.

"ලස්සන ගාඩන් එක " ගුනදාස කීවේය.

"මම මේක හදන්නෙ ලස්සනට නෙවෙයි. මෙතන තියෙන එක පැලයක් වත් ලස්සන නිසා පමනක් වවපු ඒව නෙවෙයි. මේ හැම පැලයක්ම මොකක් හරි බෙහෙතකට උවමනා වෙනව. සමහර ඒව කෑමට ගන්න පුලුවන් ඒව "

"ඒත් මේ තියෙන්නෙ ඉක්සෝරා නේ ද?" සුමනදාස මල් පැලයක් පෙන්වා ඇසුවේය. "මේක මොනවත් බෙහෙතකට ගන්නවද "

"ඉක්සෝරා කියන්නෙ ඊශ්වර කියන වචනයෙන් ආපු එකක්. ඒක ඊශ්වර දෙවියන්ට කැප වෙච්ච ගසක්. අපේ ගම් වල ඕවට කිව්වෙ රත් මල් කියලනෙ. මේක බොහොම හොඳ බෙහෙතක් පාචනයට "

තවත් වරක් ස්තුති කිරීමෙන් පසුවය ඔවුන් ඩොක්ටර් රවි ගෙන් සමු ගත්තේ.

"ඉතින් අයිය මොකද හිතන්නෙ?" ගුනදාස ආපසු එන අතර ඇසුවේය.

"මට හිතා ගන්න බැහැ. මිනිහ අපේ ආයුර්වේදය ගැනයි, නක්‍ෂත්‍රය ගැනයි මොනව හරි දන්නව. දුවගෙ හඳහන බලල කියපු දේ ඕනම නක්‍ෂත්‍ර කාරයෙකුට කියන්න පුලුවන්. වචන ටික උනත් ඒ වගේමයි " සුමනදාස බලාපොරොත්තු කඩවූ හඩකින් කීවෙන් ගුනදාස නිහඩ විය.

ආපසු ආ විට සුමනදාසගේ මුහුණෙන් ම ගමනේ ප්‍රතිඵල දුටු කුමාරි කිසිත් නොඇසුවාය. ඔහු නිහඩවම තෙල් බෝතලය මේසය උඩ තැබුවේය.

ගුනදාස කුමාරිට විස්තර කියා, පහන දල්වන අයුරු කියාදුන්නේය.

එදා සවස සුනිතා බැලීමට පැමිණි අය අතර කෝලිත ද සිටියේය. ඔහු පාසල් වියේ සිටම සුමනදාසගේ මිත්‍රයෙක් විය. එහෙත් සුමනදාස කොළඹ ආ පසු ඔවුන් තරමක් ඈත් වීමක් සිදුවිය. ඔහුට සුනිතා ගැන දැනගන්නට ලැබුනේ ටික දිනක් ගිය පසුවය. ඔහු දැනගත් දාම ඇය බලන්නට පැමිණියේය.

"මම දන්න හාමුදුරු කෙනෙක් ඉන්නව අනුරාධපුරේ, අපේ ගැමි සංස්කෘතිය ගැන හොඳට දන්න. ඒ හාමුදුරුවො සමහර විට දන්නව ඇති මේ ගැන වෙදකම් කරන්න පුලුවන් කෙනෙක් ගැන "

"මම මේ දවස් ටිකට සෑහෙන වෙද මහත්වරු ගැන ඇහුව, ඒත් ඒ සේරම මහ බොරු කාරයො වගෙයි" සුමනදාස කීවේය "ඒ උනාට කෝලිත අහල බලන්නකො"

"මම අද රෑටම කෝල් එකක් දෙන්නම් "

"අම්පාරෙ වෙදා ගැන මට අද ආරංචියක් ලැබුන" රාජු ආ ගමන් කී විලාසයෙන්ම ඒ බලාපොරොත්ත!වත් බිඳී ගිය බව සුමනදාසට තේරුම් ගියේය.

"මොනවද ඔයාගෙ රෙජ් කිව්වෙ?"

"ඒ තරම් දෙයක් නැහැ. තැන සොයාගන්න නම් අමාරුවක් වෙලා නැහැ. පාර අයිනෙ මහ විසාල බෝඩ් එකක් ගහල තියෙනවලු පොඩි වෙද මහත්තයා කියල"

"එයා ඒ තරම් දක්ෂ වෙදෙක් නම් එහෙම බොඩ් එකක් උවමනා වෙන්නෙ නැහැ" සුමනදාස කීවේය.

"මාත් හිතුවෙ එහෙම තමයි. ඒත් රටේ හැම තැනකින්ම වගේ ලෙඩ්ඩු නම් එනවලු. හැබැයි අම්පාර අවට අය නම් වැඩිය යන පාටක් නැතිලු "

"ලෙඩ හොඳ වෙච්ච අය ගැන ආරංචි තියෙනවද?"

"නැහැ. අපේ මිනිහ ගිය දවසෙ ඉඳල තියෙන්නෙ හුගක්ම පලමුවෙනි වතාවට බෙහෙත් ගන්න ආපු අය. කිහිප දෙනෙක් ඉඳල තියෙනව දෙවෙනි, තුන්වෙනි වතාවෙ ආපු. හුගක් අයට බෙහෙත් දෙන්නෙ දවස් හතකට සෑහෙන්න, දීල කියනවලු දවස් හතකින් ආපහු එන්න කියල. සම්පූර්ණ වෙදකමට දවස් එකසිය දහයක් යනවලු "

"එහෙනම් එහේ ගිහිල්ලත් වැඩක් නැහැ. මිනිහත් අලි හොරෙක් වගෙයි" සුමනදාස එතැනින් ඉවත් වූයේ ඔහුගේ දෑසට ආ කඳුලු අනිත් අය දකින්නට පෙරය.

පසුදා කෝලිත සුමනදාසට කතාකළේ එම සති අන්තයේ ඔවුන් සමග අනුරාධපුරේ යන්නට හාමුදුරුවන් කැමති වූ බව කීමටය. ගමනට වාහනයක් සොයා ගත හැකිදැයි කෝලිත ඇසුවිට රාජුගෙන් අසන බව සුමනදාස කීවේය.

සෙනසුරාදා උදේ පාන්දරින්ම ඔවුන් අනුරාධපුරය බලා පිටත්වූහ. උදේ ආහාර සඳහා කුරුණෑගල වැව අයිනට යමුයැයි පාලිත හාමුදුරුවෝ යෝජනා කළහ. චිත්‍රා ඔවුන්ට පාන් සහ කෝපි පිළියෙල කරදී තිබින.

ඔවුන් ඊළගට නැවැත්වූයේ අනුරාධපුරයට නුදුරින් වූ කුඩා ගමකය. ගම අයිනේ වූ වැව අනුරාධපුර යුගයෙන් පසු අලුත්වැඩියා නොකළ ලෙසින් වැනසී ගොස් තිබුණේය. දිවා ආහාර ලැබුනේ පාලිත හිමියන්ගේ මවගේ නිවසින්ය. බත් සමග වූ එළවලු කිසිවක් ඔවුන්ට නුහුරු විය. පාලිත හිමිගේ මව ඒවා එකින් එක ඔවුන්ට හඳුන්වා දුන්නාය. කටු පුහුල් හා තල ව්‍යංජනද පලා මැල්ලුමක්ද එයට අයත් විය.

"අද මහත්තයලගෙ දවල් කෑමට සල්ලි දීල ගන්න ඇත්තෙ ලුණු විතරයි. අනිත් සේරම වත්ත පිටියෙන් සොයා ගත්තු දේ තමයි " පාලිත හිමි එතැණින් පිටත් වූ පසු ඔවුන්ට පැවසීය.

"දැන් කොහාටද?" රාජු ඇසුවේය.

"අපි ඉස්සෙල්ල යමු මම දන්න හාමුදුරුකෙනෙක් හමුවෙන්න. උන්නාන්සෙ අපව එක්ක යාවි "

තවත් කිලෝමීටර් කිහිපයක් ගිය තැන ඔවුන්ට ගුරු පාරකට හැරෙන්නට සිදුවිය. එතැන සිට ගමන ඉතා දුෂ්කර විය.

"අපට එන්න තිබුනෙ ෆෝ වීල් එකක " කෝලිත කීවේය.

"කිසි දේකට බය වෙන්න එපා. මේ වාහනෙන් මම ලංකාවෙ ඕන තැනකට එක්ක යන්නම් ඔයගොල්ලන්ව" රාජු සුක්කානමට තට්ටු කරමින් කීවේය. තවත් විශාල වැවක් අසලට ඔවුන් ළගාවූහ.

"අන්න. අන්න අලි " කෝලිත එක වරම කෑගැසුවේය.

"කෝ? කොහේද?" රාජු තිගැස්සී එකවරම කාරය නැවැත්විය.

"අර. අර. වැවේ?" කෝලිත අත දිගු කළේය "අර මැරිච්ච ගස් වලට එහායින්"

"උන් නානව වගෙයි " රාජු කීවේය.

"හතර පස් දෙනෙක් ඉන්නව"

"අපරාදෙ මට කැමරාව ගේන්න බැරි උනානෙ"

"මහත්තයල බය වෙන්න එපා. ජ්ළ❑ග සැරේ එනකොටත් උන් ඉඳියි"

"ඒ කොහොමද?"

පාලිත හිමි සිනාසුනා පමනකි.

"මෙහේ එන හුගක් අය රැවටෙනව. ටිකක් හොඳට බලන්න"

"වැවේ තියෙන ගල් නේ මේ යකා කලබල උනාට" රාජු අන්තිමේ රිය පනගන්වමින් කීවේය.

පන්සල තිබුනේ වැවට ඔබ්බින් වූ කඳු ගැටයක් මතය. තරුණ වියේ හිමිනමක් ඔවුන් වෙත ආවේය.

"අපි හිතුව දවල් කෑමට එයි කියල" පාලිත හිමිට වැඳ ඔහු අනිත් අයට පැවසීය.

"අපි අම්මලගෙ ගෙදර ගියා. මේ මහත්තුරු සුමනදාස, රාජු, කෝලිත "

සුමන හිමි ඔවුන් ඔහුගේ කුටිය වෙත කැටුව ගියහ. ගල් ගුහාවක ඉදිරිපස බිත්තියක් බැඳ, දොරක් සවි කර තිබුණේය. දොර හැරිය පසුය ඔවුන් විස්මය පත් වූයේ. එහි මුලින් ඔවුන් දුටුවේ ඇඳත් පොත් රාක්කයකුත් වුවත්, ඊළග මොහොතේ නෙත ගැටුනේ මේසය මත වූ පරිඝණකය වෙතය.

"ගුහාවක හිටිය කියල ගල් යුගේ ජිවත් වෙන්නම ඕන නැහැනෙ " සුමන හිමි සිනාසෙමින් කීවේය.

" මේක ඇතුලෙ හරිම සිසිලයිනෙ " කෝලිත වටපිට බලමින් කීවේය.

"ඒක නිසාම තමයි මම කොම්පියුටර් එක මෙහාට ගෙනැත් තියාගත්තෙ"

අමුත්තන් බංකුවක් මත වාඩිවී කොලු ගැටයෙක! ගෙනා තේ බොන්නට වූ අතර හාමුදුරුවරුන් දෙදෙනා මිදුලට බැස්සහ.

"එහෙනම් අපි යමුද?" සුමන හිමි ඇසුවේය.

"කාර් එකෙන් යන්න පුලුවන්ද?" රාජු ඇසුවේය.

"පුලුවන් තරමක් දුර කාර් එකෙන් ගිහිල්ල ඉතුරු ටික පයින් යමු "

මද දුරක් ගිය තැන වමට වූ පාරක් පෙන්වූ සුමන හිමි, එතැණින් ගිය විට ඉතා පැරණි ගල් පාලමක් ඇති බව පැවසීය.

"කොච්චර පරණද?"

"දේවානම්පියතිස්ස කාලෙ විතර කියලයි හිතන්නෙ"

"එහෙනම් කොහොමහරි හවසට බලමු " කෝලිත පැවසීය.

පාර දෙපස කටු පඳුරු වලින් ගහනවූ කැලයක් විය. තැනින් තැන කුඩා පැල්පත් කිහිපයක් විය. ඒවා සියල්ල කටුමැටි ගසා පිදුරු සෙවිලි කර තිබිණි. ඉඳ හිට ගෙයක පමණය තහඩු සෙවිලි කර තිබුණේ.

"දැන් ඉස්සර වගේ පිඳුරු සෙවිලි කරන එක ලේසි නැහැ" සුමන හිමි පැවසීය.

"දැන් පිදුරු මාස කීපයක ඇතුලත දිරණව. ඊළග වැහි කාලෙ එනකම් වත් පිදුරු ටික තිබුනෙ නැත්නම් මිනිස්සු ලොකු අමාරුවක" පාලිත හිමි එකතු කළේය.

"ඇයි ඒ?"

"වෙන මොනවද ඉතින්, දැන් මේ වසංගතයක් වෙලා තියෙන කෘෂි රසායනික බෙහෙත් ගැහිල්ල නිසා තමයි, කුඹුරු වලට "

"මේ තෙල් බෙහෙත් ගහන්න ඉස්සර පිඳුරු මේ වගේ ඉක්මනට දිරුවෙ නැහැ"

"මේව නිසා පිදුරු විතරක් නෙවෙයි අපිත් ඉක්මනට දිරාපත් වෙනව" පාලිත හිමි එකතු කළේය.

"ඉස්සර අපි කාපු එළවලු වගේ නෙවෙයිනෙ දැන් කන්න තියෙන ඒව" සුමනදාස බොහෝ වේලාවකට පසු අදහසක් ඉදිරිපත් කළේය.

"මම එන ගමන් මහත්තයලට පෙන්නනම් හොඳ උදාහරනයක්"

පාර සැම තැනම විසාල වළවල් වූ අතර, තැනින් තැන ගල් මතුවී තිබුණේය. සමහර තැනකදී ඔවුන්ට කාරයෙන් බැස ටික දුරක් ගමන් කරන්නට සිදුවිය.

"මං හිතන්නෙ අපි කාරෙක මෙතන තියල ගියොත් හොඳයි කියල "

"තව කොච්චර දුරද?"

"හැතැක්මක් විතර ඇති "

"ඔට්ටපාලු හැතැක්මක් ද?"

"මොකක්ද ඔට්ටපාලු හැතැක්මක් කිව්වෙ?" කෝලිත ඇසුවේය.

"අපේ ගම් පලාත්වල හැතැක්ම කියන එක ටිකක් ඇදෙනව, ඔට්ටපාලු වගේ " පාලිත හිමි පැහැදිළි කළේය.

"මට නම් ඒත් තේරුණේ නැහැ "

ඉදිරියෙන් හමුවූ වැවේ ගමුන් කිහිප දෙනෙක් නාන බව දුර තියාම ඔවුන්ට දක්නට ලැබුනේය. ළමුන් වැවේ සෙල්ලම් කරමින් සිටි අතර ගැහැණු රෙදි සේදූහ.

"හොඳ වෙලාව නාගන්න "

"අපිට වෙලා තියෙනව, ආපහු පන්සලට ගිහිල්ලම නාගන්න" සුමන හිමි පැවසීය.

"එතකොට කරුවල වෙලා තියෙයි "

"එච්චර ඉක්මනට මෙහේ රෑ වෙන්නෙ නැහැ "

"මේ වෙලාවට තමයි අලි එන්නෙ "

"පාරටත් එනවද?"

"සමහර වෙලාවට" පාලිත හිමි කීවේය.

"දවසක් අලියෙක් මෙතෙන්දි තමයි මිනිහෙකුට ගහල තිබුනෙ"

"ඉතින් මිනිහ මැරුනද?"

"මේ මොනව අහනවද මහත්තය. අලිය බයිසිකලේ ගිය මිනිහව හොඬවැලෙන් අල්ලගෙන මෙන්න මේ ගහේ තමයි ගහල තිබුනෙ"

"තව හුගක් දුරද " කොලිත හෙමිහිට ඇසුවේය.

"දැන් ළගයි "

පැතලි ගල් තලාවක් අසලදි පාර අවසාන විය. ඒ අවට එලිමහනක් විය. සුමන හිමි අඩි පාරක් දිගේ ඔවුන් කැඳවාගෙන ගියහ. ඉදිරියේ තවත් විසාල ගල් තලාවක් විය. ඒ මත උතුරා යන වතුර සහිත ළිඳක් තිබුණේය. වතුර ඉතා සිහිල් ඇතැයි ඔවුන්ට සිතාගත හැකිවිය. මෙතැනට බෝධියත්, නටබුන් වූ චෛත්‍යයත් දිස්විය.

"කෝ මම ගේන්න කියපු බුලත් අත" කෝලිත හිමි සුමනදාස වෙතට හැරුණේය. හාමුඳුරුවන් බුලත් අත සකසන අන්දම ඔවුහු බලා සිටියහ.

"වැඩිහිටි උන්නාන්සෙල බොහොම සැලකිලිමත් වෙනව බුලත් අත පිළිගන්වන විදිහ ගැන " සුමන හිමි පැහැදිළි කළේය.

ආවාස ගෙය වෙත ගමන් කළ ඔවුන්ට ආලින්දයේ වූ ඇඳක් මත වාඩිවී සිටි වයස්ගත භික්ෂුවක් දක්නට හැකි විය. ඔවුන් කැටුව ගිය හාමුඳුරුවන් පහත් වී වැන්ද පසු අනිත් තිදෙනාද වැන්දහ. සුමනදාස බුලත් අත පිළිගැන්විය.

ඇඳ අසල එලා තිබූ පැඳුරේ සුමනදාසත් කෝලිතත් වාඩිවූහ. ඒ අසල මළ බැඳුන පඩික්කමක් විය. ඇඳ මත පැදුරක් එළා ඒ මත ඇඳ ඇතිරිල්ලක් දමා තිබුණේය. ඇතිරිල්ලේ, පඩික්කම අසලින් පහලට එල්ලා වැටී තිබූ පෙදෙස කිළිටි වී තිබුනේ බුලත් කෙළ කහට නිසා විය යුතු!යැයි සුමනදාසට සිතුනේය. එම ඇතිරිල්ල අන්තිමට වෙනස් කරන්නට ඇත්තේ කවදාදැයි සිතන්නට ඔහු උත්සාහ කළේය.

මෙසේ ජීවත් වන කෙනෙක් හොඳ වෛද්‍ය වරයෙක් විය හැක්කේ කෙසේදැයි ඔහුට ඊළගට සිතුණේය.

"දෙස්තරල කියල තියෙනව මෙයාගෙ දූවගෙ අක්මාව නරක්වෙලා කියල" කෝලිත විස්තර කළේය.

"සෙංගමාලය එහෙම හැදිල තියෙනවද?"

"නැහැ. බෙහෙතක් විස වෙලා "

"දැන් කොහේද ඉන්නෙ, එක්ක ගෙන ආවද?"

"ඉස්පිරිතාලෙ. දොස්තරල කියනව වෙන අක්මාවක් බද්ධ කරන්න ඕන කියල"

"කොච්චර කල් වෙනවද අසනීප වෙලා"

"සති දෙකක් විතර "

"මට ලෙඩා බලන්නෙ නැතුව මොනවත් කියන්න බැහැ. ඔය කියපු විස්තර වල හැටියට නම් ටික කලක් වෙදකම් කරන්න වෙයි " වෙද හාමුදුරුවෝ පැවසූහ "බෙහෙත් ඔරුවක තියන්න වෙනව, විටින් විට. නිට්ටාවට සුව වෙන්න මාස තුනක් වත් යාවි "

"මේ තරම් දුරක් එන්න තරම් තත්වෙක නෙවෙයි දැනට දුව ඉන්නෙ" සුමනදාස ඉතා පහත් හඬින් පැවසීය.

"දැනට බෙහෙතක් දෙන්න බැරිද ටිකක් හරි සුවයක් ලබන්න මෙහේ ගේන්න පුලුවන් වෙන්න තරමටවත් " කෝලිත ඇසුවේය.

"බෙහෙතක් නම් දෙන්න පුලුවන්" මඳ වේලාවක් කල්පනා කර පැවසූ වෙද හාමුදුරුවෝ ඇතුලු ගෙට පිවිසියහ.

මහලු මිනිසෙක් ඔවුන් අසලින් වාඩිවිය. තරුණයෙක් පැමිණ ඔවුන්ට තේ පිළිගැන්විය.

"දුවට වයස කීයද?" මහල්ලා ඇසුවේය.

"තවම විසි එකයි "

"හරිම අපරාදයක්නෙ. ඔය තරම් ලාබාල වයසෙදි. ඒ උනාට බය වෙන්න එපා. අපේ ලොකු හාමුදුරුවො සනීප කරාවි. ඔයිට වඩා බරපතල ලෙඩ සනීප කරල තියෙනව"

"මේ වගේ අක්මාව නරක්වුණ ලෙඩ්ඩු සනීප කරල තියෙනවද?"

"අපොයි මොකද නැත්තෙ, සිය ගණනක් සනීප කරල ඇති " ඉලත්තට්ටුවෙන් තෝරාගත් පුවක් ගෙඩියක් කපමින් මහල්ලා කීවේය. තේ කෝප්පයේ වූ සීනි රස මකාගන්නට සුමනදාස බුලත් කොලයක් සපන්නට විය. මහල්ලා ඔහුට පුවක් කැබැල්ලක් දී දුම්කොල කැබැල්ලක් දෙන්නට සැරසුණේය.

"මේ ඇති. මට දුම්කොල වලට මත් වෙනව "

වෙද හාමුදුරුවන් නැවත ඔවුන් වෙත ආවේ කඩදාසියක එතූ බෙහෙත් මුලක් හා කොල කැල්ලක් අතැතිවය. ඔහු කොලය දිග හැර එහි ලියා තිබූ බෙහෙත් වට්ටෝරුව කියවන්නට විය. කුඩු මුල උදේ සවස මී පැණි සමග දිය යුතුවිය.

"දින දහයකින් ලෙඩා මෙහේ එක්ක එන්න පුලුවන් වෙයි" ඔහු පැවසීය.

ආපසු එන අතර සුමනදාස කිසිවක් කීවේ නැත. අනිත් අය වැවේ නැම ගැනත්, අලි ගැනත්, දඩයම් ගැනත් කතා කරන අතර සුමනදාසගේ සිතේ තිබුනේ සුනිතා පමනක් විය. ලෙඩ ඇඳක වැතිර, ඉරනමට ඉඩදී, එහෙත් ඇගේ වේදනාවත් බයත් අන් අයට නොපෙන්වන්නට තැත් දරණා අහිංසක දැරිය ඔහුට පෙනුනේය. චිත්‍රා ඇය අසලින් හි□ද සිටිනවා ඇත. ඔහු මේ වෙද හාමුදුරුවන් පිළිබඳව මහත් බලාපොරොත්තු ඇතිවය මේ ගමන පැමැණියේ. මෙහිදී දුවට සාර්ථක පිළියමක් ලද හැකිවෙතැයි ඔහු සිතා සිටියේය.

ඔහු සිතින් මවා ගෙන සිටියේ එදා සිටි බුදුන් වහන්සේ වැනි වූ තැන්පත්, සිල්වත්, කරුණාභරිත වූ භික්‍ෂුවක් වුවද ඔහුට හමුවූයේ දින ගණනකින් රැවුල නොකැපූ, කිළිටි සිවුරක් පොරවාගෙන, කිලිටි ඇඳක සිටි ගොරහැඩිවූ මහල්ලෙකි. ඔහු බලාපොරොත්තුවූයේ ලෙඩා ගැන කී සැණින් රෝගය හඳුනාගෙන, බෙහෙත් නියම කර ඔහුගේත් සිත සනහත හැකිවූ කෙනෙක් විය. අඩුම ගණනේ ලෙඩා ගැන තව විස්තර අසතැයි, ඇගේ හඳහන ඉල්ලාගෙන බලතැයි ඔහු සිතා සිටියේය.

කසාය වට්ටෝරුවත් බෙහෙත් මුලත් ඔහුගේ සාක්කුවේ තිබෙනවා ඔහුට දැණුනේය. එය කාරයෙන් ඉවතට විසි කරන්නට ඔහුට සිතුණේය. ඒ බෙහෙත නම් දුවට පොවන්නට ඔහු කිසිවිටක් නොසිතුවේය. දැනටමත් එක බෙහෙතක් විස වී දුක් විඳිනා ඇයට මෙවන් බෙහෙතක් කෙසේනම් දෙන්නද. ඔහුට තමා කෙරෙහිම මහත් කෝපයක් ඇතිවිය. මේ රට තුළ ඔහු සිතා සිටි අන්දමේ අව්‍යාජ වූ දේශිය වෙදකම ප්‍රගුන කළ ජීවකයින් සිටිතැයි කියාත්, පහසුවෙන් දුවගේ රෝගය සුවකර ගතහැකි වෙතැයි කියාත් විස්වාස කිරීමට තරම් ඔහු මොඩ වූවානේදැයි ඔහුට සිතුණේය.

හැකි ඉක්මනින්, එදා රාත්‍රියේම, ආපසු කොළඹ යාමට ඔහුට උවමනා විය. එහෙත් ඔහුගේ මිතුරන්ට වැවේ බැස නා ගෙන, වල් අලින් කිහිප දෙනෙක් නොදැක ආපසු යන්නට අදහසක් නැත. හැරත් රාජුට මේ රෑ ආපසු කාරය පැදවීමට කියන්නටත් බැරි බව ඔහුට වැටහිණ. ඔවුන් සියලු දෙනාම මේ ගමන පැමිණියේ ඇත්තටම සුනිතාට පිහිට වීමට ඇති කැමැත්ත නිසාය.

මිතුරන් සමග සුමනදාසත් වැවට බැස්සේ විඩාපත් ගතත් ගිනිගත් සිතත් තරමක් දුරට හෝ නිවාගත හැකි වෙතැයි සිතාය. වැවේ වතුර ඔවුන් සිතා සිටියාට වඩා උනුසුම් විය. රාජුත් කෝලිතත් වැව අයිනේ ගසක බැඳ තිබූ කුඩා ඔරුවක් ලිහාගෙන තල්ලු කරන්නට වූහ. කෝලිත එතුලට නැග ගත්තේය. රාජු එයට නගිනවා වෙනුවට කෝලිත සමග ඔරුව වෙගයෙන් දියඹට තල්ලු කළේය. කෝලිත බියවී කෑ ගසන්නට විය. රාජු ඔරුව අල්ලාගෙන වේගයෙන්

සොලවන්නට විය. කොලිතගේ දැගලිල්ල නිසා ඔරුව පෙරළුනේය. කොලිතගේ කෑ ගැසිල්ලට භික්ෂූන් දෙදෙනාද වැව අයිනට දිව ආහ. ඒ වනවිට පෙරලුන ඔරු කඳ මත නැගගත් කෝලිත මහ හඬින් සිනාසෙන්නට විය.

අසල නිවසකින් රෑ කෑම ගෙන්වා ගන්නට සුමන හිමි පිළියෙල කර තිබිණ. ගල් ගුහාව අමුත්තන්ට නිදා ගන්නට දී භික්ෂූන් දෙදෙනා අලුත් ගොඩනැගිල්ල වෙත ගියහ.

සුමනදාස නිදා ගන්නට උත්සාහ කළේය. ඔහුගේ මිතුරන් දෙදෙනා පාලිත හිමිත් සුමන හිමිත් සමග මිදුලේ ගල් තලාවක් මතට වී කතා කරමින් සිටියහ. සුමනදාස සුදු හුණු පිරියම් කළ ග!හාවේ වහලය දෙස ඇස් යොමාගෙන සුනිතා ගැන සිතුවේය. මිට වසර දෙදහසකට පමණ පෙරත් මේ ගුහාවේ භික්ෂුවක් වාසය කරන්නට ඇත. එකල අවට මහ වනයක් මැද ඔහු ඉන්නට ඇත්තේ හුදකලාව භාවනාවේ යෙදෙමින්ය.

එවන් භික්ෂුවක් බොහෝවිට අපවත් වන්නට ඇත්තේද මේ ලෙන තුලමය. මළ සිරුර මේ තුලම කුණුවී දිරාපත් වන්නට ඇත. නැතිනම් වන සතුන් විසින් කා දමන්නට ඇත.

ඔහු අද රාත්‍රි මේ ලෙන තුල මිය ඇඳුනොත් කියා සුමනදාසට ඒ සමගම සිතුණේය. ඔහුට සුනිතා සිහිවිය. ඔහු මැරුනොත් සුනිතා බේරා ගන්නේ කෙසේද? ඇය වෙනුවෙන් ඔහු ජීවත් විය යුතුය. කෙසේ හෝ ඇය සුව කර ගන්නට ක්‍රමයක් සොයා ගත යුතුය.

## මිත්‍ර

දෙඇස් වසා තිබූ වෙලුම් පටිය ගලවන අතර මිත්‍ර ඇසිපිය වසා ගෙන සිටියේය. වෙලුම ඉවත් කර ඇතැයි දැනුණත් ඔහු ඇස් හැරියේ නැත.

"දැන් ඇස් අරින්න " මහ වෙද්නා කියනවා ඔහුට ඇසුණේය.

ඒත් ඔහු ඇස් හැරියේ නැත. ඔහුගේ සිතට මහත් බියක් දැනුණේය. එදා උදේ වෙලුම් පටි ගලවන බව දැන සිටි නිසා රෑ තිස්සේ ඔහුගේ සිත තුල ඇතිවූ හැඟීම් යලිත් ඔහුට සිහිවිය. මේ ප්‍රතිකර්මය අසාර්ථක වුවහොත් යන්න ඔහුගේ ප්‍රධානම හීතිය වුයේය. එසේ නම් ඔහුට ජිවිත කාලයම අන්ධයෙකු ලෙස ගත කරන්නට වෙයි. තවත් බලාපොරොත්තු තබා ගන්නට කිසිම හේතුවක් නැති වන්නේය. හැමදාමත් පාලිගේ පිහිටෙන් ජිවත් වන්නට සිදුවන්නේය.

පෙනීම ලදහොත් යන්න ප්‍රළගට ඔහුගේ සිතේ සසළ කළේය. ඔහුට ප්‍රථම වතාවට පාලි දැක ගන්නට ලැබෙන්නේය. ඈ ලස්සනද, ඇගේ සමේ පැහැය කලුද, සුදුද, තළඑළලුද, ඇගේ දැස් මොන පාටද? මෙවන් ප්‍රශ්න ගණනාවක් ඔහු සිත තුල සිරවී ඇත. පාලිගේ රුව සිතින් මවා ගන්නට මිත්‍ර මෙතෙක් කල් උත්සාහ නොකළේ සිතාගෙන සිටියාට වඩා ඇගේ රුව වෙනස් වුවොත් යැයි බිය නිසාය. ඇය රූමත් නැත්නම් ඔහුගේ සිතේ ඇය ගැන ඇති හැඟීම් වෙනස් වෙයිද? එසේ නොවෙතැයි ඔහුට හොඳටම ස්ථිර වුවත්, ඒ ගැන මඳවු හෝ සැකයකුත් සිතේ කොණක සැගවී තිබුණේය.

මිත්‍ර එක් වරම සිත එකලස් කර ගත්තේය. ඔහුට ඇස් පෙනීම ලැබී ඇත. මේ වෛද්‍ය වරුන් මේ තරම් වෙහෙසක් ගත්තේ ඒ සඳහාය.

පාලි ඔහු සිතා සිටියාටත් වඩා ලස්සනය. පැහැපත්ය, ඇගේ සිතත් ඇගේ ගතිගුණත් මෙන්ම, ඇයද රූමත්ය.

මිත්‍ර ඇසිපිය හැරියේය. වරක් දෙවරක් වසා යලිත් හැරියේය.

මුලු ලොවම යලිත් ඔහු ඉදිරියේ දිස්වුයේය. මුලින්ම ඔහු දුටුවේ ඔහු වෙත නැඹුරුවී සිටි කසාවන් රෙද්දක් හැඳ සිටි, කරුණාවන්ත තැනැත්තෙකි. ඔහු පිටුපසින් සුදු ඇඳුමක් හැඳි තරුණයෙක් සිටියේය. මදක් ඇස හැරවූ විට ඔහු දුටුවේ, මෙතෙක් දේශ දේශාන්තර වලදී කිසි දිනක නොදුටු තරම් රූමත් යුවතියකි. ඒ ඔහුගේ පාලි විය හැකිද? වෙනත් තරුණියක්ද? ඔහු මේ දකින්නේ සිහිනයක්ද?

ඔහු අසල සිටි තිදෙනාගේම මුහුණු සිනහවෙන් පිරී තිබිණ. ඔහුගේ දෙතොල්ද සිනහවකින් විවර විය.

"මට දැන් පේනවා" මිත්‍ර නොදැනුවත්වම කෑ ගැසුණේය.

පාලිගේ දීප්තිමත් දෑස කඳුලින් බර වෙනවා ඔහු දුටුවේය. ඇය මහ වෙද්නා ඉදිරියේ බිම වැටී ඔහුගේ දෙපා මත හිස තබාගෙන හඬන්නට වූවාය.

මිත්‍ර යලිත් දෑස පියා ගත්තේ නැවතත් ඔහුට නොපෙනී යාදැයි බියක් උපන් නිසාය. ඔහු අවට සියල්ල හොඳින් දැක බලා ගත යුතු වුවත්, එක් වර ඇස් වෙහෙස කළ යුතු නැතැයි ඔහු සිතුවේය.

නැවත ඇස් හරින විට තවමත් ඔවුහු ඇඳ අසල සිටියහ. පාලි ඇඳ පාමුල කණුව අල්ලාගෙන සිටියාය. මුහුණෙක් වැගිරෙන කඳුලු පිසදා ගැනීමට ඇය නොසිතුවාය. මහ වෙද්නාටත් ඔහුගේ සහායක වෙද්නාටත් වැඳ පිංදීමෙන් පසු ඇය මෙතෙක් කන්නලව් කළ සියලුම දෙවි දේවතාවන්ට නිහඬව ස්තූති කරන්නට වූවාය.

"ඇයි ඔයා අඩන්නෙ, හිනා වෙන්න ඕන වෙලාවෙ " මිත්‍ර ඇසුවේය.

"ඒ ළමයට අඩන්න ඉඩ දෙන්න දරුවා. ඒ අඬන්නෙ සතුටට. මෙච්චර කල් යටපත් කරගෙන තිබුන බය, ශොකය, කණගාටුව සේරම එකවර නැතිඋනාම ඒක දරා ගන්න ටිකක් අමාරුයි " මහ වෙද්නා පැවසීය.

පාලි මිත්‍ර අසලට ආවාය.

"ඔයා හරිම ලස්සනයි" මිත්‍ර පහත් හඬින් කීවේය.

ලජ්ජාවෙන් මුහුණ රතුවී ඇය ඇස් කොණින් මහ වෙද්නා දෙස බැලුවේ ඔහුට ඇසෙන්නට ඇතැයි සිතාය.

පසුව එන බව පවසා වෛද්‍යවරු දෙදෙනා පිටව ගියහ.

"ඔයා ඇත්තටම ලස්සනයි. මම දැනගෙන හිටිය ඔයා ලස්සන බව. ඒත් ඔයා ඒ හිතා සිටියටත් වඩා ලස්සනයි " මිත්‍ර ඇගේ අතින් අල්ලා ගත්තේය.

"බොරු කියන්න එපා, පව් සිද්ධ වෙනව"

"මම මොකටද බොරු කියන්නෙ? ඔයා මගේ ඇස් දෙක පාදල දුන්න"

"මම නෙමෙයි. මෙහේ වෙද හාමුදුරුවො "

"ඒ අයට මට බෙහෙත් කරන්න පුලුවන් උනේ ඔයා මාව මෙහාට ගෙනැත් මට සාත්තු කරල මං වෙනුවෙන් හැමදාම යාඥා කරපු නිසයි " ඔහු ඇගේ කම්මුල දිගේ රූරා වැටෙන කඳුලු පිට අත්ලෙන් පිස දැම්මේය.

"ඔයා දන්නෙ කොහොමද මම දෙවියන්ට කිව කියල"

"සමහර වෙලවට රෑට නින්දට ගියාමත්, උදේට ඇස්වලට බෙහෙත් ගල්වන කොටත් මට ඇහුණා ඔයා දෙවියන් යදිනව. මම ඔයාගෙ කටහඩ අඳුන ගත්ත. මගේ ළඟින් මේ කුටියෙ ඇතුලෙම ඉඳගෙන ඔයා හෙම්හිට යාඥා කළා. එතකොට මම දැනගත්තා මට සනීප වෙන බව "

මිත්‍රට ඔහුගේ ඇස් පාලිගේ මුහුණින් ඉවතට ගන්නට නොහැකි සේ ඒ වෙත බැඳුණේය. පාලි ඔහු දෙස නෙත් යොමු කළ හැම විටම ඔහු ඇය දෙස බලා ඉන්නා බව දැක ඇය බිම බලා ගත්තාය. තවත් කවදාවත් ඔහුට හොරෙන් ඔහුගේ මුහුණ බලා ඉන්නට බැරි බව ඇයට කල්පනා විය.

"අනේ එපා " ඇය අයැද සිටියාය.

"මොකක්ද "

"මොනවද ඔයාට ඔය හැටි මගේ දිහා බලන්න තියෙන්නෙ "

"මට මෙච්චර කල් දකින්න බැරි වුන පාඩුව අල්ල ගන්න එපැයි. අනික ඔයා කළ දේ තමයි මාත් කරන්නෙ "

"මම මොනවද කළේ? "

"ඔයා මගේ මූණ දිහා බලාගෙන හිටියෙ හැම තිස්සෙම. මට පෙන්නෙ නැහැ කියල හිතාගෙන "

"ඔයා ආයිත් බොරු කියනව, ඔයා දන්නෙ කොහොමද මම බලා හිටිය කියල "

"මම දැක්කනෙ ඔයා බලාගෙන ඉන්නව "

දෙදෙනාගේ සිනහව කුටිය පුරා පැතිර එතැණින් එළිමහනේ වූ ළහිරු රැසින් නැහැවුණු මල් ගොමු අතරට වැද මල් සුවඳත් සියොතුන්ගේ ගී හඬත් හා මුසුවී ආපසු කුටිය තුලටම ගලා ඇවිත් ඔවුන්ගේ මුහුණු මතම පතිත වීම නිසා ඇස් ප්‍රීතියෙන් දිලෙන්නට විය.

මහ වෙද්නා ආපසු එන හඩ ඇසී පාලි වහා මිත්‍රගෙන් ඈත් වූවාය. ඔහු ඇඬෙන් බැස්සේය.

"අද ඔබට රෝහලෙන් පිට වෙන්න පුලුවන් "

එබස් අදහා ගන්නට බැරිවාක් සේ දෙදෙනාම බලා සිටියහ.

"අද ගියාට ටික දවසක් යන කම් හැමදාම උදේට එන්න ඕන, ඇස් පරීක්‍ෂා කරන්න. එතෙක් නවාතැනේ ඉන්න පුලුවන්. අපට අවශ්‍ය වෙනව එළිමහනෙ සාමාන්‍ය පරිසරයෙ අස්වල වෙනසක් ඇතිවෙයිද කියල බලන්න "

මිත්‍ර පහත්වී වෙද්නාට වඳින්නට සැරසුණේය.

"ඔය ඉතින් දැනටම අමතක වෙලානෙ මම දුන් උපදෙස්" ඔහු මිත්‍රගේ දෙවුරෙන් අල්ලා ඔහු පහත් වීමෙන් වැලකිය. "මම ආයිත් කියන්නම්. ඔය ළමයත් අහගන්න ඕන. මෙච්චර කලක් බලා ගත්ත වගේ තව සති දෙකක් හොඳට බලා ගන්න ඕන. එක පාරට හිස ගැස්සෙන කිසිම දෙයක් කරන්න එපා, ඒකයි එක පාරට පහත් වෙන්න එපා කීවෙ, වඳින්න උනත්. දීප්තිමත් ආලෝකය දිහා බලන්න එපා. උතුරවා නිවා ගත් ජලයෙන් මිසක් මුහුණ සෝදන්න එපා "

පාලි නැවත වරක් මහ වෙද්නාට වැන්දාය. මිත්‍ර දෑත් එකතු කර වැඳ ඔහුගෙන් සමු ගත්තේය.

ඇය පසුගිය දිනවල බලා සිටියාක් මෙන් බලාගෙන සිටිනා පිරිසය, රෝහලෙන් එළියට ආ පාලිගේ නෙත ගැටුණේ. ඇය මිත්‍ර අසලින් ගමන් කරනා විට එහි සිටි අයගේ ඇස් ඔවුන් වෙත යොමුවී තිබිණ. සුවවී පිටව ගිය වෙනත් රෝගීන් ගේ ගමනේ තිබූ සැහැල්ලු සංතෝසය මිත්‍රගේ ගමන් විලාසයේද ඇය දුටුවාය.

බදකර අටන රෝහලෙන් ඔහු පිටවී ගිය අන්දම මිත්‍රට මතක් වුයේය. සති කිහිපයකට ඔහුගේ නිවහන වූ රෝහලෙන් පිටවී නාඳුනනා ලෝකයක, සිතාගත නොහැකි අනාගතයකට එදා පිවිසුනේ කෙතරම් අකමැත්තකින්දැයි ඔහුට වැටහුණේ දැන්ය.

අද ඔහු පිවිසෙන්නේ ඔහුට හොඳින් පෙනෙන, ඔහු දැන හඳුනාගෙන ඇති ලෝකයකටය. ඔහුගේ අනාගතය සැලසුම් කර ගන්නට ඔහුට හවුල් වෙන්නට සහකාරියක් ඔහු අසල සිටියාය. ඔහු පාලිගේ අත අල්ලා සෙමින් මිරිකුවේය.

"ඇයි?" පාලි ඔහු දෙස බලා සිනාවක් පෑවාය.

"මට ඔයා හිනාවෙනව බලන්න ඕන උනා "

"පිස්සු " ඇය හඩ නගා සිනාසුනාය.

"ඔයාගෙ හිනාව අහන්නත් ඕන උනා "

ඔවුන් ඉතා සෙමෙන් ඇවිද ගෙන ගියේ මිත්‍රට හිතේ හැටියට වටපිට බලන්නට අවශ්‍ය වූ නිසාය. ඔවුන් මෙහි පැමිණි මුල් දිනයේ වාඩිවී සිටි තැන, ඇතුලු වූ තැන, ආදිය හඳුනා ගත හැකි දැයි ඔහු බැලුවේය. ඔහුගේ සිත හඳුනාගෙන පාලි අවට පෙනෙන දේ විස්තර කරන්නට වුවාය.

සියඹලා ගහ යට ඇය වාඩිවී සිටි ආසනය පෙන්වා, ඇය එතැන සිට අනිත් අය යන එන සැටි බලාහුන් අන්දම ඇය පැවසුවාය. නවාතැනට යන්නට එතරම් හදිසියක් ඔවුන්ට නොවිය.

සතියා සිටියා නම් ඇයටත් මිත්‍ර මුණගැසෙන්නට තිබිණ. මිත්‍රට සුව ලද බව අසන්නට ලැබුණා නම් සතියාද සතුටුවන බව ඇය සහතිකවම දැන සිටියාය. දැන් සතියාට ඒ සුභාරංචිය දන්වන්නට ක්‍රමයක් නැත. ඊට ප්‍රථම ඇගේ දෙමාපියන්ටත්, බදකර රෝහලේ මහ වෙද්නාටත් මේ බව දන්වන්නට මාර්‍ගයක් සොයාගත යුතුය.

එදින සවස පාලි ඇගේ අලුත් මිතුරියට මිත්‍ර හඳුන්වා දුන්නාය. නැම්බියා එහි පැමිණියේ ඊට දින දෙකකට පෙර ඇගේ මවගේ ඇසක ශල්‍ය කර්‍මයක් සඳහාය.

"ඔයා හරිම වාසනාවන්තයි, ඔය දෙන්නම" නැම්බියා කිවාය.

"දැන් අම්මට කොහොමද "

"හෙට සැත්කම කරනවා. අද ඇහැට බෙහෙත් ගල්වා තියෙනව. මට නම් හරිම බයයි "

"බය වෙන්න එපා. මේ වෙද හාමුදුරුවරු හරිම දක්‍ෂයි. හරිම කරුනාවන්තයි. අම්මට ඉක්මනටම සුවය ලැබෙයි" පාලි ඇයට කිවාය. "අපි යමු මල් ටිකක් පූජ කරල අම්මට සෙත් පතන්න "

"අම්මට හුගක් රිදෙයිද?"

"මොනවටද කියල දන්නවද වෙද කම් කරන්නෙ" මිත්‍ර ඇසුවේය.

"අම්මගෙ එක ඇසකින් පේන්නෙ නැහැ. ඒකෙ පටලයක් බැඳිල කියලයි කිව්වෙ"

"ඒක බොහොම සුලු ප්‍රතිකර්‍මයක්. ටිකක්වත් රිදෙන එකක් නැහැ. දකුණු ඇසේ ශල්‍ය කර්‍මයක් නම් වම් අතේ තැනකට සියුම් කටුවක් තද කරනව. එතකොට ටික වෙලාවක් යනකම් ඇහේ කිසිම වේදනාවක් දැනෙන්නෙ නැහැ. හිස මත කුඩා වතුර භාජනයත් තියනව, වේදනාව තවත් අඩු කරන්න. මම අහල තියෙනව හරිම කෙටි වෙලාවක් ගන්නෙ මේ වෙද කමට. දවසට කිපයක්ම කරනව"

"මට ඒත් බයයි "

"ඔයා බය වෙන්නෙ මොනවටද?" මේ බලන්න මිත්‍ර දිහා. අපි මෙහේ එනකෙට එයා ආවෙ මගේ අතින් අල්ලගෙන ඇස් දෙකම පේන්නෙ නැතුව. මෙතන හාස්කම් සිද්ධ වෙන තැනක් " නැම්බියා කඳුලු පිස දමමින් සිනාසෙන්නට තැත් කළාය.

එදා රෑ කෑමට පසු පාලිත් මිත්‍රත් මිඳුලේ ගසක් යට බංකුවක් මත වාඩිවී කතා කරමින් සිටියහ.

" අද හඳ පායල හරිම ලස්සනයි. හඳ එළිය කොයි තරම් ලස්සනද කියල මට අමතක වේගෙනයි ආවෙ "

" හඳ දිහා බලල ලස්සන මූණක් දකින එක වාසනාවන්තයිලු "

"මම එහෙනම් ඔයාගෙ මූණ දිහා දෙපාරක් බැලුවම හරි "

"ඒව හරියන්නෙ නැහැ, හඳ දිහා බලන්න ඕන "

"අපි යමුද ටිකක් ඇවිදින්න " මිත්‍ර යොජනා කළේය.

"අපි අද මෙහෙම ඉමු. ඔයාට වැඩිය වෙහෙස වෙන්න හොඳ නැහැ "

"මෙතන අපි දෙන්න විතරක් නෙමෙයිනෙ ඉන්නෙ "

"ඒවට තව කල් තියෙනව" ඇය ඔහුගේ අත අල්ලාගෙන පහත් හඬින් කීවාය, "මං ඔයාට ආදරෙයි "

"ආයිත් කියන්න "

"බැහැ. එක පාරයි ඒව කියන්නෙ "

"මට හැම දාම හැම තිස්සෙම අහන්න ඕන "

"වෙන වැඩ නැතුවටද මට "

## හින් බෝව්ටියා

රාත්‍රියේ කිසියම් මොහොතක ඔහුට නින්ද යන්නට ඇත. ඔහු යළිත් අවදිවෙන විට අනිත් දෙදෙනා ගොරව ගොරවා නිදිය. ඔවුන් ඇතුලට ඇවිත් නිදාගන්නවා සුමනදාසට දැනුණේ නැත. ඔහු හඩ නොනැගෙන සේ දොර හැරගෙන පිටතට ආවේය. වැවට උඩින් ඈත අහසේ ලා රතු පැහැය නිසා එළිවෙන්නට ආසන්න බව ඔහුට වැටහුණේය. එය සනාථ කරන්නට මෙන් කුරුළු ගී නාදය සතර දෙසින්ම ඇසෙන්නට වීය.

ඔහු වැව අයිනේ ගල් තලාවක් මත වාඩිවී හිරු පායන දෙස බලා සිටියේය. වෙනදා නම් මෙවන් අසිරිමත් දසුනකින්  චමත්කාරයෙන් මත් වන ඔහුට අද ඒ ගැන කිසිදු හැගීමක් ඇති නොවීය. ඔහුගේ නෙත් ඉදිරියේ තවමත් දක්නට තිබුණේ දයාබර දියණිය ඇඳෙහි වැතිර එළිවෙන තුරු නින්දක් නොලැබූ දෑසින් ඇඳට ඉහලින් ඇති සුදු සිවිලිම දෙස යොමාගෙන සිටිමින් විඳින වේදනාවයි.

"නින්ද ගියාද හොඳට?" ඒ හඬින් තිගැස්සී බැලූ ඔහු දුටුවේ මුහුණ සෝදා ගන්නට වැවට පැමිණි සුමන හිමියන්ය.

"ඔවු, මෙහෙ හරිම නිස්කලංකයි " කියමින් ඔහු නැගිට සිටියේය.

"මං කිව්ව තේ ටිකක් හදන්න කියල ඔයාලට " කියාගෙන සුමන හිමි වතුරට පැන්නේය.

සුමනදාස ආපසු ලෙන වෙත ගියේය. මිතුරන් දෙදෙනා තවමත් නිදිය. ඔහු ගහක් යටවූ බංක!වක් මත වාඩි විය.

ගැමියෙක් බයිසිකලයක් පැදගෙන පංසල අසලට පැමිණ, දුර තියාම බයිසිකලයෙන් බැස එයත් තල්ලු කරගෙන මිදුලට ආවේය. බයිසිකලයේ එක් අතක නිල්පාට ප්ලාස්ටික් පනිට්ටුවක් එල්ලා තිබුණේය. පිටුපසින් කාඩ්බෝඩ් පෙට්ටියක් බැඳ තිබිණ. ගැමියා එවාත් රැගෙන අසලවූ මුලුතැන් ගෙය තුලට ගියේය.

ඔහු කුඩාකල ප්ලාස්ටික් පනිට්ටු තිබුණේ නැත. පන්සලට හීල ගෙන ආවේ පන්සලෙන්ම ලබා ගන්නා එනැමල් භාජන වලටය. නැතිනම් මැටි භාජන වලය. ගැමියා සුදු රෙදි කඩකින් වැසූ බන්දේසියක් දෑතින් ඔසවාගෙන බුදු මැඳුර වෙත පිය නගනවා සුමනදාස බලා සිටියේය.

තවත් වයසක ගැමියෙක් පැමිණ ආවාසගෙය අසල ගසක් අයිනට වී නැවතුණේය. ඔහු ඇඳ සිටියේ සුදු සරමක් පමණක් විය. එක් උරයක් මත සුදු තුවායක් දමාගෙන සිටියේය. සුදුවී කොණ්ඩය පිටුපසින් ගැටයක් ගසා තිබූ අතර මුහුණේ වූයේ හොඳින් රැවුල බෑම නිසා ඇති සෞම්‍ය පෙණුමකි. ඔහුගේ වයස කොපමණ විය හැකිදැයි සිතන්නට සුමනදාස උත්සාහ කළේය. එහෙත් මේ වියලි

කටුක පරිසරයේ ජිවිතය ගැන එතරම් අවබෝධයක් නොතිබූ නිසා ඔහුට අනුමාන කළ හැකිවූයේ වයස අවුරුදු සැත්තෑවක් පමණ විය හැකියැයි කියාය.

මගේ දුවට තවම විසිඑකයි. ඔහුගේ මනස ඒ සැනෙකින් සුනිතා වෙත දිව ගියේය. ඔහු තුළ යළිත් මහත් ක්‍රෝධයක් ඇතිවිය. ඇයට බෙහෙත් නියම කළ වෛද්‍ය වරයා කෙරෙහි පමණක් නොව ඉතා සංවේදි දැරියකගේ මුහුණේ වූ කුරුලෑ ගැන ඇයට වද දෙන තිරිසන් සමාජය කෙරෙහිද ඒ ක්‍රෝධය එල්ල විය. සුනිතාගේ මුහුණේ කුරුලෑ තිබීම ගැන ඇගේ යෙහෙලියන්ටත් ඔවුන්ගේ නෑදෑ හිතවතුන්ටත් ඇති කැක්කුම කුමක්දැයි සුමනදාසට සිතාගත නොහැක. ඉඳහිට හමුවිවිට යමක් ඇසිය යුතු නිසා අසන්නට, ඔවුන්ට මේ හැරෙන්නට වෙනත් මාතෘකාවක් නොවිද?" ඔය කුරුලෑ වලට මොනවත් කරන්නේ නැද්ද?" කියා අසන ප්‍රශ්නය තරම් මෝඩ ප්‍රශ්නයක් කෙනෙකුට සිතාගත හැකිද? එසේ නැතිනම් මෙවන් ගැහැණුන් හෝ මිනිසුන් මේ ප්‍රශ්න අසන්නේ තමන්ට ඒ රෝගය නැති නිසාවෙන් ඇතිවූ ආත්ම තෘප්තිය නිසාද?

සුමනදාස ඔහුගේ දියණිය ගැන හොඳින් දැන සිටියේය. මුහුණේ කුරුලෑ ඇයට එතරම් ප්‍රශ්නයක් නොවූ බව ඔහු දැන සිටියේය. එහෙත් සුනිතාට ඉවසිය නොහැකි මානසික වේදනාවක් වූයේ කෙළවරක් නැතිව මෝඩ මිනිසුන් විසින් අසන්නාවූ අමන ප්‍රශ්නය.

"මහත්තය තේ බිව්වද?"

"තාම නැහැ හාමුදුරුවනෙ, අනිත් අය තාම නැගිට්ටෙත් නැහැ "

වයසක ගැමියා ඉදිරියට විත් පහත්වී හාමුදුරුවන්ට වැන්දේය.

"හුගක් වෙලාද ඇවිල්ල?" සුමන හිමි ඔහුගෙන් ඇසුවෙය.

"නැහැ මේ දැන් වගේ ආවෙ "

"සුමනදාස මහත්තයො මේ තමයි අපේ සියාතු වෙද මහත්තය "

සුමනදාස ඒ අසලට පැමිණි විට වෙද මහතා ඔහුට දෙඅත් එකතු කර ආචාර කළේය.

"සුමනදාස මහත්තය ඇවිත් ඉන්නෙ කොළඹ ඉඳල. මේ වෙද මහත්තය අපේ ගමට ඉන්න වැදගත්ම කෙනෙක් තමයි, පරම්පරා ගණනාවක ඉඳළ පැවත එන වෙද පරපුරක් "

"එහෙනම් මේ පලාතෙ මුල් පදිංචි කාරයො වෙන්නැති " එතැනට ආ පාලිත හිමි ඇසුවේය.

"නෑ හාමුදුරුවනේ, අපේ ගම තිබුණෙ වැවෙන් එහා පැත්තෙ. මීට අවුරුදු තිහකට විතර ඉස්සර තමයි ආංඩුවෙ මහත්තුරු අපව මෙහේ පදිංචි කළේ " ඔහු පාලිත හිමිට වැන්දේය.

"වෙදකම හුගක් කල් ඉඳල පවතිනව ඇති එහෙනම් "

"මං අහල තියෙනව සුද්දෝ එන්නත් කලියෙන් ඉඳල අපේ පරම්පරාව වෙදකම් කළා කියල "

"එහෙනං හුගක් පරණ වෙද පොත් එහෙම ඇති " පාලිත හිමි කීවේය.

"එක පොතක් ලියල තියන්නෙ දුටුගැමුණු රජ්ජුරුවන්ට වෙදකම් කරපු වෛද්‍යවරයෙක් කියල තමයි අපේ අප්පච්චිල කිව්වෙ "

"අපට බලන්න බැරිද ඒව?" එතැනට පැමිණි කෝලිත ඇසුවේය.

"අපොයි මහත්තය. ඒව බොහොම විටිනව අපට. මගේ පනටත් වඩා වටිනව. ඒවා එළියට වත් ගන්නෙ නැහැ මම දැන්. අහල පහල ගම් වල තිබුණ ඒ වගේ පොත් වලට සිද්ද වෙච්ච දෙවල් මම දන්න නිසා "

"ඇයි මොනවද වෙද මහත්තයො ඒවට උනේ "

"මොනවද ඉතින් කොළඹින් මහත්තුරු ඇවිල්ල ඉල්ලගෙන යනව එක එක කතා කියල. ඒව පින්තූර ගන්න කියයි, පරීක්ෂණ වලට කියයි, එහෙම ගෙනියපු එක පොතක් වත් ආපහු ලැබිල නැහැ "

"ඒව කොළඹදි විකුණනව, රුපියල් ලක්ෂ ගණන් වලට, පිටරට විශ්ව විද්‍යාල වලට" පාලිත හිමි කීවේය.

"ඊට වැඩිය අපරාදෙ, ඒ පොත් ඉරු වෙන් කරල, එක එක පත් ඉරුව විකුණනව, මෝඩ සුද්දන්ට " සුමන හිමි එකතු කළේය.

"මට තේරුම් ගන්න බැරි ඇයි අපේ ගම් වල මිනිස්සු දැන් දේශීය වෙදකම අත් ඇරල බටහිර බෙහෙත් ගන්නෙ කියල. ගමේදිම බෙහෙත් කර ගන්න පුලුවන්කම තියෙද්දි, හැතැක්ම ගණන් පයින් ගිහිල්ල, වරු ගණන් පෝලිම්වල ඉඳල, පාට වතුර බෝතලේකුයි පෙති ටිකකුයි අරගෙන එනව "

"ඒ අපේ වෙදකම එපා වෙලා නෙවෙයි, බටහිර බෙහෙත් පාවිච්චි කරන්න ලේසි නිසා"

"දැන් ඉස්සර වගේ බෙහෙත් කරන්නත් බැහැ, බෙහෙත් බඩු හොයාගන්න බැරි නිසා. අද සර්පයෙක් ගහල ලෙඩෙක් මා ගාවට ගෙනාවත් උවමනා කරන බෙහෙත් පැලෑටි හොයාගන්න හරිම අමාරුයි "

"ඇයි ඒ "

"දැන් හැම තැනම කැලේ සුද්ද කරල. බෙහෙත් පැල වර්ගත් ඒ එක්කම විනාස වෙලා. අනිත් එක අද අපේ ගමේ ගෙවල් වල මී තෙල් ටිකක්වත් සොයාගන්න තියෙනවද. දැන් ගෙවල් වල ලයිට් ඇවිල්ල. නැත්නම් ලේසියට ලාම්පු තෙල් පාවිච්චි කරනව. අනිත් එක අද ගමේ කවුද මහන්සි වෙන්න කැමති මී තෙල් ටිකක් හිඳින්න. ඒ වගේම තමයි පිරිසිදු මී පැණි ටිකක හොයාගන්න කියෙන අමාරුව " වෙද මහතා පැවසුවේය. " මට මතකයි මම පුංචි කාලෙ ගමේ හදිසි ලෙඩෙක් උනාම මමත් යනව තාත්ත එක්ක. මුලු ගමම ලෙඩාගෙ ගෙදරට එකතු වෙලා. තාත්ත බෙහෙත් වලට ඕන කරන දේවල් කියන සුනංගුව විතරයි, එක්කෙනෙක් ගෙදර දුවයි මී පැණි ගේන්න. තව එකකෙනෙක් තෙල් ගේන්න. ටිකක වයසක දෙතුන් දෙනෙක් කැලෑවට දුවයි බෙහෙත් පැලෑටි හොයන්න. ගෑණු උදවිය ඉන්නව, කොටන්න, උණු කරන්න, අඹරන්න ඕන දේකට "

"අද එහෙම එන්නෙ නැද්ද?"

"අද කොහේ එන්නද? කාටද විවේකයක් තියෙන්නෙ? ළමයි ඉස්කොලෙ ගිහිල්ල ඊට පස්සෙ රස්සාවල් වල ගිහිල්ල. අද බෙහෙතක් හොයා ගන්න හරි හදා ගන්න හරි ඕන නම් සල්ලි දෙන්න ඕන. ඒත් මට විශ්වාස නැහැ මී පැණි වගේ දෙයක් පිරිසිදුවට ලැබේද කියල "

"ඉස්සර හැම ගෙදරකම පිරිසිදු තල තෙල් වරදින්නෙ නැහැ. අද අපේ හේන්වල තල වවන්නෙවත් නැහැ "

"ඒ කාලෙ අපි හරියට කන දෙයක් තමයි තල " පාලිත හිමි කීවේය.

"අපි නං කන්නෙ තල ගුලි විතරයි " කොලිත කීවේය..

"අපේ අප්පච්චි කියනව තල තෙල් තමයි ඉන්දියාවෙ මුලින්ම හදාපු තෙල් වර්ගය කියල. එක මිනිස්සු අමරණීය කරනව කියල විශ්වාසයක් තිබුණ. තව විශ්වාසයක් තිබුණ, තල තෙල් හඳුන්වල දුන්නෙ යම රජ්ජුරුවො කියල " සියාතු වෙද මහතා පැවසීය.

මෙතෙක් කතාවට බාධා නොකර සිටි සුමන හිමි, වෙද මහතාට සුනීතාගේ අසනීපය ගැන සඳහන් කළේය. සුමනදාස යලිත් වරක් රෝගය සෑදුනු අයුරුත් දැනට කෙරෙන ප්‍රතිකාර ගැනත් විස්තර කළේය. ඔහුගේ කටහඬෙහි සියලු බලාපොරොත්තු සුන්වූ පරාජිත බවක් දැනුණ කෝලිතට, තමන් මෙහි විනෝද වීම වරදක් යැයි කණගාටුවක් ඇතිවිය.

මහලු වෛද්‍යවරයා සුනීතා ගැන බොහෝ විසතර ඇසුවේය. ඇගේ කුරුලෑ ගැන, කරන ලද බෙහෙත් ගැන, දෙමාපියන් ගැන එදිනෙදා දිවි පෙවත ගැන අසද්දී සුමනදාසගේ සිත තුල යලිත් බලාපොරොත්තුවක සේයාවක් මතු වන්නට විය.

"බය වෙන්න කිසි දෙයක් නැහැ මහත්තය. ඔපරේෂන් කරන්න ඕන වෙන්නෙ නැහැ. බොහොම සුලු ප්‍රතිකාරයක් තියෙනව " සියාතු වෙද මහතා කීවේය.

සුමනදාස ප්‍රතිකාරය දැන ගන්නට බලා සිටියේය. භික්ෂූන් දෙදෙනාගේ මුහුනේ වූයේ වෙද මහතා කෙරෙහු ඔවුන් තුල වූ විශ්වාසයයි.

"දවස් හතක් හැමදාම උදේට හීන් බෝවිටියා කැඳ ටිකක් දෙන්න. ඒ ඇති " වෙද මහතා කීවේය.

"එච්චරයි ද බෙහෙත?" කොලිත ඇසුවේය. සුමනදාස ඔහු දෙස බැලුවේ නොසතුටු මුහුණකිනි.

"හීන් බෝවිටිය පැල හොයාගන්න ඕන මහත්තයම. ඒක වෙන කාටවත් පවරන්න එපා. හොඳ නිරෝගී පැල වෙන්න ඕන. අනිත් එක විහාර භූමියක, සොහෙන් බිමක, මළ පහ කරන තැනක, සතරමං හංදියක වැවෙන බෙහෙත් පැලැටියක් ගන්න එපා. කැළයක, කඳු අතරෙ, කුඹුරක, උයනක වැවෙන ඒවාම තොරා ගන්න බලන්න. කැඳ ටික අම්මගෙ අතින්ම හැදෙන්න ඕන. කැඳ හදන කොටත්, ලෙඩාට දෙන කොටත්, හිතේ කරුණාව මෛත්‍රිය මෙනෙහි කර ගන්න. කිසිම කෙනෙක් ගැන වෛරයක්, අහිතක් හිතන්න එපා මේ වෙලාවට. දූවට ඒක බොන්න දෙන කොට තුනුරුවන් සිහිකර ගෙන, මේ බෙහෙතෙන් ලෙඩේ සුවවෙයි කියන විශ්වාසෙන් බොන්න දෙන්න "

"හොඳමයි වෙද මහත්තය" සුමනදාස පහත්වී වෙද මහතාට ආචාර කළේය. "මට මතකයි පුංචි කාලෙ අපේ අම්ම කොත්තමල්ලි ටිකක් බොන්න දුන්නත් කියනව, මේකෙන් ම පුතාට සනීප වෙයි කියල "

"අපේ තිබුණ වටිනා සිරිත් හුගක් දැන් නැතිවෙලා " සුමන හිමි කීවෙය.

"මේ බෙහෙත් වලින් පස්සෙ දූව එක්කගෙන එන්න ඕනද වෙද මහත්තයො "

"මහත්තයට ඕන නම් එක්කගෙන එන්න. හැබැයි බෙහෙත් ගන්න නෙවෙයි. මේ පංසලට ඇවිත්, වැවෙන් නාලා, වල් අලි එහෙම බලල යන්න " සියාතු වෙද මහතා මද සිනහවකින් කීවේය. "හත් දවස යනකොට දූවගෙ අක්මාව කලින් තිබුණටත් වඩා නිරෝගී වෙයි. තුනුරුවන් සරණින් වෙන බෙහෙත් ඕන වෙන එකක් නැහැ "

සුමනදාසට මෙය අදහා ගන්නට බැරිවාක් සේ බලා සිටියේය.

"මහත්තයට කැමති නම් බාරයක් වෙන්න, මහ මලුවට ඇවිත් බොධි පූජාවක් කරනව කියල " බෙහෙත ගැන ඔහුගේ සිත තුල සැකයක් ඇතිදැයි සිතා සුමන හිමි කීවේය.

එහෙත් සුමනදාසට ඒ ගැන කිසිත් සැකයක් තිබුණේ නැත. ඔහු සිතින් මවා ගෙන සිටියේ මේ සියාත! වැනි වෙද මහතෙකි. දැන් ඔහුට අවශ්‍ය වූයේ හැකි

ඉක්මනින් කොළඹ යන්නටත් ඔහුගේ දූවටත් බිරිඳටත් මේ සුභ ආරංචිය කියන්නටත් ය. ඒ එක්කම ඔහුට සිහිවුයේ මේ ගමෙන්ම ඔහුට හින් බෝවිටියා පැල සොයාගෙන යන්නට ඇත්නම් පසුදා උදේම කැඳ සාදාදෙන්නට හැකිවෙන බවත්, නිවැරදි අයුරින් ඒවා එකතු කර ගත හැකි බවත්ය. සියාතු පැල සොයාදෙන්නට කැමති විය. සුමනදාස වෙද මහතා සමග පන්සලෙන් එලියට බැස්සේය. අනිත් අය ගල් පාලම බලන්නට යාමට සැරසුණාහ.

"මම පස්සෙ දවසක එනව, සුනීතයි, කුමාරියි එක්ක, ගල් පාලම බලන්න " සුමනදාස ඔහුගේ යහලුවන් සමග ඈත යන සුමන හිමිට කෑ ගසා කීවේය.

"ඇති යන්තම් උගෙ කටට ටිකක් පණ ඇවිල්ල වගෙයි" රාජු අනිත් අයට කීවේ සමනදාසට නොඇසෙන්නටය.

එකතු කර ගත් පැල, ගසකින් කඩාගත් කොල කිහිපයක දවටා, වැල් කැබැල්ලකින් ගැට ගසන ලදි. පොලිතින් බෑග් වල බෙහෙත් පැල නොදමන ලෙස ඔහුට අවවාද කෙරිණ.

සවස් වෙනවිට ඔවුහු කොළඹට ළගාවුහ. සුමනදාසගේ විස්තරය අසා කුමාරි මහත් සතුටට පත් වූවාය.

"අපි බෙලන්ඩර් එක පාවිච්චි කරන්න හොඳ නැහැ, කැඳ ටික හදන්න " සුමනදාස කීවේය.

"කොහොමද එතකොට ඒක කොටාගන්නෙ "

"පොඩි ගල් වංගෙඩියක් හොයාගන්න ඕන "

"අපි කොහෙන්ද වංගෙඩි හොයන්නෙ "

"අපි එද්දි මග තිබුණ ලි වංගෙඩි. කල්පනා උනානං එයින් එකක් ගේන්න තිබුන"

"මේ ළග පහත කා ළගද වංගෙඩියක් ඇත්තෙ "

"සුජාත ලගෙ ගෙදර?"

"එයා ජිවිතේට වංගෙඩියක් දැකලවත් නැතුව ඇති " සුමනදාස කීවේය.

"චිත්‍රා ළග නම් ඇති " කුමාරිට මතක් විය. ඇය දුර කථනය වෙත දිව්වාය. ඇය චිත්‍රාට කතා කරන අතර සුමනදාස කල්පනා කළේ දුර කථන මේ කරම් බහුල නොවූ කාලයේ මෙවැන්නක් සොයාගන්නට වූවානම් කොළඹ පුරාම ඇවිදින්නට වෙන වා නේදැයි කියාය.

"ගල් වංගෙඩියයි මොල් ගහකුයි තියෙනව, රාජු හවසට ගෙනැත් දෙයි "

"පොල් කිරි දාන්න හොඳ නැතුව ඇති නේද " කුමාරි පැල කොටසක් කෙසෙල් කොළයක ඔතා තබා ඉතිරි කොටස සකස් කරමින් ඇසුවාය.

"මටත් ඒක අහගන්න බැරි උනානෙ, අපි කොයි එකටත් පොල් කිරි නොදා හදමු"

චිත්‍රාත් රාජුත් වංගෙඩියත් මොල් ගසත් රැගෙන එන විට දෙදෙනාම රෝහලට යන්නට සැරසී සිටියහ. සුනීතාට මේ ගැන කියන තුරු ඔවුන්ට ඉවසිල්ලක් තිබුණේ නැත. වඩාත්ම සතුටින් සිටියේ භානුය.

"ඔන්න තාත්ති නියම වෙද මහත්තයෙක් සොයාගෙන. දැන් දූවට ඉක්මනටම සනීප වෙයි " කුමාරි කාමරයට ඇතුලුවෙමින් කීවාය.

"ඇත්ත ද තාත්ති "

"එයා නම් අපේ නියම දේශීය අයුර්වේද වෙද මහත්තයෙක්. දැන් දූවට බයවෙන්න දෙයක් නැහැ. ටිකක් හිනාවෙලා ඉන්න" සුමනදාස ඇගේ හිස අතගාමින් කීවේය.

"මම හැම තිස්සෙම හිනාවෙලා තමයි ඉන්නෙ. තාත්තිනෙ බුම්මගෙන ඉන්නෙ" ඇය කීවාය. සුනිතා ඇගේ පෙර පුරුදු සැහැල්ලු ලෝකයට ආපසු පිවිසෙන ලෙසක් ඔහු දුටුවේය.

"හෙටම මාව එක්ක යනව නේද වෙද මහත්තය ගාවට " ඇය ඇසුවාය.

"යන්න ඕන නැහැ "

"එතකොට මං බෙහෙත් ගන්නෙ කොහොමද?" ඇය අම්මා දෙස බැලුවාය.

"හරිම සුලු බෙහෙතක් වෙද මහත්තය කියල දීල තියෙනව. හෙට උදෙන්ම පටන් ගන්න පුලුවනි "

"මෙහේ ඉඳගෙන, හොස්පිටල් එකේම?"

"මෙහේ කාටවත් කියන්න ඕන නැහැනෙ "

"එතකොට අපට බලා ගන්න පුලුවන් නෙ ප්‍රතිඵලත් ලේසියෙන්ම " සුමනදාස කීවේය.

"සුනීතට සනීප උනාම වෙද මහත්තය බලන්න යනකොට මාත් එන්නද?" භානු ඇසුවාය.

"දූව යන්නෙ නැතුව කොහොමද? දූව විතරයිනෙ මගේ පැත්තට හිටියේ වෙද මහත්තයෙක් හොයන්න " සුමනදාස ඇගේ දෙවුරට අත තබා කීවේය.

දැනටම ලෙඩ හොඳ වෙලා වගේ කතා කිරීම ගැන කුමාරිගේ සිතේ චකිතයක් ඇතිවිය. කට ඉස්සර කරන්න හොඳ නැහැ නේදැයි ඇය සිතුවාය. ඇය හෙමිහිට මේස ලෑල්ල ඇල්ලුවාය. ඒ අදහස ඉවත් කර ලන්නට මෙන් ඇය වේගයෙන් හිස සැලුවාය.

සුමනදාස ඔරලෝසුව නාද වන්නට තියා තිබුණේ උදේ හතරහමාරටය. එහෙත් එදා උදේ ඔහු අවදිවී බලන විට කුමාරි ඇඳේ සිටියේ නැත. ඔහු මුලුතැන් ගෙයට යන විට කුමාරි කොල ටික සෝදමින් සිටියාය. සුමනදාස වහා වංගෙඩිය සෝදා පිළියෙළ කළේය. කුමාරි නුහුරු දෑතින් කොටනවා ඔහු බලා සිටියේය. මෝල් ගහ වංගෙඩිය තුළ වැදෙනවාට වඩා ගැට්ටේ වැදෙන වාර වැඩි විය. ඇය කොටාගත් කොළ අලුත් වළඳකට මිරිකුවාය.

"කොහෙන්ද ඇලුත් වළඳක් "

"ගෙදර තිබුණා. අද පරණ එකකට හදන එක හරි නැහැ කියල මට හිතුන"

ඇය වළඳ පිළියෙළ කර ගිනිපෙට්ටිය අතට ගන්නා විටය ඔහු දුටුවේ ගල් තුනක් තබා සාදාගෙන තිබුණ ලිප. ඇස්බෙස්ටොස් තහඩු කැබැල්ලත් මත එය සාදා තිබුණේය.

"කොහෙන්ද මේ දර හොයා ගත්තෙ?" ලිප් ගල් තුනත්, තහඩු කෑල්ලත්, අලුත් අවුරුද්දට කිරිබත් උයන්නට ගන්නා ඒවාය.

ඇය වළඳ ලිප මත තබා දෑත් එකතු කර වැන්දාය. ලිප අසලින් වාඩිවී ඇය ඒ දෙසම බලා සිටියේ ලෝකයේ අන් සියලු දේ අමතක කරමින්ය.

සුමනදාස විසින් සෝදා තිබූ උණු වතුර බෝතලයට ඇය කැඳ වත්කර ලිප නිවා දමන තෙක් ඔහු ඇය අසලින් නිහඬව වාඩිවී සිටියේය.

ත්‍රිරෝද රථයකින් ඔවුහු රෝහල වෙත ගියේ කැඳ ටික බොන තුරු සුනිතා බඩගින්නේ සිටි නිසාය. ඔවුන් දෙදෙනාද උදේට තේ කෝප්පයක් වත් නොබිව්වේ සුනිතා බොන තෙක් සිටිය යුතුයැයි සිතාය.

උදේ කැඳ පිළියෙළ කළයුතු නිසා කුමාරිට ගෙදර යන්නට වීම නිසා එදා රෑ සුනිතා ළඟ තනිවට සිටියේ භානුය. කාමරයේ දොර හරින විට සුනිතා මුහුණ පුරා පැතිර ගිය සිනහවකින් ඔවුන් පිළිගත්තාය.

භානු විසින් අතට දෙන ලද කෝප්පයට කැඳ වත් කර කුමාරි එය සුනිතා අතට දුන්නාය. ඇයත් සුමනදාසත් සුනීතාගේ අතින් අල්ලාගෙන කැඳ පොවන අතර සුමනදාස ඇගේ හිසට අනිත් අත තබා ගෙන සිටියේය.

"තුනුරුවන්ගෙ පිහිටෙන් මේකෙන්ම දූවගෙ සේරම ලෙඩ හොඳ වෙන්න ඕන " දෙදෙනාම එකවර ප?ාර්ථනා කළහ. සුනිතා එක හුස්මට කැඳ ටික බීවාය.

"හරි රසයි අම්මි. තව තියෙනවද " ඇය ඇසුවාය. කුමාරි ඉතිරි කැඳ ටිකත් වත් කර දුන්නාය.

"වතුර ටිකක් බොන්න ඕනද?" කුමාරි ඇසුවාය.

"එපා. හකුරු කෑල්ලක් තිබුණ නම් හොඳයි "

"මං හවසට අරගෙන තියන්නම් " සුමනදාස කීවේය.

"ඔය කඩේ තියෙන ඒව ගන්න එපා. මම හොඳ කිතුල් හකුරු ටිකක් හොයාගන්න බලන්නම් " කුමාරි ඔහුට කීවාය.

"මං අද ඉඳල මෙහෙන් දෙන බෙහෙත් බොන්නෙ නැහැ " සුනීතා පැවසුවාය.

"එහෙම කළබල වෙලා කොහොමද දූව. අපි හොස්පිටල් එකේ අයට දැන ගන්න තියන්න හොඳ නැහැනෙ දැන්ම "

"ඒක හොඳයි. හෙට එස්. ජී. ඕ. ටී. රිපොට් එක දකින කොට මට බලන්න ඕන ඩොක්ටර් ගෙ මූණ " සුනීතා සිනා සෙමින් කීවාය.

"දූව කට පරිස්සම් කර ගන්න ඕන. එහෙම දේවල් කියන්න හොඳ නැහැ " කුමාරි ඇයගේ හිස අතගෑවාය.

"මං දැන් මේක ගලවල දාන්නද?" අතේ වූ කැනියුලාව ගලවන්නට ඇය සැරසුණාය.

"දූට පිස්සුද, මොනවද මේ කරන්න හදන්නෙ?" කුමාරි උස් හඬින් කියුවාය.

"මං විහිලුවට නෙ කිව්වෙ, අම්මට තරහ යාවිද බලන්න. මං ලෙඩ වෙච්ච දවසෙ ඉඳල අම්මි මට බැන්නෙ නැහැ නෙ. දැන් ඒ කියන්නෙ ඇත්තටම මට සනීප වෙනව" ඇය ඇගේ සුපුරුදු සිනහව පෑවාය. දින ගණනාවකට පසු ඇගේ සිනා හඬ ඇසුණු සුමනදාසගේ විඩාපත් මුහුණටද සිනහවක සේයාවක් මතුවීය.

සුනීතා දින කිහිපයකට පසු සම්පූර්ණයෙන් සුවය ලබා ගෙදර ගියාය.

"තව සුභ ආරංචියක් තියෙනව " භානු පසුදා උදේ කාමරයෙන් එළියට ආවාය.

"මොකක්ද?" චිත්‍රා ඇසුවාය.

"කෝ ඩැඩී?"

"බාත් රූම් එකේ "

"ඩැඩීත් ආවම කියන්නම් "

"මොකද මේ උදේ පාන්දර කෑ ගහන්නෙ. මට බාත්රූම් එකටත් ඇහුන "

"හොඳ ආරංචියක් තියෙනව "

"ඉතිං "

"තාත්තලගෙ මහ ලොකු කොම්පැණිය තීරණය කරල හැම රටකින්ම ස්මුත් ඉවත් කර ගන්න. ඒ ගොල්ලන්ගෙ වචන වලින් ම කියනවනං වැඩිදුර පරීක්ෂණ සඳහා"

"ඒක වෙන්න බැහැ. ඩොක්ටර් සිල්ව ඊයෙ මාත් එක්ක කිව්වෙ සුනීතගෙ අසනීපෙ ස්මුත් නිසා වෙන්න බැහැ කියල. ලැබ් එකේ මොකක් හරි සුලු වැරදීමක් වෙන්න ඇති. ලිවර් එකට ඒ තරම් හානියක් වෙලා නැහැ. මේ නිකම් සෙංගමාලය විතරයි හැදිල තියෙන්නෙ, ඒකයි ඔය කැඳ වලට ලෙඩේ සනීප උනේ කියල. ඊටත් ඩොක්ටර් කියන්නෙ එයාගෙ බෙහෙතුත් දවස් ගණනක් ඇගට වැටුණානෙ "

"දොස්තරල වෙන මොනව කියන්නද, මේ හද්දා පිටිසර ගමක, නූගත් ගොවියෙක්, කැඳ වේල් කීපෙකින් හොඳ කළාම, ඒ ගොල්ලන්ට මෙහේ බැහැ කියල ඇමරිකාවෙ යවන්න සිටි ලෙඩෙක්ව "

ස්මුත් වෙනුවට දැනට වෙළඳ පොලේ ඇති බෙහෙත් වර්ග කිහිපයක්, නව මුහුණුවරකින්, එහෙත් දැනට වඩා වැඩි මිලකට ඉදිරිපත් කරන්නට ඔවුන්ගේ සමාගම තීරණය කර ඇති බව, භානුට නොකියන්නට රාජු තීරණය කළේ ඇය ජය ලැබුවා යැයි සිතන්නට ඉඩ දීමටය, ස්මුත් සඳහා ගිය වියදම් සියල්ල මේ මගින් යලි උපයා ගන්නට හැකිවෙනවා ඇත. දොස්තර වරුන්ටත් මේවා අත්දුටු සුපුරුදු බෙහෙත් නිසා ලෙඩුන්ට හානියක් නොවන බව සිතාගෙන නියම කළ හැක. සියල්ල යහපත් අයුරුන් විසඳී ඇත.

## නව දිවිය

පසුදා උදේ ඔවුහු රෝහල වෙත ගියහ. මිත්‍රගේ ඇස් පරීක්‍ෂා කළ මහ වෛද්‍ය ඔහුගේ සහායකයාට මිත්‍ර බාර දුන්නේය.

"හෙට ඉඳල මේ උන්නාන්සෙ පරීක්‍ෂා කළාම ඇති. දැන් බය වෙන්න දෙයක් නැහැ. මොනව හරි අමුත්තක් දැනුණොත් මට කියන්න. තාමත් මම කිව්ව විදිහට පරිස්සම් වෙන්න ඕන "

අව් රශ්මිය වැඩි වන්නට පෙර ආපසු නවාතැනට ගිය ඔවුන් ශාලාව ඇතුලේ පැදුරක් එළාගෙන වාඩිවුහ. මිත්‍රට එක තැනකට වී සිටීම මහත් අසහනකාරී විය. අවට ඇති දෑ බලන්නට, ඇවිදින්නට, ඔහුට ඕනෑ විය. ඔවුන් දෙදෙනාට මදක් ඈතින් කුඩා ළමුන් කිහිප දෙනෙක් සෙල්ලම් කරමින් සිටියෝය. දෙමාපියන්ගෙන් කෙනෙකු රෝහලේ නැවතී ප්‍රතිකාර ගන්නා අතර දරුවන් බලා ගන්නට නිවසේ කිසිවෙකු නැති විට මව හෝ පියා සමග නවාතැනට පැමිණෙන්නට සමහර කුඩා දරුවන්ට සිදුවේ. මෙහි එවැනි කිහිප දෙනෙක්ම වූහ.

පාලි මිත්‍ර සමග ඔවුන්ගේ අනාගත ජීවිත සැලැස්ම ගැන කතා කළාය. ඔවුන් විවාහ වී මාස කිහිපයක් ගතවී තිබුණත් ඇත්තටම ඔවුන්ගේ විවාහ ජීවිතය ඇරඹෙන්නේ දැන් යැයි ඇයට සිතුණේය. මෙතෙක් කල් ඇගේ සිත තුල වූදේ නොකීවේ ඉන් මිත්‍රගේ සිත් රිදෙතැයි සිතාය.

"මටත් හරිම විශාල බලාපොරොත්තුවක් තියෙනව " මිත්‍ර ඇයට කීවේය.

"කියන්න මොකක්ද කියල "

"මට වෛද්‍ය විද්‍යාව ඉගෙන ගන්න ඕන. මට අක්‍ෂි රෝග ගැනත්, ඒවා සුව කරන අන්දමත් ඉගෙන ගන්න ඕන. එතකොට මං වගේ ඇස් නොපෙනී ගිය අයට වෙදකම් කරන්න පුලුවන්. මම දැන් දන්නව අන්ධ වීම කියන්නෙ මොකක්ද කියල. එහෙම දෙයක් හතුරෙකුට වත් වෙන්න එපා කියල මම ප්‍රාර්ථනා කරනව"

"අනේ ඒක කොච්චර හොඳද. මටත් ඕන වෙද කම ඉගෙන ගන්න තමයි"

"ඉතින් අද වෙන කම් කිව්වෙ නැත්තෙ ඒ ගැන "

"ඔයත් කිව්වෙ නැහැනෙ "

"මට එහෙම දෙයක් ගැන හිනෙකින්වත් හිතන්න පුලුවන් තත්වෙක නෙවෙයිනෙ මම හිටියෙ "

"ඒ හින්ද තමයි මමත් මගේ බලාපොරොත්තු නොකීවෙ "

"ඉතින් දැන් වත් කියන්න ඔයා කරන්න ආසා මොනවාද කියල" මිත්‍ර ඇයට පැවසීය, " මම මට පුලුවන් හැම උදව්වක්ම දෙන්නම් ඔයාගෙ සිහින සැබෑ කර ගන්න "

"මම දන්නව ඒක. අපි ගෙදර ගිය හැටියෙ මම අප්පට කියනව මට විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉගෙන ගන්න ඕන කියල. ද්වාර පණ්ඩිත හාමුදුරුවො පවත්වන ඕනම පරීක්ෂණයක් සමත් වෙන්න මට පුලුවන් "

"අපි දෙන්නම එකට ඉදිරිපත් වෙමු " මිත්‍ර යොජනා කළේය.

"එතකොට අපට එකට පාඩම් කරන්නත් පුලුවන් "

"ඒ උනාට ඔයාලගෙ පිරිවෙනේ ගැහැණු ළමයෙකුට ඉගෙන ගන්න දෙයිද?"

"අපේ ඉතිහාසෙ සඳහන් වෙනව බොහෝ වනිතාවන් ගැන, වෛද්‍ය සේවයෙ යෙදුන. මුලින්ම සිටි කෙනෙක් තමයි සුප්පියා "

"වෛද්‍ය විද්‍යාව ඉගෙන ගන්න එක ඒ තරම් ලේසි නැහැ. බදකර රෝහලේ වෙද්නා මා සමග කීව මිනිස් සිරුර ගැන ඉගෙන ගන්න කොට මළ මිනී කපන්නත් වෙනව කියල "

"මම දන්නව. ඒකට කමක් නැහැ. එකෙන් මට මිනිස්සුන්ගෙ ලෙඩ සුව කරන්න පුලුවන් වෙනව නම් මළ සිරුරක් අත ගාන එක කොහොමහරි කරනව " පාලි දැඩි අධිෂ්ඨානයකින් යුතුව පැවසුවාය.

"මම එහෙනම් කියන්නද කොහෙමද මළ සිරුරු සකසා ගන්නෙ කියල "

"හොඳයි කියන්න. හැබැයි ඔයා හිතන්න එපා ඒව කියල මාව බය කරන්න පුලුවන් කියල "

"මම කියන්නම් වෙද්නා කියපු දේ "

"හොරා වගේ එහෙනම් සේරම විස්තර අහගෙන මෙයා කළින්ම "

"ඉතින් ඒ දවස්වල මම ඔයා අඳුනන්නෙ නැහැ නෙ ඔයාට කියන්න. මළ සිරුරක් ලැබුණම ඉස්සෙල්ලම ඒකෙ බඩවැල් ආදිය ඉවත් කරන්න ඕන. ඊට පස්සෙ ගසක පොතුවල, තණ කොල වල නැත්නම් හණ වල ඔතල කුඩුවක දානව "

"ඒ මොනවටද? "

"ඉන්නකො කියනකම්. ඒ කුඩුව සෙමින් බැස යන ඇළක හෝ දොළක දාල තියෙනව දවස් හතකට. කුඩුවෙ දාල තියන්නෙ සත්තුන්ටයි මාලුන්ටයි කන්න බැරිවෙන්න. වතුරෙන් එළියට ගන්න කොට සිරුර හොඳට මොලොක් වෙලා තියෙන්නෙ. ඉතින් රලු කෙඳි වර්ගයකික් හරි උණ පතුරු කැල්ලකින් හරි හදපු පින්සලකින්, සිරුරේ මස් තටටුවෙන් තට්ටුව හූරන්න ඕන, මතුවෙන හැම තට්ටුවක්ම පරීක්ෂා කරමින්. එහි අඩංගු දේ ගැන ඉගෙන ගන්න, මෙහෙම කරන්න ඕන. අන්තිමේ ඇට කටු වලට එන කම්. ඊට පස්සෙ ඇට සැකිල්ල පරීක්ෂා කරන්න ඕන. ඔයාට ඒව කරන්න පුලුවන් ද? "

"මට කරන්න උනොත් කරනව. ඒත් මම දන්නෙ කොහෙමෙද ඔයා කියන්නෙ ඇත්තද කියල "

"ඔයා එක්කො මාව විශ්වාස කරන්න ඕන. නැත්නම් ආපහු ගියාම වෙද්නාගෙන් අහන්න ඕන "

"මම වෙද්නා ගෙන් අහනව "

"මම කියන්නද, යවන දේසෙ හිටපු තරුණියක් ගැන ඔයා වගේ වෙද කම ඉගෙන ගන්න හිතා ගත්තු. එයාග නම ඇග්නොඩයිස්. ඒ රටෙත් ගැහැණුන්ට වෙදකම ඉගෙන ගන්න ඉඩ දුන්නෙ නැහැ. ඉතින් එයා කොණ්ඩෙ කොට වෙන්න කපල, කොල්ලෙක් වගේ ඇඳගෙන ගියාලු හෙරෝ"ලොස් ළගට, ඉගෙන ගන්න "

"මට නම් එහෙම ප්‍රශ්නයක් වෙන එකක් නැහැ. මාව බාර ගනියි විභාගෙ සමත් උනොත් "

"ඉතින් මම කතාව කියල ඉවරවෙනකම් ඉන්න බැරිද " මිත්‍ර අමනාපයෙන් මෙන් ඇසුවේය.

"මම තවත් බාදා කරන්නෙ නැහැ. කතාව කියන්නකො "

"බැහැ "

"අනේ "

"ඉතින් ඇග්නොඩයිස් වෛද්‍ය කර්මය ඉගෙන ගෙන වෛද්‍ය වරයෙක් හැටියට සේවය ඇරඹුවා. කවුරුත් පිළි ගත්තෙ මේ පිරිමියෙක් කියල. දවසක් මෙයා නගරයෙන් බැහැර ගමනක් යනකොට කවුද කෑ ගහනව ඇහිල බලනකොට මඩුවක් ඇතුලෙ ගැහැණියක් කෙඳිරිගානව ඇහිල තියෙනව, දරුවෙක් වදන්න ළග. ඇග්නොඩයිස් ඇයට පිහිට වෙන්න ළං වෙනකොට ඒ මනුස්සය කෑ ගැහුවලු ළගට එන්න එපා කියල. මේ පිරිමියෙක් කියල හිතාගෙන "

"ඉතින් "

"ඉතින් ඇග්නොඩයිස්ට ඔප්පු කරන්න වුනා, ඇයත් ගැහැණියක් බව "

"කොහොමද ඒ "

"ඔයා කියන්න බලන්න "

"මං දන්නෙ නැහැ "

"මට කියන්න බැහැ "

"එහෙනම් කතාව කියන්න පටන් ගත්තෙ ඇයි "

"ඔයත් එහෙනම් කඳුරුගොඩ විහාරෙට යන කොට කපුටගෙ කතාව බාගෙට කියල නතර කළේ "

"ඒ නිකම. ඔයාට ඒක තාමත් මතකද? ඉතින් දැන් කියන්න කොහොමද අර ගැහැණියට ඒක සනාථ කළේ කියල "

"හරිම සුලු දෙයක්නෙ. ඇග්නොඩයිස් එයා ඇඳගෙන හිටි රෙද්ද ඉස්සුව "

"ඔයා මේ වගේ නරක ඒව දන්නවයි කියල මං හිතුවෙ නැහැ "

"ඒකෙ මොකක්ද නරක. අනිත් එක මම කිව්වනෙ කියන්න බැහැ කියල "

"ඉතින් ඊළගට මොකද උනේ "

"ඔයා නරක කතා අහන්න කැමති නැහැනෙ "

"ඒක නරක කතාවක් නෙවෙයි. අනේ කියන්නකො "

"නගරෙ සෙරම කාන්තාවො ඇග්නොඩයිස් ළගට එන්න පටන් ගත්තා බෙහෙත් ගන්න. පිරිමි වෙද්දුන්ට රස්සාව නැතිවේගෙන ආව. ඒත් මේ වෙද්දු දැනගෙන හිටියෙ නැහැ මෙයා කාන්තාවක් කියල. ඉතින් මේ වෙද්දු නගරෙ පිරිමින් අතරෙ පතුරුවන්න ගත්ත මේ ආග්නොඩයිස් ඒ අයගෙ බිරියන් දූෂණය කරනව කියල. මේක විස්වාස කරල මිනිස්සු ඇග්නොඩයිස්ට විරුද්ධව නඩු පවරල එයා සිරභාරයට ගත්ත. ඇයට විරුද්ධව තියෙන චොදනාව ඇහුවම ඇයට ආයිත් සිද්ද උනා ඇය කාන්තාවක් බව ප්‍රකාශ කරන්න. එයා චෝදනාවෙන් නිදහස් උනාට වෙද්ඳු ආයිත් චෝදනාවක් කළා වෛද්‍ය සභාව නොමග යැව්ව කියල, පිරිමියෙක් විදිහට වෙස් වළාගෙන. මේක ආරංචි වෙලා රටේ ගැහැණු ඇවිත් උද්ගෝෂණය කලා ඇයව බේර ගන්න. අන්තිමේ ඇග්නොඩයිස් ට වෙදකම දිගටම කරගෙන යන්න අවසර දෙන්න සිද්දු උනා "

"ඔය ඇත්ත කතාවක්ද "

"ඇත්ත වෙන්න ඕන. ඒ රටවල තාම තියෙනව ඇය සිහිවෙන්න හදපු කුඩා සිහිවටන. ඒවයෙ තියෙන්නෙ ගැහැණියක් ඇඳුම උස්සගෙන ඉන්නව. බඩේ ඇඳල තියෙනව තව මුහුණක් "

"ඔයා අතින් දාන කතා ඒව "

"ඇයි මම බොරු කියන්නෙ. මම ඇත්තටම දැක්ක දේ තමයි කිව්වෙ "

"වෙන මොනවද දැක්කෙ "

"තව හුගක් දේවල් දැක්ක ඒ උනාට කියන්නෙ නැහැ "

දිනක් ඔවුන් රෑ කෑම කන අතර අලුතින් පැමිණි යුවලක් ඔවුන්ට එක් වුහ.

"මේ කෑම සපය ගන්නෙ කොහොමද මෙතෙන්ට" එක් අයෙක් පාලිගෙන් ඇසුවේය.

"මෙතන කොයි වෙලේත් කෑම වරදින්නෙ නැහැ. මමත් ආව දවස්වල එහෙම ඇහුව. මමත් තාම හරියටම දන්නෙ නැහැ. සමහරු කියනව රජවරු තෑගි කළ ගම්බිම් වල ආදායම කියල. මෙහේ එන අයත් තම තමන්ට පුලුවන් විදිහට ආධාර කරනව. අවට ඉන්න ධනවත් අයත් නිතරම උදව් කරනව "

"අපි අද පන්සල් යමුද " පසුදා උදේ මිත්‍ර ඇසුවේය.

"ඔයාට ඕන නම් යමු. රෝහල තියෙන්නෙත් පන්සල ඇතුලෙ නෙ. අපි හැමදාම යනවනෙ "

"එහෙම නෙවෙයි අප පන්සලට කියල ඒ වෙනුවෙන්ම යමු. අනිත් එක මම තාම පන්සල හරියට දැකල නැහැ. මතක නැද්ද මට ඒ දවස් වල ඇස් නොපෙණුන බව "

"ඔයා ගෙ ඇස් පෙනුණෙ නැද්ද, ඇත්තටම?"

"හොඳට පෙනුණ. මට බලන්න ඕන උනේ ඔයා මට සලකන හැටි "

"ඉතින් බලා ගත්තද?"

"ඔව් "

"මං ඔයාට ගොඩක් ආදරේ කියල දැක්කද?"

"ඔය කියන තරම් ආදරයක් නම් දැක්කෙ නැහැ "

ඔවුන් නවාතැනින් පිටවී පන්සල දෙසට දුවන්නට වුයේ කුඩා ළමයින් දෙදෙනෙකු මෙන් යැයි ඒ දෙස බලා සිටි අය සිතඹහ. එහෙත් ඔවුන් විඳි ඳුක දන්නා අය සිදුවූ ප්‍රාතිහාර්ය ගැන සතුටු වූහ.

පාලි මුලින්ම පන්සලේ නායක හාමුඳුරුවන් බැහැ දකින්නට මිත්‍ර කැඳවාගෙන ගියාය. මීට ඉහත කිහිප වතාවක් වඳින්නට පැමැණි විට පාලිට ඔහු හමුවී තිබූ හෙයින් මිත්‍ර ගැන භික්ෂුව දැන සිටියේය. නායක හාමුඳුරුවෝ ඔවුන් දෙදෙනා බුදුරුව වෙත කැඳවාගෙන ගියහ.

මෙතරම් උස එහෙත් මෙතරම් ශාන්ත පෙණුමක් ඇති බුදු පිළිමයක් ඔහු කිසි දාක තිබුණේ නැත. බදකර විහාරයේ තිබූ පිළිමය ට වඩා මෙය උස බව පාලි කිවාය. පාලි බුදුන් වඳින විට මිත්‍රද ඇය අසලින් දන නමා හිඳ දෙඅත් එකතු කර වැඳගෙන සිටියේය. එතැනින් ඔවුන් ඊළගට ගියේ කුඩා කඳු ගැටයක් මත රෝහලට මුහුණ ලා සිටි අවලෝකිතේශ්වර බොධිසත්වයන්ගේ රුව වෙතටය.

"මම හැමදාම හවස මෙතනට ඇවිත් මල් පූජා කළා ඔයාට සෙත් පතන්න "

"අපි යමු බොධිගරය ත් දාගැබත් වඳින්න "

"මම රටවල් කිහිපයකම දැකල තියෙනව මේ වගේ හැඩයක් තියෙන ඉස්ලාමීය දේවස්ථාන " මිත්‍ර කීවේය.

"වෙන්න පුලුවන්. ඉස්ලාමික වාස්තු විද්‍යාවට ඉන්දියානු ආභාෂය හුගක් ලැබුණා, පසු කාලෙක ඒකෙ අනිත් පැත්තත් උනා "

"අපේ රටෙත් බෞද්ධ හා වෛදික පූජ්‍යස්ථාන වල නටබුන් තියෙනවා " මිත්‍ර කීවේය.

"ඇයි ඒව නටබුන් වෙලා තියෙන්නෙ " පාලි ඇසුවාය.

"අපි අහල තියෙන්නෙ සාන්ත ග්‍රෙගරි වගේ ක්‍රිස්තියානි අය තමයි ඒව විනාස කළේ කියල " මිත්‍ර කීවේය.

"ඔව් මමත් අහල තියෙනව. ඔහු ඉහළ යුප්‍රටිස් ප්‍රදේශයේ තිබුන වෙහෙර විහාර සියල්ලම විනාශ කළා කියල. ඒත් වෙහෙර විහාර විනාස කළා කියල ඒ මිනිස්සුන්ගෙ විශ්වාසය නැති කරන්න බැරි උනා. අන්තිමේ ගෞතම බුදුරජාණන් වහන්සේත් ඒ අයම අයිති කරගන්න හැදුවා. සාන්ත ජොසපත් යැයි නම් කෙරුණා. ඒ අතර මීට අවුරුඳු දෙසීයකට පමණ ඉස්සර. පර්සියාවේ සාදන ලද බුදු පිළිම චීනය දක්වා පැතිර ගියා "භික්ෂුව පැහැදිළි කළේය.

"මට පර්සියාවෙදි විතරක් නෙවෙයි රොමයෙදි, ග්‍රීසියෙදි පවා බෞද්ධ හා ශිව භක්තිකයින් මුණ ගැහිල තියෙනව "

"ක්‍රිස්තියානි ආගම පැතිරෙන්න කලින් බුදු දහම පැතුරුණා අප්‍රිකාවට පවා. මේ පිරිවෙනේ භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙක්ම ඒ රටවලට වැඩම කරල තියෙනව ධර්මදූත වැඩ සඳහා "

"කෙහොමද උන්වහන්සේලා ඒ තරම් දුරක් ගමන් කළේ හුගක් භයානක ගමනක් නෙ"

"භයානක තමයි දරුව. වන සතුන්ගෙන්, රෝගාබාධ වලින් විතරක් නෙවෙයි, මිනිස් ජීවිත ගැන කිසිම තැකීමක් නැති නපුරු මිනිස්සුන්ගෙනුත් ආරක්ෂා වෙන්න වෙනව"

"ආරක්ෂා උනේ කොහොමද"

"ආත්මාරක්ෂක ක්‍රම පුහුණුවක් ලබල තියෙන නිසා. මම දන්නව ඔබ අහන්න හදන්නෙ අවිහිංසාව සමග මේ සටන් ක්‍රම ගැලපෙන්නෙ නැහැ නේද කියල. ඒ උනාට සමහර අවස්ථාවලදි, තැනට සුදුසු විදිහට හැඩගැහෙන්න වෙනව, අපේ විශ්වාස වෙනස් කර ගන්නේ නැතිව. අහල තියෙනවද කලාරිපයත කියල ආත්මාරක්ෂක සටන් ක්‍රමයක් ගැන?"

"නැහැ. ඒත් චීන දේශයේ සටන් ක්‍රම ගැන අහල තියෙනව "

"චීනයට ඒ සටන් ක්‍රම අඳුන්වාදුන්නෙ බෞද්ධ භික්ෂූන් තමයි. අපේ භික්ෂූන් මේ සටන්ක්‍රම වල ආයුධ භාවිතය හා හිංසාකාරී අංග ඉවත් කරල, අලුත් සටන් ක්‍රම දියුණු කර ගත්තා සතුරාට දිගු කාලීන අන්තරාවක් නොවෙන්න. ඔහුගේ ආයුධ උදුරාගෙන ඔහු මෙල්ල කර ගන්න පුලුවන් විදිහට. ඒ ක්‍රම පුහුණු කරන එක ලෙහෙසි නැහැ. භාවනා ක්‍රම ඇතුලත් ඉතාම දැඩි ශික්ෂණයකින් හැදෑරිය යුතු ශිල්පයක්. අවාසනාවකට වගේ දැන් අපේ රටිනුත් ඉන්දියාවෙනුත් මේ ශිල්ප ක්‍රම අතුරුදහන් වේගෙන යනවා "

ඔවුන් ගමන් කළ මග දෙපස මලින් බර ගස් පේළියකින් සෙවන වී තිබුණේය.

"හරිම ලස්සන පරිසරයක මේ පන්සල තියෙන්නෙ" මිත්‍ර වට පිට බලමින් පැවසීය.

"ඔව්. මේ එරබදු ගස් පේළිය නිසා මෙතෙන්ට අමුතු ලස්සනක් ගෙන දෙනව " පැවසූ භික්ෂුව පාලි වෙතට හැරුණේය. " මේ ගස් වලට ඔය දරුවන්ගෙ පලාතෙ සමහර විට කියනව ඇති මුල්ලු මුරුක්කු කියල. මේක ඖෂධ වලට ගන්නව. බලන්න මේ එරබදු කොළය දිහා. මේ මැද කොළේ කැප වෙන්නෙ විශ්නු දෙවියන්ට, දකුණු පැත්ත බ්‍රහ්මයාට, වම් පැත්ත සිව දෙවියන්ට "

ඔහු තවත් ගසක් පෙන්වීය.

"මේ අසෝක ගහේ මල් පිපුණාම හරිම ලස්සනයි. කතාවක් තියෙනව මේ ගහේ මල් පිපෙන්නෙ කන්‍යාවක් ගහ ඇල්ලුවාට පසුවයි කියල. සීතා දේවිය රාවණාගෙන් බේරෙන්න මේ ගහ පිටි පස්සෙ සැඟවුණා කියලත් කියනව "

ඔවුහු ඉරු එළිය දැඩි වන්නට පෙර හික්ෂුව ගෙන් සමුගෙන නවාතැන බලා පිටත් වූහ.

"කවද්ද ඔයාගෙ දෙමාපියන් බලන්න යන්නෙ " හිටි වනම පාලි ඇසුවාය.

"මාත් ඒ ගැන තමයි කල්පනා කළේ "

"ඔය හැටි කල්පනා කරන්න දෙයක් තියෙනවද. අපි ආපහු ගමට ගිහින් අම්මටයි අප්පටයි කියල මාන්තොටින් නැවක නගිමු "

"ඒ කියන තරම් ලේසි නැහැ කරන්න ගියාම. මුහුදු ගමනට සල්ලිත් ඕන කරනව"

"මුදල් අප්ප දේවි "

"එහෙම ගන්න බැහැනෙ මට. ඊටත් වඩා ප්‍රශ්නය අපේ අම්මල දැන් මම මැරිල හැටියට හිත හදාගෙන ඇති. මම හිටපු නැව දැන් ආපහු ගිහින් මෙලහකට. නැවේ හිටි කෙනෙක් අපේ ගෙදරට පණිවිඩයක් දෙන්න ඇති. මම මැරුණ කියල කියන්න ඇති. මම පණිවිඩයක් යැව්වෙත් නැති නිසා අම්මල ඒක විශ්වාස කරන්න පුලුවන් "

"අපට පණිවිඩයක් යවන්න තිබුණ "

"මම කොහොමද ඇස් පේන්නෙත් නැතුව නාඳුනන රටක අතරමං වෙලා කියල කියන්නෙ. ඒකයි මම සනීප වෙනකම් හිටියෙ "

"මේ නාඳුනන රටේ දුප්පත් කෙල්ලෙක් බැන්ද කියලත් කියන්න වෙනවනෙ "

"එක නම් කියන්න ගැටලුවක් නැහැ "

"එහේ තව බිරිඳක් ඉන්නව නම් මිසක "

"එක්කෙනා නෙවෙයි. තව තුන් දෙනෙක් ඉන්නව "

"එතකොට දරුවො "

"දරුවො ද? කෝ බලන්න " ඔහු ඇඟිලි ගනින්නට විය, " එකයි, දෙකයි, පහයි, හත් දෙනෙක් ඉන්නව මං හිතන්නෙ "

"හරියට ඉන්න දරුවො ගණනවත් දන්නෙ නැති තාත්ත කෙනෙක්නෙ. ඉතින් කවදද හතරවෙනි බිරිඳ එක්ක යන්නෙ "

"තව ටික කලක් ඉන්න වෙයි ඒකට. මම දැකල තියෙනව මෙහේ ගොඩක් ලස්සන ගෑණු ළමයි. ඉතින් තව දෙන්නෙක් වත් බඳින්න ඕන යන්න කලින් "

"ඒ කියන්නෙ මම ලස්සන නැහැ කියන එකනෙ "

"මම කී පාරක් කියල තියෙනවද මේ ලොකෙ ඉන්න ලස්සනම කෙල්ල ඔයා කියල "

"එහෙනම් මොකටද අනිත් කෙල්ලො දිහා බලන්නෙ"

"එතකොට නෙ මට පේන්නෙ ඔයා ඒ අයට වඩා කොයිතරම් ලස්සනද කියල "

"ඉතින් තව දෙන්නෙක් බඳින්න හදන්නෙ "

"මට සෙරම බිරින්දන් හත් දෙනෙක් ඕන නිසා "

"ඇත්තටම මම දන්නෙ කොහොමද ඔයාට ඒ රටේ කෙල්ලෙක් ඉන්නවද කියල " එදා රෑ සුපුරුදු ගහ යට වාඩිවී සිටිනා අතර ඇය ඇසුවාය.

"ඒක අහන්න තිබුණෙ මාව බඳින්න කලින්. දැන් අහල මොනව කරන්නද "

"මම දන්නෙ නැහැ ඔයා ඇත්තටම මොනව හරි කියනවද, නැත්නම් විහිලු කරනවද කියල "

"මම විහිලුවට මොනවත් කියන්නෙ නැහැ. හැම තිස්සෙම ඇත්ත තමයි කියන්නෙ"

"ඔයත් එක්ක මම තවත් කතා කරන්නෙ නැහැ "

"කමක් නැහැ. ඔයාට තරහ ගියාම වඩාත් ලස්සනයි. මට ඔයා දිහා බලාගෙන ඉන්න පුලුවන් "

## පැපිරස් පොත

භානු ඈ මෙතෙක් කියවමින් සිටි විද්‍යුත් පොතේ අවසාන පරිච්ඡේදය කියවා අවසන් කළාය. අන්තර්ජාලය තුල ඇයට මේ නවකතාව හමු වුනේ ඉපැරණි වෛද්‍ය ක්‍රම ගැන සොයන විටෙකදිය.

මේ කතාව විද්‍යුත් මාධ්‍යයෙන් පළ කර තිබුණේ ප්‍රංශ ජාතික තරුණයෙකු විසිනි. මෙය පර්සියානු ජාතිකයෙකු විසින් 10 වන සියවසේදි පැපිරස් පත් ඉරු වල ලියන ලද්දකි. පර්සියානු රචකයා විසින් විස්තර කරන ලද්දේ පෙරදිගට යාත්‍රා කළ වෙළඳ නැවක සේවය කළ පර්සියානු ජාතික නැවියෙකුගේ කතාවකි. එම නැවියා කාලයක් ලංකාවේ උතුරු ප්‍රදේශයේ ජීවත් වී ඇත.

මෙතෙක් දිනක් භානු මේ පොත ගැන කිසිවෙකුට කීවේ නැත. අන්ධ නැවියා ගේ කතාවත්, ඈත අතීතයේ ලංකාවේ වෛද්‍ය සේවය කෙතරම් දියුණු තත්වයක තිබුණේද යන්නත්, කිසිවෙකුට කියන්නට ඇයට අවශ්‍ය විය. පොතේ පිටපතක් මුද්‍රණය කර සුමනදාසට දෙන්නට ඇය සිතා ගත්තාය. ඇය පොත කියෙව්වේ පරිච්ඡේදයෙන් පරිච්ඡේදය පරිගණක තිරය මතය.

කතාව කියවද්දි ඇය පාලි ගේ රූපය සිතින් මවා ගන්නට තැත් කළාය. ඇය අද යාපනයේ වසන කරුණියකට වඩා පෙනුමින් වෙනස් විද ඇගේ ඇඳුම් මොනවාගේ ද ඇයට දිගු වරලසක් තිබෙන්නට ඇද්ද? මිත්‍ර ට යලිත් පෙනුම ලැබුණාට පසුව වත් පාලි ගේ පෙනුම විස්තර නොකිරීම ගැන ඇයට රචකයා කෙරෙහි තරහක් උපන්නේය. භානු කිසිදිනක යාපනයට ගිහින් නැත. ඇගේ ජීවිත කාලය තුලදි යන්නට ලැබේදැයි සැක සහිතය.

උතුරේ සිටි පැමිණි කවරෙකු හෝ හමුවුවිට භානු යාපනය ගැන අසා දැනගන්නට උත්සාහ කළාය. සොයාගන්නට හැකි වු සෑම පොතක්ම ඇය කියෙවුවාය. ඒ නිසා යාපනය ගැන යම් චිත්ත රූපයක් මවා ගැනීමට ඇයට හැකි විය. කීරිමලෙයි පොකුණත්, මාවිඩ්ඩපුරම් කෝවිලත්, කන්දරෝඩෙයි බෞදධ නටබුන් ගැනත් ඇය විස්තර සොයාගත්තාය. බදකර අටන ලෙස හැඳින්වුයේ අද වල්ලිපුරම් බවත් ඇයට හඳුනා ගන්නට හැකිවිය. එහෙත් එහි බෞද්ධ පිරිවෙනක් ගැන ඇති එකම සටහන වූයේ වල්ලිපුරම් රන් සන්නස පමණක් විය.

දසවන සියවස වන විට යාපනයේ දකුණු ඉන්දියාවෙන් පැමිණ පදිංචිවී සිටි ද්‍රවිඩ ජාතිකයින් සිටි බව මේ කතාවෙන් ඇය දුටුවාය. ඔවුන් අතර බෞද්ධයන් විශාල වශයෙන් සිටින්නට ඇත.

සුමනදාසට මේ කතාව කියා, තාත්තාත් ඔහුත් සමග දකුණේ පිහිටි ඇස් රෝහල තිබෙන්නට ඇතැයි සිතිය හැකි මාළිගාවිල බලන්නට යන්නට ඇය ආසා කළාය. කුමාරි කතරගමට බාරයක් වී තිබුණෙන් එය ඔප්පු කරන්නට යන ගමනේ වැල්ලවාය හරහා මාලිගාවිල යන්නට ඇය යෝජනා කළ යුතුය. අනුරාධපුරයේ සියාතු වෙද මහතා බලන්නට ගිය විට අනුරාධපුරයෙත්, මිහින්තලේත්,

**පොලොන්නරුවේ ආලාහන පිරිවෙනේත් තිබූ රෝහල් වල නටබුන් බලන්නට ඇයට අවස්ථාවක් ලැබෙනවා ඇත.**

**සියලු සත්ත්වයෝ නිදුක්වෙත්වා**

## Bibliography


Ancient Hospitals of Sri Lanka, L. Prematilalake & A. Aluvihare,1990
Ancient Irrigation Works of Ceylon. R. L. Brohier. 1934
Annals of Internal Medicine, Dr Beaty & Dr. Petersdorf (1966):
Ascetisim and the Art of Healing in Ancient India. Kenneth G. Zysk. 1991
Early History of Buddhism in Ceylon, E.W.Adikaram, 1946
Early History of Ceylon, G.C.Mendis, 1940
Early Settlements in Northern Sri Lanka, Marina Ismail, 1995
Education in Ceylon, A Centenary Volume I. Ministry of Education 1969
Epigraphia Zeylanica. Vol I-VII
Food and the People, R. L. Brohier. 1975
Historiography in a Time of Ethnic Conflict - R.A.L.H. Gunawardena 1995
History of Buddhism in Ceylon, W. Rahula, 1956
History of Ceylon, University of Ceylon, 1959
India in Ceylonese History Society & Culture. M.D.Raghavan, 1964
JRAS Ceylon Vol XII, 1968. Kantarodai Dr. C. E. Godakumbura
JRAS Ceylon Vol VI, Historical Topography of Anicient & Medieval Ceylon. C.W. Nicholas
Life & Culture in Ancient India. B. N. Luniya 1978
Mediaeval Sinhalese Art, A.K.Coomaraswamy, 1956
Medicine Out Of Control, Dr Richard Taylor, 1979
Sinhalese Materia Medica. John Attygala. 1917
Social History of Early Ceylon, H.Ellawala, 1969
Society in Medieval Ceylon, M.B.Ariyapala, 1956
Study of the Economic History of Pre-modern Sri Lanka, 1994
The History and Culture of the Indian People. The Classical Age. R.C Majumdar (Editor). 1954
The Mahawamsa. Tr. Wilhelm Geiger. 1950
The Wonder That was India, A. L. Basham 1954